ගරු කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ උපදේශකවරු : විස්තර
## வெகுசன ஊடக, தகவல் அமைச்சின் ஆலோசகர்கள்: விபரம்
## ADVISERS UNDER MINISTRY OF MASS MEDIA AND INFORMATION : DETAILS

1481/'11

**3. ගරු රවි කරුණානායක මහතා (ගරු අජිත් කුමාර මහතා වෙනුවට)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க- கௌரவ அஜித் குமார சார்பாக)
(The Hon. Ravi Karunanayake on behalf of the Hon. Ajith Kumara)
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;
(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;
(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;
(iv) පසු ගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිල රථ ලබා දී ඇති උපදේශකයන්ගේ නම්, ලබා දී ඇති නිල රථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;
(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබා දෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;
(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

வெகுசன ஊடக, தகவல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வெகுசன ஊடக, தகவல் அமைச்சில் தற்போது சேவையாற்றுகின்ற ஆலோசகர்களின் எண்ணிக்கை எத்தனையென்பதையும்;
(ii) இவர்களின் பெயர்கள், கல்வித் தகைமைகள் மற்றும் பொறுப்புகள் யாவையென்பதையும்;
(iii) இவர்களுக்குச் செலுத்தப்படும் சம்பளம் மற்றும் கொடுப்பனவுகள் யாவையென்பதையும்;
(iv) கடந்த மாதத்திற்காகச் செலுத்தப்பட்ட அனைத்து கொடுப்பனவுகளினதும் கூட்டுத் தொகை எவ்வளவென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள், வழங்கப் பட்டுள்ள வாகனங்களின் எண்ணிக்கை மற்றும் அவற்றின் விபரங்கள் யாவையென்பதையும்;
(ii) இவர்களுக்கு எரிபொருள் கொடுப்பனவு வழங் கப்படும் எனின், ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்படுகின்ற எரிபொருள் கொடுப்பனவு தனித்தனியாக யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) இவர்களுக்கு தொலைபேசி வசதிகள் வழங்கப் படுமெனின், தற்போது தொலைபேசி வசதிகள் வழங்கப்பட்டுள்ள ஆலோசகர்களின் பெயர்கள் யாவையென்பதையும்;
(ii) தொலைபேசிக் கொடுப்பனவுத் தொகை யொன்று வழங்கப்படுமெனின் ஒவ்வொரு ஆலோசகருக்கும் வழங்கப்பட்டுள்ள கொடுப் பனவுத் தொகை தனித்தனியாக எவ்வள வென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

[ගරු රවි කරුණානායක මහතා]

asked the Minister of Mass Media and Information:

(a) Will he state-

(i) the number of advisers who serve in the Ministry of Mass Media and Information at present;

(ii) their names, educational qualifications and responsibilities;

(iii) the salaries and allowances paid to them; and

(iv) the total of all the allowances paid during the previous month?

(b) Will he inform this House-

(i) the names of the advisers to whom official vehicles have been provided, the number of official vehicles provided and the details of those vehicles; and

(ii) separately of the fuel allowance provided to each adviser, if they are provided with a fuel allowance?

(c) Will he state-

(i) the names of the advisers to whom telephone facilities have been provided by now if telephone facilities are provided to them; and

(ii) separately of the amount of the telephone allowance paid to each adviser, if they are paid a telephone allowance?

(d) If not, why?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා (ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல - வெகுசன ஊடக, தகவல் அமைச்சர்)
(The Hon. Keheliya Rambukwella - Minister of Mass Media and Information)
ගරු කථානායකතුමනි, පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
**சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) නැත.
(ii) අදාළ නොවේ.
(iii) අදාළ නොවේ.
(iv) අදාළ නොවේ.

(ආ) (i) අදාළ නොවේ.
(ii) අදාළ නොවේ.

(ඇ) (i) අදාළ නොවේ.
(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රශ්න අංක 6-1690/'11-(1), ගරු පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි

**ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා**
(மாண்புமிகு எரிக் பிரசன்ன வீரவர்தன)
(The Hon. Eric Prasanna Weerawardhana)
ගරු කථානායකතුමනි, ගරු පූජ්‍ය එල්ලාවල මේධානන්ද හිමි වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### රජ රට විශ්වවිද්‍යාල අර්බුදය
### ரஜரட்ட பல்கலைக்கழக நெருக்கடிநிலை
### CRISIS AT RAJARATA UNIVERSITY

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, 23(2) ස්ථාවර නියෝගය යටතේ මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමි.

ගරු කථානායකතුමනි, රජ රට විශ්වවිද්‍යාලයේ වර්තමානයේ ඇති වී තිබෙන අර්බුදය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරවමි. රජ රට වෛද්‍ය පීඨය 2006.09.04 වන දින උත්කර්ෂවත් අන්දමින් මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා සහභාගිත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී ආරම්භ විය. එහිදී ජනාධිපතිතුමා පැවසුවේ රජ රට වෛද්‍ය පීඨය මහින්ද චින්තනයේ සුජාත වූ දරුවෙක් බවත් එය වැඩිදියුණු කරන බවත්ය.

තවද මෙම උත්සවය සඳහා එවකට උසස් අධ්‍යාපන ඇමතිව සිටි සුසිල් ප්‍රේමජයන්ත මහතා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා වන මහාචාර්ය ගාමිණී සමරනායක මහතා සහභාගි විය. එහිදී ඔවුන් පැවසුවේ රජ රට වෛද්‍ය පීඨයට පළමු වසර දෙක සඳහා අත්‍යවශ්‍ය සියලුම පහසුකම් ඇති බවත්, ඉදිරි වසර තුන සඳහා අත්‍යවශ්‍ය වන පහසුකම් කඩිනමින් ලබා දීමට පොරොන්දු වන බවත්ය.

රජ රට වෛද්‍ය පීඨය නිල වශයෙන් සාලියපුර පරිශ්‍රයේ දී 2006.09.11 වන දින ආරම්භ කිරීමේ දී ඔවුන් පෙන් වූ සුරපුරය රජ රට වෛද්‍ය පීඨයේ නොමැති විය. සිසුන් සඳහා රජ රට වෛද්‍ය පීඨයට තිබුණේ එකම දේශන ශාලාවක් පමණි. එය තුළ කියවීම් ශාලාව, විද්‍යාගාරය, පුස්තකාලය හා ආපන ශාලාව ද විය. ඒ මන්ද යත් එම කිසිදු පහසුකමක් රජ රට වෛද්‍ය පීඨය තුළ ඒ වන විට

නොමැති වීමයි. කිසිදු ප්‍රායෝගික පරීක්ෂණයක් නොමැතිව පළමු මාස දෙක ගෙවී ගිය අතර, පළමු දෙමාසික පරීක්ෂණය පැවැත්වීමෙන් පසු පහසුකම් නොමැති වීම හේතුවෙන් පීඨය දින නියමයක් නොමැතිව වසා තබන ලදී. එයින් සිසුන්ට නිවසට වී නිකරුණේ කාලය ගත කරන්නට සිදු විය. ඉන් පසු ශිෂ්‍යයන් එම පහසුකම් සහිතව පීඨය නැවත ආරම්භ කරන ලෙස ඉල්ලා දැඩි ශිෂ්‍ය අරගලවල නිරත වූ අතර, මාස තුනකට පසුව පීඨය නැවත ආරම්භ කරන ලදී.

නැවත අර්බුදය පැන නැඟුණේ පළමු ශිෂ්‍ය කණ්ඩායම තුන්වන වසර ආරම්භයේ දීය. ඒ ඔවුන්ගේ තුන්වන වසර සඳහා අත්‍යවශ්‍ය විද්‍යාගාර පහසුකම් නොමැති වීම සම්බන්ධවයි. එනම් 2009 වසරේ සිටියදීම මහාචාර්ය ඒකක ගැටලුව සම්බන්ධයෙන් සිසුන්ට අරගල කිරීමට සිදු විය. එහිදී පරිපාලනය විසින් සිසුන්ට පැවසුවේ ඒ සඳහා කල් තිබෙන බවත්, ශිෂ්‍යයන් අවසන් වසරට පැමිණෙන විට එම පහසුකම් සම්පූර්ණ කරන බවත්ය.

පළමු ශිෂ්‍ය කණ්ඩායමේ මහාචාර්ය සායනික පුහුණුව ආරම්භ කිරීමට නියමිතව තිබුණේ 2011 මැයි මස මුල් සතියේ දීය. නමුත් අවශ්‍ය මහාචාර්ය සායනික ගොඩනැඟිල්ල වැඩ ආරම්භ කිරීමට මුල් ගල තැබුවේ 2010 ජනවාරි මස 13වැනි දිනය. එම ගොඩනැඟිල්ල මහල් 06කින් යුක්ත වන අතර ඇස්තමේන්තු මුදල මිලියන 1,000කට ආසන්නය. එම මුල් ගල මාස 06ක් පමණ පැළ විය. නැවත ජූලි මාසයේ වැඩ ආරම්භ කළ මහාචාර්ය ඒකකය වැඩ නිමා කොට, මහාචාර්ය සායනික පුහුණුව නියමිත පරිදි 2011 මැයි මාසයේදී ආරම්භ කරන බව පාලකයන් සිසුන්ට ප්‍රකාශ කරන ලදී. නමුත් 2011 පෙබරවාරි මාසය වන විට නියමිත පරිදි එය සිදු කළ නොහැකි විය. ඒ නිසා ශිෂ්‍යයන්ගෙන් මෙයට දැඩි විරෝධයක් එල්ල වන්නට විය. එහිදී පීඨයේ සියලු දෙනා කොටුව දුම්රිය ස්ථානයේ සිට ජනාධිපති ලේකම් කාර්යාලය දක්වා සාමකාමී පා ගමනක් යන ලදී. එහිදී, රජ රට වෛද්‍ය පීඨය ආරම්භ කළ ආණ්ඩුව විසින්ම බේරේ වැවේ කුණු ජලයෙන් පහර දෙනු ලැබිය. ඉන් අනතුරුව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ පැවැති සාකච්ඡාවේදී පොරොන්දු වූයේ සියලුම පහසුකම් සහිතව මහාචාර්ය සායනික පුහුණුව නොවැම්බර් මස 15වන දින ආරම්භ කරන බවත්, නියමිත පරිදි අනෙකුත් වෛද්‍ය පීඨවල, ඒ කියන්නේ 2005-2006 ශිෂ්‍ය කණ්ඩායම් සමඟ සීමාවාසික පත්වීම් ලබා දෙන බවත්ය. නමුත් මේ වන විටත් රජ රට වෛද්‍ය පීඨයේ මහාචාර්ය ඒකකයේ අධ්‍යයන කටයුතු ආරම්භ කර නොමැති අතර සමාන්තර අනෙකුත් වෛද්‍ය පීඨ ශිෂ්‍ය කණ්ඩායම් කීපයක අධ්‍යයන කටයුතු අවසන් වී ඇති අතර අනෙක් පීඨවල අධ්‍යයන කටයුතු අවසන් වෙමින් පවතී.

ඉහත ගැටලුව නිසා රජ රට වෛද්‍ය පීඨයේ අවසන් වසර සිසුන්ට වසර 05ක අධ්‍යාපන කාලයට අමතරව තවත් වසරකට අධික කාලයක් ගත වනු ඇත. මේ හේතු කොට ගෙන රජ රට වෛද්‍ය පීඨයේ සිසුන් සමාන්තර අනෙකුත් පීඨ ශිෂ්‍ය කණ්ඩායම්වලට වඩා වසරකින් පසු පසට යන අතර එය රජ රට වෛද්‍ය පීඨයේ අනෙකුත් ශිෂ්‍ය කණ්ඩායම්වලටද බලපාමින් ඔවුන් සියලු දෙනාටද වසරකින් පසු පසට යාමට සිදු වේ.

සීමා වාසික පත්වීම් ලබා දීමේදී සාමාන්‍ය පටිපාටිය වනුයේ එකම වසරකදී අ.පො.ස. උසස් පෙළ ලියා වෛද්‍ය පීඨවලට ඇතුළු වූ සියලු දෙනාටම එක වර පත් වීම් ලබා දීමේ ක්‍රමවේදයයි. නමුත් ඉහත පරිදි සිදු වන ප්‍රමාදය නිසා රජ රට වෛද්‍ය පීඨ සිසුන්ට ඔවුන්ට සමාන්තර අනෙක් සිසුන් සමඟ සීමා වාසික පත්වීම් නොලැබී යාමේ අවදානමක් ඇති අතර, එම නිසා ශ්‍රේණිගත කිරීම් අනුව අසාධාරණ ලෙස පසු පසට යාමට සිදු වේ. මෙය රජ රට වෛද්‍ය පීඨයේ සිසුන්ගේ අනාගත වෛද්‍ය වෘත්තීය කටයුතුවලට සෘජුවම බලපාන බැවින් ඔවුනට සිදු වන බලවත් අසාධාරණයක් වන්නේය. මෙම ගැටලු හේතු කොට ගෙන පසු ගිය නොවැම්බර් 28වැනි දින උපකුලපතිවරයා හා පීඨාධිපතිතුමිය ඉදිරියේ පැවැත්වූ උද්ඝෝෂණයේදී දෙසැම්බර් 15වැනි දින මහාචාර්ය ඒකකයේ සායනික කටයුතු ආරම්භ කරන බවට පොරොන්දු වූ අතර, අසාධාරණ ලෙස සිසුන් 06 දෙනෙකුගේ පන්ති තහනමක් සිදු කර රජ රට වෛද්‍ය ශිෂ්‍ය සංගමය තහනම් කරන ලදී.

ගරු කථානායකතුමනි, ඒ අනුව ගරු ඇමතිතුමාගෙන් පහත ප්‍රශ්නවලට පිළිතුරු අපේක්ෂා කරනවා.

01. විශ්වවිද්‍යාල උපකුලපතිතුමා පොරොන්දු වන පරිදි -මීට පෙර අවස්ථා ගණනාවකදීම පොරොන්දු වී තිබෙන නිසා- නියත වශයෙන්ම දෙසැම්බර් 15වැනි දින මහාචාර්ය ඒකකය ආරම්භ කිරීමට කටයුතු කරමින් සිටිනවාද?

02. රජ රට වෛද්‍ය සිසුන්ට සීමා වාසික පත් වීම් ලබා දීමේදී ඒ හා සමාන අනෙකුත් විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨ සිසුන් සමඟ එකට පත් වීම් ලබා දීමට කටයුතු කරනවාද?

03. පොදු බහුවරණ පරීක්ෂණයන් (common MCQ) කරන ශ්‍රේණිගත කිරීමේදී ඔවුන්ට අසාධාරණයක් නොවීමට කටයුතු කරනවාද?

    ගරු කථානායකතුමනි, මෙහෙම වුණොත් සිද්ධ වන දේ තමයි සිසුන් කණ්ඩායමක් පහළින් තියන්න සිද්ධ වීම. ඒක ඔවුන්ට වන ලොකු අසාධාරණයක්. එය වළක්වන්න ඔබතුමා කටයුතු කරනවාද?

04. මහාචාර්ය ඒකකය සම්බන්ධයෙන් ඇති ගැටලුව කථා කිරීමට උපකුලපතිවරයා මුණ ගැසී, පීඨාධිපතිවරයා මුණ ගැසී සිසුන්ට එවැනි උද්ඝෝෂණයක් කරන්න සිදු වුණේ පාලක පාර්ශ්වයෙන් ඒ කටයුතු ඉටු කර නොදීම නිසායි. නමුත්, ඒ හේතු කොට ගෙන සිසුන් 06 දෙනෙකුගේ පන්ති තහනම් කිරීමේ පදනම කුමක්ද? එය ඉවත් කිරීමට කටයුතු කරන්නේද?

05. ගරු කථානායකතුමනි, මෙම සිද්ධිය හා කිසිසේත්ම සම්බන්ධ නොවූ ශිෂ්‍ය සංගමය -සාමාන්‍ය ශිෂ්‍යයෝ තමයි ඒකට ගියේ-තහනම් කිරීමේ පදනම කුමක්ද? ඒ තහනම ඉවත් කිරීමට ගරු ඇමතිතුමා කටයුතු කරනවාද කියා දැන ගන්න කැමැතියි.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා (උසස් අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க - உயர் கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Nandimithra Ekanayake - Deputy Minister of Higher Education)

ගරු කථානායකතුමනි, අනුර දිසානායක මන්ත්‍රීතුමා දීර්ඝ විස්තරයක් සහිතව අහපු ප්‍රශ්නවලට මම කෙටියෙන් පිළිතුරු දෙන්න කැමැතියි.

01. ආචාර්ය මණ්ඩලයත්, විශ්වවිද්‍යාල උපකුලපතිතුමා ඇතුළු අපි ඒ කොන්ත්‍රාත්කරුවන් සමඟ දිවා රාත්‍රී පැය 24ම වැඩ කරලා මහාචාර්ය ඒකකය නියමිත දිනට විවෘත කිරීම සඳහා පූර්ණ මහන්සියක්, වෙහෙසක් දරලා තිබෙනවා. නමුත් අනපේක්ෂිත විධියට ඇති වුණු යම් යම් කාලගුණික විපර්යාසයන් නිසා ඒවා ටිකක් ප්‍රමාද වෙලා තිබෙනවා. අපි තවමත් ඒ උත්සාහයේ නිරත වෙලා ඉන්නවා.

02. පත් වීම් ලබා දීම තීරණය වන්නේ එක් එක් විශ්වවිද්‍යාලවල ප්‍රතිඵල නිකුත් කරනු ලබන දින වකවානු අනුවය. ප්‍රතිපාදන ලැබෙන දින වකවානු අනුව පත් වීම් ලබා දීමට තීරණය කරනු ඇත.

03. ඔව්.

[ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා]

04. රජරට විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ රාජකාරියට බාධා කිරීම, ඔහුට තර්ජනය කිරීම, බිය වැද්දීම, කලහකාරී සිසුන් විසින් ඔහු අත් අඩංගුවට ගැනීම ආදී විනය විරෝධී ක්‍රියාවලට මූලික වූ සිසුන්ගේ පන්ති තහනම් කර ඇත. විනය පරීක්ෂණයේ ප්‍රතිඵල අනුව ඉදිරි පියවර ගනු ලැබේ. [බාධා කිරීමක්]

සිසුන්ගේ පන්ති තහනම් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ උපකුලපතිවරයා බලහත්කාරයෙන් රඳවා ගැනීම ඇතුළු විනය විරෝධී කටයුතු නිසායි. ගරු මන්ත්‍රීතුමනි, ඊයේ "ඩේලි නිව්ස් " පුවත් පතේ පළ වුණු මේ ලිපිය මන්ත්‍රීතුමා කරුණාකරලා කියවන්න. මේ ප්‍රමාදයට කිසිසේත් උපකුලපතිවරයා වග කිව යුතු වෙන්නේ නැහැ. මේ ප්‍රමාදය ඇති වෙලා තිබෙන්නේ ස්වභාවික හේතූන් නිසා ඇති වෙච්ච බාධක නිසාය කියන එක අවබෝධ කර ගන්න ඕනෑ. මමත් මේ ශිෂ්‍යයන් සමඟ සාකච්ඡා පැවැත්වූවා; දෙමව්පියන් සමඟ සාකච්ඡා පැවැත්වූවා. එසේ සාකච්ඡා පවත්වා නියම විධියට මේ කටයුත්ත කරන්න අපි උත්සාහ දැරුවා. මීට අදාළ කාරණා දෙකක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. එකක් තමයි, මහාචාර්ය ඒකකයේ ගොඩනැඟිල්ල ගැනයි ගරු මන්ත්‍රීතුමා කතා කරන්නේ. ගොඩනැඟිල්ල පමණක් නොවෙයි, සම්පත් දායකත්වය තිබෙනවා. අපට රජ රට විශ්වවිද්‍යාලයට අවශ්‍ය මහාචාර්යවරු ලබා ගැනීමේ ලොකු අපහසුතාවක් තිබෙනවා. කිසි කෙනෙක් යන්න කැමැති නැහැ. මෙන්න මේ හේතු තමයි මේකට බාධක වෙලා තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කැලෑවක වෛද්‍ය පීඨයක් ආරම්භ කළේ මොකටද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
වෛද්‍ය පීඨය ආරම්භ කළේ අනාගත බලාපොරොත්තු ඇතිවයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, රජ රට ඇත කැලෑවක මේ වෛද්‍ය පීඨය ආරම්භ කළා. දැන් දිගටම ඒ දරුවන්ට උගන්වන්න මහාචාර්යවරු නැහැ; ආචාර්යවරු නැහැ. ගරු කථානායකතුමනි, ආචාර්යවරු නැතිව මාස ගණනක් විශ්වවිද්‍යාලය වහලා තිබුණා.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
කිසිසේත්ම ඒ හේතුව නිසා අපි විශ්වවිද්‍යාලය අක්‍රිය වෙන්න දෙන්නේ නැහැ. ඒක සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ආචාර්යවරු නැතිකම නිසා මාස ගණනක් විශ්වවිද්‍යාලය වහලා තිබුණා. මමත් රජ රට කෙනෙක්. මම ඒ බව දන්නවා.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඔබතුමන්ලාගේ දේශපාලන අරමුණු ඉෂ්ට කර ගන්න ශිෂ්‍යයන් දඩමීමා කර ගෙන, ශිෂ්‍යයන් මහ මඟට බස්සවා කටයුතු කරනවා. මේක මොන නීතියක්ද? රටේ නීතිය අතට ගන්න ශිෂ්‍යයන්ට ඉඩ දෙන්න බැහැ. ඒ ගොල්ලෝ සමඟ සුහදව සාකච්ඡා කරලා, මේ ප්‍රශ්නය විසඳන්න රජය උත්සාහ දරනවා. අතිගරු ජනාධිපතිතුමා විටින් විට මේ ගැන විමසනවා; මේ කටයුතු සම්පූර්ණ කිරීමට පූර්ණ සහයෝගය දෙනවා. අපේ ගරු ඇමතිතුමාත් ඒ විධියටම මහන්සි ගන්නවා. UGC එකත් එහෙමයි. නිකම් බොරුවට ඒ ශිෂ්‍යයන් පාරට බස්සවා, ඒ අයට ගුටි අන්නවා, ඒ අය අරගලවලට අරගෙන, දෙමව්පියන්ගේ ඇස්වලින් කඳුළු හෙළන්නට සලස්වන තමුන්නාන්සේලාගේ ව්‍යායාමය අපි දන්නවා. පෙරේදා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති අයින් කරන්නය කියා ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් මහමඟට බැස්සුවා. මේවා අදාළද?

05. එම ප්‍රශ්නයට පිළිතුර මේකයි. අපි කෙළින්ම චෝදනා කරනවා, මෙම ශිෂ්‍ය සංගමය ජනතා විමුක්ති පෙරමුණේ පසුබිම මත කටයුතු කරන ශිෂ්‍ය සංගමයක්ය කියා. මේක තමුන්නාන්සේලාගේ බළල් අතක්. මේ බළල් අත තමයි හැම තැනකදීම තමුන්නාන්සේලා මෙහෙයවන්නේ. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා අස් කරන්නය කියා තමුන්නාන්සේලා ශිෂ්‍යයන් පාරට බස්සවනවා.

එහෙම සිරිතක් තිබෙනවාද? විශ්වවිද්‍යාලයේ උපකුලපති පත් කරන්නේ ජනාධිපතිතුමායි. ඒක තමුන්නාන්සේලා අතටවත්-

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමන්ලා හැම දාම කරන දේ තමයි ඒ ළමයින්ගේ සාධාරණ ඉල්ලීම්-

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා වශයෙන් ඔබතුමා පත් කරන්න කියලාද කියන්නේ? ඒකයි මම අහන්නේ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. පිළිතුර අවසන්ද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරයා වශයෙන් අනුර දිසානායක මන්ත්‍රීතුමා පත් කරන්නද, සෝමවංශ අමරසිංහ පත් කරන්නද, ටිල්වින් සිල්වා පත් කරන්නද ශිෂ්‍යයන් කියන්නේ?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
වාද වැඩක් නැහැ. පිළිතුර අවසන්ද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
පත් කරන්නේ ජනාධිපතිවරයායි. [බාධා කිරීම්] උගතුන්, බුද්ධිමතුන්, වියතුන් මිසක් මේ වාගේ අය විශ්වවිද්‍යාලයේ උපකුලපති ලෙස කරන්න බැහැ. [බාධා කිරීම්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ප්‍රකාශයක් කරන්න ඉඩ දුන්නම වාද කරන්න ඉඩ දෙන්න බැහැ. ප්‍රකාශය පමණයි.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කියන කිසිම දෙයක් මට ඇහෙන්නේ නැහැ.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුර අවසන්ද?

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
පස්වැනි ප්‍රශ්නයට පිළිතුර ඒකයි.

ඒ සංගමය තහනම් කරන්න හැදුවේ ඒකයි. [බාධා කිරීමක්] පෙලඹවීම්, බිය වැද්දීම්, ශිෂ්‍යයන්ට බලහත්කාරකම් කිරීම්, ඒ තුළ මේ උපකුලපතිවරයාව නිවාස අඩස්සියේ තබන්නට කටයුතු කිරීම් සිදු කර තිබෙනවා. පීඨාධිපතිනී මහාචාර්ය උඩුපිහිල්ලේ මැතිනිය ලොකු උනන්දුවක් දරනවා, නිසියාකාරව මේ කටයුතු කර ගෙන ගන්න. තමුන්නාන්සේලා ප්‍රායෝගිකව මේ අපහසුකම් අවබෝධ කර ගන්න. ඒ දරුවන් අද සමථයකට පත් කරලා යවලා තිබුණා. අපි දෙමව්පියන් එක්ක සාකච්ඡා කළා; ඒ ගොල්ලන් එකඟ වුණා; අපහසුකම් තේරුම් ගත්තා. නමුත් තමුන්නාන්සේලා ගිහිල්ලා, තමුන්නාන්සේලාගේ දේශපාලන න්‍යාය පත්‍රයට අනුව ඒ අයව ඉදිරියට ගෙනිහිල්ලා, ඒ අයව මෝඩයන් කරලා එළියට ගන්න උත්සාහ දරලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තමුන්නාන්සේලාගේ වැඩ නිසායි ළමයින් පාරට බැස්සේ. වෙන මොකක් නිසාද?

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. වාද කරන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
ඇයි පාරට බහින්න තමුන්නාන්සේලාට තිබෙන- [බාධා කිරීමක්] ඇයි ඒ? අපි ඒක සාකච්ඡා කරලා සමථයකට පත් කරලා තිබුණා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
හොඳයි. දැන් ඒක නියෝජ්‍ය ඇමතිතුමාගේ පිළිතුර-

**ගරු නන්දිමිත්‍ර ඒකනායක මහතා**
(மாண்புமிகு நந்திமித்ர ஏக்கநாயக்க)
(The Hon. Nandimithra Ekanayake)
මගේ පිළිතුර දීලා ඉවරයි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, එක කාරණයක් කියන්න මට අවස්ථාව දෙන්න.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
තමුන්නාන්සේත් ඒ වාදයට සම්බන්ධ වෙන්නද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම ඒ වාදයේ කොටස්කාරයෙකු නොවෙයි. [බාධා කිරීමක්]

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, මම මේ ඉදිරිපත් කරන ප්‍රශ්නය මේ සභාවත්, දෙස් විදෙස් බොහෝ දෙනෙකුත් අද බොහොම උනන්දුවෙන් බලා ගෙන ඉන්න දෙයක් සම්බන්ධයෙනුයි. LLRC කොමිෂන් වාර්තාව ජනාධිපතිතුමාට භාර දෙනවා අපි දුටුවා. ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කවදාද කියන ප්‍රශ්නය තමයි ඔබතුමාගෙන් මම අහන්න බලාපොරොත්තු වෙන්නේ. ඒකට සිංහලෙන් කියනවා උගත් පාඩම් හා සංහිඳියා කොමිසම කියලා. ඉංග්‍රීසියෙන් කියනවා, Lessons Learnt and Reconciliation Commission කියලා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
ඔබතුමා ඔහොම කථා කරන්නේ මොන ස්ථාවර නියෝගය යටතේද?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝගයක් යටතේ නොවෙයි. මේක මුළු රටටත්, රජයටත්, දෙස් විදෙස් සියලු දෙනාටමත් බලපාන ප්‍රශ්නයක්. ඒ නිසා කවුරුත් බලා ගෙන ඉන්නවා, මේ වාර්තාව ප්‍රසිද්ධ කරලා ජනතාවට බලා ගන්න ලැබෙන කල්.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)
නිසි අවස්ථාවට, නිසි වෙලාවට ස්ථාවර නියෝගවලට අනුකූලව-

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

ඔබතුමා කිසි අසාධාරණයක් කරන්නේ නැති කථානායකතුමෙක් බව මම දන්නවා. ඒ නිසා කරුණාකරලා මේකට ඇහුම්කන් දීලා හැකි ඉක්මනින් මේ වාර්තාව පාර්ලිමේන්තුවට ගේන්න කියලා මම බැගෑපත්ව ඉල්ලා සිටිනවා.

**කථානායකතුමා**
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

හොඳයි. බොහොම හොඳයි.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### බදු අභියාචන කොමිෂන් සභාව (සංශෝධන) පනත් කෙටුම්පත
### வரி மேன்முறையீட்டு ஆணைக்குழு (திருத்தம் சட்டமூலம்
### TAX APPEALS COMMISSION (AMENDMENT) BILL

"2011 අංක 23 දරන බදු අභියාචනා කොමිෂන් සභාව සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

***පිළිගන්වන ලද්දේ ගරු අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසිනි.***

***2011 දෙසැම්බර් 12 වන සඳුදා දෙවන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද නියෝග කරන ලදී.***

*பிரதம அமைச்சரும் பௌத்த சாசன, மத அலுவல்கள் அமைச்சரு மானவரின் சார்பாக மாண்புமிகு தினேஷ் குணவர்தன அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2011 டிசம்பர் 12, திங்கட்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப் பட்டது.*

*Presented by the Hon.Dinesh Gunawardena on behalf of the Prime Minister, Minister of Buddha Sasana and Religious Affairs;*

*to be read a Second time upon Monday, 12th December, 2011 and to be printed.*

## විසර්ජන පනත් කෙටුම්පත, 2012
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2012
## APPROPRIATION BILL, 2012

**කාරක සභාවේදී තවදුරටත් සලකා බලන ලදී. - [ප්‍රගතිය : දෙසැම්බර් 02]**
**[කථානායකතුමා මූලාසනාරූඪ විය.]**

குழுவில் மேலும் ஆராயப்பெற்றது.- [தேர்ச்சி : டிசம்பர் 02]
[சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்]

Considered further in Committee - [Progress: 02nd December]
[MR. SPEAKER in the Chair.]

**105 වන ශීර්ෂය.- ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා**
01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 1,130,650,000

**தலைப்பு 105.- பொருளாதார அபிவிருத்தி அமைச்சர்**
நிகழ்ச்சித்திட்டம் 01.-செயல்முறைச் செயற்பாடுகள்- மீண்டுவருஞ் செலவு ரூபா 1,130,650,000

HEAD 105.- MINISTER OF ECONOMIC DEVELOPMENT
Programme 01.- Operational Activities - Recurrent Expenditure, Rs. 1,130,650,000

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

පළමුවැනි උපලේඛනය ශීර්ෂ අංක 105, 218, 294, 305, 322 සලකා බැලීම පෙර වරු 10.00 සිට පස් වරු 12.30 දක්වා සහ පස් වරු 1.00 සිට පස් වරු 6.00 දක්වා. විවාදය ආරම්භ කරන්නේ ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමා.

[පූ.භා. 10.12]

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, "2012 විසර්ජන පනත් කෙටුම්පතෙහි කාරක සභා අවස්ථාවේ අද දින ඉදිරිපත් කරන අමාත්‍යාංශ හා ඒවා යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තු හා ආයතනවලට අදාළ අංක 105, 218, 294, 305, 322 දරන වැය ශීර්ෂයන්ගෙන් එක් එක් වැඩසටහන්හි සියලුම පුනරාවර්තන වියදම් හා මූලධන වියදම් රුපියල් 10කින් කපා හැරිය යුතුය" යි මම යෝජනා කරමි.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම අද බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ විවාදය ආරම්භ කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. රටේ ආර්ථික සංවර්ධනය කෙසේ වෙතත් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව දැනටමත් ලොකු සැකයක් ඇති වෙලා තිබෙනවා. එක පැත්තකින් අපි දකිනවා ආණ්ඩුව පෞද්ගලික අංශයට අයත් ආයතන රාජ්‍ය සන්තක කර ගන්නා බව. ඒ එක්කම රජයේ ආයතන ටික පෞද්ගලික අංශයට විකුණනවා. රජයේ ආයතන බංකොලොත් කරලා බහු ජාතික සමාගම්වලට, විදේශිකයන්ට, විවිධ කොම්පැනිවලට විකුණනවා. මේකෙන් රටට ඉතා අපැහැදිලි පණිවුඩයක් යනවා. ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳවත් අපැහැදිලි භාවයක් තිබෙනවා. ඉතින් විශේෂයෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට විශාල වැඩ කොටසක් කරන්න තිබෙන අවස්ථාවේදී, ඒ ගැන රටට පැහැදිලි කිරීමක් කරන්න වග කීමක් තිබෙනවා කියලා මා හිතනවා. ආණ්ඩුවේ ගමන් මඟ දිහා බැලුවාම, ඒ අනුගමනය කරන ආර්ථික සංවර්ධන මොඩලය කුමක්ද කියන එක ප්‍රශ්නයක්. දැන් යන විධියට, දැන් ක්‍රියාත්මක කරන ඒ මූලා ප්‍රතිපත්ති අනුව, අලුත් සුපිරි පන්තියක් ලංකාවේ බිහි වෙනවාය කියන එක ඉතා පැහැදිලියි Super Star වාගේම. අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඒක නම්, Super Star. නමුත් මේ කියන්නේ super rich සමාගමක් ගැන. සුපිරි ධනේශ්වර පන්තියක්. ඒකට තමයි එදා මගේ මිත්‍ර ගරු හර්ෂ ද සිල්වා ආචාර්යතුමා කථා කරන කොට කිව්වේ, "Djilas සමාජය" කියලා. ඒ අනුව, මේ ඇති වන අලුත් සුපිරි පන්තිය මෙන්න මෙහෙමයි අපි දකින්නේ: "කොළඹ හතේ කොල්ලන්ට 'ලැම්බෝගිනි' ඡන්ද දුන්නු ගමේ කොල්ලන්ට බඩගිනි." ඒක තමයි මේ ගෙන යන ප්‍රතිපත්තිය. අපට ඉතාම පැහැදිලියි, ඔබතුමන්ලා ඇති කරන, ඔබතුමන්ලා ගෙන යන මේ ආර්ථික වැඩ පිළිවෙළ අනුව මේ ආදායම් විෂමතාව, ආදායම් පරතරය අද වර්ධනය වෙලා තිබෙන බව. ඒක ඉතා පැහැදිලියි. ඉතින්,- [බාධා කිරීමක්]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)
කොහොමද මනින්නේ?

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම පෙන්වා දෙන්නම්. මනින හැටි පෙන්වා දෙන්නම්. මනින හැටි මම වෙනම කියලා දෙන්නම් ගරු ඇමතිතුමනි. [බාධා කිරීමක්] මේ ආණ්ඩුව අනුගමනය කරන්නේ,- [බාධා කිරීමක්] මගේ අය වැය විවාද කථාවේදී මම ඒක පැහැදිලි කරලා දුන්නා. ඇමතිතුමා හැන්සාඩ් වාර්තාව බැලුවා නම් ඒකේ තියෙනවා විෂමතාව, ඉලක්කම් එක්ක. මම ඒක ආයෙත් කියන්න ඕනෑ නැහැ. ඒකේ ඔක්කෝම විස්තර තියෙනවා. ඒ විෂමතාව මනින්නේ කොහොමද කියලා තිබෙනවා. "මානව සංවර්ධන දර්ශකය" කියලා එකක් තිබෙනවා. ඒක පහත වැටෙනවා. අධ්‍යාපනයට වෙන් කරන මුදල, සෞඛ්‍යයට වෙන් කරන මුදල ගිය අවුරුද්දේ සිට මේ අවුරුද්ද දක්වා ප්‍රතිශතයක් හැටියට අඩු වී තිබෙන හැටි මා පෙන්වා දුන්නා. දත්ත ටික, ඉලක්කම් ටික මම කිව්වා. ඒක තේරෙන්නේ නැත්නම් අපට කරන්න දෙයක් නැහැ.

ගරු සභාපතිතුමනි, අපි ඒ කාරණය මේ සභාවේ ඔප්පු කළා. ඉතින් ඇත්තටම මේ ආණ්ඩුව අනුගමනය කරන්නේ අන්ත දක්ෂිණාංශික නියෝ ලිබරල්වාදී ප්‍රතිපත්ති. ඒ හරහා තමයි මේ තත්ත්වය ඇති වන්නේ, ගරු සභාපතිතුමනි. සමාජය තුළ ඇති වන මේ පරතරය, මේ විෂමතාව ඇති වන්නේ ඒ නිසායි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ 2011 අය වැය කථාවේ ප්‍රධානම හරය වුණේ විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය ගැනයි. ජනාධිපතිතුමා සංචාරක ව්‍යාපාරය ගැන කියලා, එක තැනකදී එතුමා මෙහෙම කියනවා:

"සංචාරක ව්‍යාපාරය එක්සත් ජනපද ඩොලර් බිලියනයක් ඉක්මවන ව්‍යාපාරයක් විය යුතුයි."

එතුමා තවදුරටත් මෙහෙම කියනවා:

"2016 වන විට වැඩියෙන් වියදම් කරන සංචාරකයන් මිලියන 2.5ක් සඳහා පහසුකම් සැලසීමට සූදානම් විය යුතුයි."

2016 වන කොට වැඩියෙන් වියදම් කරන සංචාරකයන් ලක්ෂ 25ක් සඳහා පහසුකම් සැපයීමට සූදානම් විය යුතුයි කියලා ජනාධිපතිතුමා කියනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා බදු සහන රැසක් ඒ අය වැය තුළින් වාගේම විටින් විට විවිධ අවස්ථාවලදී ලබා දුන්නා. ගරු සභාපතිතුමනි, රජය ඒ අය වැය තුළින් සංචාරක ව්‍යාපාරයට විශාල වශයෙන් සහන ලබා දුන් නමුත් එයින් තව ප්‍රශ්නයක් මතු වී තිබෙනවා. සේවා ආර්ථිකය පුළුල් කරන අතර එයින් නිෂ්පාදන කර්මාන්තය අධෛර්යවත් කර තිබෙන බවත් මට ඔප්පු කරන්න පුළුවන්. සේවා ආර්ථිකය ශක්තිමත් කිරීම පිළිබඳව අපට කිසිම තර්කයක් නැහැ. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ ආණ්ඩුවත් නිතරම කථා කරන්නේ මේ රටේ දේශීය නිෂ්පාදන අංශය ශක්තිමත් කිරීම ගැනයි. සේවා අංශය දියුණු කිරීමේදී සමහර අවස්ථාවලදී කෙළින්ම නිෂ්පාදන පද්ධතියටම පහර ගහලා තිබෙනවා. මේකෙන් පෙනෙන්නේ නව ලිබරල්වාදී ප්‍රතිපත්ති මේ ආණ්ඩුවේ ප්‍රතිපත්ති තුළට ඇතුළත් වෙලා තිබෙන බවයි.

සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම ගැන කථා කරද්දී, 2009 අය වැය කථාවේදී ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? එතුමා මෙන්න මෙහෙමයි කියන්නේ:

"ශීතකරණ, විදුලි පංකා, පිඟන් වැනි භාණ්ඩ අපනයනය කිරීමට අපේ නිෂ්පාදකයින් සමත් වී තිබෙනවා. එබැවින් පිට රටින් ගෙන්වනු ලබන එවැනි භාණ්ඩ සඳහා දැනට පවත්නා සෙස් බදු සියයට 50කින් වැඩි කිරීමට යෝජනා කරනවා."

ජනාධිපතිතුමා දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා 2009 අය වැය කථාව ඉදිරිපත් කරමින් කියනවා, විදුලි පංකා, ශීතකරණ ආදී භාණ්ඩ ලංකාවේ නිෂ්පාදනය කිරීම සඳහා පිට රටින් ආනයනය කරන එම භාණ්ඩවලට සියයට 50ක සෙස් බද්දක් අය කරනවාය කියලා. ඒක වැදගත්. ඒක දේශීය නිෂ්පාදනය ශක්තිමත් කරන්න ගත්ත හොඳ තීරණයක්. එහෙම කියලා ජනාධිපතිතුමා ඊළඟට මොකක්ද කළේ 2010 අය වැයේදී? 2010 අය වැයේදී ශීතකරණ යන්ත්‍රවල ආනයන බද්ද, සෙස් බද්ද සියයට 30කින් අඩු කළා. 2009 දී දේශීය නිෂ්පාදනය ආරක්ෂා කරන්න ඕනෑ කියලා සෙස් බද්ද සියයට 50කින් වැඩි කරලා, 2010 දී ඒ සෙස් බද්ද සියයට 30කින් අඩු කළා. වායු සමීකරණ යන්ත්‍රවලට සියයට 94කින් අඩු කළා. විදුලි යන්ත්‍ර කොටස්වලට සියයට 90කින් ඒ සෙස් බද්ද අඩු කළා. ආනයන බදු අඩු කළා. එතකොට ඔරලෝසු, ඉලෙක්ට්‍රොනික් භාණ්ඩ, ඒ වාගේ සියලු භාණ්ඩවල බද්ද අඩු කළා. ලංකාවේ දේශීය නිෂ්පාදන ගැන ඔච්චර මොර දුන්න ආණ්ඩුව, දේශීයත්වය, අපේකම අපේ කර්මාන්ත ගැන කථා කරලා, අවුරුද්දක් ඇතුළත ආපසු ඒ ප්‍රතිපත්ති සම්පූර්ණයෙන්ම වෙනස් කළා. මේකෙන් මොකක්ද පෙනෙන්නේ? ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල කිසිම සංගතභාවයක් නැති එක. මොකක්ද එතැනදී කියන්නේ? එදා ආණ්ඩුව ගෙනාපු තර්කය තමයි විදේශීය සංචාරකයන්ට ලංකාවට ඇවිත් ෂොපින් කරන්න පහසුකම් සකස් කර දෙන්න ඕනෑය කියන එක. විවිධ රටවලින් එන සුද්දන්ට මෙහෙ ඇවිල්ලා ෂොපින් කරන්න, ඔර්ලොසුවක් ගන්න, ශීතකරණයක් ගන්න එහෙම නැත්නම් ඉලෙක්ට්‍රොනික් භාණ්ඩයක් ගන්න පුළුවන් විධියට පහසුකම් දෙන්න ඕනෑ කිව්වා. ඊට පස්සේ ආපහු ඒ බද්ද වැඩි කළා. ඒකෙන් සිද්ධ වුණේ අපේ ආනයන වියදම දෙගුණයකින්, තුන් ගුණයකින් වැඩි වුණ එක.

අද අපේ ගෙවුම් ශේෂයේ හිඟයක් තිබෙනවා. අපේ ජංගම ගිණුමේ හිඟයක් තිබෙනවා. මේ ප්‍රතිපත්ති නිසා තමයි මේවා සිද්ධ වුණේ. අන්තිමට රුපියල අවප්‍රමාණය කරන්න සිද්ධ වුණේ මේ වැරදි තීරණ ගත්ත නිසාය කියන එක මා විශේෂයෙන් කියන්න කැමැතියි. වැඩියෙන් වියදම් කරන විදේශිකයන්ට මේ යන්ත්‍ර උපකරණ ගන්න සෙස් බදු අයින් කරලා ඒවා පිට රටින් ගෙන්වනවා කිව්වා. එතකොට ලංකාවේ නිෂ්පාදන අංශය සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවා. සංචාරක ව්‍යාපාරය දියුණු වීම සඳහා දේශීය කර්මාන්ත බිලි දෙන්න බැහැ. සංචාරක ව්‍යාපාර දියුණු කරනවා නම් අපි ඒ එක්කම අපේ දේශීය කර්මාන්ත ආරක්ෂා කළ යුතුයි. ඊට අවශ්‍ය ප්‍රතිපත්ති, නීතිරීති සකස් කර ගන්න ඕනෑ. ඒකයි මම කියන්නේ. ඉතින්, මේක නියෝ ලිබරල්වාදී ප්‍රතිපත්තියක් නොවෙයිද? [බාධා කිරීම්] මම මොනවා වුණත් ඔබතුමන්ලා නියෝ ලිබරල්වාදී නෙවෙයි කියලා නේ කිව්වේ. ඔබතුමන්ලා කිව්වේ සමාජවාදියි කියලා නේ. අද මා කියන්නේ ඔබතුමන්ලා නියෝ ලිබරල්වාදියි කියලා. ප්‍රතිපත්තිවල සංගතභාවයක් නැති වීම නිසා තමයි, මේ වාගේ පරස්පර තීරණ හැම අය වැයකින්ම අරගෙන තිබෙන්නේ. ඒක රටට ලොකු පාඩුවක්. ඒකෙන් සිදු වන්නේ මොකක්ද? ගරු ඇමතිතුමනි, ඔබතුමා ආර්ථික සංවර්ධන ඇමතිවරයා හැටියට මේ ගැන හිතන්න.

මෙම අය වැයෙන් ඉදිරිපත් කරන මේ වාගේ ප්‍රතිපත්තිමය තීරණවලින් අපේ ආර්ථිකයට ලොකු බලපෑමක් සිදු වෙනවා. විශේෂයෙන්ම ජනාධිපතිතුමා මේ භාණ්ඩ ටිකේ සෙස් බදු අඩු කරනවා කිව්වේ සංචාරකයෝ ටික රටට ගෙන්වලා අපිට shopping centre එකක් කරන්න පුළුවන් කියලා. එහෙම කියද්දී ඔබතුමන්ලාගේම කැබිනට් ඇමතිවරයෙක් වන විමල් වීරවංශ මහතා මම දැක්කා ළඟදී ඇත්ත තත්ත්වය කියනවා. එතුමා කියනවා, ලංකාවට එන්නේ අතේ ශතේ නැති සුද්දන් ලු. ඔවුන්

[ගරු කබීර් හාෂිම් මහතා]

නැවතිලා ඉන්න හෝටලයෙන් කෑම ටිකක්වත් කන්නේ නැතුව අර රොටී පිටි පැකට් එක අරගෙන ඇවිල්ලා කාමරයේ තිබෙන ඉස්තිරික්කයෙන් ඒ රොටී ටික රත් කරලා කාමරයේ ඉඳ ගෙන රොටී හදනවා ලු. ඒ වාගේ රොටියක්වත් හෝටලයකින් කන්න බැරි සුද්දෝ ලංකාවට එන්නේ කියලා ඇමතිවරයෙක්ම කියන කොට තමුන්නාන්සේලා air conditioners වැනි electronic items සුද්දන්ට විකුණන්න පුළුවන් කියලා ඒවායේ බදු අඩු කරනවා. ඉතින් ඒක තමයි ඇත්ත තත්ත්වය. ඉලක්ක කරපු target එකට අපි ගිහිල්ලා නැහැ. එතුමා කියන එකේ ඇත්තක් තිබෙනවා. මොකද, ඉන්දියාවෙන් එන සමහර විදේශ සංචාරකයෝ, එහෙම නැත්නම් රුසියාවෙන්, යුරෝපයෙන් එන අය සාමාන්‍යයෙන් වියදම් නොකරන, පොඩි ගණනක් අරගෙන ඇවිල්ලා පොඩි හෝටලයක ඉඳ ගෙන තමන්ගේ කෑමට මොනවා හෝ හදා ගෙන නැවත යන අය. වැඩිය වියදම් කරන්නේ නැහැ. එතකොට ඒ සුද්දන්ට, ඒ සංචාරකයන්ට යම් කිසි දෙයක් කරන්න අපේ දේශීය නිෂ්පාදනය බිලි දීම හරි ප්‍රතිපත්තියක් නොවෙයි. ඒ නිසා විශේෂයෙන්ම ගරු සභාපතිතුමනි, අද මම කරන මේ පැහැදිලි කිරීම හා චෝදනාව තමයි මෙතැන පරස්පරයක් තිබෙන බව. අපේ දේශීය නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කරන්න, මහින්ද චින්තනය තමයි නියම චින්තනය කියලා ඔබතුමන්ලා කිව්වාට, අද අපි දකින්නේ සේවා අංශය දියුණු කිරීම සඳහා ඔබතුමන්ලා ගන්නා වැඩ පිළිවෙළ අනුව ලංකාවේ නිෂ්පාදන අංශය කඩා වැටෙන බවයි. අපට අද තරගකාරී තත්ත්වයක් නැතුව අපේ දේශීය කර්මාන්ත, කාලයක් තිස්සේ අපේ තිබුණු කර්මාන්ත අද බිඳ වැටෙනවා. ඉතින් ඒක ඉතා වැදගත් කාරණයක්.

විශේෂයෙන්ම ආණ්ඩුව ගන්නා ප්‍රතිපත්තිවලින් තමයි මේ ප්‍රතිඵල එන්නේ. 2011 වර්ෂයේ පෙබරවාරි 08 වැනිදා "දිනමිණ" පුවත් පතේ දැන්වීමක් පළ වුණා. ඒ දැන්වීම ගැන කියන්න ඉස්සර වෙලා මම කියන්න කැමැතියි, මේ සේවා අංශය දියුණු කරන කොට ඔබතුමන්ලා කරන වැඩ පිළිවෙළ අනුව නිෂ්පාදන අංශයට තිබෙන බලපෑම ගැන. ඔබතුමන්ලා සංචාරකයෝ ගොඩ බැස්සවීම සඳහා මීගමුව මිරිදිය කලපුව තුළ seaplanes බස්සවන්නට සකස් කරලා තිබුණා. ඒ මිරිදිය කලපුව තුළ sea planes බස්සන්න ගියාම එතැන ඉන්න ධීවරයෝ ඒකට විරෝධතාව පළ කළා. මුහුදු යන ධීවරයන්ට ඒකෙන් බලපෑමක් වෙනවා කියලා ඔවුන් ලොකු විරෝධතාවක් කරපු නිසා ඒක නතර වුණා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඒ කලපුවේ. ඒ කලපුවේ ධීවර කර්මාන්තය කරන අයට බලපෑමක් වෙනවා කියලා එයාලා කරපු ඒ විරෝධතාව නිසා යාන්තම් ඒක නැවතුණා. ඒක කමක් නැහැ. නමුත් වයඹ දිග මුහුදු වෙරළේ පුත්තලම ප්‍රදේශයේ සංචාරක ව්‍යාපෘති හදන නිසා ඒ ප්‍රදේශයේ ධීවර කර්මාන්තයට ලොකු බාධක කිහිපයක් පනවලා තිබන බවට වාර්තා වෙලා තිබෙනවා. ඒ වාගේම තමුන්නාන්සේලා එතැන තිබෙන දූපත් 17ක්- [බාධා කිරීමක්]

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ලොකු බොරුවක්.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
තමුන්නාන්සේලා එතැන තිබෙන දූපත් 17ක් විදේශිකයන්ට හෝටල් ගහන්න විකුණලා තිබෙන අතර ඒ ප්‍රදේශයේ ධීවරයන්ට ධීවර කර්මාන්තය කරන්න යන්න බැරි ලෙසට යම් යම් තහනම් කිරීම් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] මම කියන එක අහ ගෙන ඉන්න නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා උත්තර දෙනකොට කියන්න. ඒ වාගේ විස්තර දාලා තිබෙනවා. සරලව කිව්වොත් සංචාරක කර්මාන්තය වෙනුවෙන් ධීවර කර්මාන්තය බිලි දීමක් හැටියටයි මම එය දකින්නේ. ගරු සභාපතිතුමනි, 2011 පෙබරවාරි 28 වැනිදා "දිනමිණ" පුවත් පතේ දැන්වීමක් දාලා තිබුණා. ඒක වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරපු දැන්වීමක්. [බාධා කිරීම්] හොඳයි. ඔබතුමා දන්න දෙයක් නැහැ. වාඩි වෙන්න කෝ.

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඔය බොරු කියන්නේ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
හොඳයි. බොරු නම් ඒක ඔබතුමාගේ අවස්ථාවේදී ඔප්පු කරන්න. මේ ගරු සභාපතිතුමනි, දැන්වීමේ තිබෙන්නේ සංචාරක බෝට්ටු සේවාවන් සඳහා වැව් 22ක් බදු දීමට ඒ අදාළ කොම්පැනිවලට ඉල්លුම් පත්‍ර එවන්න කියලායි. වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් තමයි මේ දැන්වීම දාලා තිබෙන්නේ. සංචාරක බෝට්ටු සේවා සඳහා වැව් 22ක් බදු දීමට. ඒ තෝරා ගත්තු ජලාශ ධීවර කර්මාන්තයට සහ කෘෂිකර්ම කර්මාන්තයට විශාල දායකත්වයක් දෙනවා. සොරබොර වැව, තිස්ස වැව, තිසා වැව, මින්නේරිය වැව, පරාක්‍රම සමුද්‍රය, කන්තලේ වැව, ගිරිතලේ වැව යන මේ වැව්වල බෝට්ටු සේවාවක් දානවා කිව්වාම ඒ සඳහා ජලාශය අවම මට්ටමින් පාලනය කිරීම නිසා මොකක්ද වෙන්නේ? කෘෂිකර්මයට ගොවිතැනට පාඩුවක් වනවා. ඒ ජලාශ මට්ටම පාලනය කරනවා නම්, අවශ්‍ය වෙලාවට කුඹුරුවලට වතුර ටික යවා ගන්න බැරි වනවා. [බාධා කිරීමක්] මෙන්න ඇමතිවරයාත් ඉන්නවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
සම්පූර්ණ තාක්ෂණික වාර්තා අරගෙන ඒ සීමාවන් තුළ තමයි ඒ වැඩ කටයුතු කරන්නේ. ඒ නිසා වැව්වලින් ජලය ගලා යාමේදී; කෘෂි ජලය ලබා දීමේදී ඒ වැව්වල ඉන්න මාළුන්ටවත් කිසිම බලපෑමක් ඇති වන්නේ නැහැ. ඒ විධියට තමයි ඒ සියල්ල සකස් කර තිබෙන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ අපේ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. මොකද, එතුමා පසු ගිය සතියේ - [බාධා කිරීමක්] මට විනාඩියක් දෙන්න. මේක විසඳා ගන්න ඕනෑ. [බාධා කිරීමක්] මෙතුමා පසු ගිය සතියේ කිව්වා, මෙතුමාගෙන් අවසර ගන්නේ නැතුව ගොඩක් දමා තිබෙනවා කියා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
දැන් ඇමතිතුමා පිළිගන්නවා. මටත් ඕනෑ වුණේ ඇමතිතුමා ඒක පිළිගන්නවා දකින්න.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)
එහෙම අවසර ගන්නේ නැතුව සමහර ප්‍රදේශවාසීන් පවා එහෙම කර තිබෙනවා. ඒවා අපි නිවැරදි කරනවා. ඒවාට විරුද්ධව අපි පියවර ගන්නවා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ඒ එතුමාගේ order එක. බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ order එකෙන් තමයි ඕවා කරන්නේ. ඔබතුමා නොවෙයි, වැරදිකාරයා බැසිල් රාජපක්ෂ මැතිතුමා වන්න පුළුවන්. නමුත් අපේ වැව්වල විදේශිකයන්ට බෝට්ටු සේවාවන් දමා දුවවන්න තරමට අපේ රට බංකොලොත් වෙලා නැහැ. ඒවා රජ කාලයේ ඉඳලා හදපු අපේ වැව්. කෘෂි කාර්මික යථාර්ථය නැති කරන්න, පළුදු කරන්න ඒවා සුද්දන්ට විකුණන්න යනවාද? ඇයි අපි එච්චර බංකොලොත්ද? සංචාරක ව්‍යාපාරය දියුණු කිරීමේදී යම්කිසි සීමාවන් තියෙන්න ඕනෑ; මායිම් තියෙන්න ඕනෑ. [බාධා කිරීමක්]

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

මෙවැනි කථාවක් කිරීම ගැන කනගාටු වනවා. මාලදිවයිනේ sea planes 94ක් තියෙනවා.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ඔබතුමාත් මේ පැත්තට එන්න. එතකොට ඔබතුමාත් අපි වාගේ කථා කරයි. ඒ පැත්තේ ඉන්නකොට කථාව එන්නේ නැහැ. ඒ නිසා මෙහාට එන්න.

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

එහේ seaplanes 94ක් තිබෙනවා. එහේ ධීවර කර්මාන්තය නැති වෙලාද?

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ඔබතුමන්ලාගේ කටවල්වලට ප්ලාස්ටර් දාලද?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)

ඔබතුමා ගැන කනගාටු වනවා. මොකද, ඔබතුමාගෙන් ඔය වාගේ කථාවක් බලාපොරොත්තු වුණේ නැහැ.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

මම සතුටු වෙනවා, මම ගැන. අපි කථා කරන්න ඕනෑ දේවල් අපි කථා කරන්නේ. ඒ ගැන මම සතුටු වෙනවා. සරලව කියනවා නම්, කර්මාන්ත වෙනුවෙන්, කෘෂිකර්මය වෙනුවෙන් ධීවර කර්මාන්තය බිලිදීමක් කරනවාද? සේවා අංශය දියුණු කිරීම සඳහා නිෂ්පාදන අංශය බිලිදීමක් කරනවාද? ඒක වැරදියි. ඒක මා පිළිගන්නේ නැහැ.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment)

Sir, I rise to a point of Order.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

මොකක්ද, point of Order එක?

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

කබීර් හාෂිම් කාලයක ඉඳලා මගේ හොඳ මිත්‍රයෙක්. එතුමාගෙන් මා අහන්න කැමැතියි,-

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, එපමණක් නොවෙයි. සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ඕනෑ. අපේ ජීවන රටාවක් තිබෙනවා; ශිෂ්ඨාචාරයක් තිබෙනවා; සංස්කෘතියක් තිබෙනවා. මේ රටට විදේශ ආයෝජනයක් එන ආකාරයට කෙරෙන්න ඕනෑ. අපි විකුණන්නේ අලෙවි කරන්නේ මොනවාද? අපේ වටිනාකම් ටික අපි අලෙවි කරන්නේ නැහැ. අපේ වැව් ටික බදු දෙන්නට සූදානම් නම් ඒක සාධාරණ නැහැ. අපට ඒක අනුමත කරන්න බැහැ. ඒ වාගේම මා රජයට චෝදනාවක් කරනවා. අපට ආරංචි වෙලා තිබෙනවා, සුද්දන් -විදේශිකයන්- වැඩි පිරිසක් මෙහාට ගෙන්වන්න, කොළඹ, ඩී. ආර්. විජේවර්ධන මාවත හෙවත් පරණ මැකලම් පාරේ දිගටම කැසිනෝ කැබරේ දමන්න; ඒ මට්ටමට මායිම් සීමාවල් ඉවත් කරලා ඊළඟ පියවරට යන්නට කටයුතු කරනවාය කියා. ඒක පිළිගන්න පුළුවන්ද? [බාධා කිරීමක්] ඒක පිළිගන්න පුළුවන්ද? [බාධා කිරීමක්] අපට ඒක පිළිගන්න බැහැ. ඒ නිසා මේවායේ යම් යම් සීමාවන් තිබිය යුතුයි කියලා මම කියන්නට කැමැතියි. සංචාරක ව්‍යාපාරය දියුණු කළ යුතුයි කියා මමත් සිතනවා. එහෙම වුණත් අපේ රටේ දේශීය නිෂ්පාදන පදනම විනාශ කරලා හෝ අපේ රටේ ශිෂ්ඨාචාරය, සාරධර්ම, සමාජ වටිනාකම් විනාශ කරලා හෝ සංචාරක ව්‍යාපාරය දියුණු කරන වැඩ පිළිවෙළ අපට පිළිගන්න බැහැ; අනුමත කරන්න බැහැ. දේශීය නිෂ්පාදනය වැඩි වෙලා නැහැ. ගරු ඇමතිතුමනි, එක පැත්තකින් දේශීය නිෂ්පාදන අංශයේ තිබෙන ප්‍රශ්නය මෙයයි.

අද ලංකාවේ සමස්ත ආර්ථිකය, -2010 වසර ගත්තාම සමස්ත ආර්ථිකය- තුළ කෘෂිකර්මය ලබා දෙන දායකත්වය සියයට 12යි. ඒක ප්‍රමාණවත් නැහැ. ඒක දියුණු විය යුතුයි. ඔබතුමන්ලාගේ "අපි වවමු - රට නඟමු" කියන ප්‍රතිපත්තිය මත ඔබතුමන්ලා අද "දිවි නැඟුම" ගැන කථා කරද්දී, මුළු දේශීය නිෂ්පාදනයේ -සමස්ත ආර්ථිකයේ- කෘෂිකර්මය ලබා දෙන දායකත්වය සියයට 12යි. මේ, මහින්ද චින්තනයේ හත්වන වසර. එතකොට ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ අසාර්ථක බවයි මට පේන්නේ.

ඊළඟට, කර්මාන්ත අංශයේ සමස්ත ආර්ථිකයට දායකත්වය සියයට 28යි. නමුත් සමස්ත ආර්ථිකයේ සේවා අංශයෙන් දායකත්වය සියයට 60යි. ඒ කියන්නේ සේවා අංශය පැත්තට තල්ලු වෙනවා කියන එක පැහැදිලි. මේක නියෝ ලිබරල්වාදය පැත්තට තල්ලු වීමක්. ඒකයි මම ඔප්පු කරන්න බලන්නේ, කියන්න බලන්නේ. ඒ නිසා අපේ දේශීය කර්මාන්ත, අපේ දේශීය කෘෂිකර්මය සඳහා මේ අය වැයවල හරියාකාර නීතිරීති සහ ප්‍රතිපත්ති සකස් විය යුතුයි. අය වැය කථාවලදී කරන්න බැරි පොරොන්දු දීලා හැම අවුරුද්දකම එකම කථාවල් ටික කරනවාට වඩා අපේ රට නිවැරදි මඟට යොමු කිරීම සඳහා වැඩ පිළිවෙළක්

[ගරු කබීර් හාෂිම් මහතා]

සකස් විය යුතුයි. එහෙම නම් ආර්ථික සංවර්ධන ඇමතිවරයා හැටියට ඔබතුමාට වග කීමක් තිබෙනවා මුදල් ඇමතිවරයා හැටියට ඉන්න ජනාධිපතිතුමාට රටේ තිබෙන පසු බිම හරියට කියලා දෙන්න. එහෙම නැත්නම් ඔබතුමා එතුමාව නොමඟ යවනවා කියලා මම හිතනවා.

ගරු සභාපතිතුමනි,1980 දශකයේ ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් අපනයනයේ ප්‍රතිශතය සියයට 30යි. අද වන විට, 2010 දී අපනයනය දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 18යි. සියයට 30ට තිබුණු අපනයන ප්‍රතිශතය සියයට 18කට අඩු වෙලා තිබෙනවා. එතකොට අපේ නිෂ්පාදනය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

මම අහගෙන හිටියා, මහින්ද සමරසිංහ ඇමතිතුමා තේ කර්මාන්තය ගැන රවි කරුණානායක මන්ත්‍රීතුමාට උත්තරයක් දෙනවා. තේ කර්මාන්තයේ තිබෙන ප්‍රශ්න පිළිබඳව සොයා බැලුවා නම්, එතැන ලොකු ගැටලුවක් තිබෙනවා. අපි ලෝකයේ හොඳම තේ නිෂ්පාදනය කරන රටක් වුණා. අපට ඒ ගැන ආඩම්බර වෙන්න පුළුවන්කම තිබුණා. අද Ceylon tea කියන එක නැති වී ගෙන යනවා. ලංකාවේ තේවලට Kenyan tea මිශ්‍ර කරනවා. මොකද, අපේ නිෂ්පාදන වියදම වැඩි නිසා; අපි තරගකාරී නැති නිසා. ලංකාවේ තේ කියන නම දැන් නැති වී ගෙන යනවා. මේවා තමයි ප්‍රශ්න. මේවා දැනට පේන්නේ නැහැ. මේවාට පැලැස්තර දාලා වසා ගන්නවා. මේවා ඉතා වැදගත්. මේ සංඛ්‍යා ලේඛනවලින්, මේ දත්තවලින් අපනයන ක්ෂේත්‍රයේ ප්‍රතිශතය අඩු වී ගෙන යන හැටියට යම් කිසි අනතුරු හැඟවීමක් මේකෙන් ලැබෙනවා කියන එක ඔබතුමන්ලාට පේනවා ඇති කියා මම හිතනවා. ගරු සභාපතිතුමනි, රටේ කාර්මික අපනයන ගත්තාම, 2010 වසරේ කාර්මික අපනයන ආදායම අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ පළමුවෙනි කාර්තුවේ සියයට 16.7කින් කාර්මික අපනයන වටිනාකම අඩු වෙලා තිබෙනවා. මම පෙන්වන්නේ ඔබතුමන්ලා ගෙන යන ප්‍රතිපත්තියේ ප්‍රතිඵල. ඒක පොඩ්ඩක් හරියට හදා ගන්න පුළුවන් නම් අපට මේ නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කරන්න පුළුවන්. ඒ වාගේම ලංකාව තරගකාරී තැනකට ගේන්න පුළුවන් කියන එක අප විශ්වාස කරනවා.

ගරු සභාපතිතුමනි, පසු ගිය අය වැය දෙකකට කලින් අතිගරු ජනාධිපතිතුමාම මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වා පාසල් ළමුන්ට නිල ඇඳුම් දෙන කොට මින් පස්සේ අප විදේශ රටවලින් රෙදි ආනයනය කරන්නේ නැහැ, ඒ රෙදි ලංකාවේ නිෂ්පාදනය කරන්න අවශ්‍ය පහසුකම් දෙනවා කියලා. පිට රටින් ගේන රෙදිවලට සෙස් බදු, අරවා මේවා පනවලා අපේ නිෂ්පාදන පද්ධතිය ශක්තිමත් කරනවා කියලා පොරොන්දු වුණාට, මේ වසර වෙන කොට පාසල් ළමුන්ට නිසි වෙලාවට නිල ඇඳුම් රෙදි නොදී අන්තිමට මොකක්ද වුණේ? පාකිස්තානයෙන්, වියට්නාමයෙන්, චීනයෙන් රෙදි ගේන්න සිද්ධ වුණා. ඒකෙන් මොකක්ද පේන්නේ, මේ රටේ අපේ ළමයින්ගේ නිල ඇඳුම්වලට අවශ්‍ය රෙද්ද පවා මේ මහින්ද චින්තන ආණ්ඩුව යටතේ නිෂ්පාදනය කරන්න බැරි වෙලා තිබෙන බවයි. ඉතින් අප කොම්පියුටර් යුගයක් ගැන කථා කරලා වැඩක් තිබෙනවාද? අප යථාර්ථවාදීව කල්පනා කරන්න ඕනෑ. මෙතැන ප්‍රතිපත්තිවල යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රතිපත්තිවල යම් කිසි සංසතභාවයක් නැති වීම නිසා මේ වාගේ අපේ නිෂ්පාදන පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වෙනවා. එතකොට ආර්ථික සංවර්ධනය ගැන අප කථා කරන්නේ මොකක්ද?

ගරු සභාපතිතුමනි, මම ඊළඟට SME එක ගැන -කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත ගැන- කථා කරන්න කැමැතියි. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදී එතුමා විශේෂයෙන්ම ආයෝජන දිරි දීමනා පිළිබඳව කථා කළා. ඇත්ත වශයෙන්ම හොඳ යෝජනා කීපයක් තිබෙනවා. කුඩා හා මධ්‍යම පරිමාණයේ කර්මාන්ත දියුණු කිරීම සඳහා එතුමා සහන කීපයක් ගැන කථා කරලා තිබෙනවා. එතුමා මේ යෝජනා ඉදිරිපත් කෙරුවාට, කුඩා සහ මධ්‍යම පරිමාණ කියන කර්මාන්ත ගත්තාම ලංකාවේ මට්ටම අනුව අතිගරු ජනාධිපතිතුමා කියනවා රුපියල් මිලියන 50යි, රුපියල් මිලියන 300යි අතර ආයෝජනය කිරීමේ ආයතනවලට අවුරුදු හතරයි, අවුරුදු හයයි අතර කාලයක බදු විරාමයක් දෙනවා කියලා. මා හිතන විධියට රුපියල් මිලියන 50ක් ආයෝජනය කරන්න පුළුවන් කුඩා කර්මාන්ත ඉතාම අතළොස්සයි ලංකාවේ තිබෙන්නේ. ලංකාවේ තිබෙන කුඩා කර්මාන්ත, ව්‍යාපාර ගැන තිබෙන හැකියාව මත ඒ ආයෝජනය රුපියල් මිලියන 50කට අවම කරන්නේ නැතිව ඊට වඩා අඩු කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම හිතනවා. ඒ වාගේ පුංචි ආයෝජනයක් කරන අයටත් ඒ බදු විරාමය ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා. විශේෂයෙන්ම පසු ගිය කාලයේ ගෙනාපු පනත්වලින් මේ ආණ්ඩුව විදේශ කොම්පැනිවලට අවුරුදු 15ක අවුරුදු 20ක බදු විරාම දීපු අවස්ථා අප දැක්කා.

ඒ විදේශීය කොම්පැනිවලට අවුරුදු 15ක් 20ක් බදු විරාම දෙන කොට අපේ දේශීය කුඩා කර්මාන්තකරුවන්ට අවුරුදු 10ක 15ක් ඇයි දෙන්න බැරි? එය අවුරුදු හතරකට හයකට සීමා කරන්න එපා. ඒකත් රුපියල් මිලියන 50යි කියලා අවමය කරන්න එපා. ඒ සීමාව තවත් පහතට ගෙනෙනවා නම් කුඩා ව්‍යාපාරිකයන්ට ඒක ශක්තියක් වනවා. ඒ වාගේම මධ්‍ය ප්‍රමාණයේ ව්‍යාපාරිකයන්ට ඒ කියන්නේ රුපියල් මිලියන 100 සිට රුපියල් මිලියන 200 දක්වා වන ඒ ප්‍රමාණයත් තවත් අඩු කරනවා නම් තවත් කුඩා ව්‍යාපාර කීපයක් ඒකට ඇතුළත් කර ගත හැකියි. එය කළ යුතුයි සහ ඒක වැදගත් වනවායි කියන එක මම විශේෂයෙන්ම ගරු ඇමතිතුමාට මතක් කරනවා. මේ වාගේ කිරීම අපට ලොකු ශක්තියක් වනවා.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - வினைத்திறன் மேம்பாட்டு அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - Minister of Productivity Promotion)

Do you know that the "National Geographic Traveller" magazine has named Sri Lanka among its top six destinations for world travellers in 2012? What does it mean?

**ගරු කබීර් හාෂිම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු සභාපතිතුමනි, මේ ලංකාවේ කැසිනෝ දාලා කැබරේ දාලා ඕවා ඔක්කොම දාන කොට top six destinations අතරේ ඉන්නවා වෙන්න පුළුවන්. මම කියන්නේ මේක එහෙම විකුණන්න එපා කියලා. සුද්දෝ ගෙන්නන්න කියලා අපේ තිබෙන සංස්කෘතිය, ශිෂ්ටාචාරය කඩලා විනාශ කරලා, "National Geographic Traveller" magazine බලලා වැඩක් නැහැ. පොළොන්නරුවට, අනුරාධපුරයට ගිහිල්ලා ගොවීන්ගෙන් අහන්න; කෘෂිකර්මාන්තයේ යෙදෙන අයගෙන් අහන්න. ධීවරයන්ගෙන් අහන්න. කම්පියුටර් බලලා සංවර්ධනය ගැන කියන එකෙන් හරි යන්නේ නැහැ. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)

මන්ත්‍රීතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.[බාධා කිරීම්] බාධා කරන්නේ නැතුව අහ ගෙන ඉන්න. [බාධා කිරීම්] එතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ. බාධා කරන්න එපා.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Give me three minutes, Sir.

මේ රටේ තිබෙන ආවේණික ප්‍රශ්න ගැන මම කථා කරනවා. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
තව විනාඩි දෙකයි, බාධා කරන්න එපා.

**ගරු කබීර් හාෂීම් මහතා**
மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Chairman, since my time is limited, I would like to bring about a very important point. There has been an issue about the share market in the last couple of months and there have been certain allegations about insider dealings. These allegations finally led to the removal of the CEO of the share market and Mr. Marikkar was removed. I remember that when he was being removed, the Chairperson of the share market, Mrs. Indrani Sugathadasa, made a speech. Hon. Basil Rajapaksa, if you may remember, you were the Chief Guest at that meeting. She made a speech where she said , "Those who live by the *Dhamma* will be protected by the *Dhamma*". ධර්මය අනුව ජීවත් වන අය ධර්මය විසින්ම ආරක්ෂා කර දෙනවායි කියලා එතුමිය ප්‍රකාශ කළා. මොනවා හෝ හේතුවකට එහෙම ප්‍රකාශයක් කළා. ඊයේ වන කොට එතුමියගේ රක්ෂාවත් නැති වුණා. ඉන්ද්‍රානි සුගතදාස කියන්නේ ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමාගේ භාර්යාව. එතකොට එතුමියටත් පහර වදිනවා මාටින් නිමොලර්ගේ කථාව. මාටින් නිමොලර්ගේ කථාව ඊළඟට ඔබතුමාටත් සිද්ධ වෙන්න පුළුවන්, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමනි. ඔබතුමාත් ප්‍රවේශම් වන්න. මොකද, ජනාධිපති ලේකම්ගේ භාර්යාවටයි මේ දේ සිද්ධ වුණේ. ඔබතුමාත් ප්‍රවේශම් වන්න. කැපෙන්න පුළුවන්.

මම කථා කරන්නේ මොකද, පොඩි මිනිස්සු තමයි මේ කොටස් වෙළෙඳ පොළට ගිහිල්ලා ආයෝජනය කළේ. ගරු සභාපතිතුමනි, පුංචි මිනිස්සු තමන්ගේ මුදල් අරගෙන ගිහිල්ලා කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කළා. 2009 යුද්ධයක් තිබුණා නේ. 2009 යුද්ධයෙන් පසුව කොටස් වෙළෙඳ පොළ දියුණු වුණා.

Actually what happened was, there was a profit Price-Earnings Ratio. Before Prabhakaran died, the Price-Earnings Ratio was 13. But, after Prabhakaran's death, the Price-Earnings Ratio shot up to 19, because the share market really boomed after the war. And, as the war was over, more people started shoving investment in the share market. As interest rates started coming down, pensioners, Government servants and private sector workers went and put their money into the share market. Once they put their money in, what happened? Some people - this new super-rich class - started manipulating the market. I will give you one incident.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු සභාපතිතුමනි, මා කථාව අවසාන කරන්නම්. Ceylon Grain Elevators කියන ආයතනය on 2nd August, 2010, one share was Rs. 29. But, on 3rd of February, 2011 - මාස ගණනකින්- the share price of Ceylon Grain Elevators went up to Rs. 265 from Rs. 29. Then, it dropped back to Rs. 190. On 4th March 2011, EPF went and bought at Rs. 190. They bought for a few million rupees and workers' money was invested. After EPF bought, within two days, it started dropping down. Hon. Chairman, now, it is Rs. 90. EPF bought at Rs. 190 and now it is dropped down to Rs. 90. These are manipulations in the market. - [*Interruption.*] Day light robbery! This is not right. Then, on 7th October, 2011 in the morning, Laugfs Gas was Rs. 41.50 per share and at the end of the day, it went up to Rs. 50.50. Rs. 20 million shares were traded. It was manipulated from inside. On 10th October, the share price was Rs. 50. Then, it dropped by Rs.2 and it was Rs. 48. EPF went and bought shares. Now, the price has dropped down to Rs. 41. Therefore, millions of rupees were lost by EPF.

Blue Diamonds is a bankrupt company. Blue Diamonds has no value and the Sri Lanka Insurance Corporation buys Blue Diamond shares at Rs. 9 a share. Today, it has dropped down to Rs. 3 It is a bankrupt company. Who advises the Government to buy shares of bankrupt companies? The Sri Lanka Insurance Corporation had no right to put money there. This is public money and as a result now the market has collapsed. All the pensioners, the retired Government servants and the private sector workers have lost their investment. Those who had investment worth Rs. 50,000, their money is now worth only Rs. 5,000. This is not fair. This is to allow only one class of people to manipulate this market and make millions. They are not even 0.01 per cent of the population. You cannot let those people run this economy.

Since my time is up, I will not take anymore time. At present what has happened is that, what should go up at the right time after the Budget is coming down and what should come down is going up. The prices should be coming down but the prices are going up. The share prices should be going up but the share prices are coming down. That is the result of the Budget.

Thank you.

[පූ. භා. 10.45]

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා (සෞඛ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன - சுகாதார அமைச்சர்)
(The Hon. Maithripala Sirisena - Minister of Health)
ගරු සභාපතිතුමනි, 2012 වර්ෂය සඳහා අය වැය කාරක සභා අවස්ථාවේ දී අද දින විවාදය සඳහා ගැනෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ විශේෂයෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සහ ඊට අදාළ කරුණු කිහිපයක් සම්බන්ධයෙන් කථා

[ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා]

කිරීමට ලැබීම ගැන මා ඉතාමත්ම සතුටු වනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ රජයේ නව අමාත්‍යාංශයක්. මීට පෙර ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයක් මේ රටේ තිබුණේ නැහැ. පසු ගිය කාල සීමාව තුළ විශේෂයෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ක්‍රියා දාමය මේ රටේ ජාතික සංවර්ධනය සඳහා ඉතාමත්ම පුළුල් කාර්ය භාරයක් ඉටු කළ, මේ රටේ නව සංවර්ධනයේ පරිවර්තනයක් කළ අමාත්‍යාංශයක් කියලා මම ඉතාමත්ම පැහැදිලිව කියන්නට ඕනෑ. බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා ඉතාමත්ම දක්ෂ අමාත්‍යවරයෙක් විධියට රට තුළ සංවර්ධන කාර්යන්හි ප්‍රමුඛතාවන් තෝරා ගෙන, ඒ සඳහා අදාළ පසුබිම සකස් කර ගෙන රටේ සියලු අංශවල සහයෝගය ලබා ගෙන, මේ අමාත්‍යාංශයේ කටයුතු ඉතාමත්ම සාර්ථකව ඉටු කර ගෙන යනවා.

ප්‍රධාන ලෙසම මේ රටේ ආර්ථිකය පිළිබඳව කථා කරන විට අපිට අද සතුටු විය හැකි පසුබිමක් මේ රටේ ගොඩනැඟිලා තිබෙන්නේ, විපක්ෂයට ආර්ථිකය පිළිබඳ නොයෙකුත් වාද විවාද ඉදිරිපත් කරන්නට හැකියාවක් ඇති වෙලා තිබෙන්නේ, යුද්ධයෙන් පසුව මේ රට නිදහස් සාමකාමී රටක් විධියට ගෙන යන අවස්ථාවකයි. ප්‍රභාකරන්ට විරුද්ධව යුද්ධය ගෙන යන අවස්ථාවේ දී එක්සත් ජාතික පක්ෂයේ සියලු දෙනාගේ නොවෙයි, ඇතැම් අයගේ ප්‍රාර්ථනාව වෙලා තිබුණේ මොකක්ද කියන එක රහසක් නොවෙයි. ශ්‍රී ලංකා රජය පරාජය වෙලා ප්‍රභාකරන් දිනනවා දැකීම තමයි එක්සත් ජාතික පක්ෂයේ ඇතැම් අයගේ ප්‍රාර්ථනාව වෙලා තිබුණේ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
පක්ෂයට චෝදනා කරන්න එපා. ඇතැම් අය කියන්නේ පක්ෂය නොවෙයි නේ.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
අප එය ඉතාම පැහැදිලිව දන්නා දෙයක්. ගරු සභාපතිතුමනි, රටේ සංවර්ධන කාර්යය තුළ ඇති වෙලා තිබෙන වර්තමාන තත්ත්වය පිළිබඳව අප කථා කළ යුතු වෙනවා. ගරු සභාපතිතුමනි, අපේ මිත්‍ර කබීර් හාෂීම් මන්ත්‍රීතුමා කියපු කරුණු දිහා බැලුවාම ඒ කථා කළේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකුද කියලා මට හිතෙනවා. එතුමාගේ කථාව ගැන මට පුදුම හිතෙනවා. ඒ මොකද, අපි දන්නවා, මේ රටේ ජනතාව දන්නවා එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය, දර්ශනය මොකක්ද, ඒ අය ආණ්ඩු කරපු ආකාරය කොහොමද කියලා. කබීර් හාෂීම් මන්ත්‍රීතුමා තම කථාවේදී දේශීය නිෂ්පාදන පිළිබඳව කථා කළා; කෘෂි ආර්ථිකය පිළිබඳව කථා කළා; සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් සුද්දෝ, එහෙම නැත්නම් විදේශිකයන් ගෙන ඒම පිළිබඳව කථා කළා; ඒ වාගේම කැසිනෝ පිළිබඳව කථා කළා. ඒ කථා කළේ කබීර් හාෂීම් මන්ත්‍රීතුමාගේ ප්‍රතිපත්තිය ගැනද; එහෙම නැත්නම් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිය අද වෙනස් වෙලාද කියන ප්‍රශ්නය ගැන තමයි අපට හිතන්න වෙලා තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂය රට පාලනය කරපු හැම වෙලාවකම මේ රටේ දේශීය නිෂ්පාදකයා ගැන හිතුවාද? විශේෂයෙන්ම 1977-1994 කාලයේ මේ රටේ දේශීය ආර්ථිකය ගැන හිතුවාද? 2002-2004 ආණ්ඩුව කොයි ආකාරයටද කටයුතු කළේ? දේශීය ගොවියා, දේශීය කෘෂි කර්මාන්තය පිළිබඳව මොන විධියේ සැලසුම්ද එක්සත් ජාතික පක්ෂයට තිබුණේ?

ගරු සභාපතිතුමනි, 1977 විවෘත ආර්ථිකයත් එක්ක මේ රටේ දේශීය ආර්ථිකය කඩා දාපු හැටි, දේශීය කෘෂි කර්මාන්තය බිඳ වැටුණු හැටි අපට මතකයි. අපේ ගොවියා වහ බොන කාලයක් උදා වූ යුගය එක්සත් ජාතික පක්ෂයේ අවාසනාවන්ත යුගයයි. ඒ නිසා ඉස්සර වෙලාම තෝරා බේරා ගන්න වෙනවා, අපට අහන්න වෙනවා එක්සත් ජාතික පක්ෂය දැන් වෙනස් වෙලාද; එහෙම නැත්නම් කබීර් හාෂීම් මන්ත්‍රීතුමා වෙනස් වෙලාද; එහෙමත් නැත්නම් එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරපු හැටි අපේ මිත්‍ර කබීර් හාෂීම් මන්ත්‍රීතුමා දන්නේ නැතිවද කියා. ඒ කියන ප්‍රශ්න අපට මතු වෙනවා.

මේ රටට කැසිනෝ ගෙනාවේ කවුද? මේ රටේ කැසිනෝ පිළිබඳ ප්‍රශ්න මතු වුණේ කොයි කාලයේද? මේ රටට කැසිනෝ ගෙනා, මේ රටට HIV/AIDS ගෙනා එකම කාලය එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයයි. අප එය බොහොම පැහැදිලිව දන්නා දෙයක්.

**ගරු කබීර් හාෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ඔබතුමන්ලාට බලය දුන්නේ ඒවා නවත්වන්න.

**ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා**
(மாண்புமிகு மைத்திரிபால சிறிசேன)
(The Hon. Maithripala Sirisena)
කලබල වෙන්න එපා.

මේ තත්ත්වයන් සැලකිල්ලට ගත්තාම අප ඉතාම පැහැදිලිව තේරුම් ගන්නට ඕනෑ, අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යටතේ අද මේ රටේ ගෙන යන වැඩ පිළිවෙළ තුළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයිති විවිධ අංශ, ක්ෂේත්‍ර, ආයතනවල විශාල සංවර්ධනයක් ඇති වෙලා තිබෙන බව.

මේ අමාත්‍යාංශය යටතේ තිබෙන සමෘද්ධි ව්‍යාපාරය ගත්තාම මම ඉතාමත්ම සතුටු වෙනවා. සමෘද්ධි ව්‍යාපාරය තුළ සමෘද්ධි නිලධාරින්ට දීර්ඝ කාලයක් තිබුණු ප්‍රශ්නයක් තමයි තම සේවයේ ස්ථිරතාව. මේ අමාත්‍යාංශය යටතේ අද සියලු සමෘද්ධි නිලධාරින් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයන් බවට පත් කරන්න ඇමතිතුමා සහ අතිගරු ජනාධිපතිතුමා ගත් තීන්දුව අපි ඉතාමත්ම අගය කරනවා. මේ රටේ ආර්ථික සංවර්ධනයේදී පුළුල් කාර්ය භාරයක් සමෘද්ධි නිලධාරින් විසින් ඉටු කරනවා. 1994 දී අපි සමෘද්ධි ව්‍යාපාරය ආරම්භ කරන වෙලාවේ මගේ දිස්ත්‍රික්කය වන පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ජීවත් වන ජනතාවගෙන් සියයට 52ක් සමෘද්ධි ප්‍රතිලාභීන් වුණා. අද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි ප්‍රතිලාභීන් ඉන්නේ සියයට 24යි. ඒ විධියට අපේ මේ ආණ්ඩු කාල තුළ ඉතා පැහැදිලි ලෙස මේ රටේ අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා.

කබීර් හාෂීම් අපේ මිත්‍ර මන්ත්‍රීතුමා කෘෂි කර්මාන්තය පිළිබඳව කථා කළා. කෘෂි කර්මාන්තය පිළිබඳව කථා කරන විට මම කියන්නට ඕනෑ, අපේ කෘෂිකර්ම අමාත්‍යාංශය වාගේම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයත් "දිවි නැගුම" වැඩ පිළිවෙළත් එක්ක කෘෂි කර්මාන්තය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කරනවාය කියා. මගේ පෞද්ගලික අදහස නම්, විවිධ අංශවල විවිධ මත දරන ආර්ථික විශේෂඥයන් යම් යම් දේශපාලන මතත් එක්ක කුමන විධියේ අදහස් හා මත දැරුවත් මේ රටේ ජාතික ආර්ථිකයේ ශක්තිය රඳා පවතින්නේ, මේ රටේ අනාගත සංවර්ධනය සම්පූර්ණයෙන්ම රඳා පවතින්නේ කෘෂි කර්මාන්තයේ දියුණුවත් එක්ක බවයි. මේ රටේ ගොවියා ශක්තිමත් වීම තුළ තමයි මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් වන්නේ. මේ රටට අවශ්‍ය ආහාර ටික මේ රට තුළ නිෂ්පාදනය වීමෙන් තමයි මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් වන්නේ. එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු කරන කාලවලදී කෘෂි නිෂ්පාදනය කඩා හැලිච්ච හැටි අපට මතකයි. විශේෂයෙන්ම පිට රටින් සියලු කෑම බීම ගෙනැල්ලා පුරවපු හැටි අපට මතකයි. ගොවියාගේ පොහොර සහනාධාරය

කපලා, වී අලෙවි මණ්ඩලය අහෝසි කරලා, ඒ සියලු දේවල් නැත්තට නැති වෙච්ච යුගයක් තුළ තමයි ඒ කටයුතු කෙරුණේ. ඒක නිසා මේ රටේ අද දවස ගත්තොත් අපි ඉතාමත්ම සතුටු වෙනවා.

අද ලංකාවේ ඕනෑම තැනක වී මිල කීයද කියලා තමුන්නාන්සේලා දුරකථනයෙන් අහලා බලන්න. අද දවස ගත්තාම වී සඳහා ගොවියාට හොඳ මිලක් ලැබෙනවා. අද මේ රටේ වහ බොන ගොවීන් නැහැ. විශේෂයෙන්ම එක පැත්තකින් මේ රටේ ගෙවතු වගාවට, අනෙක් පැත්තෙන් කෘෂි කර්මාන්තය පිළිබඳ ස්වයං රැකියා ව්‍යාපෘතිවලට, තවත් පැත්තකින් කෘෂි කර්මාන්තය ජාතික ආර්ථිකයට වඩ වඩාත් කාර්යක්ෂම කිරීමේ නැඹුරු කිරීමේ පුළුල් සංවර්ධන කාර්යයන්වලට ඉතා පැහැදිලි ප්‍රගතියක් "දිවි නැඟුම" නව කෘෂි කාර්මික වැඩසටහන මඟින් මේ වන විට ලැබිලා තිබෙනවා. ඒක නිසා විපක්ෂයේ තිබෙන කණ්ණාඩිය ගලවලා අපක්ෂපාතීව, මධ්‍යස්ථව ආණ්ඩුවේ වැඩ කටයුතු දිහා බලන්නය කියන කාරුණික ආරාධනය අපි විපක්ෂයට කරනවා. රටක් සංවර්ධනය කිරීමේදී ඒ රට තුළ තිබෙන්නා වූ ප්‍රශ්න, ගැටලු සහ අභියෝගයන් මොනවාද කියා බලන්නට ඕනෑ. මේ රටේ කෘෂි කර්මාන්තය කඩා හැලිලා කියලා කබීර් හාෂිම් මන්ත්‍රීතුමා කිව්වා. මම දන්නේ නැහැ මොනවා පදනම් කර ගෙනද එහෙම කිව්වේ කියලා.

පසු ගිය අවුරුදු තුන හතරක කාලය ගත්තාම මේ රටේ වී නිෂ්පාදනයේ විශාල වැඩි වීමක් තිබෙනවා. මේ රටේ වී නිෂ්පාදනයේ විශාල ප්‍රගතියක් තිබෙනවා. ඒ ගැන අපි ඉතාමත්ම සතුටු වෙනවා. මේ රටේ පෞද්ගලික අංශය අද සහල් පිට රට යවනවා. සීඅයිසී ආයතනය වගේ ආයතන සහල් පිට රට යවනවා. අපේ රාජ්‍ය ප්‍රතිපත්තිය නිසා පෞද්ගලික අංශයේ සංවර්ධනයක් තිබෙනවා. ඒ වාගේම සීඅයිසී ආයතනය අද සහල් පිට රට යවන්නේ, එම සමාගම විධියට ඒ ගොල්ලන් විතරක් නිෂ්පාදනය කරන, ඒ ගොල්ලන්ගේ වගාවන්ගෙන් ගත් ඵලදාව විතරක් නොවෙයි. ඒ ගොල්ලෝ ගොවීන්ගෙනුත් සහල් අරගෙන තමයි පිට රට යවන්නේ. ඒක නිසා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුගය තුළ යුද්ධය අවසන් කරලා සහල් පිට රට යවන්නත් අපට පුළුවන්කම ලැබිලා තිබෙනවාය කියන එක විශේෂයෙන්ම කෘෂි කර්මාන්තය පිළිබඳව කථා කරන විට මතක් කරන්නට ඕනෑ.

සමෘද්ධි ව්‍යාපාරය, දිවි නැඟුම වාගේම, අනෙක් පැත්තෙන් ගත්තොත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා මේ රටේ මාර්ග සංවර්ධනයේ පැහැදිලි පරිවර්තනයක් ඇති කර තිබෙන බව දැන් ඉතා පැහැදිලියි. මම සෑම වෙලාවේම කියන දෙයක් තමයි, මේ රටේ සංවර්ධනය දකින්න කොළඹින් පිටට යන්නය කියන එක. අද උතුරු නැඟෙනහිර සංවර්ධනය, දකුණු පළාත් සංවර්ධනය, වයඹ පළාත් සංවර්ධනය, උතුරු මැද පළාත් සංවර්ධනය, ඌව පළාත් සංවර්ධනය, ප්‍රධාන වශයෙන්ම රටකට අවශ්‍ය ජාතික මාර්ග පද්ධතිය සංවර්ධනය අද දකින්නට තිබෙනවා. 1948 නිදහස ලැබුවායින් පසු කාල සීමාව ගත්තාම මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ යුගය තුළ තරම් සංවර්ධනයක් වෙනත් කවරදාකවත් සිදු වෙලා තිබෙනවාය කියලා හෘදය සාක්ෂියට එකඟව කාටද කියන්න පුළුවන්? ඒක අපි ඉතා පැහැදිලිව අහන්නට ඕනෑ. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ.

වෛරයෙන්, ද්වේෂයෙන්, ක්‍රෝධයෙන් නොවෙයි; විපක්ෂයක් විධියට සියලු දෙයට විරුද්ධ වීමේ ප්‍රතිපත්තිය නොවෙයි. විපක්ෂයටත් වග කීමක් සහ යුතුකමක් තිබෙනවා, ගරු සභාපතිතුමනි, සංවර්ධනයේ යහපත් පැත්ත පිළිබඳව සුබවාදී ලෙස කතා කරන්න. ආණ්ඩුවකින් කෙරෙන කටයුතු පිළිබඳව විවේචනය කරන්න ඕනෑ. ඒක අත්‍යවශ්‍යයි. විපක්ෂය මේ අය වැය යෝජනා ගැන කතා කරනකොට රජය කරන සුබවාදී දේවල්, රජය කරන යහපත් දේවල්, රජය කරන සංවර්ධන කටයුතු පිළිබඳව කිසිම ආකාරයකින් සුබවාදී ලෙස වචනයක්වත් කතා කරන්න හුරු පුරුදු වෙලා නැහැ. මොකද, ඒ අය ආණ්ඩුව දිහා බලන්නේ, අපි යන ගමන දිහා බලන්නේ, මේ ගමන වළක්වන්නේ කොහොමද කියායි. ඒකයි මම මගේ කතාවේදී කිව්වේ එක්සත් ජාතික පක්ෂයේ සමහර අය මේ ආණ්ඩුව ගැන සිහින මැව්වාය කියා. ප්‍රභාකරන් යුද්ධය දිනලා, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව ඇද වැටිලා, මේ රටේ ආර්ථිකය කඩා වැටිලා මේ ආණ්ඩුවට යන එන මං නැති වේවිය කියා තමයි ඒ අය හිතා ගෙන හිටියේ. නමුත් එක්සත් ජාතික පක්ෂයට ඒ සිහිනය දකින්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ සිහිනය සැබෑ වුණේ නැහැ. මේ රටේ ජනතාවාදී ගමන් මඟක යන ආණ්ඩුවක් විධියට, මේ රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳව පැහැදිලි ප්‍රතිපත්තියක්, අරමුණක් එක්ක යන ආණ්ඩුවක් විධියට, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා යුද්ධය අවසන් කරලා සාමකාමී රටක් විධියට -ප්‍රබුද්ධ රාජ්‍යයක් විධියට- මේ රට ගොඩ නැඟීමේදී, ඉදිරියට යාමේදී අපට ඒ සියලු ආකාරයේ කාර්යයන් පිළිබඳව ඉතාමත්ම සතුටු වෙන්න පුළුවන්කමක් ඇති වුණා.

එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මීට පෙර කතා කළ ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේ ආණ්ඩුව අන්ත දක්ෂිණාංශික ආණ්ඩුවක්ය කියා. එතුමා සුපිරි පන්තියක් පිළිබඳව කතාවක් කළා; ආදායම් පරතරය පිළිබඳව කතා කළා; දේශීය නිෂ්පාදනය පිළිබඳව කතා කළා. සුපිරි පන්ති ගැන කතා කරනකොට, අන්ත දක්ෂිණාංශකයක් ගැන කතා කරනකොට, ඒ වාගේම ආදායම් පරතරය පිළිබඳව කතා කරනකොට, ඒ වාගේම මේ රටේ දේශීය කර්මාන්ත කඩා හැලීම පිළිබඳව කතා කරනකොට මම දකින විධියට නම් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ ගෙන ගිය වැඩ පිළිවෙළත් එක්ක මේ එක කාරණයක් පිළිබඳවවත් කතා කරන්න එක්සත් ජාතික පක්ෂයට කිසිදු අයිතියක් නැහැ. ඒ බව මම ඉතා පැහැදිලිව කියන්න ඕනෑ. මේ රටේ සෑම කෙනෙක්ම දන්නවා අන්ත දක්ෂිණාංශික ලෙස මේ රට පාලනය කළේ කවුද කියන එක; මේ රටේ දේශීය ආර්ථිකය කඩා වැටෙන්නට සැලැස්වූවේ කවුද කියන එක. මේ රටේ සුපිරි පන්ති බිහි වුණේ කාගෙන්ද, කොයි කාලයේද කියන එක මේ රටේ හැම කෙනෙක්ම පැහැදිලිව දන්නා දෙයක්.

ගරු සභාපතිතුමනි, ඒ නිසා මේ රටේ ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය කරන කාර්ය භාරය අපි ඉතාමත්ම අගය කළ යුතු වෙනවා. රට සංවර්ධනයේදී ඉතාමත්ම පැහැදිලි ගමන් මඟක් සඳහා, සැලසුම් සහගතව පැහැදිලි වැඩ පිළිවෙළක් යටතේයි ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ කාර්යයන් කෙරෙන්නේ. ඒ සියලු අංශවලින් කෙරෙන ආයෝජනය, ඒ සැලසුම්වල ප්‍රතිඵලය මේ රටේ කෙටි කාලීනව වාගේම දීර්ඝ කාලීන සංවර්ධනය සඳහා, අද ජීවත් වෙන ජනතාවට වාගේම හෙට උපදින දරුවන් සඳහාත් මේ ප්‍රතිඵලය ලබා දෙනවාය කියන එක ඉතාමත්ම පැහැදිලිව අපි කියන්න ඕනෑ.

ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා ඉතාමත් දක්ෂ විධියට මේ අමාත්‍යාංශය හසුරුවනවා. අමාත්‍යාංශයේ ලේකම් හැටියට පී.බී. ජයසුන්දර මැතිතුමා කටයුතු කරනවා. ඒ වාගේම මේ අමාත්‍යාංශයේ ඉතාම දක්ෂ නිලධාරීන් පිරිසක් සිටිනවා. මම ස්තුති කරන්න ඕනෑ, රත්නදාස මහත්මයාට. මේ රටේ රාජ්‍ය නිලධාරීන් අතරේ ඉතාමත්ම දක්ෂ, අවංක නිලධාරියෙක් තමයි එතුමා. එතුමා මේ අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරයෙක්. අනිකුත් අය ගැන කතා කරන්න මා කාලය ගන්නේ නැහැ. ගරු අමාත්‍යතුමාගේ නායකත්වය යටතේ ඉතාමත්ම දක්ෂ නිලධාරි මණ්ඩලයක් මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා ගන්නා වූ වෙහෙස, මහන්සිය, කැප වීම ඉතාමත්ම අගය කරන අතර, ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා බලාපොරොත්තු වන ආකාරයට මේ රට ලෝකයේ ප්‍රබුද්ධ රාජ්‍යයක් විධියට ගොඩ නැඟීමේ කාර්යයේදී ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශය ගෙන යන මේ වැඩ පිළිවෙළ ඉතාමත්ම සාර්ථක වැඩ පිළිවෙළක්ය; ඉතාමත්ම යහපත් වැඩ පිළිවෙළක්ය; ඉතාමත්ම ප්‍රතිඵලදායී වැඩ පිළිවෙළක්ය කියන එක මම කියන්න ඕනෑ. ස්තුතියි ගරු සභාපතිතුමනි.

[පූ.භා. 11.00]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු සභාපතිතුමනි, මගේ කතාව පටන් ගන්න කලින් මම "Weekend FT" පුවත් පතේ ප්‍රධාන ශීර්ෂ පාඨය පෙන්වන්න කැමැතියි.

The caption of that article is, I quote:

"Reserves a buffer for tough time: CB Chief"

එතුමා එහි කියනවා:

"…Ajith Nivard Cabraal yesterday defended declining reserves, insisting that they were built up to be used in times of need."

ගරු සභාපතිතුමනි, මහ බැංකුවේ අධිපතිවරයා පිළිගන්නවා ආර්ථිකය අමාරු තත්ත්වයකට වැටිලා තිබෙනවා කියලා. ඒක තමයි මේ කියන්නේ. එතුමා තමයි ඒක කියන්නේ. හදිසි අවශ්‍යතාවකට අවශ්‍ය නිසා තමයි මේ ඩොලර් විකුණන්නේ කියලා එතුමා කියලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, එතුමා පිළිගන්නවා, මෙතැන ගැටලුවක් තිබෙනවා කියලා.

ඊ ළඟට කියනවා, මෙන්න මෙහෙම: I quote :

"When you see an ant collecting food for winter, no one tells the ant that it shouldn't eat the food to survive the winter because it would decrease the reserve. Sometimes we must learn from ants not just from people who write books. In these complicated times, we tend to forget these simple tales."

බැසිල් රාජපක්ෂ ගරු ඇමතිතුමාගේ අමාත්‍යාංශය පිළිබඳව කථා කරන කොට ගරු ඇමතිතුමා මෙතැනින් නැඟිටලා යෑම පිළිබඳව මට දුකයි. [බාධා කිරීම්] මම විශ්වාස කරනවා, එතුමා නැවත එයි කියලා. [බාධා කිරීම්] මොකද මම මෙතැන දේශපාලන කථාවක් කරන්න නොවෙයි ආවේ. [බාධා කිරීම්] මම එතුමාට ආරාධනා කරනවා, නැවත සභා ගර්භයට පැමිණෙන්න කියලා.

Sir, let me now read from the Holy Bible: Proverbs 6:6-8. It states, I quote:

"Go to the ant, O sluggard; consider her ways, and be wise. Without having any chief, officer, or ruler, she prepares her bread in summer and gathers her food in harvest."

මම බුද්ධාගමේ නිසා කතෝලික ආගමේ කෙනෙකුගෙන් call කරලා ඇහුවා, මොකක්ද මේකෙන් කියලා තිබෙන්නේ කියලා. නිවාඩ් කබ්රාල් මහබැංකු අධිපතිතුමා කියනවා, "කුඹියෝ කෑම එකතු කරනවා, winter එකේදී පාවිච්චි කරන්න" කියලා. අපි කවුරුත් ඒක දන්නවා. අපි පොඩි කාලේ ඉඳන් කුඹින්ගේ කථා අහලා තිබෙනවා. කුඹින් හරිම කඩිසරයි. කොයි වෙලාවෙත් වැඩ කරනවා. එක තැනකින් යන්න බැරි නම් ආපසු පස්සට ඇවිල්ලා වෙන තැනකින් යනවා. එහෙම කරලා ඒ කෑම හොයා ගන්නවා. ඒවා පස්සේ කාලයේ පාවිච්චි කරන්න තියා ගන්නවා. ඒවා හොඳයි. නමුත් ඒක සංසන්දනය කරන්න බැහැ, මේ මහ බැංකුව ඩොලර් එකතු කරපු ක්‍රමයට. මොකද මහ බැංකුව ඩොලර් එකතු කරපු ක්‍රමය තමයි ණයට ගැනීම. අපි කවුරුත් දන්නවා, ඔය සංචිතවලින් වැඩි ප්‍රමාණයක් තිබෙන්නේ ණයට ගත්තු සංචිත බව. කුඹියෙක් ගිහිල්ලා වෙන කුඹියෙකුගෙන් ණයට කෑම ඉල්ලා ගෙන එන්නේ නැහැ නේ. ඒ කුඹියා ගිහිල්ලා කෑම හොයා ගන්නවා. ඒ විධියට තමයි අපට මේ විදේශ සංචිත ප්‍රමාණය වැදගත් වන්නේ. එතැනදී තමයි රුපියල අවප්‍රමාණය කිරීමේ ගැටලුව මතු වන්නේ. ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේදී රුපියල අවප්‍රමාණය කරන බව සඳහන් කළා. එතැනදී ගැටලුවක් මතු වුණා, කවුද මේ රුපියලේ අගය පිළිබඳ කටයුතු කරන්නේ කියලා. මොකද අපි දන්නා තරමට, අපට කියලා තිබෙන විධියට මහ බැංකුවෙන් තමයි රුපියලේ අගය කළමනාකරණය කරන්නේ. ඒ කෙසේ වෙතත් මම මේක ගැන වැඩි පුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. නමුත් මම ඒ කුඹියාගේ කථාවේ ඇත්ත අර්ථය මහ බැංකුවේ අධිපතිතුමාට කියලා දෙන්න කැමැතියි.

මම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා මෙතැනට අවාට පස්සේ සංවර්ධනය මනින්නේ කොහොමද කියන එතුමාගේ ප්‍රශ්නයට උත්තර දෙන්න සූදානම්. ඉතින් මම එතුමා එන කල් ඒ කථාව කරන්නේ නැහැ. අය වැය දෙවැනි වර කියවීමේ විවාදයේදී මම කථා කළා, ඇස්ටන් මාටින් හෙවත්, "Carlton Class" කියන පන්තිය පිළිබඳව. සාමාන්‍යයෙන් ජනතාවට සොච්චමක් දීලා ඒ ප්‍රධාන පවුලට අනුබද්ධව තිබෙන කාල්ටන් පන්තිය රටේ සම්පත් රස කර කර, සුප්පු කර කර බෝජනය කරන්නේ කොහොමද කියලා මම එදා කියලා දුන්නා. ගරු සභාපතිතුමනි, ඔබතුමා දන්නවා ඇති ආචාර්ය එන්.එම්. පෙරේරා මැතිතුමා ගැන. එතුමාගේ නම තමයි නානායක්කාර පතිරණගේ මාටින් පෙරේරා. නිකම් ආදරයට, යහළුකමට මාටියා කියලාත් කියනවා. එතකොට ඒ කාලයේ හිටියේ නානායක්කාර පතිරණලාගේ මාටින්. දැන් තිබෙන්නේ, ඇස්ටන් මාටින්. ඒ මාටින්ලාගේ කථාව හරි වෙනස්. ඒ කාලයේ මාටින්ලා සමාජවාදී මාටින්ලායි. දැන් කාලයේ මාටින්ලා අධි ධනවාදී කාල්ටන් පන්තියේ මාටින්ලායි. මෙතැන ලොකු වෙනසක් තිබෙනවා කියලා කලින්ම කියන්න කැමැතියි. ඔය අලුත් මාටින් පන්තිය ගැන තමයි අපට මේ කථාව කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

ගරු සභාපතිතුමනි, ආර්ථික සංවර්ධනය කියන්නේ මොකක්ද? එතැන ආර්ථික වර්ධනය තිබෙනවා. අපි කියනවා, රටේ ආර්ථිකය සියයට 6කින් වර්ධනය වුණා, ඒකපුද්ගල ආදායම ඩොලර් 2,500ට ගිහිල්ලා තිබෙනවා කියලා. ඒක හොඳයි. අපි ඒවා වැරදියි කියන්නේ නැහැ. අපට ආර්ථික වර්ධනය අවශ්‍යයි. ඒ කේක් ගෙඩිය ලොකු කර ගන්නයි අපට ඕනෑ. නමුත් සංවර්ධනය කියන්නේ එපමණක් නොවෙයි. සංවර්ධනය කියන්නේ ඊට වඩා පළල් සංකල්පයක්. ඒ වර්ධනයෙන් ලැබෙන ප්‍රතිලාභ අපි සමාජ සාධාරණත්වයක් ඇති වන විධියට ජනතාව අතරේ බෙදා දෙන්නේ කොහොමද?

ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා ඉස්සරවෙලා කථා කරයි කියලා මම බලාපොරොත්තු වුණා. බෝඩ් එකේ එහෙමයි නම දමලා තිබුණේ. නමුත් එතුමා මට කලින් කථා කළේ නැහැ. ඒකට කමක් නැහැ. ඊයේ එතුමා කථා කරනවා radio newsවලින් මම අහ ගෙන හිටියා. එතුමා කියනවා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ස්ථාපිත කළේ ආර්ථික පෙරළියක් කරන්නයි කියලා. ගරු සභාපතිතුමනි, දැන් ප්‍රශ්නය තිබෙන්නේ මෙතුමන්ලා ආර්ථික පෙරළියක් කරලාද, ආර්ථිකය පෙරළා ගෙනද කියන එකයි. තව ටික වේලාවකින් මම ඒ ගැන කියන්නම්.

දැන් අපි සොයලා බලමු, එතුමා කියන විධියට මේ කරලා තිබෙන ආර්ථික පෙරළිය මොකක්ද කියලා. අපට ඊයේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් නිකුත් කළ පොතක් බෙදුවා. මේ දැන් මා අතේ තිබෙන්නේ ඒ පොත. මේ පොතේ මුල් පිටුවේ සඳහන් වෙලා තිබෙනවා "සංවර්ධනයේ පුරෝගාමියා" කියලා. ඒ එක්කම DVD එකකුත් බෙදුවා. මම හිතන හැටියට ඒක ඉතාම හොඳ ක්‍රියාවක්. ගොඩක් වෙලාවට අපි මේ පොත් බලන්නේ නැහැ. මට පොත් 100ක් දුන්නොත් ඒකෙන් තෝරලා මම ගන්නේ 10යි. අනෙක් ඒවා ආපසු දෙනවා. ඉතින් ඒක වැඩකට නැති දෙයක්. ගරු සභාපතිතුමනි, මම ඉතාම කැමැතියි, එතුමා ඒ කරපු ක්‍රියාවට. ඒක හොඳ දෙයක්. මේ පොතේ මුල් පිටුවේ "සංවර්ධනයේ

පුරෝගාමියා" කියලා සඳහන් කරලා ඉස්සර වෙලාම තිබෙන්නේ මොකක්ද? ඉස්සරවෙලාම තිබෙන්නේ "දිවි නැඟුම" ගැන. හරි බලමු. මේක ඔබතුමාගේ පොත. "දිවි නැඟුම" ගැන මොකක්ද කියන්නේ? ගරු ඇමතිතුමනි, මේ පොතේ 12 වැනි පිටුව බලන්න. එහි මෙසේ සඳහන් වනවා:

"ජාතික ආහාර නිෂ්පාදනය දිරිගන්වමින් කෘෂිකාර්මික හා පශු සම්පත් ප්‍රවර්ධනය කෙරෙන ගෘහ ආර්ථික ඒකක දශ ලක්ෂයක් ස්ථාපිත කිරීම...."

ඊට පස්සේ, 13 වැනි පිටුවේ මෙහෙම කියනවා:

"කෘෂිකාර්මික සංරචකයේ පළමු අදියර ගෙවතු දශ ලක්ෂයක් සංවිධානය කිරීමේ මූලික ඉලක්කය සාධනය කර ගැනීමට සමත් විය."

එහෙම කරන්න පුළුවන් වෙලා තිබෙනවා නම් ඒක හොඳයි. නමුත් මම කියන්නේ මේකයි. අපි කරන්නත් වාලේ කරලා වැඩක් නැහැ නේ. මොකක් හරි අවසාන ඉලක්කයක් දක්වා තමයි අපි මේ දේවල් කරන්නේ.

ගරු ජනාධිපතිතුමා අය වැය කථාවේ 12 වන පිටුවේ මෙන්න මෙහෙම කියනවා:

"දිවි නැඟුම නමින් දියත් කළ එම වැඩ සටහන සාර්ථක වී තිබෙනවා."

"ආහාර උද්ධමනය සියයට 3ක පමණ මට්ටමක පවත්වා ගැනීමට මෙම වැඩ සටහන දායක වුණා."

දිවි නැඟුමේ සාර්ථකත්වය නිසා ආහාර උද්ධමනය සියයට 3ට අඩු වුණා කියලා එතුමා කියනවා.

ගරු සභාපතිතුමනි, එදාම අපට මුදල් අමාත්‍යාංශයෙන් පොතක් බෙදුවා. අද රටේ ආහාර උද්ධමනය කීයද කියලා මම ඒ පොතේ බැලුවා. මේවා මම කියන ඒවා නොවෙයි. මුදල් අමාත්‍යාංශයෙන් දුන්න පොතේ තිබෙන ඒවා මම කියන්නේ. ඒ පොතේ 57 වැනි පිටුවේ තිබෙනවා, 2011 ආහාර උද්ධමනය ගැන. එය ජනවාරි මාසයේ සියයට 7.1යි; පෙබරවාරි මාසයේ සියයට 7.5යි; මාර්තු මාසයේ සියයට 8.1යි; අප්‍රේල් මාසයේ සියයට 8.7යි; මැයි මාසයේ සියයට 9.4යි; ජූනි මාසයේ සියයට 10යි; ජූලි මාසයේ සියයට 10.5යි; අගෝස්තු මාසයේ සියයට 10.7යි; සැප්තැම්බර් මාසයේ සියයට 10.6යි. ගරු සභාපතිතුමනි, මම කියන්නේ සියයට 3ට අඩු වෙලා තිබෙනවා කියලා මේ පොතේ කිව්වාට,- [බාධා කිරීම්] ඔබතුමාගේ වෙලාවේ දී කියන්න. මම මේවා ඔක්කොම සභාගත කරනවා. මෙතැන කිසි බොරුවක් වංචාවක් නැහැ. මම මේ පොතේ තිබෙන ඒවා කියන්නේ. සියයට 3යි කියලා කිසිම තැනක සඳහන් වන්නේ නැහැ. උද්ධමනය සියයට 10 කියලා තමයි තිබෙන්නේ.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ඔබතුමා නොවැම්බර් මාසයේ සියයට ගණන කිව්වේ නැහැ. [බාධා කිරීමක්] නොවැම්බර් මාසයේ එකත් කියන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
"සංවර්ධනයේ පුරෝගාමියා" නැමැති පොතේ "ගම නැඟුම" ගැන සඳහන්ව තිබෙනවා. අපි ඒකට යමු. [බාධා කිරීමක්] අපි බලමු, "ගම නැඟුම" ගැන. එම පොතේ 18 වැනි පිටුව බලන්න. ඉස්සර වෙලා තිබුණේ "දිවි නැඟුම" ගැන. මම ඒ විස්තරය කියලා දුන්නා. දෙවනුව තිබෙන්නේ "ගම නැඟුම" ගැන. ගම නැඟුමේ මොකක්ද කියලා තිබෙන්නේ? "සංවර්ධනයේ පුරෝගාමියා" නැමැති පොතේ 18 වැනි පිටුවේ සඳහන් වන්නේ මෙහෙමයි:

"සෞන්දර්යයෙන්, ශ්‍රී විභූතියෙන් හා සෙනෙහසින් සපිරුණු පරමාදර්ශී ගමක් පිළිබඳ සිහිනය යථාර්ථයක් බවට පත් කර ගනිමින් ගම් 14,000ක් වර්ෂ 2016 වන විට සමෘද්ධිමත් කිරීමේ ක්‍රමවේදයක් ලෙස ගම නැඟුම වැඩ සටහන ඉදිරිපත් කෙරිණි."

හරිම ලස්සන වචන. කවුද මේවා ලියන්නේ? ගරු සභාපතිතුමනි, මේවා ලියන කට්ටිය අපේ පැත්තටත් එවන්න. [බාධා කිරීම්]එතකොට අපටත් මේ වාගේ ලස්සනට ලියවා ගන්න පුළුවන්. [බාධා කිරීම්]

ගරු සභාපතිතුමනි, මගේ ළඟ තිබෙනවා අය වැය ඇස්තමේන්තුවල 3 වන වෙළුම. [බාධා කිරීම්] ගරු සභාපතිතුමනි, ඒ පොතේ 285 වන පිටුව බලන්න. [බාධා කිරීම්]

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
තමුන්නාන්සේ බොරු පොත් පෙරළන්න එපා. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කථා කරන එක විතරයි මට ඇහෙන්නේ. ඔබතුමා කථා කරන්න.[බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඊට පස්සේ ගම නැඟුම වැඩසටහන,-[බාධා කිරීම්] අනේ! විජයමුණි නියෝජ්‍ය ඇමතිතුමනි, කථා කරන්න දෙන්නකෝ, please. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඒවාට ඇහුම් කන් දෙන්න එපා. තමුන්නාන්සේ කථා කරන්න. [බාධා කිරීම්] නිශ්ශබ්ද වෙන්න.[බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගමට යන්න. ගමට ගිහිල්ලා බලන්න, මොනවාද කරලා තිබෙන්නේ කියලා.[බාධා කිරීම්] අසත්‍යය කියන්න එපා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
කරුණාකරලා කථා කරන්න දෙන්න. වාඩි වෙන්න. කොහේද අසත්‍යය කිව්වේ? බලන්න මේ පොත. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
තමුන්නාන්සේ කථා කරන්න. ඔබතුමා කථා කරන ඒවා විතරයි අපට ඇහෙන්නේ. ඒ නිසා ඔබතුමා කථා කරන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු සභාපතිතුමනි, දැන් ගම නැඟුම වැඩසටහන පිළිබඳව ලස්සන අකුරුවලින් ලියලා කියනවා, "සමෘද්ධිමත් ගමක්" කියලා.

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

දැන් බලන්න, මේවාට කොච්චර මුදල් වියදම් කරලා තිබෙනවාද කියලා. අය වැය ඇස්තමේන්තු සිංහල පොතේ - 3 වන වෙළුමහි- 285 වැනි පිටුව බලන්න. ශීර්ෂය - 105, 02 - 02, "මූලධන වියදම් - ගම නැඟුම වැඩසටහන" යටතේ සඳහන් වන පරිදි, 2011 දී බිලියන 11ක් වියදම් කරලා තිබෙනවා. නමුත් 2012 දී ගම නැඟුමේ වියදම බිලියන 6.6ට අඩු කරලා තිබෙනවා. ඔබතුමන්ලාගේ අය වැයෙන් කරලා තිබෙන දේවල් ගැන තමයි මම මේ කථා කරන්නේ. එහෙනම් කෝටි 1,100 ඉඳලා කෝටි 660 දක්වා සියයට හතළිහකින් ගම නැඟුමට වෙන් කරන මුදල් අඩු කරලා තිබෙනවා. ඒ නිසා ශ්‍රී විභූතියෙන් පිරුණු ගම පොතට පමණක් සීමා වෙලාද කියලා මා අහනවා.

ඊළඟට, "මතට තිත" වැඩසටහන බලන්න. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර තිබෙන මේ දැන් මා අතේ තිබෙන පොතේ "මතට තිත" සම්බන්ධයෙන් මොකක්ද කියන්නේ? මේ පොතේ 20 වැනි පිටුවේ සඳහන් වනවා, "මතට තිත" වැඩසටහන ගැන. මතට ඇබ්බැහි වූ බොහෝ දෙනෙකු ඉන් මුදවා ගනිමින් වැඩසටහන ක්‍රියාත්මක කරන්නට හැකි වුණාය කියලා මේ පොතේ තිබෙනවා. මම ගිහිල්ලා බැලුවා වෙබ් අඩවිය. ඒකේ තිබෙනවා මෙන්න මේ විධියට. මත්පැන්වලට ඇබ්බැහි වෙච්ච 18,656කුත්, සිගරැට්වලට ඇබ්බැහි වෙච්ච 17,991කුත් මේ වැඩසටහනෙන් බේරා ගත්තා කියනවා. ඒක හොඳයි. එහෙම බේරා ගන්නවා නම් හොඳයි. [බාධා කිරීම්] හත් දෙයියනේ! අහගෙන ඉන්නකෝ. [බාධා කිරීම්] මොකක්ද, ඒක හොඳ නැද්ද? ඒක හොඳයි කියලා මම කියන්නේ. ඒක හොඳයි කියලා මම කියන්නේ. අරක්කු බොන කට්ටිය අඩු කර ගත්තාලු. [බාධා කිරීම්]

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඒවාට ඇහුම් කන් දෙන්න එපා. තමුන්නාන්සේ කථාව කරන්න. ඒක විතරයි හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වන්නේ. [බාධා කිරීම්] හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වන්නේ, කථා කරන ගරු මන්ත්‍රීතුමාගේ කථාව පමණයි. බාධා කිරීම් ඇතුළත් වන්නේ නැහැ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු සභාපතිතුමනි, එහෙම නම් මේ හොඳ දේට කොච්චර මුදල් වෙන් කරලා තිබෙනවාද? හොඳ දේවල්වලට මුදල් වෙන් කරන්න ඕනෑ. මේ අය වැය ඇස්තමේන්තු හැදුවේ මම නොවෙයි, ඔබතුමන්ලා. මේ පොතේ තිබෙන විධියට "මතට තිත" වැඩසටහන සඳහා 2011 දී දීලා තිබෙනවා, රුපියල් මිලියන 200ක්. 2012 දී ශතයක්වත් දීලා නැහැ. ඒකයි මම කියන්නේ. [බාධා කිරීම්] දීලා නැහැ. මේ පොතේ නැහැ. දුන්නා නම් මේ පොත්වල තියෙන්න එපායැ. මම කියන්නේ මේකයි. අරක්කුවලට, සිගරැට්වලට ඇබ්බැහි වෙච්ච කට්ටිය 30,000ක් බේරා ගත්තා නම්, ඒක හොඳ දෙයක් නම්, ඒක තව ප්‍රවර්ධනය කරන්න එපායැ. ඒක වෙනුවට මොකක්ද කරලා තිබෙන්නේ? ඒ මිලියන 200 කපා දමලා තිබෙනවා.

ඊළඟට, අපට එවලා තිබෙනවා, National Dangerous Drugs Control Board එකේ අත් පොතක්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
අන්න හරි. මේ පොතේ තිබෙන දේ බලන්න. අරක්කු භාවිතාව පිළිබඳව මේ පොතේ සඳහන් වනවා. 2009 අරක්කු භාවිතාව ලීටර් මිලියන 70යි; 2010 ලීටර් මිලියන 75යි. විස්කි 2009 භාවිතාව ලීටර් මිලියන 352යි; 2010 වර්ෂයේ ලීටර් මිලියන 542යි. වොඩ්කා භාවිතය 2009 වර්ෂයේ ලීටර් මිලියන 219යි; 2010 වර්ෂයේ 231යි. ඔය වාගේ හැම එකෙන්ම වැඩි වෙලා තිබෙනවා.

ඊට පස්සේ බලන්න, සිගරැට් සම්බන්ධව. 2009 සිගරැට් විකුණලා තිබෙනවා බිලියන 4.1ක්. ගරු සභාපතිතුමනි, 2010 සිගරැට් විකුණලා තිබෙනවා බිලියන 4.3ක්. ඒ කියන්නේ සිගරැට් බොන එකත් වැඩි වෙලා තිබෙනවා, අරක්කු බොන එකත් වැඩි වෙලා තිබෙනවා. ඉතින් "මතට තිත" තුළින් පුළුවන් වුණා නම් මේවා අඩු කර ගන්න, මා ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේකට තව වැඩිපුර සල්ලි දෙන්න කියලායි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මිනිසුන්ගේ ආර්ථිකය ඉහළට ගිහිල්ලා, ඒකයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතකොට මේ අමාත්‍යාංශය යටතේ තමයි සමෘද්ධිය තිබෙන්නේ. [බාධා කිරීම්] ගරු සභාපතිතුමා, මේ අමාත්‍යාංශයට තමයි සමෘද්ධිය අයිති වන්නේ. [බාධා කිරීම්] මේ ගරු සභාවේ කථා කරපු මැති ඇමතිවරු දිගටම කිව්වේ සහනාධාරවලින් ශත 5ක්වත් කැපුවේ නැහැ කියලායි. මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමාගේ ආණ්ඩුවෙන් සහනාධාර ශතයක්වත් කැපුවේ නැහැයි කියලා තමයි කිව්වේ. [බාධා කිරීම්] නමුත් ගරු සභාපතිතුමනි, මා පෙන්වන්න කැමැතියි, 2012 අවුරුද්ද සඳහා සමෘද්ධියට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය. [බාධා කිරීම්] ගරු සභාපතිතුමනි, "අයවැය ඇස්තමේන්තුව (කෙටුම්පත) 2012, 3 වන වෙළුම" පොතේ 294 වන පිටුවේ සමෘද්ධියට වෙන් කර තිබෙන මුදල් ප්‍රමාණය සඳහන් වෙලා තිබෙනවා. සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ සාරාංශය යටතේ සුබසාධක වැඩසටහන් යනුවෙන් සඳහන් වනවා. ඒ කියන්නේ සහනාධාර. සුබ සාධක වැඩසටහන් සඳහා 2011 ප්‍රතිශෝධිත අය වැය යටතේ රුපියල් බිලියන 11ක් වෙන් කර තිබෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, 2012 වර්ෂය සඳහා සුබසාධක වැඩසටහන් සඳහා කොපමණ මුදලක්ද වෙන් කරලා තිබෙන්නේ? රුපියල් බිලියන 9.9යි. "කවුරු කෙසේ කිව්වත්, අසන්නා සිහි බුද්ධියෙන් ඇසිය යුතුයි" කියලා කියමනක් තිබෙනවා. ඊට වඩා පොත පෙරලා බලන්න වනවා, ඇත්ත වශයෙන්ම කවුද සත්‍ය ප්‍රකාශ කරන්නේ, කවුද අසත්‍ය ප්‍රකාශ කරන්නේ කියලා. සහනාධාරවලින් ශත 05ක්වත් කැපුවේ නැහැයි කියන මේ ආණ්ඩුව, රුපියල් බිලියන 11 සිට රුපියල් බිලියන 9.9 දක්වා සමෘද්ධි සහනාධාරය කපා තිබෙනවාය කියලා 2012 අයවැය ඇස්තමේන්තුව කෙටුම්පතේ සඳහන් වනවා. [බාධා කිරීම්] එහෙම නම් ගරු සභාපතිතුමනි, මෙතැන ලොකු පරස්පරයක් තිබෙනවා. [බාධා කිරීම්] අපි මෙච්චර වෙලා කථා කළේ ප්‍රතිලාභ බෙදී යැම සම්බන්ධයෙනුයි. මා කිව්වා, සංවර්ධනයේ ප්‍රතිලාභ බෙදී යැම එක පැත්තක්, අනික් පැත්ත තමයි වර්ධනය ඇති කිරීම කියලා. ආර්ථික වර්ධනය ඇති කරන්න ඕනෑ. ආර්ථික පෙරළියක් අවශ්‍ය මොකටද? ඒ ආර්ථික වර්ධනය ඇති කරන්නයි, ගරු සභාපතිතුමනි. [බාධා කිරීම්] දැන් අපි දේශීය සහ විදේශීය - [බාධා කිරීම්] මා මෙහිදී ආර්ථික වර්ධනය ගැන විග්‍රහය කරන්න අවශ්‍ය වන්නේ නැහැ. අපි කවුරුත් දන්නවා, ආර්ථික වර්ධනයට අවශ්‍ය

ප්‍රධානම දේ ආයෝජනයයි කියලා. අපට ආයෝජන අවශ්‍යයි. මේ ආයෝජන ප්‍රවර්ධනය තමයි, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ප්‍රධානම කාරණාව. ඒ කියන්නේ දේශීය, විදේශීය - [බාධා කිරීමක්] මොකක්ද?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ආයෝජනයත් මගේ අමාත්‍යාංශයේ එක අංශයක්. අපේ රටේ වැඩි ජනතාවක් -සියයට 80ක්- ග්‍රාමීය ජනතාවයි. ඒ ග්‍රාමීය ආර්ථිකය සංවර්ධනය කිරීම තමයි අපේ aim එක.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
බොහොම ස්තුතියි.

දැන් බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේ ග්‍රාමීය ආර්ථිකයේ කෙරුවාව මා පෙන්වා දෙන්නම්. දැන් ඔබතුමා එන කල් තමයි මා සිටියේ. ඔබතුමා පැමිණි එක හොඳයි. ඔබතුමා ඇහුවා, "සංවර්ධනය මනින්නේ කොහොමද?" කියලා. [බාධා කිරීම්] ඔබතුමා ගිහින් කථා කරන්න කෝ. ඔබතුමා කබීර් හාෂීම් මන්ත්‍රීතුමාගෙන් ඇහුවා, "සංවර්ධනය මනින්නේ කොහොමද?" කියලා. "සංවර්ධනය මනින්නේ කොහොමද?" කියලා මා පෙන්වන්නම්. සංවර්ධනය මනින්නේ ගෘහස්ථයක ජීවන තත්ත්වය අනුවයි, ගරු සභාපතිතුමනි. අපි 1981 සිට හැම අවුරුදු තුනකටම, හතරකටම වරක් මූර්ත ගෘහස්ථ ආදායම සටහන් කරලා ජනතාවට පෙන්වනවා. [බාධා කිරීම්] ගරු සභාපතිතුමනි, මා පාර්ලිමේන්තුවට ආපු පළියට මා දේශපාලනය ගැන කථා කරන්න සූදානම් නැහැ. මා ආර්ථික විද්‍යාව හදාරපු කෙනෙක්; ආර්ථික විද්‍යාව උගන්වන කෙනෙක්. මෙතැන දේශපාලනයක් නැහැ. [බාධා කිරීම්] 1981 සිට හැම අවුරුදු තුනකටම, හතරකටම වරක් ගෘහස්ථයක මූර්ත ආදායම කීයද කියලා පෙන්වූවා. [බාධා කිරීම්] 2006 දී ගෘහස්ථයක මූර්ත ආදායම රුපියල් 17,465යි. 2010 දී, අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාල පරිච්ඡේදයේදී ඒක රුපියල් 17,129 දක්වා අඩු වුණා. ඒ විධියට තමයි සංවර්ධනය මනින්නේ. ඇස්ටන් මාර්ටින් ගෙනෙන්න පුළුවන් අයට, ලැම්බෝගිනි ගෙනෙන්න පුළුවන් අයට සල්ලි තිබුණු පළියට, රටේ ආර්ථික වර්ධනය උඩ ගිය පළියට සාමාන්‍ය ජනතාවගේ ගෘහස්ථ ජීවන තත්ත්වය වැඩි වන්නේ නැහැ. මා ඒක පෙන්වා දෙන්නම්, ගරු සභාපතිතුමනි. හරිම කනගාටුයි කියන්න.

2011 ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කරපු වාර්තාවේ, 1981 සිට සංවර්ධනය මනින මාපකය, නිර්ණායකය මකා දමා තිබෙනවා. [බාධා කිරීම්] ගරු ඇමතිතුමා අහනවා, "මනින්නේ කොහොමද?" කියලා. මේ සම්බන්ධයෙන් ඇමතිතුමා දන්නවාද, නැද්ද කියා මා දන්නේ නැහැ. මා නැවත වරක් ඉල්ලා සිටිනවා, 1981 සිට සංවර්ධනය මනින ක්‍රමවේදය මේකෙන් අයින් කරන්න එපාය කියලා. මේක පහළ ගිය පළියට ඒක අයින් කරන්න එපා. අප කථා කළේ රාජ්‍ය ආයෝජන කළ හැක්කේ-[බාධා කිරීමක්] ඔබතුමා ඔබතුමාගේ වෙලාවේදී කියන්න. රාජ්‍ය ආයෝජන කරන්නට පුළුවන් සීමිත ප්‍රමාණයයි. අපට සංවර්ධනයට ආයෝජන අවශ්‍යයි. රාජ්‍ය ආයෝජන කරන්නට ආණ්ඩුවට සල්ලි නැහැ. [බාධා කිරීම්] ඒක තමයි සත්‍යය. මම හොඳ දෙයට හොඳ කියන්නට ඕනෑ. මේ ආණ්ඩුව දිගටම සියයට 6ක්, සියයට 7ක් ආයෝජනය කර තිබෙනවා. ඒක හොඳයි. ඒක හොඳ දෙයක්. මා කියන්නට හදන්නේ, ඊට වඩා කරන්නට ආණ්ඩුවට හැකියාවක් නැහැ කියන එකයි. [බාධා කිරීම්] මොකද, ඇත්ත වශයෙන්ම බලන්න, 2011 අය වැය ඇස්තමේන්තුවේ ආණ්ඩුවේ බදු ආදායම ගරු සභාපතිතුමනි, කෝටි 82,700යි. ඒ, බදු ආදායම. ඊට පස්සේ Galle Face එක විකුණලා, ඒවාගේ ඔක්කොම දේවල් කරලා තව බිලියන 121 හොයා ගන්නවා. එතකොට මුළු ආදායම බිලියන 962යි; කෝටි 96,200යි. වර්තන වියදම් බලන්න. ඒ කියන්නේ එදිනෙදා ජීවත් වෙන්න අපට කොච්චර ඕනෑද? පඩිය හම්බු වෙනවා. එදිනෙදා ජීවත් වන්නට ඕනෑ. එදිනෙදා ජීවත් වෙන්න අපට වර්තන වියදම් පමණක් ගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළ අය වැය ලේඛනයේ තිබෙනවා, රුපියල් කෝටි එක් ලක්ෂ එක් දහස් හාරසියයක් ඕනෑය කියා. එතකොට අපට හම්බ වෙන්නේ රුපියල් කෝටි අනූහය දහස් දෙසියයි. අපට ඕනෑ කරනවා, කෝටි එක් ලක්ෂ එක් දහස් හාර සියයක්. ඒකෙන් පොලිය විතරක් රුපියල් කෝටි තිස්පන් දහස් පන්සියයි. පඩි නඩි විතරක් කෝටි තිස් හතර දහස් හාර සියයක්. [බාධා කිරීම්] Pensionsවලට කෝටි දහ දාහයි. ඒ කියන්නේ එදිනෙදා ජීවත් වන්නට අපට අවශ්‍ය තරම් මුදල් නැහැ. මීට අමතරව ගරු සභාපතිතුමනි. පොලී වාරිකය ඒ කියන්නේ capital එක ගෙවන්නට තිබෙනවා, රුපියල් කෝටි පණස්පන් දාහක්. රුපියල් කෝටි පණස්පන් දාහක් වාරිකයට විතරක් ගෙවන්නට ඕනෑ. එම නිසා රජයට කළ හැකි ආයෝජන කරන්නේ හැම ශතයම ණයට අරගෙන. හැම ශතයම ණයට අරගෙන තමයි මේ ආයෝජන කරන්නේ. කවුරුත් මා කියන දෙය පිළිගන්නෙ නැහැ කියා මම හිතන්නේ නැහැ. [බාධා කිරීම්]එහෙම ආයෝජනය කරනවා නම්, ඒවා ගැන අප ඉතාමත් හොඳට කල්පනාකොට කරන්නට ඕනෑ. ඒ ආයෝජනවලින් අපට ප්‍රතිලාභ ලැබෙන ඒවා විතරක් කරන්නට ඕනෑ. එම නිසා තමයි අපට අවශ්‍ය වෙන්නේ, එතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන ආයෝජන ප්‍රවර්ධනය. මොකක් ද ප්‍රතිඵලය? [බාධා කිරීම්]

දැන් බලන්න, 2009 ජූනි මාසයේ එවකට BOI එකේ සිටිය සභාපති, ධම්මික පෙරේරා මහතා, "Bloomberg" එකත් එක්ක කළ සම්මුඛ සාකච්ඡාවේදී කියන්නේ මොකක්ද කියා. “Sri Lanka expects foreign direct investment to more than quadruple, to US Dollars 4 billion by 2012 ...” ඒ කියන්නේ ලබන අවුරුද්ද වෙනකොට ඇමෙරිකන් ඩොලර් බිලියන 04ක් බලාපොරොත්තු වෙනවාය කියනවා. ඒ කෙසේ වෙතත්, මම දන්නවා මෙන්න මේ කාරණය. ආණ්ඩුව කිව්වා, අපට බිලියන එකක් හෝ ගන්න පුළුවන් වෙනවාය කියා. දැනට ඇවිල්ලා නැහැ. 2011 පැමිණෙයි කියා මා ප්‍රාර්ථනා කරනවා. 2008 වර්ෂයේ ලැබුණේ මිලියන 889යි; 2009 මිලියන 601යි; 2010 මිලියන 516යි. මේවා ඔක්කොම ඇමෙරිකන් ඩොලර්ස්. මම පිළිගන්නවා, 2011 පළමුවන මාස හයට ඩොලර් මිලියන 413ක් ඇවිත් තිබෙනවා කියා. මේ සල්ලි ඇවිත් තියෙන්නේ කොහෙන්ද කියා මම සොයා බැලුවා. [බාධා කිරීම්] ඇත්ත වශයෙන්ම මොන අංශවලට ද මේ ආයෝජන එන්නේ කියන එක අප දැන ගන්න එක හොඳයි. මේවා ඔක්කොම කියන්නේ ඩොලර් මිලියනවලින්. බලන්න, ඇඟලුම් අංශයට ඇවිත් තිබෙනවා, ඩොලර් මිලියන 72ක්. 2009 වර්ෂයේදී ඩොලර් මිලියන 51ට අඩු වෙලා තිබෙනවා. 2010 නැවතත් අඩු වෙලා තිබෙනවා, ඩොලර් මිලියන 37ට. ඒක හොඳ දෙයක් නොවෙයි. [බාධා කිරීම්] ඇත්ත වශයෙන්ම රක්ෂා දීලා විදේශ විනිමය සොයා ගන්නේ ඇඟලුම් කර්මාන්තයෙන්. ඇඟලුම් කර්මාන්තයේ ආයෝජන අවුරුදු දෙකක් ඇතුළත මේ විධියට සියයට පණහකින් අඩු වෙලා තිබෙනවා නම් ඒක හොඳ දෙයක් නොවෙයි කියන එක මම මේ ගරු සභාවට ඉතාමත් අවධාරණයෙන් කියන්න කැමැතියි.

අනෙක් එක තමයි telecommunication ; විදුලි සන්දේශ. එතැන බලන්න, 2008 ඇමෙරිකන් ඩොලර් මිලියන 888ක් ආපු වෙලාවේ 553ක්ම ඇවිත් තිබෙන්නේ දුරකථන ක්ෂේත්‍රයෙන්. ඒක 2009 ඩොලර් මිලියන 296ට අඩු වෙලා තිබෙනවා. ඊළඟට, ඒක 2010 දී ඩොලර් මිලයන 205ට අඩු වෙලා තිබෙනවා. ඇඟලුම් අංශයෙනුයි විදුලි සන්දේශ අංශයෙනුයි තමයි ප්‍රධාන ආයෝජන ගලා ගෙන එන්නේ. ඒවා අඩු වෙනවා නම් එතැන ප්‍රශ්නයක් තිබෙනවාය කියන එක ඔබතුමන්ලා කල්පනා කර බලන්නය කියායි මා මේ කියන්නේ. [බාධා කිරීම්]මේ මාස හයට මෙච්චර ගණනක් ආවේ කොහොමද කියා අපි බලමු. ඒක වැදගත්. අප

[ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා]

සොයා බැලුවා. සොයා බැලුවාම ප්‍රධාන වශයෙන් කියන්න ලැබුණා, ඩොලර් මිලියන 189ක් ලැබී තිබෙනවාය කියලා. [බාධා කිරීමක්]

මම කලින් කිව්වා වාගේ මම හොයලා බැලුවා කොහෙන්ද, කවුද මේවා ගෙනැල්ලා තිබෙන්නේ කියලා. මා ළඟ ඒ විස්තර තිබෙනවා. නැවතත් මේක දීලා තිබෙන්නේ Reuters එකට. එවකට BOI එකේ හිටපු Chairman ජයම්පති බණ්ඩාරනායක මහත්මයා. එතුමා කියනවා: “The strong performance was helped by investments in the dynamic tourism sector, which accounted for US Dollars 132 million. The major contributor has been luxury Shangri-La Hotels Lanka Limited, subsidiary of Hong Kong”. මම කියන්නේ නැහැ මේකේ හොඳ, නරක. මම පෙන්වන්න හදන්නේ මේ ෂැන්ග්‍රි-ලා හෝටලයේ තවම board එක විතරයි තිබෙන්නේ කියලායි. තවම foundation එකවත් කපලා තියෙනවා අපි දැක්කේ නැහැ. [බාධා කිරීමක්] මම නම් දැක්කේ නැහැ. මම ඒ පැත්තෙන් යනවා එනවා. මම නම් දැක්කේ නැහැ. එක පස් පිඩැල්ලක්වත් තවම කපලා නැහැ. එහෙම නම් කොහෙන්ද මේ සල්ලි හම්බ වෙලා තිබෙන්නේ? මේ සල්ලි හම්බ වෙලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, Galle Face එක විකුණලා. Galle Face එක විකුණලා ලැබුණු සල්ලි ආයෝජන ප්‍රවර්ධනය කියන එක කොච්චර සදාචාරාත්මකද කියලා මම ගරු සභාවෙන් ප්‍රශ්න කරනවා. අපිට පුළුවන් ඕනෑ දෙයක් විකුණන්න. මේ පාර්ලිමේන්තුව වීනෙක්ට හෝ කාට හරි විකුණලා අපිට කියන්න පුළුවන්, "මෙන්න අපි ගෙනාවා ආයෝජන" කියලා. එහෙම නොවෙයි ආයෝජන කියන්නේ. ඇත්ත වශයෙන්ම ආයෝජන කියන්නේ ගෙනැල්ලා business එකක් පටන් ගන්නවා නම් ඒකට අදාළව කරන ඒවාට. ඇත්ත වශයෙන්ම එහෙම නම් කෝ ආයෝජකයෝ? මේක හොඳ දෙයක්. මම අවසන් කරන්න ලැස්ති වෙනවා. ආයෝජකයෝ කෝ?

**ගරු එච්. ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச். ஆர். மித்ரபால )
(The Hon. H.R. Mithrapala)
සිංහරාජය, සීගිරිය විකුණන්න ගියා මතක නැද්ද? [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
දැන් බලන්න ඇත්ත වශයෙන්ම කෝ ඒ ආයෝජකයෝ? [බාධා කිරීම්] දැන් මම බැලුවා ආයෝජකයෝ කොහේද ගිහිල්ලා තිබෙන්නේ කියලා. බිලියන 4ක් ගෙනෙන්න ඕනෑ ආයෝජකයන්ගෙන් දැනට සියයට 10ක්, මිලියන 400ක් ගෙනැල්ලා තිබෙනවා. එහෙම නම් කොහේද මේ ආයෝජකයෝ ගියේ? හොයලා බලන කොට කොහේද ගිහිල්ලා තිබෙන්නේ ගරු සභාපතිතුමනි, වියට්නාමයට ගිහිල්ලා. ඒ ගොල්ලෝ මේ අවුරුද්දේ පළමුවැනි මාස 11ට ඇමෙරිකන් ඩොලර් බිලියන 12.7ක් සෘජු විදේශ ආයෝජකයෝ හැටියට ආයෝජනය කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේක දැන ගන්න එක හොඳයි ගරු සභාපතිතුමනි. අපි කවුරුත් ඉගෙන ගන්න ඕනෑ. ආර්ථික ප්‍රතිසංස්කරණ පටන් ගත්තේ වියට්නාමයේ 1986දී. එදායින් පස්සේ වියට්නාමයට ඇමෙරිකන් ඩොලර් බිලියන 200ක් එන්න පොරොන්දු වෙලා තිබෙනවා. හරි, අපි පිළිගන්නවා පොරොන්දු වන හැම දේම එන්නේ නැහැ කියලා. බිලියන 200ක් පොරොන්දු වෙලා තිබෙනවා. නමුත් බිලියන 100කට ආසන්න ප්‍රමාණයක් ඇවිල්ලා තිබෙනවා රටවල් 92කින්. මම අහන්න කැමැතියි ලංකාවට විදේශ ආයෝජන ගලා ගෙන ඇවිල්ලා තිබෙන්නේ රටවල් කීයකින්ද කියලා. වියට්නාමයට රටවල් 92කින්. මෙන්න අහ ගන්න ගරු සභාපතිතුමනි, පළමුවැනි රටවල් 5. තායිවානය පොරොන්දු වෙලා තිබෙනවා ඇමෙරිකන්ඩොලර් බිලියන 23ක්; ඇවිල්ලා තිබෙනවා 10ක්. සිංගප්පූරුව ඇමෙරිකන් ඩොලර් බිලියන 22ක්; ඇවිල්ලා තිබෙනවා 07ක්. කොරියාව ඇමෙරිකන් ඩොලර් බිලියන 22ක්; ඇවිල්ලා තිබෙනවා 07ක්. ජපානය ඇමෙරිකන් ඩොලර් බිලියන 21ක්; ඇවිල්ලා තිබෙනවා 06ක්. මැලේසියාව ඇමෙරිකන් ඩොලර් බිලියන 19ක්; ඇවිල්ලා තිබෙනවා 04ක්. වියට්නාමය ඇමෙරිකාවත් එක්ක කාලයක් තිස්සේ සටන් කළා. නමුත් හත්වැනි ස්ථානයට කවුද වියට්නාමයට සෘජු විදේශ ආයෝජන ගෙනෙන්නේ ගරු සභාපතිතුමනි? ඇමෙරිකාව. ඇමෙරිකාව පොරොන්දු වෙලා තිබෙනවා ඩොලර් බිලියන 13ක්.

මම හොයලා බැලුවා ලංකාවෙනුත් ගිහිල්ලා තිබෙනවාද කියලා වියට්නාමයට ආයෝජනය කරන්න කියලා. ගිහිල්ලා තිබෙනවා ගරු සභාපතිතුමනි. 65 වන ස්ථානයට ඉන්නේ ලංකාව. ශ්‍රී ලංකාව වියට්නාමයට ආයෝජන පොරොන්දු වෙලා තිබෙනවා ඇමෙරිකන් ඩොලර් මිලියන 14ක්. ඒකෙන් දැනට ඇමෙරිකන් ඩොලර් මිලියන 6.9ක් මේ ශ්‍රී ලංකාවෙන් ගිහිල්ලා ආයෝජනය කරලා තිබෙනවා වියට්නාමයට. මම හිතන හැටියට මේකට හේතුව මොකක්ද කියලා ඔබතුමා දන්නවා. වියට්නාමයේ ජනාධිපති Truong Tan Sang මහත්මයා ලංකාවට ආවා දැනට මාස දෙකකට හෝ තුනකට කලින්. ඔබතුමා සම්භාෂණයකුත් පැවැත්වූවා එතුමාට. එතුමා interview එකක් දීලා තිබෙනවා ETV කියන television station එකට.

I will read it in English because he spoke in English. Giving an interview to the ETV, he talks on the secret of attracting foreign direct investment to Vietnam. This is what he says: “We must always deliver on our commitments and promises to our investors”. It is a very serious thing. He goes on to say: "We must ensure a liberal business and investment environment so that they may come”.

Sir, the Ministry of Economic Development is doing the complete opposite of it. I am actually saddened by this. They have broken all promises given to investors. We saw in this House how promises were broken overnight without giving any opportunity to the investors even to argue their case. During the Committee Stage of the Revival of Underperforming Enterprises and Underutilized Assets Bill, I proposed an amendment. -[*Interruption.*] I said, please give these people 30 days to submit a restructuring plan. Even that, they did not do. So, they broke all agreements.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
ඔබතුමාගේ කාලය අවසානයි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ගරු සභාපතිතුමනි, විනාඩි 2ක් දෙන්න.

BOI එකත් එක්ක ගහපු agreements මා ළඟ තිබෙනවා. BOI එකත් එක්ක ගහපු agreements ඔක්කොම කැඩුවා. සිංගප්පූරු ආයෝජකයෙක් ඉන්නවා බේරේ වැව ළඟ. එතැන කැසිනෝ එකක් දමන්න හදනවා. කවුද කියා මා නම කියන්නේ නැහැ. ඒ කැසිනෝ එක දමන්න ඒ සිංගප්පූරු කොම්පැනිය පයින්

ගහලා එලවා දැම්මා. ඒ සිංගප්පූරු කොම්පැනියේ BOT - Build, Operate and Transfer - එකක් තිබුණා. ඒකේ තව අවුරුදු හතක් ඉතුරු වෙලා තිබුණා. වෙලාව ඉවර නිසා ගරු සභාපතිතුමනි, මා කථාව අවසන් කරන්නම්. එහෙම නම් -

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විනාඩි 5ක් දෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Thank you. විනාඩි 2ක් ඇති.

The irony of it is that the expropriations were promoted by the Ministry of Economic Development. මේක වෙන කවුරු හෝ කිව්වා නම් කමක් නැහැ. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත් කෙටුම්පත - Expropriation Bill - විවාද කරන අවස්ථාවේදී දේශීය ආයතන විදේශ ආයතන පවරා ගැනීම ගැන ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා තමයි වැඩිපුරම මේ ගරු සභාවේ කථා කළේ. එතැනයි පරස්පරය තිබෙන්නේ. ඒක තමයි අපේ කබීර් හාෂීම් මන්ත්‍රීතුමා ඇහුවේ. යන්නේ කොහේද කියලා ඇහුවාම, "මල්ලේ පොල්" කියනවා. There is inconsistency in policy. ප්‍රතිපත්තිවල අසංගතයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ලස්සන වචන set එකක් තිබෙනවා. ඒක මා කියෙව්වා. ලස්සන වචන set එකක් තිබෙනවා. ඒක BT Options එකට දෙනවා. BT Options එකට දුන්නාම මිලියන කීයක් හරි අරගෙන ඒක ලස්සනට පොත්වලට ගහලා පින්තූර දමලා glossy papersවල ගහලා marketing කරනවා. නමුත් අවසානයේ මොකද වෙලා තිබෙන්නේ? ආර්ථික වර්ධනයත් නැහැ; ඒ ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ බෙදී යන්නෙත් නැහැ. කාල්ටන් පන්තියට රජ සැප. සාමාන්‍ය ජනතාවට දහ දුක. මගේ මිත්‍ර කබීර් හාෂීම් මන්ත්‍රීතුමා කිව්වා නේ කොළඹ කොල්ලන්ට ලැම්බෝගිනි, ගමේ කොල්ලන්ට බඩගිනි කියා. මා හිතන විධියට ඒ කථාව කවුරු කවුරුත් පිළිගන්නවා.

ගරු සභාපතිතුමනි, මගේ කථාව අවසාන කරනවා. ආර්ථික පෙරලියක් කරන්න තමයි මේ අමාත්‍යාංශය ස්ථාපිත කළේ කියලා කිව්වා. නමුත් ආර්ථික පෙරලියක් කරලාද නැත්නම් ආර්ථිකය පෙරලාගෙන ගිහින්ද කියා අහමින්, මට වෙලාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

[පූ.භා. 11.33]

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. Tissa Karalliyadde - Minister of Child Development and Women's Affairs)
ගරු සභාපතිතුමනි, මා පළමු වෙන්ම ස්තුතිවන්ත වනවා, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව. ඒ වාගේම අපේ හිතවත් ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසු අදහස් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳවත් මා සතුටු වනවා. මේ අවස්ථාවේදී එතුමාට ගණන් හිලවු වචන එහෙම ටිකක් පැටලුණා කියා මා හිතනවා. බුද්ධිය වැඩි වුණාමත් ඔය වාගේ පටලැවිලි සිදු වනවා.

අපි නිරන්තරයෙන්ම සාධාරණ විවේචනවලට ඇහුම්කන් දීලා නිවැරදි ගමනක් යන්න උත්සාහ කරන මොහොතක් මේ. විවිධ යුගයන්වලදී විශාල වශයෙන් ජනතාවට පොරොන්දු ලබා දුන්නා. ප්‍රධාන පක්ෂ දෙකම පොරොන්දු ලබා දුන් යුගයන් තිබුණා. අපට මතකයි, එක කාලයක කිව්වා, "හඳෙන් හරි හාල් ගෙනත් දෙනවා" කියා. ඒකත් ජනතාව පිළිගත්තා. ඉන් පසු ධාන්‍ය රාත්තල් අටක් - ඇට අටක්- දෙනවා කියා ඇඟ පත පුරාම තිබුණු ඇට ටික කුඩු කර ගත්තු යුගයකුත් තිබුණු බව අපට අමතක කරන්න බැහැ. අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා 2012 වර්ෂයේ අය වැය මේ උත්තරීතර සභාවේ ඉදිරිපත් කරද්දී, ඒ කථාවේ එක් තැනකදී ප්‍රකාශ කර තිබෙනවා, "ඉදිරියේදී ඇති විය හැකි ලෝක ආහාර හිඟයට මුහුණ දීමට හැකි වන පරිදි අපි සමාජය හැඩ ගැන්වීම අවශ්‍යයි. කුකුළන් ඇති කිරීම, පශු සම්පත්, එළවලු හා පලතුරු වර්ග වගාව යනාදිය මඟින් නිසි පරිදි ආහාර සැපයීම කර ගත හැකි වනවා" කියා.

**සභාපතිතුමා**
(தவிசாளர் அவர்கள்)
(The Chairman)
Order, please! මේ අවස්ථාවේදී නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR ] *took the Chair.*

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එබැවින් ජාතික ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය හරහා ගෙවතු දස ලක්ෂයක් ඇති කිරීමට යෝජනා කරනවා කියලා එතුමා එදා ප්‍රකාශ කළා.

වර්ෂ 2016 වන විට ජීවනෝපාය හා සමාජ සංවර්ධනය තුළින් සම්පත් පිරුණු සමාජයක්, සමෘද්ධිමත් ගමක් නිර්මාණය කිරීම අතිගරු ජනාධිපතිතුමාගේ අරමුණ වෙලා තිබෙනවා. මෙවැනි යෝජනාවක් අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කළේ පසු ගිය දශක කිහිපය තුළ මෙරට සමාජ සංස්කෘතික ව්‍යුහය තුළ සිදු වී ඇති පරිවර්තනයන් නිසා පවුල තුළ දෛනික ආහාර පුරුදු හා පරිභෝජන රටාවේ සිදු වී ඇති වෙනස්කම් හේතුවෙන් සමස්ත ජනගහනයේම නිරෝගී පැවැත්මට හා පෝෂණයට ඒ තුළින් විශාල බලපෑමක් එල්ල විය හැකි බැවිනුයි.

අතීත සමාජය තුළ සෑම පවුලක්ම අවට පරිසරයෙන් බොහෝ පෝෂ්‍යදායී හා සෞඛ්‍ය ආරක්ෂිත ආහාර බෝග සපයා ගෙන ඒවා භාවිතයට ගැනීමටත්, ඉතිරිය නැවත ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි සුරක්ෂිත කර ගැනීමටත් පුරුදු වී සිටියා. මෙය සම්ප්‍රදායික ක්‍රමයක් ලෙස අද බොහෝ දෙනා බැහැර කළත් ඒවා ස්වභාවයෙන්ම අපට උරුම වූ හිමිකම් බව කියන්නට කැමැතියි.

මෙම තත්ත්වය යළි ඇති කර ගැනීම සඳහාත්, නව සමාජයට ගැළපෙන අයුරින් පවත්වා ගෙන යෑම සඳහාත්, ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහාත් නව දැක්මකින් යුත් ජාතික මට්ටමේ වැඩ පිළිවෙළක් ජනතාවට හඳුන්වා දීමේ අවශ්‍යතාව ජනාධිපතිතුමා පෙන්වා දුන්නා.

මේ සඳහා යෝජනා වූ වැඩ පිළිවෙළ වඩාත් අර්ථවත් පුළුල් වැඩසටහනක් ලෙස "දිවි නැගුම" නමින් ස්ථාපිත වුණා. ග්‍රාම

[ගරු තිස්ස කරල්ලියද්ද මහතා]

නිලධාරි වසම් 14,000ක් ඇතුළත්ව ජාතික මට්ටමේ පුළුල් වැඩසටහනක් ලෙස මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වීමේදී ඒ සඳහා ශක්තිමත් ජාතික සංවර්ධන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතු නිසා එය ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය භාරයක් බවට පත් කළා. අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා අද එය අපේක්ෂිත ප්‍රතිඵල නෙළා ගැනීමේ මාර්ගයට යොමු කර තිබෙනවා.

මෙම දිවි නැඟුම වැඩසටහන කෘෂිකර්ම, පශු සම්පත්, ධීවර කටයුතු, කර්මාන්ත හා වාණිජ, සෞඛ්‍ය සහ පෝෂණ වැනි ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කරමින් නිර්මාණය වූවක්. නමුත් මෙම විෂය ක්ෂේත්‍රයන් මුල් කර ගත් අමාත්‍යාංශ ගණනාවක් අපට තිබෙනවා. කෘෂිකර්ම, වැවිලි කර්මාන්ත, සුළු අපනයන බෝග, වනජීවී, වාරිමාර්ග, පොල් සංවර්ධන, පරිසර, සෞඛ්‍ය, දේශීය වෛද්‍ය යන විෂය ක්ෂේත්‍රයනුත් පශු සම්පත්, ධීවර, කර්මාන්ත, තාක්ෂණ හා පර්යේෂණ, යෞවන කටයුතු වැනි විෂය ක්ෂේත්‍රයනුත් නියෝජනය වන අමාත්‍යාංශ 17ක් යටතේ මෙම වැඩසටහනට ඇතුළත් විෂය කටයුතු සිදු කරනවා. මෙතරම් අමාත්‍යාංශ ගණනාවක් තිබුණත් මීට පෙර කී අප අතීතයේ දුටු ඒ සමෘද්ධිමත් පවුල, ගම අද දකින්නට නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එසේ සිදු වූයේ නව ගෘහ ආර්ථික සහ සමාජ ක්‍රමයකට අප යොමු වී ඇති නිසායි. අද නිර්මාණය වී තිබෙන ගෘහ ආර්ථික ක්‍රමයෙන් මිදෙන්නට ජනතාව පෙළඹවිය හැක්කේ එම ක්‍රමය නව නිර්මාණාත්මක සැලැස්මකට අනුව පරිවර්තනය කළහොත් පමණයි.

දිවි නැඟුම වැඩසටහන සඳහා ජාතික මට්ටමේ පිළිගැනීමක් ඇති කරමින් බිම් මට්ටමේ වැඩසටහනක් ලෙස නිර්මාණය වීම හේතුවෙන් එය ජනතාව ඉතා ඉහළින් පිළිගත්තා. ඒ සඳහා ජනතා සහභාගිත්වයද ඉතා ඉහළ මට්ටමකින් ලැබී තිබෙනවා.

ජනතාවගේ එදිනෙදා අවශ්‍යතා සඳහා භාවිත වන පාරිභෝගික භාණ්ඩවල මිල ඉහළ යන එක ගැන අප නිතර නිතර මේ පාර්ලිමේන්තුවේදී කථා කරනවා. මිරිස් කරලේ සිට එළවලු, පලතුරු, පලා මිටිය දක්වා දිනපතා සිදු වන මිල ඉහළ යෑම් ගැන කථා කරනවා. ඒ සමඟම ගොවීන්ට සහ නිෂ්පාදකයන්ට දෙන සහන පිළිබඳවත් කථා කරනවා. නමුත් මේ රටේ ජනතාවගේ ගෙදර ප්‍රශ්න, මුළුතැන්ගෙයි ප්‍රශ්න විසඳී නැහැ. අද මේ සියල්ල සිදු වන්නේ වෙළෙඳ පොළ ක්‍රමයකට අනුවයි. අපේ සාම්ප්‍රදායික කුස්සියත් මේ වෙළෙඳ පොළ ක්‍රමයට හසු වෙලා. අන්න ඒ නිසා තමයි නිවසට අවශ්‍ය එළවලු ටික, පලතුරු ටික හා වෙනත් අවශ්‍ය බෝග හා කුළු බඩු ටික තමන්ගේ ගෙවත්තෙන්ම ලබා ගන්නා ක්‍රමයකට අපට පුරුදු වෙන්න අවශ්‍ය වෙලා තිබෙන්නේ. දිවි නැඟුම වැඩසටහනේ අරමුණ එයයි. දිවි නැඟුම වැඩසටහන ආරම්භ කළ අවස්ථාවේ සිට සාර්ථක ප්‍රතිඵල ලබා ගත්තා. ග්‍රාමීය මට්ටමේ පහළම නිලධාරියාගේ සිට දිස්ත්‍රික් ලේකම්වරයා දක්වා සහභාගි කරවා ගෙන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනවා. පසු ගිය වර්ෂයේ ඒ සඳහා රුපියල් මිලියන 8,261ක් වෙන් කළා. මේ වසරේ ඒ සඳහා රුපියල් මිලියන 6,875ක් වෙන් කර තිබෙනවා.

සමෘද්ධි ව්‍යාපාරය මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ වීමෙන් ගම් මට්ටමේ සංවර්ධන යාන්ත්‍රණය යළි පණ ගන්වන්නට හැකි වුණා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සමෘද්ධි ව්‍යාපාරය මඟින් ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 6,515ක් 2012 වර්ෂය සඳහා වෙන් කර තිබෙනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන සංවර්ධන ව්‍යාපෘති අතර දිවි නැඟුම වැඩසටහන මා විශේෂ කොට සඳහන් කළේ මා නියෝජනය කරන ඇත පිටිසර ගම්දනාවුවල ජනතාවට එය වඩාත් සමීප වූ නිසායි. ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශ විෂය ක්ෂේත්‍රයට මෙය සම්බන්ධතා දක්වනවා. විශේෂයෙන්ම ගෘහ මූලික කාන්තාවන් සිටින පවුල්, වැන්දඹු කාන්තාව හා ආර්ථික අතින් දුෂ්කරතා මැද දිවි ගෙවන පවුල් නඟා සිටුවීම සඳහා ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයෙන්ද විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඒ වැඩසටහන් අතර කාන්තාවන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ක්‍රියාත්මක කරන ව්‍යාපෘති අතර ගෙවතු වගා සහ සත්ව පාලන වැඩසටහන්, ගෘහ ආශ්‍රිත කුඩා කර්මාන්ත ආදිය ඇතුළත්.

විශේෂයෙන්ම පවුලක ස්වාමියා උත්පාදකයාවූ විට බිරිඳ ගෘහ කළමනාකාරිණිය වනවා. එහිදී කාන්තාවට ද පවුලේ ආර්ථික වර්ධනය වෙනුවෙන් දායකත්වයක් සැපයිය හැකියි. ඒ සඳහා කාන්තාවගේ දායකත්වය සපයා දිය යුතු ආකාරය පිළිබඳව අපේ අමාත්‍යාංශයෙන් කාන්තාවන්ට දෙන පණිවුඩය මෙම දිවි නැඟුම වැඩසටහන හා සමෘද්ධි සංවර්ධන වැඩසටහන් තුළ අන්තර්ගත වී තිබෙනවා.

ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශයේ විෂය පථයට ඇතුළත්ව තිබෙන ළමා සංවර්ධන කටයුතු තුළ පූර්ව ළමා විය සංවර්ධනය විශේෂ තැනක් ගන්නවා. අප අමාත්‍යාංශය යටතේ තිබෙන ළමා ලේකම් කාර්යාලය, වයස අවුරුදු 5 දක්වා දරුවන්ගේ කටයුතු ගැන සොයා බලන ආයතනයක්. එම නිසා පෙර පාසල් අධ්‍යාපනය ගැන අවශ්‍ය කටයුතු සොයා බැලීම් කරනවා. පූර්ව ළමා විය සම්බන්ධ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති සැකසීම හා තීරණ ගැනීම, ප්‍රමිතීන් නිර්මාණය කිරීම තමයි මෙම ලේකම් කාර්යාලය තුළින් සිද්ධ වන්නේ. එහිදී ගන්නා තීරණ ක්‍රියාත්මක වන්නේ බොහෝ දුරට පළාත් සභා හා පළාත් පාලන ආයතන හරහායි. සෑම ගමකම අද පෙර පාසලක් දකින්න තිබෙනවා. අප අමාත්‍යාංශයට මේ පෙර පාසල් සඳහා ගොඩනැඟිලි හදා දෙන්න මුදල් ටිකක් දෙන්න පුළුවන්කමක් නැහැ. නමුත් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගම සවිබල ගැන්වීමේ වැඩ පිළිවෙළ යටතේ ඒ සඳහා ආධාර අනුබල ලබා දෙන්න හැකියාව තිබෙනවා. පසු ගිය වර්ෂයේ ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල් සංවර්ධනයට රුපියල් මිලියන 200ක් වෙන් කළා. ඒ තුළින් ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යාංශය යටතේ තිබෙන පෙර පාසල් විෂය ක්ෂේත්‍රය නඟා සිටුවීමට ලැබෙන රුකුල හා ශක්තිය මා විශේෂයෙන් සඳහන් කළ යුතුයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Minister, please wind up now.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

It is very difficult to give you more time. Hon. Minister, we have a very tight schedule. You can table the rest of your speech.

**ගරු තිස්ස කරල්ලියද්ද මහතා**
(மாண்புமிகு திஸ்ஸ கரல்லியத்த)
(The Hon. Tissa Karalliyadde)

එහෙම නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කථාවේ ඉතිරි කොටස ඇතුළු මේ සියලු දේ මා **සභාගත*** කරනවා. ඒවා හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්නය කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

***සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி:*
*Rest of the speech tabled:*

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගම සවිබල ගැන්වීමේ වැඩ පිළිවෙළ යටතේ විශේෂයෙන්ම ගම නැඟුම, සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය, ගම්බද පාලම් ඉදි කිරීම්, යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධනය වැනි වැඩසටහන් තුළින්, ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවට ලැබෙන ප්‍රතිලාභ ඉහළයි. දීර්ඝ කාලයක් යුද්ධයෙන් පීඩා විඳි ජනතාවක් ජීවත් වූ ප්‍රදේශයක් ලෙස අනුරාධපුර දිස්ත්‍රික්කයේ මා නියෝජනය කරන ප්‍රදේශවල ජනතාවට මේ තුළින් විශාල අනුබලයක් ලැබෙනවා. උතුරු නැඟෙනහිරත් එසේමයි.

යුද්ධය පැවති කාලයේ ඒ ප්‍රදේශ පුරා පැතිරී තිබුණු අඳුරු ජීවන රටාව හේතුවෙන් ගම්වල ජනතාවගේ සුළු පරිමාණ සංවර්ධන කටයුතු සම්පූර්ණයෙන්ම අඩාළ වුනා. යුද්ධය අවසන් වීමත් සමඟ ජනතාව නව ජීවන රටාවකට යොමු වෙන්න පටන් ගත්තා. යුද්ධය අවසන් වීමෙන් පසු රට තුළ ඇතිවන සංවර්ධන ප්‍රබෝධය ඒ ජනතාවද බලාපොරොත්තුවෙන් සිටියා. මාර්ග, විදුලිය, සෞඛ්‍ය, ප්‍රවාහනය වැනි පහසුකම් ජනතාව ඉල්ලා සිටියා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගම සවිබල ගැන්වීමේ වැඩ සටහන තුළින් මේ සඳහා අනුග්‍රහය දක්වමින් විදුලිය ලබා දීම්, මාර්ග ඉදි කිරීම්, සුළු වාරිමාර්ග සංවර්ධන කටයුතු ආදී අවශ්‍ය සේවා රැසක් ඉටු කරගන්න අවස්ථාව ලැබුණා. 2011 වර්ෂයේ ගම් සවිබල ගැන්වීම් වැඩ පිළිවෙළ සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 23,822ක් වූ අතර මෙම සංවර්ධන වැඩ පිළිවෙළ ඉදිරියටත් ගෙන යන්න අතිගරු ජනාධිපතිතුමන් ගම සවිබල ගැන්වීමේ වැඩ පිළිවෙළට මේ වසරේ රුපියල් මිලියන 27,738ක් වෙන් කර තිබෙනවා.

රජ රට නවෝදය වැඩ සටහන තුළින් රජ රට ජනතාවට ලැබුණු විශාල අනුග්‍රහය මෙන්ම උතුරු වසන්තය, "රුහුණු උදානය", "නැඟෙනහිර නවෝදය", "පුබුදමු වෙල්ලස්ස", "සබරගමු අරුණාලෝකය", "වයඹ පුබුදුව", "කඳුරට උදානය", "බටහිර රන් අරුණ" ආදී ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති තුළින්ද රට පුරාම ජනතාවට විශාල වශයෙන් වරප්‍රසාද ලැබෙනවා.

මෙම සංවර්ධන ව්‍යාපෘතිවල විශේෂත්වයක් තිබෙනවා. එය නම් මේ සඳහා දේශපාලන පාට, පක්ෂ තෝරා බේරා ගෙන ප්‍රතිලාභ ලබා නොදීමයි. කිසිම දේශපාලන භේදයක් නොමැතිව සියලු වරප්‍රසාද ජනතාව වෙත ගලා යනවා. ජනතාවට යම් වරප්‍රසාදයක් ලබා දෙන විට ගමේ දේශපාලන ශාඛා සමිතියෙන් සුදුස්සන් තේරීමේ ක්‍රමවේදයක් මේ රටේ ඉස්සර තිබුණා. ජනසවිය හිමිකම් ලබා දෙන විට ශාඛා සමිතියේ සාමාජිකයෙක්ද කියලා බැලුවා. ඒ යුගය දැන් අවසන්. රටක සංවර්ධනය සම්පූර්ණ වන්නට නම් ඒ රට ආර්ථික, සාමාජීය හා දේශාපාලන යන අංශ සියල්ලකින්ම සංවර්ධනය විය යුතුයි.

අතිගරු ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් රට තුළ සදාචාර සම්පන්න දේශපාලන රටාවක් බිහි වෙමින් තිබෙනවා. ඒ නිසාම අපේ සාමාජීය හා සංස්කෘතික උරුමයන්ට වටිනාකමක් ලැබෙමින් පවතිනවා. ආර්ථික වශයෙන් රට සංවර්ධනය කිරීමට මේ රටේ සෑම ක්ෂේත්‍රයකටම වගකීමක් තිබෙනවා. රාජ්‍ය, රාජ්‍ය නොවන හා පෞද්ගලික යන අංශ සියල්ලක්ම ඒ සඳහා අත්වැල් බැඳ ගත යුතුයි. ඒ සඳහා නායකත්වය සැපයිය හැකි රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන ආයතනය ලෙස ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට විශාල වගකීමක් පැවරී තිබෙනවා.

මේ වගකීම නිසියාකාරව ඉටු කිරීම සඳහා මෙහි නායකත්වය දෙන ආර්ථික සංවර්ධන අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමා මේ රටේ ගම්දනව්වල අස්සක් මුල්ලක් නෑරම ඇවිදිමින් තම කාර්ය ඉටු කරමින් ඉන්නවා. සෑම විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව පුළුල් දැක්මක් එතුමාට තිබෙනවා. බදු ආදායම්වලින් පමණක්ම රටක් සංවර්ධනය කළ නොහැකි බව හඳුනා ගත් රජය රාජ්‍ය ව්‍යවසාය ක්ෂේත්‍රයේ විදේශ ආයෝජන, සංචාරක කර්මාන්තය හා වෙනත් ආදායම් උත්පාදන විෂය ක්‍රියාත්මක කළ හැකි සෘජු නායකත්වයක් වෙත අමාත්‍යාංශයේ වගකීම භාරදී තිබෙනවා.

සමෘද්ධි නිලධාරින් ස්ථිර කර දීමට කටයුතු කිරීම ගැන අතිගරු ජනාධිපතිතුමාට හා ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාට අප ස්තුති කරනවා.

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය භාරය**

- දුප්පත්කම තුරන් කිරීම, සංචාරක කර්මාන්තය, විදේශ ආයෝජන, ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන කටයුතුවලට අදාළ ව්‍යාපෘති සකස් කිරීම හා
- ප්‍රජා මූල ජීවන උපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- විමධ්‍යගත අය වැය ක්‍රියාත්මක කිරීම.
- සංචාරක ආයතන ලියාපදිංචි කිරීම.
- කළමනාකරණය සහ සම්බන්ධ කටයුතු කිරීම.
- සත්වෝද්‍යාන, උද්භිද උද්‍යාන සහ ඒවා සංවර්ධනය කිරීම.
- විදේශ ආයෝජන ප්‍රවර්ධනය.

| **2012 වර්ෂය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන** | **2011 වර්ෂය** | **2012 වර්ෂය** |
|---|---|---|
| ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන | රුපියල් මිලියන 65,358 | රුපියල් මිලියන 86,024 |

01. **ගෘහ ආර්ථික සංවර්ධනය**

මේ යටතේ දිවි නැඟුම වැඩසටහන, සමෘද්ධි අධිකාරිය ක්‍රියාත්මකයි.

| | **2011 වර්ෂය** | **2012 වර්ෂය** |
|---|---|---|
| · දිවි නැඟුම වැඩසටහන | මිලියන 8,261 | මිලියන 6,875 |
| · සමෘද්ධි අධිකාරිය | මිලියන 4,400 | මිලියන 6,515 |

02. ගම් සවිබල ගැන්වීම 2011 (මිලියන 23,822) 2012 (මිලියන 27,738)

| | **2011 වර්ෂය** | **2012 වර්ෂය** |
|---|---|---|
| · ගම නැඟුම | මිලියන 6,600 | මිලියන 6,600 |
| · සුළු වාරිමාර්ග පුනරුත්ථාපනය | මිලියන 300 | මිලියන 800 |
| · නිවාස ඉදි කිරීම සඳහා | - | මිලියන 1,200 |
| · ගම්බද පාලම් ඉදි කිරීම | - | මිලියන 2,364 |
| · ග්‍රාමීය ප්‍රදේශවල පෙර පාසල් ඉදි කිරීම සඳහා | මිලියන 200 | මිලියන 200 |
| · විමධ්‍යගත අය වැය | මිලියන 1,125 | මිලියන 1,125 |
| · යටිතල පහසුකම් හා ජීවනෝපාය සංවර්ධනය | මිලියන 1,788 | මිලියන 4,300 |

03. **ප්‍රාදේශීය සංවර්ධනය 2011 (මිලියන 23,523) 2012 (මිලියන 29,616)**

උතුරු වසන්තය, රුහුණු උදානය, රජරට නවෝදය, නැඟෙනහිර නවෝදය, පුබුදමු වෙල්ලස්ස, සබරගමු අරුණාලෝකය, බටහිර රන් අරුණ, වයඹ පුබුදුව, කඳුරට උදානය

04. **අන්තර් ප්‍රදේශ සංවර්ධනය**

- සංවර්ධන කාර්යයන් සඳහා යන්ත්‍රෝපකරණ ලබා ගැනීම.
- අත් හැර දමා තිබෙන රජයේ වත්කම් පුනරුත්ථානය කිරීම.
- අන්තර් ප්‍රදේශ සඳහා පොදු පහසුකම් 2011 (රුපියල් මිලියන 6,094) 2012 (මිලියන 18,214)

| | **2011 වර්ෂය** | **2012 වර්ෂය** |
|---|---|---|
| ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කෙරුණු මුළු මුදල | මිලියන 65,958 | මිලියන 86,024 |

[மு. ப. 11.45]

**ගරු පී. අරියනේත්‍රන් මහතා**
(மாண்புமிகு பா. அரியநேத்திரன்)
(The Hon P. Ariyanethran)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, பொருளாதார அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்திலே தமிழ்த் தேசியக் கூட்டமைப்பின் சார்பில் கலந்துகொண்டு உரையாற்றுவதையிட்டு மகிழ்ச் சியடைகின்றேன். உண்மையில், ஒரு நாட்டின் அபிவிருத்தியின் முதுகெலும்பாகத் திகழ்வது பொருளாதாரம் தான். ஒரு நாட்டின் பொருளாதாரம் நல்ல நிலையில் இருந்தால்தான் அந்த நாட்டின் அபிவிருத்தியும் சரியான முறையில் முன்னேறிச் செல்வதற்கான வாய்ப்பு ஏற்படும். இன்று நாங்கள் வடக்கு, கிழக்கிலுள்ள கிராமங்களை எடுத்துக்கொண்டால், அவை கடந்த யுத்தகாலத்திலே பல்வேறுபட்ட அழிவுகளைச் சந்தித்திருப்பதைக் காணலாம். இப்பொழுது அரசாங்கம், கிராமங்களை அபிவிருத்தி செய்யும் வாய்ப்பிருப்பதாகக் கூறுகின்றது; அது வரவேற்கத்தக்க விடயமாகும். வடக்கு, கிழக்கு மாகாணங்களில் யுத்தத்தினால் சின்னாபின்னமாக்கப்பட்டுள்ள எமது கிராமங்களும் அத்தகைய அபிவிருத்திகளுக்குட்படுமாகவிருந்தால் அது அந்த மக்களுக்கு நிச்சயமாக நல்லதொரு வாய்ப்பாக அமையும்.

சமாதானம் என்றால் என்ன என்பதற்குப் பல வரைவிலக்கணங்கள் கூறப்படுகின்றன. யுத்தம் இல்லாமல் இருப்பதுதான் சமாதானமா? என்றொரு கேள்வி எழுகின்றது. உண்மையிலே யுத்தமில்லாமல் இருப்பது சமாதானம் என்று கூறிவிட முடியாது. ஒரு மனிதனுடைய மனமும் உடலும் அமைதிபெற்று, அவன் மற்றவர்களுடன் புரிந்துணர்வுடன் இருக்கும்பொழுதுதான் உண்மையான சமாதானம் ஏற்பட வாய்ப்பாக அமையும். ஆனால், வடக்கு, கிழக்கிலுள்ள மக்கள் மனமும் உடலும் அமைதி பெறாமல், புரிந்துணர்வற்ற நிலையிலேயே தொடர்ந்தும் இருக்கின்றார்கள். ஆனால், வடக்கு, கிழக்கிலே நல்லிணக்கம் ஏற்பட்டிருக்கிறது என்றும் அந்த நல்லிணக்கத்தின்மூலம் அம்மக்களுக்குச் சமாதானம் கிடைத்திருக்கிறது என்றும் இங்கே கூறுகின்றார்கள். இந்த நாட்டிலே சிங்களவர், தமிழர், முஸ்லிம்கள், பறங்கியர் ஆகிய நான்கு இன மக்கள் வாழ்கின்றனர். இந்த நான்கு இன மக்களும் சமமாக நடத்தப்படுகின்றார்களா என்பதே இன்று எழுந்துள்ள கேள்வி. அவ்வாறு நடத்தப்படாமையினால்தான் வடக்கு, கிழக்கு மாகாணங்களில் வாழ்கின்ற எமது மக்கள் கடந்த 63 வருட காலமாகச் சமாதானம் இல்லாத சூழ்நிலையிலேயே வாழ்ந்து கொண்டிருக்கிறார்கள். யுத்தம் நிறுத்தப்பட்டு 2009 மே மாதம் 19ஆந் திகதியுடன் இரண்டரை வருடங்கள் பூர்த்தியடைந்துள்ளது. ஆயினும், எமது நாட்டின் வடக்கு, கிழக்கு மாகாணங்களின் அபிவிருத்தியையோ, அங்கு யுத்தத்துக்குப் பின்னராக இடம்பெறும் விடயங்களையோ நோக்கும்போது, அல்லது கடந்த பல வருடங்களாகத் தடுத்து வைக்கப்பட்டுள்ள இளைஞர், யுவதிகளின் நிலைமைபற்றி நோக்கும்போது அவை வேதனைக்குரிய விடயங்களாகவே இருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. இதன் அடிப்படையில் எமது மக்கள் இன்று புரிந்துணர்வு இல்லாத சூழ்நிலையிலேயே வாழ்ந்து கொண்டிருக்கின்றார்கள்.

நாட்டை அபிவிருத்தி செய்வதாகக் கூறிக்கொண்டு, வன்னியிலே இறப்பர் செய்கையை மேற்கொள்வதன்மூலமோ, அல்லது மட்டக்களப்பில் கத்தரிச் செய்கையை மேற்கொள் வதன்மூலமோ, அம்பாறையில் புடோல் செய்கையை மேற்கொள்வதன்மூலமோ அல்லது யாழ்ப்பாணத்தில் வெங்காயத்தை உற்பத்தி செய்வதன்மூலமோ திருமலையில் கீரைச் செய்கையில் ஈடுபடுவதன்மூலமோ அந்த அபிவிருத்தியை ஏற்படுத்திவிட முடியாது. நாங்கள் இப்பொழுது 21ஆம் நூற்றாண்டிலே வாழ்ந்து கொண்டிருக்கின்றோம். இந்த 21ஆம் நூற்றாண்டின் கால ஓட்டத்துக்கேற்ப ஒவ்வொரு நாட்டிலும் இருக்கின்ற அரசுகள், அந்த நாட்டிலுள்ள மக்களையும் கிராமங்களையும் அபிவிருத்தி செய்ய வேண்டிய கடப்பாடுடையனவாக இருக்கின்றன. எந்த அரசாங்கமாக இருந்தாலும் ஒரு கிராமத்தைக் கிராமமாகவே வைத்துக்கொண்டு நாட்டை அபிவிருத்தி செய்ய முடியாது. இன்று தகவல் தொழில் நுட்பம்மூலம் உலகமயமாக்கலின் அடிப்படையில் நாடுகள் வளர்ச்சியடைந்து கொண்டிருக்கின்றன. இந்த அரசாங்கம் தான் கிராமங்களை அபிவிருத்தி செய்வதாகக் கூறுவதை நாம் ஏற்கின்றோம். குரங்கு இனத்திலிருந்தே தோன்றிய மனிதன் வளர்ச்சியடைந்து மேலும் முன்னேறி வருகின்றான். அவ்வாறே, நிச்சயமாக கிராமங்களை அபிவிருத்தி செய்வதனூடாக நாட்டை அபிவிருத்தி செய்ய முடியும். அந்தக் கடப்பாட்டை அரசாங்கம்தான் நிறைவேற்ற வேண்டும். "கிராமத்துக்குக் 'கொங்கிறீட்' பாதை கொடுத்திருக்கிறோம்; நகரத்துக்கு 'கார்பட்' பாதை கொடுத்திருக்கிறோம்; அதிவேகப் பாதையை திறந்துவைத்திருக்கிறோம்" என்றெல்லாம் சொல்கிறார்கள். அவை செய்யப்படத்தான் வேண்டும்; அதிலே எந்த மாற்றுக் கருத்தும் இல்லை. நாங்கள் கேட்பது என்னவென்றால், கடந்த காலங்களில் போரினால் பாதிக்கப்பட்ட மக்களின் மனங்களைத் தேற்றுவதற்காக, அவர்களின் வடுக்களை அகற்றுவதற்காக இந்த அரசாங்கம் எவ்வாறான பொருளாதார நடவடிக்கையைச் செய்திருக்கிறது? என்பதைத்தான்.

இங்கு கூறப்பட்ட பல்வேறு அபிவிருத்திப் பணிகளுக்கு மத்தியிலே உல்லாசப் பயணத்துறை பற்றியும் கூறுகிறார்கள். இத்துறையிலே வடக்கு, கிழக்கு நிலைமைகளை எடுத்து நோக்குவோம்! உல்லாசப் பயணத்துறையின் அபிவிருத்தி காரணமாக மன்னார் மாவட்டத்தில் பூர்வீகமாக வாழ்ந்துவரும் தமிழ், முஸ்லிம் மக்கள் மத்தியில் தங்களது குடியிருப்புக்களை இழக்கநேரிடுமோவென்ற ஒரு சந்தேகம் நிலவிக் கொண்டிருக்கின்றது. ஆகவே, உல்லாசத்துறையை முன்னேற்றுகின்ற அதேநேரம், அந்த மக்களின் வாழ்விடங்களும் பாதுகாக்கப்பட வேண்டும் என்பதை நான் இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

கடந்த டிசம்பர் மாதம் நடைபெற்ற வரவு செலவுத் திட்ட விவாதத்திலே நான் உரையாற்றும்போது ஒரு விடயத்தைக் கூறியிருந்தேன். அதாவது, மட்டக்களப்பு மாவட்டத்தில் கல்லடிப் பாலத்திற்கடியில் ஒரு வகையான உயிரினம் மேல்நோக்கி வருகின்றதென்றும் சுனாமிக்கான அல்லது ஏதாவதோர் அனர்த்தத்துக்கான அறிகுறியாக அது இருக்கலாமென்றும் நான் சுட்டிக்காட்டியிருந்தேன். பொருளாதார அபிவிருத்தி அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்கள் அப்பொழுது அந்தக் கூற்றை ஏற்று, அதைப்பற்றி ஆய்வு செய்து அது ஓர் இயற்கை அனர்த்தமொன்றுக்கான அறிகுறியாக இருக்கமுடியாதென்று எங்களுக்கு எழுத்துமூலமாகத் தெரிவித்திருந்தார். ஆனால், அதற்கு பிற்பாடு இருமுறை மட்டக்களப்பு மாவட்டத்தில் பாரிய வெள்ள அனர்த்தம் ஏற்பட்டது. ஆகவே, இவ்வாறான அறிகுறிகள் ஏற்படுகின்றபோது முற்கூட்டியே தேவையான நடவடிக்கைகளை எடுக்கவேண்டிய தார்மீகக் கடமை அரசாங்கத்துக்கு இருக்கிறது. இப்பொழுது நான் கூறவிருப்பதும் அதுபோன்ற ஒரு விடயம்தான். அதாவது, ஐக்கிய நாடுகள் மனித குடியிருப்புத்திட்ட ஆய்வு மையம் மற்றும் மொறட்டுவைப் பல்கலைக்கழக ஆய்வு மையம் என்பன இணைந்து ஓர் அறிக்கையைத் தயாரித்திருக்கின்றன. அதிலே, 2040ஆம் ஆண்டளவில் கடல்நீர் உட்புகுவதன்மூலம் மட்டக்களப்பு மாவட்டத்தில் 20 சதவீதமான நிலப்பரப்பும்

நீர்கொழும்பு பகுதியில் 15 சதவீதமான நிலப்பரப்பும் இல்லாமற்போகின்ற அபாயம் இருப்பதாகத் தெரிவிக்கப்பட்டிருக்கிறது. அவ்வாறான ஓர் அபாயம் ஏற்படுமாக இருந்தால் கல்லடி, நொச்சிமுனை, காத்தான்குடி, குருக்கள்மடம் போன்ற இடங்கள் பாதிக்கப்படக்கூடும். இன்னும் இருப்பது 28 வருடங்கள்! எனவே, பொருளாதார அமைச்சருக்கு இந்த விடயத்திலே ஒரு பங்கு இருக்கிறது; அந்தப் பகுதிகளை எவ்வாறு பாதுகாப்பதென்பதை இப்பொழுதிருந்தே திட்டமிடவேண்டிய தேவை இருக்கிறது. இவ்வாறான எச்சரிக்கைகளை நாங்கள் வெறுமனே ஒரு செய்தியாகப் பார்க்கக்கூடாது. இதிலே அக்கறை காட்டாதிருந்தால், எதிர்காலத்திலே அபாயங்களிலிருந்து மக்களைப் பாதுகாக்க முடியாத சூழ்நிலை ஏற்படும்.

அடுத்து, பாராளுமன்ற உறுப்பினர்களுக்கு ஒதுக்கப்படுகின்ற பன்முகப்படுத்தப்பட்ட வரவு செலவுத்திட்ட நிதியானது பொருளாதார அபிவிருத்தி அமைச்சினூடாகத்தான் வழங்கப்படுகின்றது. உறுப்பினரொருவருக்கு அந்த நிதியிலிருந்து கொடுக்கப்படுவது ஐம்பது இலட்சம் ரூபாய். அந்தத் தொகையை வைத்துக்கொண்டு அபிவிருத்தி நடவடிக்கைகளுக்கு எவ்வாறு செலவு செய்யலாமென்பதைச் சிந்தித்துப் பாருங்கள்! இப்போதிருக்கின்ற பொருளாதார நெருக்கடிகளுக்கு மத்தியில் அந்த ஐம்பது இலட்சம் ரூபாய் நிதியைக்கொண்டு ஓர் உறுப்பினரால் தனது மாவட்டத்தில் எந்த வகையில் அபிவிருத்தித் திட்டங்களை மேற்கொள்ள முடியும்? ஒரு சீமெந்து bag மட்டக்களப்பிலே 860 ரூபாயாகவும் யாழ்ப்பாணத்தில் 900 ரூபாயாகவும் விற்கப்படுகின்றது. அந்தவகையில், சிறியதொரு நிர்மாணப்பணியை மேற்கொள்வதற்குக்கூட அந்த நிதி போதாதிருக்கிறது. கடந்த பாராளுமன்ற அமர்வுகளின்போதும் அந்தத் தொகையை ஒரு கோடி ரூபாயாக - 10 மில்லியன் ரூபாயாக - அதிகரிக்கவேண்டுமென்ற கோரிக்கையை நாங்கள் விடுத்திருந்தோம். எவருமே அதைக் கணக்கிலெடுக்கவில்லை. இந்த விடயம் இப்பொழுது பொருளாதார அமைச்சின்கீழ் வருவதனால் நிச்சயமாக பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்கள் இதைச் செய்வாரென்ற நம்பிக்கை எங்களுக்கு இருக்கின்றது. எனவே, கௌரவ அமைச்சரவர்கள் அதனைச் செய்யவேண்டுமென வேண்டுகோள் விடுக்கின்றோம்.

அதனைவிட, தற்பொழுது பல வீதிகள் 'கொங்கிறீட்' இடப்பட்டு வருகின்றன. குறிப்பாக, 'மஹிந்த சிந்தனை'யினூடாக கிராமங்களில் அமைக்கப்பட்டு வருகின்ற 'கொங்கிறீட்' பாதைகள் கிட்டத்தட்ட மூன்று மீற்றர் அகலமுடையதாகத்தான் இருக்கின்றன. அவ்வீதியினூடாக இரண்டு வாகனங்கள் எதிர்ரெதிர் திசையிலே வருகின்றபொழுது, அவை இரண்டும் ஒரேநேரத்தில் மாறிச் செல்ல முடியாத நிலையே காணப்படுகின்றன. ஏற்கெனவே, அகலமாக இருந்த கிரவல் மற்றும் மணல் வீதிகளுடைய அகலத்தைக் குறைக்கின்றபோது, அப்பிரதேசத்திலுள்ள மக்கள் வீதியோரத்தில் முதலில் இருந்த வேலிகளை மேலும் முன்நகர்த்தி அமைக்கின்றார்கள். எனவே, இந்த 'கொங்கிறீட்' வீதிகளை அமைக்கும்பொழுது, குறைந்தது 4-5 மீற்றர் அகலமுடையதாக அமைக்கவேண்டும். அவ்வாறு அமைத்தால்தான் இரண்டு வாகனங்கள் ஒரே நேரத்தில் மாறிச் செல்லக்கூடியதாக இருக்கும். இதனை நீங்கள் கருத்தில் எடுப்பீர்களோ, அல்லது எதிர்க்கட்சியினர் கூறுகின்றார்கள் என்பதற்காக ஒதுக்கித்தள்ளுவீர்களோ தெரியவில்லை. அவ்வாறின்றி இதனை நிச்சயமாகச் செய்யவேண்டும் எனக் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்து, வெள்ள அனர்த்தத்தின் காரணமாக இலங்கையினுடைய பல பிரதேசங்களில் பலர் இறந்திருக்கின்றார்கள். உண்மையிலே இது பரிதாபகரமான ஒரு நிலையாகும். மட்டக்களப்பைப் பொறுத்தமட்டில், அங்கு அண்மையில் பெய்த மழையின் காரணமாகப் பல கிராமங்கள் வெள்ள நீரில் மூழ்கின. இதற்குக் காரணம் என்ன என்று நாங்கள் ஆராய்ந்து பார்த்தோம். தற்பொழுது அங்கு பல குளங்கள் உயர்த்தப்படுகின்றன; இது வரவேற்கத்தக்க ஒரு விடயம்! ஆனால், மழையினால் அங்குள்ள குளங்கள் நிரம்பிவழியப்போகும் நிலையில், நீர்ப்பாசனத் திணைக்கள அதிகாரிகளினால் அக்குளத்தினுடைய வான்கதவுகள் திறந்துவிடப்படுகின்றன. இவ்வாறு அந்தக் கதவுகளைத் திறந்து விடுகின்றபொழுது, வெளியேறுகின்ற நீர் அக்குளத்தையண்டிய பிரதேசங்களில் பாதிப்பை ஏற்படுத்துகிறது. இவ்வாறு, உன்னிச்சைக் குளத்தினுடைய வான்கதவுகளைத் திறந்துவிட்டபொழுது, அதனூடாக வெளியேறிய நீரினால் சித்தாண்டியில் இருக்கின்ற உதயன்மூலை உட்படப் பல கிராமங்கள் வெள்ள நீரில் மூழ்கின. அதேபோல், நவகிரிக் குளத்தைத் திறந்துவிட்டதன் காரணமாக மண்டூர், வெல்லாவெளி போன்ற பிரதேசங்கள் பாதிக்கப்பட்டன. இவற்றிலிருந்து மக்களைப் பாதுகாக்கும்வகையில், அங்கு ஒழுங்கான வடிகால் அமைப்புக்கள் அமைக்கப்படவில்லை. அங்கு ஒழுங்கான வடிகாலமைப்புக்கள் செய்யப்பட்டிருந்தால், வெள்ளத்திலிருந்து அந்த மக்களைப் பாதுகாத்திருக்க முடியும். எனவே, இவற்றையும் நீங்கள் கவனத்தில் எடுக்கவேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

ஒரு நோயாளியை ஒரு வைத்தியர் சத்திர சிகிச்சை செய்கின்றார். சத்திரசிகிச்சை முடிந்த பின்னர் வைத்தியர் சொல்கிறார், "சத்திரசிகிச்சை சரியாக, மிகவும் வெற்றிகரமாக மேற்கொள்ளப்பட்டிருக்கின்றது; ஆனால், நோயாளி இறந்துவிட்டார்" என்று. குறிப்பாக, இவ்வரவு செலவுத் திட்டத்தை வடக்கு, கிழக்கு மக்களுடன் தொடர்புபடுத்திப் பார்க்கும்போது, இந்த நிலைதான் அந்த மக்களுக்கும் ஏற்பட்டிருப்பதாகத் தெரிகின்றது. அதாவது, இதில் பல திட்டங்கள் கூறப்பட்டிருக்கின்றன. ஆனால், கடந்த 30 வருடங்களாகப் போரினால் பாதிக்கப்பட்டு, இடம்பெயர்ந்து இன்னமும் அல்லல்பட்டுக்கொண்டு வாழ்கின்ற தமிழ் மக்களுக்குப் பாரபட்சம் காட்டப்பட்டிருக்கின்றது. அவர்களை மீட்டெடுத்து, இயல்பு வாழ்வுக்குக் கொண்டுவருவதற்குரிய எந்தத் திட்டமும் இதில் உள்ளடக்கப்படவில்லை. இந்நிலையிலேயே அம்மக்கள் தொடர்ந்தும் வாழவேண்டும் என்பதைத்தான் இது தெளிவாகக் காட்டுகின்றது.

இந்த வரவு செலவுத் திட்டத்தில் பல்வேறுபட்ட விடயங்கள் கூறப்பட்டாலும்கூட, ஒரு நாட்டின் பொருளாதார விருத்தியானது அந்த நாட்டிலுள்ள இளைஞர்களைச் சரியான வழியில் பயன்படுத்தி, தகுந்த தொழில்களில் அமர்த்துவதினூடாக உச்சக்கட்டத்தை அடையும். நேற்றுக்கூட யாழ். மாவட்டத்திலுள்ள வேலையற்ற பட்டதாரிகள் வேலைவாய்ப்புக்கோரி போராட்டம் நடாத்தினார்கள். இதுபோன்றே, மட்டக்களப்பிலுள்ள வேலையற்ற பட்டதாரிகளும் 21ஆவது தடவையாகப் போராட்டம் நடாத்தியிருக்கின்றார்கள். இதனை நாங்கள் பல தடவைகள் சுட்டிக்காட்டியிருக்கின்றோம். இவர்களுக்கு வேலைவாய்ப்புக்களை வழங்குவதற்குரிய ஒரு திட்டம் இந்த வரவு செலவுத் திட்டத்தில் முன்மொழியப்படவில்லை. நாங்கள் இவர்களை வெறுமனே கல்வி மற்றும் உயர்கல்வி அமைச்சுக்களுடன் மட்டும் மட்டுப்படுத்திவிட முடியாது. இவர்கள் பாடசாலைகளில் கல்வியைக் கற்கின்றார்கள்; பல்கலைக் கழகங்களுக்குச் சென்று பட்டத்தைப் பெறுகின்றார்கள். இவர்களைப் படிக்கவைக்கின்ற பெற்றோர்கள், தனது மகன் பல்கலைக்கழகம் சென்று பட்டம்பெற்று, அதன்மூலம் ஒரு தொழிலைப் பெற்று, தங்களுக்கு உழைத்துத் தருவான் என்ற

[ගරු පී. අරියනේත්‍රන් මහතා]

நம்பிக்கையில்தான் பல்கலைக்கழகங்களுக்கு அனுப்புகின்றார்கள். இதனைப் பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்கள் கவனத்தில் எடுக்கவேண்டுமெனக் கேட்டுக்கொள்கின்றேன். உயர் கல்வி அமைச்சு இவர்களுக்கு உயர் கல்வியினையும் பட்டத்தையும் கொடுத்தாலும், பொருளாதார அபிவிருத்தி அமைச்சு இவர்களுக்குத் தகுந்த தொழில்களைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுக்க வேண்டும். பொருளாதார அமைச்சின்மூலம் இவர்களுக்குத் தொழில்வாய்ப்புக்களைப் பெற்றுக் கொடுப்பதற்கான திட்டங்கள் இந்த வரவு செலவுத் திட்டத்தில் முன்மொழியப்பட்டிருந்தால் இளைஞர்கள் அதன்மூலம் நன்மை பெற்றிருப்பார்கள் என்பதை நீங்கள் புரிந்துகொள்ள வேண்டும்.

மட்டக்களப்பு மாவட்டத்திலே இருக்கின்ற மண்முனைத்துறைப் பாலத்தின் வேலைகளை ஆரம்பிப்பதற்கு ஜப்பான் நிதியுதவி வழங்கியிருக்கின்றது என்று நான் நினைக்கின்றேன். இருந்தபோதிலும் அங்கு மண்டூர் பாலம், அம்பிளாந்துறைப் பாலம், மற்றும் முனைக்காட்டிலிருந்து காஞ்சிரங்குடா செல்கின்ற பாதையிலுள்ள பாலம் போன்றவற்றை எல்லாம் மீள்நிர்மாணம் செய்ய வேண்டியிருக்கின்றது. எதிர்காலத்தில் இவ்வாறான பாலங்களைக் கட்டுகின்றபோதுதான் எல்லா இடங்களும் அபிவிருத்தியடையும் என்பதையும் நான் இவ்விடத்திலே தெரிவித்துக்கொள்ள விரும்புகின்றேன்.

நாங்கள் நேற்று முன்தினம் அனுராதபுரம் சிறைச்சாலைக்குச் சென்று கைதிகளைப் பார்வையிட்டுவிட்டு வந்தோம். இந்தக் கைதிகளை வெறுமனே கைதிகளாக மட்டும் பார்க்க முடியாது. ஏனெனில், இந்தக் கைதிகள் பற்றிய விடயம் மனிதாபிமானத்துடன் சம்பந்தப்பட்டதாகும். அதாவது அங்கு ஏறக்குறைய நூற்றுக்கும் மேற்பட்ட அங்கவீனமான கைதிகள் இருக்கின்றார்கள். ஆனால், அவர்களும் சாதாரண கைதிகளைப் போன்றுதான் கவனிக்கப்படுகின்றார்கள். அங்கவீனமான சிறைக்கைதிகளையும் சாதாரண சிறைக்கைதிகளையும் ஒரேவிதமாகப் பராமரிக்கின்ற ஒரு சிறைச்சாலையை நாங்கள் இலங்கையில் மாத்திரம்தான் பார்த்திருக்கின்றோம். எனவே, 'மஹிந்த சிந்தனை'யின் மீதுள்ள உங்கள் சிந்தனையை கொஞ்சம் வேறு திசையில் திருப்பி உங்கள் வீட்டில் ஒருவர் அங்கவீனராக இருக்கின்றார் என்றால் அவரும் நீங்களும் எந்தவிதத்தில் பராமரிக்கப்படுவீர்கள் என்பது பற்றிச் சிந்தித்துப் பாருங்கள்! ஆகவே, இலங்கை சுதந்திரமடைந்த பெப்ரவரி மாதம் 4ஆம் திகதியன்று வழமையாக குறிப்பிட்ட தொகையான கைதிகள் விடுவிக்கப்படும் வேளையில், அங்கவீனர்களாக இருக்கின்ற நூற்றுக்கும் மேற்பட்ட அந்தக் கைதிகளையாவது விடுதலை செய்ய நடவடிக்கை எடுக்குமாறு ஜனாதிபதி அவர்களிடம் நாங்கள் பகிரங்கமாக வேண்டுகோள் விடுக்கின்றோம். அதேநேரத்தில் சிறைக்கைதிகளாக இருக்கின்ற ஐம்பது பெண்கள் மற்றும் ஐந்து சிறுவர்கள் பற்றிய ஒரு விடயத்தை நான் கடந்த பாராளுமன்ற அமர்வுகளிலும் கூறியிருக்கின்றேன். பெண்கள் மற்றும் சிறுவர் உரிமைகள் பாதுகாக்கப்படுவது பற்றிக் குறித்த அமைச்சு வெளியிட்டுள்ள புத்தகத்தில் அழகாக எழுதப்பட்டுள்ளது. தமிழ் பெண்கள் அதிலே புறக்கணிக்கப்பட்டிருக்கிறார்கள். இது சம்பந்தமாகப் பொருளாதார நிபுணர் ஹர்ஷ த சில்வா அவர்கள் பேசும்போதும் குறிப்பிட்டார். இன்று ஐம்பது தமிழ்ப் பெண்கள் சிறையில் இருக்கின்றார்கள். அதேநேரம் ஐந்து சிறுவர்களும் பாடசாலைக்குச் செல்ல முடியாமல் சிறையில் இருக்கின்றார்கள். இது எங்களுக்கு வேதனையைத் தருகின்றது. இவ்வாறான வேதனைகளிலிருந்து நாங்கள் மீட்சியடைகின்றபோதுதான் பொருளாதார அபிவிருத்தித் திட்டங்கள் நல்ல முறையில் செயற்படக்கூடியதாக இருக்கும் என்பதை நீங்கள் தெரிந்துகொள்ள வேண்டும்.

இன்னுமொரு விடயத்தையும் கூறி எனது பேச்சை முடிக்க விரும்புகின்றேன். அதாவது, இலண்டன் பல்லைக்கழகத்தின் ஓர் ஆய்வு மையம் மனிதன் சம்பந்தமான ஓர் ஆராய்ச்சியில் ஒரு மனிதன் பூரண மனிதனாக மாற முடியாமல் இருப்பதற்கான ஏழு காரணங்கள் பற்றித் தெரிவித்துள்ளது. இதிலே முதலாவது காரணம், எதிர்மறையாகச் சிந்திப்பது; இரண்டாவது, யோசிக்காமல் வேலை செய்வது; மூன்றாவது, கேட்பது பிடிக்காமல் அதிகம் பேசுவது; நாலாவது, எல்லா விடயங்களிலும் இலகுவாகப் பின்வாங்கிச் செல்வது; ஐந்தாவது, மற்றவர்களின் குறைகளை மட்டும் பேசுவது; ஆறாவது, நேரத்தைக் கூடுதலாகச் செலவழித்துப் பேசுவது அல்லது உண்பது, உடுப்பது; ஏழாவது, கஷ்டப்படாமல் முன்னேற முயற்சிப்பது. இந்த ஏழு விடயங்களும் யாரிடம் இருக்கின்றன என்று பார்த்தால் அவை அரசியல்வாதிகளிடம்தான் இருக்கின்றன. இந்த நாட்டில் 90 வீதமான அரசியல்வாதிகள் இந்தச் சிந்தனையுடன் இருப்பதன் காரணமாகத்தான் இன்று தமிழன் தமிழனாக வாழ முடியாமல் இருக்கின்றது.

நான் பேசிக்கொண்டிருக்கின்ற இந்த நேரத்திலே, பாராளுமன்றத்தில் அரசுக்கும் எமது தமிழ்த் தேசியக் கூட்டமைப்புக்கும் இடையில் 15வது சுற்றுப் பேச்சுவார்த்தை இடம்பெற்றுக்கொண்டிருக்கின்றது. ஆனால், இன்று என்ன நடக்கின்றது? அதைக் குழப்புவதற்கும் இது சம்பந்தமான சிந்தனையைத் திருப்புவதற்கும் சர்வதேசத்துக்குக் காட்டுவதற்குமாக இன்னுமொரு பாராளுமன்றத் தெரிகுழுவில் தமிழ்த் தேசியக் கூட்டமைப்பு அங்கம் வகிக்க வேண்டும் என்று வலியுறுத்தப்படுகின்றது. ஓர் ஆண் இரண்டு பெண்களைத் திருமணம் செய்ய - அது இஸ்லாம் மதமாக இருக்கலாம், இந்து மதமாக இருக்கலாம், பௌத்த மதமாக இருக்கலாம் - மதங்கள் ஏதோ ஒரு வழியில் வசதியளிக்கின்றபோதிலும், ஒரு பெண் இரண்டு ஆண்களைத் திருமணம் முடிப்பதை எல்லாச் சமயங்களும் தடை செய்கின்றன. ஆனால், அதுதான் இன்று இந்தப் பேச்சுவார்த்தையிலும் இடம்பெறுகின்றது என்பதை நான் இங்கு கூறிக்கொள்ள விரும்புகின்றேன்.

இறுதியாக, இந்த நாட்டிலே பொருளாதாரம் அபிவிருத்தியடையவும் புத்த பகவானின் போதனைகள் வெற்றியடையவும் வேண்டுமாக இருந்தால் ஏனைய மக்களைப்போல் வடக்கு, கிழக்கு தமிழ் மக்களையும் சமனாகப் பார்த்து, அவர்களுக்கும் இந்த அபிவிருத்திகள் கிடைப்பதற்கு வாய்ப்பு ஏற்படுத்தப்பட வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி, வணக்கம்.

[අ. භා. 12.04 ]

**ගරු නියෝමාල් පෙරේරා මහතා (විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு நியோமால் பெரேரா - வெளிநாட்டலுவல்கள் பிரதி அமைச்சர்)

(The Hon. Neomal Perera - Deputy Minister of External Affairs)

ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අතිගරු ජනාධිපතිතුමා විසින් 2012 වර්ෂය සඳහා ඉදිරිපත් කරන්නට යෙදුණු අය වැය මා

දකින්නේ, ආර්ථික සංවර්ධනයේ ප්‍රතිලාභ රටේ සෑම ගෘහ ඒකකයක් වෙතම සමසේ ගලායාම තහවුරු කිරීම පිණිස විශේෂිත වූ ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශයක් හඳුනා ගෙන ක්‍රියාත්මක කිරීම සඳහා යොමු වූ අය වැයක් ලෙසයි. ඊට පෙර මෙන්න මේ කාරණය ගැන මා කියන්නට කැමැතියි. අපේ මහාචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා, ආර්ථික පරිපාලනය ගැන පොත් පත් පෙන්වමින්, එම පොත් පත්වල තිබෙන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කළා. මට ලැබී තිබෙන තොරතුරු අනුව එක්සත් ජාතික පක්ෂයේ අපි හිටපු කාලයේ සිටි සාමාජිකයන් දැන් මේ වනකොට 35,00,000කට අඩු වෙලා තිබෙනවාය කියලා එතුමන්ලා පිළිගන්නවා. ඒ 35,00,000න් රුපියල් 20 ගණනේ එකතු කළත් අවුරුද්දකට රුපියල් ලක්ෂ 70ක් එකතු වෙනවා. ඒ ලක්ෂ 70යි, මහාරාජා කොම්පැනියෙන් ලැබෙන රුපියල් මිලියන 12යි, සෙවනගල මොලැසස් ගෙන්වන කොම්පැනියෙන් ලැබෙන රුපියල් මිලියන 12යි, Roton Vander කොම්පැනියෙන් ලැබෙන - අපේ මන්ත්‍රීතුමා දන්නවා නේ - රුපියල් මිලියන 6යි, මලික්ගේ M & M එකෙන් ලැබෙන රුපියල් මිලියන 12යි, පිට රට සිටින අපේ එක්සත් ජාතික පාක්ෂිකයින්ගෙන් එකතු කර ගන්නා රුපියල් මිලියන 2යි, ඔක්කොම රුපියල් මිලියන 102ක් විතර ලැබෙනවා. නමුත් සිරිකොතේ සේවය කරන අයගේ වැටුප් ටිකයි, ටෙලිෆෝන් බිලයි ගෙවා ගන්න විධියක් නැහැ. මහාචාර්යතුමාට පුළුවන් නම් ඒක පරිපාලනය කරගන්න නායකතුමාට උදවු කරන්න, ඒක ලොකු උදවුවක් වෙනවා කියලා මා හිතනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා දැකලා තිබෙනවා, රට පාලනයයි, රජයේ ප්‍රතිපත්තියයි අනුව අද රටේ ඡන්ද ලැබෙන ආකාරය. ඒ නිසා මේ ආර්ථිකය ශක්තිමත් වන වැඩ පිළිවෙළ ජනතාවගේ ඡන්දය අනුව දකිනවා. එම නිසා තමුන්නාන්සේලාගේ පරිපාලනයේ දුර්වලකම පෙනෙනවා, ඔය පැත්තේ සිටින මන්ත්‍රීවරුන් 47 දෙනාගෙන් හැමදාම එක එක්කෙනා අඩු වන ආකාරයෙන්. ඒ නිසා ඒ මන්ත්‍රීවරුන් ආරක්ෂා කර ගන්න. මන්ත්‍රීවරුන් සංඛ්‍යාව ගැටගහ ගන්න කටයුතු කළොත් තමුන්නාන්සේ ඊට වැඩියේ ලොකු සේවයක් පක්ෂය වෙනුවෙන් කරනවා.

ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීම පිණිස ගෙවතු දස ලක්ෂයක් ඇති කිරීම සඳහා අතිගරු ජනාධිපතිතුමන් විසින් "දිවි නැඟුම" නමින් දියත් කළ වැඩසටහන අතිශයින් සාර්ථක වීම නිසා මෙවර අය වැයෙන් 2012 වසර අවසන් වනවිට අඩු ආදායම්ලාභී සියලු පවුල් ද ඇතුළත්ව ගෙවතු විසිපන් ලක්ෂයක් කරා පුළුල් කිරීමට ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා කටයුතු කරන බවට මේ අය වැයෙන් පෙන්නුම් කර තිබෙනවා. එමෙන්ම, එම වැඩසටහන යටතේ තෝරා ගත් එළවලු, පලතුරු හා මල් වගාව පුළුල් කිරීම සඳහා අක්කර දෙකහමාර දක්වා කුඩා ගෙවතුද ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම මෙම වැඩසටහන යටතේ "දිවි නැඟුම ව්‍යවසාය ගම්මාන" පිහිටුවීමට ද යෝජනා කර තිබෙනවා. පවුල් 200කින් පමණ සමන්විත මෙම ගම්මානයකට කුඩා සත්ව ගොවිපොළක්, කිරි, මස් හා එළවලු තබා ගත හැකි ගබඩා පහසුකම්, කුඩා සහල් මෝල් සහ ආහාර සැකසුම් මධ්‍යස්ථානයක්, දිවි නැඟුම බැංකු ශාඛාවක් සහ නුදුරින් පිහිටා ඇති නගරය සඳහා ප්‍රවාහන පහසුකම් ලබා දීම මෙම වැඩසටහනේ ඇතුළත් වෙනවා. මෙම සංවර්ධන ප්‍රවේශය අපේ සංස්කෘතියට ඉතාම උචිත එකක් ලෙස මා දකිනවා. ග්‍රාම නායකත්වය, ග්‍රාම සංවර්ධනය, අපේ ඉතිහාසයේ ඈත කාලයේ සිට පැවැති සංකල්පයක්. විසි එක්වන ශත වර්ෂයට ගැළපෙන පරිදි එය දේශපාලන, ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ භූගෝලීය සාධකවලට ගැළපෙන පරිදිද, ලෝක ආහාර ආරක්ෂණයේ බිඳ වැටීම ආදියට ඔරොත්තු දෙන පරිදිද, මෙම සංවර්ධන ප්‍රවේශය සැලසුම් වී ඇති ආකාරයත් මා දකිනවා. මෙම සංවර්ධන ප්‍රවේශයේ දී "දිවි නැඟුම" මෙන්ම, "ගම නැඟුම" සහ "මග නැඟුම" වශයෙන් මේ වන විටත් අති සාර්ථකව ක්‍රියාත්මක වන වැඩසටහන්වල නියමුවා වශයෙන් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ප්‍රමුඛ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වැඩ කටයුතු කරගෙන යනවා. "දිවි නැඟුම" වැඩ සටහනෙහි අරමුණ වන්නේ, ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම, ජනතාව ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම, ආහාර අවශ්‍යතා සඳහා වෙළෙඳ පොළ මත යැපීම අවම කිරීම, පවුල් ඒකකයන්හි පෝෂණ මට්ටම වැඩි දියුණු කිරීම සහ ස්වයං පෝෂිත භාවයට හැරවීම සඳහා ගෘහ ඒකකවලට සහාය වීම කියන කාරණයි. මෙම වැඩ පිළිවෙළ අදියර තුනකින් සමන්විත වෙනවා. කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ ධීවර සහ සත්ව පාලනය යනුවෙන්. පවුල් ඒකකවලට තමාට කැමැති අදියර තෝරා ගැනීමට අවකාශය සලසා දී තිබෙනවා.

දිවි නැඟුම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය කිරීම යන මෙම කටයුතුවලදී ජනතාවට ඇති වන ගැටලු නිරාකරණය කිරීමට උපදෙස් සැපයීම සහ ප්‍රතිකර්ම සැපයීම සඳහා වැඩ පිළිවෙළක් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ආරම්භ කර තිබෙනවා. "ඉසුරුමත් නිවහනක් - අසිරිමත් මව් බිමක්" යන තේමාව යටතේ ක්‍රියාත්මක වන මෙම වැඩ පිළිවෙළේ සාර්ථක අවසානය ආසියාවේ ආශ්චර්යය යන ඉලක්කයද ඉක්මවා මුළුමහත් ජාත්‍යන්තරයටම ආදර්ශයක් සපයු ව්‍යාපෘතියක තත්ත්වයට පත් වන බවට සැකයක් නැහැ. කාලගුණය වෙනස් වීම් හා අනෙකුත් බලපෑම් මත ඇති විය හැකි ආහාර අර්බුදයට පිළියමක් මෙන්ම ලෝක ආහාර ආරක්ෂණය සඳහා කටයුතු කරන ආකාරය පිළිබඳව ලෝකයට කියා දෙන පාඩමක් මෙම සංකල්පය තුළ ගැබ් වී ඇති බව ප්‍රකාශ කරන්න මම කැමැතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ගැන කථා කරන විට "ගම නැඟුම" "මග නැඟුම" යන නම්වලින් හැඳින්වෙන ග්‍රාමීය හා ප්‍රාදේශීය සංවර්ධන ප්‍රවේශයන් පිළිබඳව ද කථා නොකර බැහැ. මහින්ද චින්තන සංවර්ධන උපාය මාර්ගවලට අනුව ප්‍රධාන වශයෙන් රටක් සංවර්ධනය වූවාය යනුවෙන් සලකනු ලබන්නේ එහි ජනතාව සහ ගම සවි බල ගැන්වීමයි. එම සංවර්ධන ප්‍රතිපත්ති මූලිකව යොමු වී තිබෙන්නේ ගම සහ පවුල සවි බල ගැන්වීම සඳහායි. ඒ අනුව ග්‍රාමීය ප්‍රවේශ මාර්ග සංවර්ධනය, ග්‍රාමීය විදුලි බලය, පානීය ජලය සහ සනීපාරක්ෂක පහසුකම්, ග්‍රාමීය නිවාස, ග්‍රාමීය ජනතාව සඳහා ජීවනෝපාය සංවර්ධනය ආදී වශයෙන් ප්‍රධාන සංවර්ධන වැඩ ගම නැඟුම යටතේ ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා රජය සැලකිය යුතු මුදලක් ආයෝජනය කර තිබෙනවා. එය 2010 වසරේ මිලියන 11,327ක් ලෙස මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ 2010 වාර්ෂික වාර්තාවේ දක්වා තිබෙනවා. එසේම 2011 වසර මැද පිස්කල් තත්ත්ව වාර්තාවට අනුව 2011 වර්ෂයේ මුල් මාස පහ සඳහා මිලියන 1,153ක් ආයෝජනය කර තිබෙනවා. ගම නැඟුම වැඩ සටහනට අමතරව ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම අරමුණු කර ගත් වැඩ සටහන් කීපයක් පිළිබඳවද මා මතක් කරන්න කැමැතියි. උතුරු වසන්තය, නැඟෙනහිර නවෝදය, පුබුදමු වෙල්ලස්ස, වයඹ පුබුදුව, කඳුරට උදානය, සබරගමුව අරුණාලෝකය, රුහුණු සහ රන් අරුණ යනුවෙන් එය සඳහන් වෙනවා. මෙම වැඩ සටහන් හරහා 2010 වසරේ රුපියල් මිලියන13,100ක් ආයෝජනය කර තිබෙනවා. ඒ අතර 2011 වසරේ ජනවාරි සහ අප්‍රේල් දක්වා කාලය තුළ පාලම්, වරායවල්, විදුලි ජනනය සහ වාරි මාර්ග ආදී ව්‍යාපෘති සඳහා මිලියන 1040ක්ද ආයෝජනය කර තිබෙනවා. මේවායේ ප්‍රතිලාභ ලබන ජනතාව රජය වෙත කෘතගුණ සලකන බවද ඡන්ද ප්‍රතිඵල අනුව කියන්න කැමැතියි.

මග නැඟුම වැඩ පිළිවෙළ යටතේ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් 2011 ජනවාරි - මැයි යන කාල සීමාව තුළ පමණක් රුපියල් මිලියන 939ක් ආයෝජනය කර තිබෙනවා. නූතන තාක්ෂණික මෙවලම් උපයෝගී කර ගනිමින් ග්‍රාමීය මාර්ග පුනරුත්ථාපනය කර තිබෙනවා. මෙම කාල වකවානුව තුළ පමණක් ග්‍රාම මාර්ග කිලෝමීටර 1,560ක් පමණ පුනරුත්ථාපනය කර තිබෙනවා. මේ මඟින් ගම්වල ආර්ථික ක්‍රියාවලියේදී මාර්ග අවහිරතා මහ හැරී ගොස් තිබෙනවා. මෙම මුදල ආයෝජනය කරමින් පුනරුත්ථාපනය වූ පාරවල්, පාලම්, කාණු පද්ධති ආදියෙන් ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව 26,314ක් ලෙස ගණන් බලා තිබෙනවා.

[ගරු නියෝමාල් පෙරේරා මහතා]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කථාව අවසන් කිරීමට පෙර මා කියන්න කැමැතියි අද මට පෙර කථා කරපු මන්ත්‍රීවරුන් කථා කළේ ද්වේෂයෙන් බව. මම කනගාටු වෙනවා ඒ විධියට කථා කිරීම පිළිබඳව.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, දැන් කථාව අවසාන කරන්න.

**ගරු නියෝමාල් පෙරේරා මහතා**
(மாண்புமிகு நியோமால் பெரேரா)
(The Hon. Neomal Perera)
මම හිතනවා ඒ අය ඒ අයගේ ප්‍රතිපත්ති වෙනස් කර ගෙන රජය සමඟ ශක්තිමත් ආර්ථික ප්‍රතිපත්තියකට සහයෝගය ලබා දෙනු ඇති කියා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කථාව අවසාන කිරීමට මත්තෙන් මා සතු විශේෂ යුතුකමක් ඉටු කිරීමට මට අවසර දෙන්න. දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම්වලට ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා සිය අමාත්‍යාංශයේ නිලධාරින් කැටුව පැමිණ පවතින අඩු පාඩුකම් සොයා බලමින් අවශ්‍ය ප්‍රතිපාදන සලසා දෙමින් ඉටු කරන මෙහෙවරට සියලු මහ ජන නියෝජිතයන්ගේ උපහාරය එතුමාට පිරිනැමීමටද මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ කථාවේ ඉතිරි කොටස **සභාගත*** කරනවා. ස්තුතියි.

[පූ. භා. 12.12 ]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මහින්ද චින්තන ආණ්ඩුව ධර්ම රාජ්‍යයට වැට බඳිමින්, නිදහස් වෙළඳ කලාප වැසී යැමට ඉඩ හරිමින්, කැසිනෝ කලාපත්, අතිසුවිශේෂී වෙරළ කලාපත් පිහිටුවමින්, මතට තිත ගැන කථා කරමින්, මත් ද්‍රව්‍යවලින් ආදායම වැඩි කර ගන්නා හැටි බලමින්, ආණ්ඩුව පුන පුනා ආරක්ෂා කරනවා කියපු සදාචාරයත්, සංස්කෘතියත් වළ පල්ලට දමලා ඩොලර් සොයන්නට වලි කන මොහොතක නිදහසින් පස්සේ රජයක් තුළ වැඩිම විෂයයන් ගණනාවක් අයිති, මේ පාර්ලිමේන්තුවේ ඉන්න ආණ්ඩු පක්ෂයේ ප්‍රබලම කැබිනට් ඇමතිවරයාගේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ජනතාව වෙනුවෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආණ්ඩුවක් බලයට පත් වන්නේ තමන්ට ඡන්දය දුන් ජනතාවට පමණක් නොව සමස්ත රටවැසියන්ගේම ආර්ථිකය සංවර්ධනය කිරීම සඳහා, දුර දක්නා නුවණින්, නිවැරදි කළමනාකරණයක් තුළින්, නාස්තියෙන් හා දූෂණයෙන් තොරව ජනතාවගේ අපේක්ෂා ඉටු කරන්නයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඛේදයකින් තොරව පිළිගන්නවා, මේ ආණ්ඩුවේ ඇමතිවරුන් අතරින් ආර්ථික සංවර්ධන ඇමති බැසිල් රාජපක්ෂ ඇමතිතුමා, තමන්ට අතිවිශාල විෂයයන් ගණනක් තිබුණත් තමන්ට පැවරුණු වගකීම ඉටු කරන්න දැඩි උත්සාහයක් දරන ඇමතිවරයෙක් කියන එක. මොකද, වර්තමාන රජයේ වැඩි හරියක් මැති ඇමතිවරුන් තමන්ගේ විෂයයවත් හරියට ඉටු කරන්නේ නැතුව ඒ අමාත්‍යාංශවල නාස්තිය දූෂණය ඉහ වහා යන්න ඉඩ දීලා, ඒ මදිවාට විපක්ෂය ගැන විවේචනය කරමින් තමන්ගේ නොහැකියාවන් වහ ගන්න හදන නිසායි මම එහෙම කියන්නේ.

මට ලැබී තිබෙන්නේ සීමිත වේලාවක් නිසා මම කරුණු දෙක තුනක් ඉක්මනින් කියන්න බලාපොරොත්තු වනවා. මේ අමාත්‍යාංශය යටතේ තිබෙන වැදගත් අංශ කීපය අතර, වෙන දා වෙනම අමාත්‍යාංශයක් හැටියට තිබුණු සමෘද්ධි විෂයය අද මෙතුමාට පැවරිලා තිබෙනවා.

මේ රජයේ හත්වන අය වැයේ ඉලක්කම් හරඹය කොයි තරම් මවා පෑමක්ද යන්න සමෘද්ධි විෂයය ගැන කථා කරන කොට අපට පැහැදිලි වනවා. දැන් මේ මුදල් ඇමතිතුමාගේ සහෝදරයා වන මුදල් අමාත්‍ය අපේ ජනාධිපතිතුමා අය වැය කථාව ඉදිරිපත් කරද්දී එතුමාගේ ගෝල බාලයෝ එතුමා ඉදිරිපිටම හැසිරුණු හැටි අපි දැක්කා. අවසානයේදී අපට මේ සභාවේ ඉන්න බැරි තත්ත්වයක් නිර්මාණය කළා. අපි මේ ගරු සභාවෙන් පිට වෙලා ගියාට පස්සේ එතුමා සඳහන් කළා, 2010 දී දුප්පත්කම සියයට 8 දක්වා අඩු වී තිබෙන බව. හැබැයි ඒ අය වැය කථාවේම එතුමා සඳහන් කරනවා, සමෘද්ධිලාභීන් ප්‍රමාණය සියයට 37ක් බව. ඒ අනුව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ඇමතිතුමාට අයත් අසරණ සමෘද්ධිලාභීන් ප්‍රමාණය ගැන කියන වාර්තාව නිවැරදි නම්, සැබෑ දුප්පත්කම සියයට 8කට අඩු වෙලා තිබෙනවායි කියා ආණ්ඩුව පැවසීම සම්පූර්ණ මුසාවක් බව අය වැය ලේඛනයෙන්ම පිළි අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රුපියල් 210 සිට 1,500 සිට දක්වා වූ සොච්චම් සමෘද්ධි දීමනාවක් ලබන පවුල් සංඛ්‍යාව 15,41,410ක් බව පිළිගන්න වනවා. ඒ අනුව රටේ ජනතාවගෙන් 75,00,000කට වැඩිය අන්ත දිළිඳු ජනතාවක් ඉන්න බව පැහැදිලි වනවා. නමුත් ඇත්ත වශයෙන්ම මේ සංඛ්‍යාව මීටත් වඩා වැඩි විය යුතුයි කියලා මම කල්පනා කරනවා. මොකද, සමෘද්ධි දීමනාව ලබා දීමට අලුත් පවුල් වර්ෂ ගණනකින් ඇතුළත් කර ගෙන නැහැ. එහෙනම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූලිකම කරුණක් බිඳ වැටිලා තිබෙනවා. 1948න් පස්සේ 2005 දක්වා බලයට පත් වෙලා හිටපු සෑම ආණ්ඩුවක්ම ලබා ගත් ණය මුදල වාගේ දෙගුණයකටත් වැඩිය මුදලක් දෙදාස් පහෙන් පස්සේ මේ මහින්ද චින්තන ආණ්ඩුව ගිනි පොලියට ණය අරගෙන තිබෙනවා. ඒක පුද්ගල ණය බර රුපියල් ලක්ෂ 2,00,000කටත් වඩා ඉහළ ගිහින් තිබෙනවා. ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව සැබෑ දුප්පත්කම සියයට 8කට ගෙන ඒමේ හැකියාව ආණ්ඩුවටත්, ඒ ඉලක්ක සපුරා ගැනීම සඳහා පිහිටුවා තිබෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයටත් ලබා ගන්න බැරි වෙලා තිබෙනවා.

ඊළඟට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වැඩියෙන්ම කථා බහට ලක් වන මේ අමාත්‍යාංශය යටතේ තිබෙන ව්‍යාපෘතියක් තමයි මහ නැඟුම ව්‍යාපෘතිය. එය නාස්තිය, දූෂණය තොග පිටින් සිදු වන තැනක් බවට දැන් පත් වෙලා තිබෙනවා. විටින් විට විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් පාර්ලිමේන්තුවේ අහන ප්‍රශ්නවලට දෙන උත්තරවලට අනුවත් අපි දකිනවා, කිලෝමීටරයක් කොන්ක්‍රීට් කරන්නත්, පාරවල් කාපට් කරන්නත් වැඩිම වියදමක් දරන ආසියාවේ තිබෙන රට ශ්‍රී ලංකාව බවට පත් කිරීමට නම් "මහ නැඟුම" සමත් වෙලා තිබෙනවා කියන එක. ඒ අනුව බලන කල ජනතාවගේ සැබෑ අපේක්ෂා ඉටු කරන්න මහ නැඟුමට බැරි වෙලා තිබෙනවායි කියන එක පැහැදිලියි.

---

* පුස්තකාලයේ තබා ඇත.
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* Placed in the Library.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආණ්ඩුවේ මැති ඇමතිවරු නිතරම කිව්වා, ත්‍රස්තවාදය නිම වීමෙන් පස්සේ රටේ ජනතාවට ආශ්චර්යය උදා කරන්න සංචාරක ව්‍යාපාරයේ වර්ධනය තුළින් පුළුවන් වෙයි කියලා.

යුද්ධය ඉවර වුණාට පස්සේ ආයෝජකයෝ ගලාගෙන එයි කිව්වා. සංචාරකයෝ වැහි වහී කියලා කිව්වා. මට මතකයි, ජනාධිපතිතුමා මීට පෙර අය වැය කථාවන් කරන කොට මේ රජය කැසිනෝ ව්‍යාපාරය රට තුළ ව්‍යාප්ත කරමින් රටේ සදාචාරය, සංස්කෘතිය, සභ්‍යත්වය නැති කරමින් කෙසේ හෝ ඩොලර් හොයන්න කටයුතු කරන්නේ නැහැයි කියලා පම්පෝරි කථා කිව්වා. කෙසේ හෝ ඩොලර් හොයන්න කැසිනෝ වාගේ දේවල් ඇති කරන්නේ නැහැ කියලා අය වැය කථාවලදී කිව්වා. ඒ වාගේම අපේ හිටපු හමුදාපතිවරයා, ආණ්ඩුව කියපු විධියට ලෝකයේ හොඳම හමුදාපතිවරයා අද ඉන්නේ හිරේ. ඒ වාගේම රණ විරුවෝ අපේ රටට සුවිශේෂ ජයග්‍රහණ ලබා දී රට නිදහස් කර දුන්නාට පස්සේ ඩොලර්වලට කෑදරකමින්, සදාචාරය බල්ලාට දමමින් කැසිනෝ කලාප පටන් ගන්න අණපනත් පවා ගෙනැල්ලා තිබෙනවා කියන එක අපි හොඳින් දන්නවා. ගරු සභාපතිතුමනි, ධර්ම රාජ්‍යයට යන හැටි කියලයි මේ රජය බලයට ආවේ; දැන් කැසිනෝ රාජ්‍ය කරා ගමන් කරමින් සිටිනවා.

ලෝකයෙන්ම සුන්දර වෙරළක් හිමි අපේ රටේ වෙරළේ සුන්දරත්වය සාමාන්‍ය ජනතාවට විඳ ගැනීමේ අවස්ථාව අහුරමින් ඩොලර් හොයන්න විදේශ සංචාරක රතු කලාප ඇති කරන්නත් දැන් කටයුතු කරන බව අපි දන්නවා. ආණ්ඩුව ආරක්ෂා කරනවා කියපු සදාචාරයයි, සංස්කෘතියයි පාවා දෙමින් සංචාරකයින් වැඩි කර ගන්න කොච්චර දැඟලුවත් තවමත් ලංකාවට එන සංචාරකයකු රට තුළ වියදම් කරන මුදල් ප්‍රමාණය ඩොලර් සියයේ ඉලක්කය සපුරා ගන්නටවත් ආණ්ඩුව සමත් වෙලා නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යුද්ධය අවසන් වෙලා මේ වන විට අවුරුදු දෙකහමාරක් ගිහින් තිබෙනවා. තවම සංචාරකයන්ගේ පැමිණීම සියයට 48 ඉක්මවන්න බැරි වෙලා තිබෙනවා. සංචාරකයන් අතරින් මේ රට තුළදී වියදම් කිරීමට හැකියාව ඇති බටහිර හොඳ සංචාරකයෝ එන්නේ සියයට 19ත්, 20ත් අතර සුළු පිරිසක් විතරයි. මම නියෝජනය කරන්නේ බෙන්තර ප්‍රදේශය. බෙන්තර මුහුදු තීරය සංචාරක පුරවරයක්. අපි දන්නවා, වතුර බෝතලයක් ගන්න කොටත්, තැඹිලි ගෙඩියක් ගන්න කොටත් දෙතුන් පාරක් ගණන් අහලා ගන්න ජාතියේ සුද්දෝ තමයි තවම අපේ රටට වැඩිපුර එන්නේ. එහෙම නම් සංචාරක ව්‍යාපාරයේ වර්ධනය වෙනුවෙන් කොතරම් සංචාරකයෝ ගෙන්වා ගන්න මුදල් යෙදෙව්වත්, යුද්ධය ඉවර කරලා අවුරුදු දෙකහමාරක් ඉක්මවා ගිහින් තිබුණත් සැලකිය යුතු සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට ගෙන්වා ගන්න රජයට තවම බැරි වෙලා තිබෙනවා. වෙනත් රටවල්වලට සාපේක්ෂව අපේ රටට සංචාරකයන්ගේ පැමිණීම මදියි කියන එකයි මම තමුන්නාන්සේට කියන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රණ විරුවා භූමිය රැක ගනිමින් ත්‍රස්තවාදය නැති කර දුන්නත්, රජය ත්‍රස්තවාදය නිම කිරීමෙන් පස්සෙත් රාජ්‍ය ත්‍රස්තවාදය මුදා හැරලා නීතිය වල් වැදීමට සැලැස්වීම සංචාරකයන්ගේ පැමිණීම අඩු වීමට එක හේතුවක් විධියට මම දකිනවා. විශේෂයෙන්ම බටහිර සංචාරකයන්ගේ පැමිණීම අඩු වීමට මේක ප්‍රධානම හේතුවක් වෙලා තිබෙනවා. මේ රට තුළ අහන්න දකින්න ලැබෙන දේවල් ගැන බලන කොට සංචාරකයෝ එන එක අඩු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම රජය හෝටල් සංස්ථාව විකුණනවා වෙනුවට එය දියුණු කිරීමයි කළ යුතුව තිබුණේ. අද වන විට මහනුවර ශ්‍රී දළ දා මාලිගාව ඉදිරි පිට තිබුණු ඓතිහාසික වටිනාකමින් යුත් ක්වීන්ස් හෝටලය ඇතුළු හෝටල් ගණනාවක්ම පෞද්ගලීකරණයට ලක් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න කැමැතියි, මේ රජය කාලයේ,- [බාධා කිරීමක්] අපේ නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමා නොයෙක් දේවල් කියනවා. එතුමා අපත් එක්ක එකට හිටපු කෙනෙක්. අපේ ආණ්ඩුවක් එන එකක් නැහැ කියලා හිතලා ඒ පැත්තට කරණමක් ගැහුවා. කොහොම නමුත් නියෝජ්‍ය ඇමතිවරයෙක් හැටියට තමයි තවමත් ඉන්නේ. ඒ ගැන මම කනගාටු වෙනවා. ඊට පස්සේ ඒ පැත්තට ගිය අපේ ජොන්ස්ටන් ඇමතිතුමන්ලා වගේ අය දැන් කැබිනට් එකේ ඉන්නවා. නමුත්, නියෝමාල් පෙරේරා නියෝජ්‍ය ඇමතිතුමාටත් මම ප්‍රාර්ථනා කරනවා, ජනවාරි මාසයේවත් පරිවර්තනයක් වෙන්න කියලා. මොකද, එතුමාගේ ලොකු ආශාවක් තිබුණා කැබිනට් එකට යන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
12.30ට නේ මගේ කාලය අවසන් වෙන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ඔව්. You had thirteen minutes to speak. You have to finish now.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
රවි කරුණානායක මහත්මයාගේ කාලයෙන් මට විනාඩි දෙක තුනක් දෙන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
එහෙම දෙන්න බැහැ. I am sorry.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙම නම් මට විනාඩි 3ක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, you have to finish your speech at 12.25.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආණ්ඩුව කාලයේදී - [බාධා කිරීමක්] ඔබතුමන්ලාත් අපේ පැත්තේ ඉන්න කොට බෙන්තර, දෙද්දුව දෙවැනි සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් වැඩ සටහනක් නිර්මාණය කළා. සංචාරක ඇමතිතුමා හැටියට එදා ගාමිණී ලොකුගේ ඇමතිතුමා ඒකට හුඟක් මහන්සි වුණා. දිවංගත අනුර බණ්ඩාරනායක මැතිතුමා සංචාරක ඇමති වශයෙන් සිටියදීත් ඒ ගැන බොහොම වර්ණනා කරමින් කතා කළා. අද ඒ ගැන කිසිම පියවරක් අරගෙන නැහැ. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරන්නය කියාත් මම කියනවා. පෞද්ගලික අංශය හරහා සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නය, ඉඩම් ලබා දෙන්නය කියා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

අනික් පැත්තෙන් කඩිමුඩියේ පනත් ගෙනැල්ලා දේශීය ව්‍යාපාරිකයන්ගේ ලාබ ලබන ආයතන රජයට පවරා ගන්නවා. ඒකෙන් පෙනෙනවා රජය වෙන වැඩ වලදී වාගේ ආර්ථික සංවර්ධනයේදීත් අනුගමනය කරන්නේ දෙබිඩි පිළිවෙතක්ය කියන එක.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, යුද්ධයෙන් පසුව උතුරු නැඟෙනහිර ප්‍රදේශය නිදහස් කරලා, ඒ ඉඩම් දේශීය ගොවියාට ලබා දී ජනතාවට අඩු මිලට කෘෂි භෝග දෙන හැටි, දේශීය ගොවියා ජපානයේ ගොවීන් මෙන් ආර්ථිකයෙන් ශක්තිමත් කරන හැටි කිව්වා. නමුත් අද මොනවාද වෙන්නේ? උතුරු නැඟෙනහිර, සෝමාවතිය පුද බිම අවට, අම්පාර, පොළොන්නරුව, ත්‍රිකුණාමලය ප්‍රදේශවල අක්කර දහස් ගණන් කෙසෙල් වවන්න, බඩ ඉරිඟු වවන්නය කියා බහු ජාතික සමාගම්වලට - විදේශිකයන්ට- කුණු කොල්ලෙට දෙනවා. සංවර්ධනය සඳහා ඒවා දිය යුතුව තිබුණේ දේශීය ගොවියාටයි, දේශීය ව්‍යාපාරිකයාටයි.

අද ජාතික සත්වෝද්‍යාන අයිති එක අමාත්‍යාංශයකට, වන ජීවීන් අයිති තවත් අමාත්‍යාංශයකට. වන අලි ප්‍රශ්නය අද ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. වන අලි ගම්වලට ඇවිල්ලා ගෙවල් කඩපු අවස්ථා, ජීවිත විනාශ කරපු අවස්ථා රූපවාහිනියෙන් අපි දකිනවා. ඒ වාගේම වටිනා, අමිල වන සත්තුත් අද නැති වෙනවා. ඒ නිසා ගරු ඇමතිතුමා හිටියා නම් මම යෝජනා කරන්න හිටියේ වන අලිත් එතුමාගේ යටතට පත් කර ගත්තා නම් හොඳයි කියන එකයි. මොකද, වන ජීවීනුත්, සත්වෝද්‍යානත් දෙකම එක අමාත්‍යාංශයකට තිබුණා නම් හොඳයි කියා මා දකිනවා. [බාධා කිරීමක්] අනික් කාරණය තමයි බැසිල් රාජපක්ෂ ඇමතිතුමා වල් අලි දපනය කර ගන්න හරි දක්ෂයා. දැන් එතුමාගේ දෙපැත්තේ ඉන්න අය ගැන බැලුවොත් මහියංගනය පැත්තේ හිටපු කොටන් ඇදපු අලි, වයඹ පැත්තේ, හක්මන පැත්තේ, මේ හැම පැත්තකම හිටපු කොටන් ඇදපු, පෙරහැරේ ගියපු අලි එතුමා නිර්වින්දනය කර තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon Member, please wind up now.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මට තව විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
I want to give a chance to the other speaker also before the lunch break.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Sorry, I cannot give you any more time.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අපේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා හැමදාම කතා කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
එහෙම දෙන්න බැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එතුමාගේ වෙලාවෙන් විනාඩි දෙකක් දෙන්න එතුමා කැමැත්ත පළ කරනවා. අවසාන තත්පර දෙකේදී මම කියන්නේ, අච්චර මුදල් දැම්මාය, මෙච්චර මුදල් දැම්මාය, අච්චර පාලම් හැදුවා, පාරවල් හැදුවා, මෙච්චර කාපට් දැම්මා කිව්වත් මේවායේ බරපතළ නාස්තියක්, දූෂණයක් සිදු වනවා. ඒක අද ප්‍රසිද්ධ රහසක්. ඒවායේ විපාක විඳින්න සිද්ධ වෙන්නේ සාමාන්‍ය ජනතාවටයි. ඒ නිසා අච්චර හැදුවාය, මෙච්චර හැදුවාය කියනවාට අමතරව නාස්තියත් දූෂණයත් අවම කරලා ප්‍රමිතියෙන් යුතුව අදාළ මාර්ග, පාලම් හැදීම ගැන අවධානය යොමු කරන්නටය කියා අපි කියනවා.

අවසාන වශයෙන් මම මතක් කරන්න ඕනෑ, අය වැයෙන් රුපියල බාල්දු වුණා; සියලුම භාණ්ඩ හා සේවා මිල ගණන් ඉහළ ගියා; ඉන්ධන මිල වැඩි වුණා; සියලු දේවල්වල මිල වැඩි වුණාය කියන එක. මෙම අමාත්‍යාංශයෙන් මන්ත්‍රීවරුන්ට දෙන රුපියල් ලක්ෂ 50, දැන් දිස්ත්‍රික්කයක වැඩ කරන්න තියා හැරෙන්නවත් මදි නිසා එය ලක්ෂ 100 දක්වා වැඩි කරන්නය කියා අපි ඉල්ලනවා. ඒ ඇමතිතුමා දැන් මෙතැන නැහැ. එතුමා බොහොම සුහදශීලී, බොහොම ලෙන්ගතු, ලොකු අරමුණක් ඇතිව ඉදිරියට යන ඇමති කෙනෙක් නිසා ඒක එතුමාටත් හොඳයි. අඩු ගණනේ මේ විමධ්‍යගත මුදල් ලක්ෂ 100ක්වත් කරන්නය කියා අපි ඉල්ලනවා.

"දිවි නැඟුම" ව්‍යාපෘතියත් මේ අමාත්‍යාංශය යටතේයි තිබෙන්නේ. හැබැයි කලින් කතා කළා, "අපි වවමු - රට හදමු" ගැන. ඒවා cut-outs, postersවලට, ප්‍රචාරයට පමණක් සීමා වෙලා තිබෙනවා. මොන "දිවි නැඟුම" තිබුණත් තවම අපේ ගෙවත්තේ, ඕවිටේ වැවෙන කංකුං, නිවිති, පිපිඤ්ඤා වාගේ භෝග ගණනාවක්ම පිට රටින් ගෙන්වන නිසා "දිවි නැඟුම" වැඩසටහනත් "අපි වවමු- රට හදමු" වාගේ ප්‍රචාරයට පමණක් සීමා නොවන්නට වග බලා ගන්නය කියා ඉල්ලා සිටිමින් කාලය නිම වුණු නිසා මගේ කතාව මෙතෙකින් අවසාන කරනවා.

[අ. භා. 12.27]

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා (ළමා සංවර්ධන හා කාන්තා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் - சிறுவர் அபிவிருத்தி, மகளிர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. M.L.A.M. Hisbullah - Deputy Minister of Child Development and Women's Affairs)
*බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.*

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ කථා කිරීමට ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. මා පළමුවෙන්ම අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට නැඟෙනහිර පළාතේ ජනතාව වෙනුවෙන් බොහොම ස්තුතිවන්ත වෙනවා, මේ රටේ ආර්ථික සංවර්ධනය

නියමාකාරයට පෙරට ගෙන යන ඇමතිවරයකු හැටියට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාව පත් කිරීම ගැන. ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා එඩිතර, නිර්භීත, දක්ෂ, ක්‍රියාශීලී, උද්යෝගිමත්, කාර්යක්ෂම, දැක්මක් ඇති, අවංකව වැඩ කරන, ඒ වාගේම වෙලාවට වැඩ කරන, සම්පූර්ණ කාලයම රට වෙනුවෙන් වෙහෙසෙන ගරු ඇමතිවරයෙක්. එතුමාත් එක්ක නැඟෙනහිර පළාතේ සංවර්ධනය වෙනුවෙන් වැඩ කරන්නට ලැබීම මම භාග්‍යයක් කොට සලකනවා.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, யுத்தத்தின் பின்னர் இன்று வடக்கு, கிழக்கு மாகாணங்கள் இந்த அமைச்சின் உதவியுடன் பாரிய முன்னேற்றமடைந்து வருகின்றன. கடந்த 30 வருடகால யுத்தத்தினால் மிக மோசமாகப் பாதிக்கப்பட்ட, சின்னாபின்னமாக்கப்பட்ட கிழக்கு மாகாணம் இன்று எல்லாத்துறைகளிலும் பாரிய முன்னேற்றத்தை கண்டு வருகின்றது. குறிப்பாக, விவசாயத்துறையிலே மிகவும் கூடுதலான நெல்லுற்பத்தியைச் செய்கின்ற ஒரு மாகாணமாக மாறியிருக்கிறது. ஓரிலட்சம் ஏக்கருக்கும் மேற்பட்ட கைவிடப்பட்ட காணிகளில் இன்று பயிர்ச்செய்கை பண்ணப்படுகின்றது. வறுமைக்கோட்டுக்குக் கீழிருந்த அந்த மக்களின் வருமானத்தை அதிகரிக்கின்ற, விவசாயத்தை மேம்படுத்துகின்ற பாரிய திட்டங்கள் 'திவி நெகும' வேலைத்திட்டத்தினூடாக இன்று அந்த மாகாணத்திலே செயற்படுத்தப்பட்டு வருகின்றன.

அதேபோன்று, 10-15 வருடங்களுக்கும் மேலாகக் கைவிடப்பட்ட நிலையிலிருந்த பல பாடசாலைக் கட்டிடங்களின் நிர்மாணப் பணிகள் பாரிய அளவிலே நிதி ஒதுக்கீடுகள் செய்யப்பட்டு, மீண்டும் ஆரம்பிக்கப்பட்டிருக் கின்றன. யுத்த சூழ்நிலை காரணமாக எங்களுடைய மாகாணத்திலே பல பாடசாலைகளில் மலசலகூட வசதி போன்ற அடிப்படை வசதிகள்கூட மேற்கொள்ளப்படவில்லை. மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்கள் தனது அமைச்சினூடாக கிழக்கு மாகாணத்தில் நூற்றுக்கணக்கான பாடசாலைகளுக்கு அவ்வாறான அடிப்படைத் தேவைகளை நிறைவு செய்வதற்கு நிதி ஒதுக்கீடுகளைச் செய்திருக்கிறார். அதேபோன்று வீதி அபிவிருத்தி, மின்சார வசதி, பொருளாதார அபிவிருத்தி என எல்லாத்துறைகளிலும் இன்று அந்தப் பிரதேசங்கள் முன்னேற்றத்தைக் கண்டு வருகின்றன. எங்களுடைய மக்கள் 'கார்பட்' வீதிகளையோ கொங்கிறீட் வீதிகளையோ இதுவரை கண்டது கிடையாது. இப்பொழுதுதான் எங்களுடைய பிரதேசங்களில் 'கார்பட்' வீதிகளும் கொங்கிறீட் வீதிகளும் அமைக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. தன்னுடைய அமைச்சுப் பணிகளுக்கு மேலதிகமாக வடக்கு, கிழக்கின் அபிவிருத்தியிலே இரவு, பகலென எந்நேரமும் முழுமூச்சாக இருந்து செயற்பட்டுக் கொண்டிருக்கின்ற மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்களால் எங்களுடைய பிரதேசங்கள் இன்று முன்னேற்றத்தைக் கண்டுகொண்டிருக்கின்றன.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! The Sitting is suspended till 1.00 p.m. Hon. Deputy Minister, you may continue your speech after the lunch break.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා.1.00ට නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி. ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Deputy Minister, you have six more minutes.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, நாட்டின் வறுமை நிலையைப் போக்கி, கிராமங்களைக் கட்டியெழுப்பி அதன்மூலம் நாட்டைக் கட்டியெழுப்பி 'ஆசியாவின் ஆச்சரியம்' மிக்க நாடாக இந்த நாட்டை மாற்றும் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய சிந்தனையை முழுமையாக வெளிப்படுத்துகின்ற ஓர் அமைச்சாக பொருளாதார அபிவிருத்தி அமைச்சு செயற்பட்டுக்கொண்டிருக்கின்றது. பிரதேச வேறுபாடுகளுக்கப்பால் இன, மத வேறுபாடுகளுக்கப் பால் முழு நாட்டையும் பொருளாதார ரீதியாகக் கட்டியெழுப்புகின்ற இந்த அமைச்சுக்குப் பொறுப்பாக இருக்கின்ற மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்கள் தன்னுடைய மாவட்டத்தைவிடவும் அதிக நேரத்தை வடக்கு, கிழக்கிலே செலவு செய்துகொண்டிருக்கின்றார். பொருளாதார அபிவிருத்தி அமைச்சினுடைய பங்களிப்புடன் எல்லாத் துறையிலும் எங்களுடைய பிரதேசங்களை நாங்கள் கட்டியெழுப்பிக்கொண்டிருக்கின்றோம். 'திவிநெகும' வேலைத் திட்டத்தினூடாக ஒவ்வொரு கிராமமும் பொருளாதார ரீதியிலே முன்னேற்றத்தைக் கண்டு வருகின்றது. எங்களுடைய பிரதேசம் விவசாயத்துறையிலும் முன்னேற்றம் அடைந்திருக் கின்றது. உணவுப்பொருட்களின் விலைகள் குறிப்பாக, மரக்கறி வகைகளின் விலைகள் அந்தப் பிரதேசங்களிலே குறைவடைந்திருக்கின்றன. வறுமை நிலையிலிருந்த பல குடும்பங்கள் தங்களுடைய பொருளாதாரத்தைக் கட்டியெழுப்பக்கூடியதாக இருக்கின்றது. 'கிழக்கின் உதயம்' வேலைத்திட்டத்திற்காக பொருளாதார அபிவிருத்தி அமைச்சு இதுவரை சுமார் 125 பில்லியன் ரூபாய்களை அந்த மாகாணத்திலே செலவு செய்திருக்கிறது.

அதேபோன்றுதான் சமுர்த்தி வேலைத்திட்டம் கடந்த காலங்களில் சிறப்பாக இயங்கவில்லை. இன்று மாண்புமிகு அமைச்சர் அவர்கள் அதனைப் பொறுப்பேற்றதன் பின்னர்தான் அவ்வேலைத்திட்டத்தினூடாகப் பாரிய திட்டங்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்றன. இன்று அதனூடாக உண்மையான சுபிட்சத்தை வறிய குடும்பங்கள் பெற்றுக்கொள்வதற்கான பல வழிகள் ஏற்பட்டுக் கொண்டிருக்கின்றன.

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இங்கு உரை நிகழ்த்திய தமிழ்த் தேசியக் கூட்டமைப்புப் பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு மாவை. சோ. சேனாதிராஜா அவர்கள், மிகவும் மோசமான முறையில் அரசாங்கத்தை விமர்சித்தார். வடக்கு, கிழக்கிலே மீண்டுமொரு இரத்த ஆறை ஓடவைக்கின்ற வகையில் இன ரீதியான பேச்சுக்களை அவர் இந்தச் சபையிலே பேசினார். இன்று வடக்கு, கிழக்கிலே மக்கள் நிம்மதியாக வாழ்ந்துகொண்டிருக்கிறார்கள். வடக்கும் கிழக்கும் இணைந்த ரீதியிலேதான் அரசியல் தீர்வென்றும் இல்லையேல் எங்களுக்கு எந்தவொரு அபிவிருத்திப் பணிகளும் தேவையில்லையென்றும் அவர் சொன்னார். கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, வடக்கு, கிழக்கிலே வாழுகின்ற மக்கள் அபிவிருத்தி வேண்டும்; அடிப்படைத் தேவைகள் நிறைவுசெய்யப்படவேண்டுமென்று சொல்கின்ற போது, அந்த மாவட்ட மக்களால் தெரிவுசெய்யப்பட்ட உறுப்பினர் அவர்கள் அங்கு அபிவிருத்தி தேவையில்லை யென்று சொல்லுவதைக்கண்டு நாங்கள் மனவேதனையடை

[ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා]

கின்றோம். "கிழக்கு மாகாண மக்கள், இணைந்த வடக்கு-கிழக்கிலிருந்து கிழக்கு பிரிக்கப்படவேண்டுமென்று எப்போதுமே வாக்களிக்கவில்லை; இணைந்த வடக்கு-கிழக்குக்கு ஆதரவாகத்தான் தொடர்ச்சியாக அவர்கள் வாக்களித்து வருகிறார்கள்" என்று அவர் சொன்னார். கடந்த மாகாண சபைத் தேர்தலில் கிழக்கு மக்கள் வாக்களித்து, தனியான ஒரு கிழக்கு மாகாண சபையை உருவாக்கி, இன்று மூவின மக்களும் அங்கு நிம்மதியாக வாழ்ந்து கொண்டிருக்கிறார்கள்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, please wind up.

**ගරු එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මහතා**
(மாண்புமிகு எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ்)
(The Hon. M.L.A.M. Hisbullah)
Give me one more minute, Sir.

ஆகவே, மீண்டும் அந்த இனங்களுக்கு மத்தியிலே இனத்துவேசத்தைக் கிளப்பி, அந்த மக்கள் மத்தியிலே பிரச்சினையை உருவாக்குவதற்கு இடமளிக்கக்கூடாதென்று இந்தச் சபையிலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

අවසාන වශයෙන්, නැඟෙනහිර පළාතේ සංවර්ධනය සඳහා දෙනු ලබන සහයෝගය වෙනුවෙන් මම ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත්, ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමාටත්, නියෝජ්‍ය අමාත්‍ය ගරු මුතු සිවලිංගම් මැතිතුමාටත්, ඒ අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මැතිතුමාටත්, අතිරේක ලේකම්වරුන් වන නිහාල් සෝමවීර මැතිතුමාටත්, රණවක මැතිතුමාටත්, අධ්‍යක්ෂ ජනරාල්වරුන් ඇතුළු සියලුම නිලධාරින්ටත්, විශේෂයෙන්ම ගරු ඇමතිතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ. භා. 1.08]

**ගරු එස්. බී. නාවින්න මහතා (පාරිභෝගික සුබ සාධනය පිළිබඳ අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - நுகர்வோர் நலன்புரி அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Consumer Welfare)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාරක සභා අවස්ථාවේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ යටතේ වචන ස්වල්පයක් කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

සියලුම ක්ෂේත්‍රයන් ආවරණය කරමින් ඉතා සාරවත්, එමෙන්ම මධ්‍යස්ථ අය වැය ලේඛනයක් ඉදිරිපත් කිරීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමාට අපගේ ස්තුතිය ප්‍රථමයෙන්ම පුද කළ යුතුයි. මෙම අය වැය ලේඛනය රටේ සංවර්ධනයට විශාල පහසුකම් රැසක් සලසමින් දුර දක්නා ඉලක්කයක් ඇතිව, එමෙන්ම දර්ශනයක් ඇතිව සකස් කළ අය වැයක්. සංවර්ධනය දෙස ජනතාවගේ පැත්තෙන් බලා ජනතා අවශ්‍යතාවන් තේරුම් ගෙන සමාජයේ පහළම මට්ටම දක්වා සංවර්ධනයේ ප්‍රතිලාභ බෙදී යන ආකාරයටයි, මේ අය වැය යෝජනා සකස් වී තිබෙන්නේ. ඍජුවම ආර්ථික වර්ධනය සඳහා දායකත්වය සපයන ක්ෂේත්‍ර පිළිබඳව වඩාත් ප්‍රායෝගිකව බලා බදු සහන සහ වෙනත් පහසුකම් ලබා දී ආර්ථික වර්ධනය ඉහළට ගැනීම තුළින් ඒකපුද්ගල ආදායම ඉහළට නැංවීම මෙම අය වැයේ ඇති විශේෂ ලක්ෂණයක්.

ජනතාවාදී රජයක් වශයෙන් රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කිරීම, වීරෝදාර රණවිරුවන් සඳහා වැඩි පහසුකම් සැලසීම, විශ්‍රාමිකයන්ගේ වැටුප් ඉහළට නැංවීම මෙන්ම සමාජ සුබසාධනය සඳහා වැඩිම ප්‍රතිලාභ ලබා දුන් අය වැයක් ලෙස මෙම අය වැය ඉතිහාස ගත වනු ඇති.එසේම මේ අය වැයෙන් අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවලට විශේෂ අවධානයක් යොමු කර තිබෙනවා.

සමස්තයක් වශයෙන් ගත්තාම රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳව ආසියාවේ පමණක් නොව ලෝකයේ කැපී පෙනෙන රටක් වශයෙන් ඉදිරියට යාමේ හැකියාව අපට තිබෙන බව පෙන්නුම් කරන අය වැයක්. ජාතික අය වැය කියන්නේ යම් රටක ආර්ථික, සමාජයීය, දේශපාලනික, සංස්කෘතික ආදී වශයෙන් වූ සමස්ත සංවර්ධනය පිළිබඳව ඉලක්ක කොට සමස්ත රටේ ආදායම් හා වියදම් පිළිබඳව දැක්වෙන ලේඛනයක්. ඒ වුණාට සමාන්‍ය ජනතාව පසු ගිය කාලයේ අය වැය දිහා බැලුවේ සිගරැට්, අරක්කු මිල අඩු වැඩි කරන, භාණ්ඩ මිල වෙනස් කරන, බදු අය කරන, පඩි වැඩි කරන ලේඛනයක් විධියටයි. ඇත්තෙන්ම මැජික් පෙන්වන ලේඛනයක් විධියටයි. එහෙත් අපේ ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු මේ අය වැය ඇතුළු අය වැය ලේඛන නිසා අය වැය මැජික් ලේඛනයක් කියන දුර්වල මානසිකත්වයෙන් ඉවත් වෙලා, අය වැය කියන්නේ රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳ ඉදිරි දැක්ම දක්වන ලේඛනයක් ලෙස සාමාන්‍ය ජනතාව හිතන්න පටන් අර ගෙන තිබෙනවා. ඒක මහින්ද චින්තනය යටතේ ජනතාව ලැබූ ජයග්‍රහණයක්. විපක්ෂය තවම ඉන්නේ අර මැජික් පෙන්වන අය වැය ලේඛන මානසිකත්වයෙන්. ඒ බව ඔබතුමන්ලාගේ ප්‍රශ්නවලින් හිතෙනවා. එහෙත් අපි සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි, අතිගරු ජනාධිපතිතුමා ඉදිරිපත් කරපු අය වැය ලේඛනවලින්, ප්‍රශ්නවලට පැලැස්තර දමනවා වෙනුවට අනාගත පරම්පරාව ගැන හිතලා රට සංවර්ධනය කරන්න ස්ථිරසාර පදනමක් දමලා තිබෙනවාය කියන එක.

අපි අවුරුදු 30කට අධික කාලයක් ත්‍රස්තවාදය පරදවන්න යුද්ධයක පැටලිලා හිටියා. එහෙත් අපේ ජනාධිපතිතුමාගේ එඩිතර නායකත්වයෙන් මේ රට බේරා ගත්තා; එක්සේසත් කළා. දැන් අපි ඒ යුද්ධය දිනා ගත්තා වාගේ රට දියුණු කරන්න යුද්ධ කරන්න වෙලා තිබෙනවා. යුද්ධය ඉවර වෙලා අවුරුදු දෙකකින් අපි විශාල සංවර්ධන මාවතකට එළඹිලා තිබෙනවා. අපට අවුරුදු දෙකකින් ආරක්ෂක වියදම් සම්පූර්ණයෙන්ම අඩු කරන්න පුළුවන්කමක් නැහැ. ඒක ක්‍රමිකව සිදු වේවි. විපක්ෂයට ඒක තේරුම් ගන්න බුද්ධිය තිබෙන බව මම විශ්වාස කරනවා. අපි යුද්ධය ඉවර කළාට ජාතික ආරක්ෂාව ගැන හැමදාම හිතන්න ඕනෑ.

ජාතික සංවර්ධනයේ නිවැරදි මාවතකට අපේ රට අද යොමු වෙලා තිබෙනවා.

විපක්ෂය ඒක තේරුම් ගන්න උත්සාහ නොගත්තාට ජනතාව ඒක හොඳින් තේරුම් අරගෙන ඉන්න බව අපි දන්නවා. මේ ජාතික සංවර්ධනයේදී ආර්ථික සංවර්ධනය මූලික වෙනවා. එහිදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පිහිටුවලා එය ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා වාගේ කාර්යශූර ඇමතිවරයෙකුට ලබා දීම පිළිබඳව අපි අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ජාතික වශයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති හා වැඩ පිළිවෙළක් සකස් කරලා ජාතික, පළාත්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් විවිධ අමාත්‍යාංශ හා ආයතන සම්බන්ධීකරණය කරමින් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමේ කටයුත්තට ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා විශාල කාර්ය භාරයක් ඉටු කරනවා. අද මේ රටේ ආර්ථිකයේ සැලකිය යුතු ලෙස පෙනෙන්නට තිබෙන දියුණුවට මේ වැඩ පිළිවෙළ ප්‍රධාන හේතුවක් වුණා.

රටේ ආර්ථික සංවර්ධන කටයුතු සඳහා රුපියල් බිලියන 497ක් වෙන් කර තිබෙනවා. දැනුම, බලශක්තිය, වෙළෙඳ හා වාණිජ, නාවික, ගුවන් යන පංචබල කේන්ද්‍ර බවට ශ්‍රී ලංකාව පත් කිරීම එහි අරමුණයි. ඒ වාගේම සංවර්ධන වේගය සියයට අටකට එහාට ගෙන යෑම රජයේ අරමුණයි.

විපක්ෂය මොනවා කිව්වත් රටේ උද්ධමනය හා දුප්පත්කම මේ වන විට අඩු වෙමින් පවතිනවා. දේශීයව උපයන ආදායම පුනරාවර්තන වියදම් සඳහාවත් මදි වුණ යුගය දැන් අප පසු කර තිබෙනවා. පසු ගිය වසරේ බිලියන 180ක් වූ එම හිඟය මෙවර බිලියන 1.8ට අඩු වී තිබෙනවා. මහින්ද චින්තනය තුළ ප්‍රථමයෙන්ම කළ කාර්යයක් තමයි, ගොවියාට රුපියල් 350ට පොහොර මිටියක් ලබා දීම. මෙම අය වැයෙන් ඒ සඳහා වෙන් කර ඇති මුදල බිලියන 40ක්. එහෙම නැත්නම් කෝටි 4,000ක්. රජයේ සහනාධාර පැකේජය පමණක් බිලියන 239ක්.

යටිතල පහසුකම් සංවර්ධනය කිරීම ඉහළ ආර්ථික සංවර්ධන වේගයක් ඇති කිරීමේ ප්‍රථම පියවරයි. බිලියන 452ක් ඒ සඳහා වෙන්කර තිබෙනවා. අද සංවර්ධනය මිනිසුන්ට දැනෙනවා. තමුන්ගේ කටයුත්තක් කියලා අපි ආරම්භ කළේ ගම නැඟුමයි. ගම් යා කරන්න මාර්ග ඕනෑ. ඒ සඳහා මඟ නැඟුම ආරම්භ කළා.

දැන් භෞතික සංවර්ධනය සමඟ මිනිසුන්ගේ ජීවන මට්ටම ශක්තිමත් කරන්න ඕනෑ. ඒ නිසා දිවි නැඟුම ආරම්භ කළා. ගෙවතු ලක්ෂය දහය, ගෙවතු ලක්ෂ විසිපහ දක්වා වැඩිදියුණු කරන්න කටයුතු කරනවා. "දිවි නැඟුම ගම්මාන" පිහිටුවා සමස්ථ ආර්ථිකය සංවර්ධනය කිරීමට කටයුතු යොදා තිබෙනවා.

මේ විධියට ආර්ථික සංවර්ධනයේ අඩිතාලම ගම් මට්ටමින් ආරම්භ කර තිබෙනවා. දිවි නැඟුම ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවලා සමෘද්ධි නිලධාරීන් විශ්‍රාම ලබන රජයේ සේවකයන් බවට පත් කරනවා. පොහොර සහනාධාරය ලබා දෙන කොට ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය දියුණු වෙනවා. දැන් මේ සංවර්ධනය තුළ වෙනමම හුදෙකලා ගමක් නිර්මාණය වෙන්නේ නැහැ. නිෂ්පාදන ක්‍රියාවලිය ශක්තිමත් වෙන්න යටිතල පහසුකම් ඕනෑ.

ආර්ථික මධ්‍යස්ථාන ඇති වෙනවා. මාර්ග, විදුලිය, ජල යෝජනා ක්‍රම, නගර නිර්මාණය, පානීය ජලය, නිවාස, අධ්‍යාපනය, ක්‍රීඩා පහසුකම්, ගමනාගමනය, සෞඛ්‍ය ආදී වශයෙන් මේ සියලු දේටම ප්‍රමුඛතාව දීලා මුළු රටම ආර්ථික සංවර්ධනය කරා යොමු කරන අය වැයක් වශයෙන් අපට මේ අය වැය දකින්න අපට පුළුවන්කම තියෙන්න ඕනෑ.

අද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා දිස්ත්‍රික් මට්ටමේ සංවර්ධන කමිටු සමඟ සාකච්ඡා කරමින් පාර්ලිමේන්තුවේ අපේ මන්ත්‍රීවරුන් සමඟ කථා බහ කරලා දිස්ත්‍රික් මට්ටමේ ආර්ථික සංවර්ධනය සඳහා සාර්ථක වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා. "වයඹ පුබුදුව" තුළින් මේ බව දකින්නට පුළුවන්.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ ජනතාව වෙනුවෙන් හා එහි සංවර්ධනයට ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ඇතුළු අමාත්‍යාංශ නිලධාරීන් ගනු ලබන උත්සාහය අපි අගය කරනවා. දිවි නැඟුම, ගම නැඟුම, සමෘද්ධි වැඩසටහන් රට පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරද්දී කුරුණෑගල දිස්ත්‍රිකයේ දිවි නැඟුමට රුපියල් මිලියන 255කුත්, ගම නැඟුමට රුපියල් මිලියන 960කුත්, සමෘද්ධි සහනාධාර සඳහා රුපියල් මිලියන 150කුත් වශයෙන් මිලියන 1,365ක් 2011 වසරේදී ලබා දී තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ විදුලිබල ව්‍යාපෘති 289ක් සඳහා රුපියල් මිලියන 3,200ක් වෙන් කර තිබෙනවා. ඒ වාගේම ව්‍යාපෘති 53ක් මඟින් පාරවල් කිලෝමීටර් 374ක් සංවර්ධනය කරන්න අපි කටයුතු කර තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට නියමිත කාලය අවසන් නිසා කථාවේ ඉතිරි ටික මම **සභාගත*** කරනවා.

[අ. භා. 1.17]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා සන්තෝෂ වනවා, අද මේ රටේ ඉන්න ප්‍රබලම ඇමතිවරයාගේ සහ සියලුම බලය ඒක රාශි වෙලා තිබෙන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ ගැන වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන.

විශේෂයෙන්ම ගරු ඇමතිතුමා අද මේ දරන මහන්සිය සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වනවා. අපේ ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත්, ඔබතුමාට සහාය දීලා වැඩ කරන නායකයෙක්. ඇමතිතුමාගේ විශාල හීනයක් තමයි මේ රට දියුණු කරන වැඩ පිළිවෙළ. යුද්ධය අවසන් වුණාට පස්සේ රටට අලුත් ආයෝජන ගෙන්වා ගැනීම සහ පංචබල කේන්ද්‍රයක් හදලා රට ආසියාවේ ආශ්චර්යය කිරීමේ වැඩ පිළිවෙළ තමයි ඔබතුමන්ලාගේ ඒ හීනයේ තිබෙන්නේ. ඉතින් මේ රට ආසියාවේ ආශ්චර්යය කරන වැඩ පිළිවෙළේදී, කොයි තරම් කථා කෙරුවත් වැඩක් නැහැ, ඒ කථා කරන ප්‍රතිපත්ති සහ අවශ්‍ය කරන වැඩ පිළිවෙළ හරියට කර ගන්න බැරි වෙනවා නම්. එක පැත්තකින් ආණ්ඩුව සෘජු විදේශ ආයෝජන බලාපොරොත්තු වනවා; අලුත් සංචාරකයෝ බලාපොරොත්තු වනවා; අලුත් ආයෝජන බලාපොරොත්තු වනවා; රැකී රක්ෂා උත්පාදනය බලාපොරොත්තු වනවා. අනෙක් පැත්තෙන් ඒකට වැට බඳින ක්‍රමවේදයක්ම ඒක ඇතුළේම ස්ථාපිත කරලා තිබෙනවා.

මා විශේෂයෙන් කථා කරන්න කැමැතියි, මහ කොළඹ ආර්ථික කොමිසම -ආයෝජන මණ්ඩලය- ගැන. මා හිතන විධියට මීට පෙරත් මා මේ ගැන සඳහන් කෙරුවා. පසු ගිය කාල වකවානුවේ මේ රටට ඇවිල්ලා තිබුණු අලුත් ව්‍යාපෘති බැලුවොත්, මේ ඔබතුමාගේ පොතේ තිබෙන කාරණා අනුව, ලංකාවට ඇවිල්ලා තිබෙන සෘජු විදේශ ආයෝජන- Foreign Direct |Investment - විශාල ප්‍රමාණයක් කඩා වැටී තිබෙන බවයි අපි දකින්නේ. යුධ සමයේ, 2008 වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 888.935ක් වශයෙන් ලංකාවට ආපු ආයෝජන 2011 ජූලි මාසය වන කොට 413 දක්වා අඩු වෙලා තිබෙනවා. හැබැයි, යුද්ධය කාලයේ මීට වැඩිය ආයෝජන ඇවිල්ලා තිබෙනවා. ඒක තමයි තිබෙන ප්‍රධාන කාරණය. මා ඒකයි අහන්නේ ඔබතුමාගෙන් මෙන්න මේ කාරණය. අපි මේ ඇති කරපු අලුත් ක්‍රමවේදයත් එක්ක 2009 සිට 2011 වන තුරු අවුරුදු දෙකක්, දෙක හමාරක් තිස්සේ මේ තත්ත්වය වැඩි කර ගන්න බැරි වුණේ ඇයි කියන එකයි අපි අහන්නේ. උදාහරණයක් හැටියට 2010 වර්ෂය ගැන විතරක් මම කියන්නම්. ඔබතුමන්ලා මේ පොතේ දාලා තිබෙන කාරණා අනුව ව්‍යාපෘති 269ක් සඳහා අත්සන් කරලා තිබෙනවා. ඒ 269න්, 124ක් අවලංගු කරලා තිබෙනවා. වසා දමන ලද සහ අත් හැර දමන ලද ව්‍යාපෘති ගත්තාම 61ක් තිබෙනවා. අවලංගු කරන ලද, වසා දමන ලද සහ අත් හැර දමන ලද ව්‍යාපෘති ඔක්කෝම 185ක් තිබෙනවා. ඒ කියන්නේ, ඒ ආපු ආයෝජන 269න් 185ක් එක්කෝ අත හැර දමලා, නැත්නම් අවලංගු කරලා, නැත්නම් වසා දමලා. ඒකෙන් අදහස් කරන්නේ, අපට ආපු සෘජු විදේශ ආයෝජනවලින් සියයට 69ක් සාර්ථක නැහැ කියන එකයි. ඒ කියන්නේ ලංකාවට ආපු ආයෝජනවලින් සියයට 30යි, 2010 අවුරුද්දේ ස්ථාවරව

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ; වැඩ කරලා තිබෙන්නේ. ඒවායේත් ප්‍රශ්න තිබෙනවා. ලංකාවට පැමිණ සිටින ආයෝජකයන් ප්‍රමාණය හා ඒ ආයෝජකයන්ගේ රැකියා වර්ධනය සම්බන්ධයෙන් බැලුවාම ප්‍රශ්නකාරී වාතාවරණයක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාගේ අවධානයට ගෙනෙන්න කැමැතියි, විශේෂයෙන් ඔබතුමන්ලාගේ අලුත් වැඩ පිළිවෙළේ ආයෝජන කර්මාන්තශාලාවල හා ආයෝජන ස්ථානවල තිබෙන ප්‍රශ්න පිළිබඳව. දැන් බලන්න, පසු ගිය අවුරුද්දේ -2010 අවුරුද්දේ- බියගම වෙළෙඳ කලාපයේ පාඩුව රුපියල් මිලියන 36,989යි. ඊ ළඟට, මීරිගම ගත්තාම, ගිය අවුරුද්දේ -2010 අවුරුද්දේ- පාඩුව රුපියල් මිලියන 11,584යි. වතුපිටිවල ගත්තාම, රුපියල් මිලියන 13,703ක් පාඩුයි. පොල්ගහවෙල ගත්තාම රුපියල් මිලියන 4,167ක් පාඩුයි. කොග්ගල ගත්තාම රුපියල් මිලියන 17,503ක් පාඩුයි. දැන් වතුපිටිවල ගත්තාම, රුපියල් මිලියන 12,787 සිට රුපියල් මිලියන 13,703 දක්වා පාඩුව වර්ධනය වෙලා තිබෙනවා. මල්වත්ත ගත්තාම, රුපියල් මිලියන 3,458ක් පාඩුයි. පාඩු ලබමින් තමයි මේ වෙළෙඳ කලාප - ආයෝජන කලාප- ක්‍රියාත්මක වන්නේ. මේ රට ඔවුන්ට සියලු පහසුකම් දෙනවා; වතුර ටික දෙනවා. සියලු දේ දීලා අන්තිමට පාඩු ලබන තැනට ඒවා පත් වෙලා තිබෙනවා.

මේක ඇමතිතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි. මේක BOI එකේ තිබෙන පාරම්පරික ප්‍රශ්නයක්. ජී.එල්. පීරිස් ඇමතිතුමාත් එක්ක ඉන්න කාලයේ මමත් අවුරුදු ගණනක් ආයෝජන මණ්ඩලයත් එක්ක වැඩ කළා. ඒ කාලයේ ඉඳලා ආයෝජන මණ්ඩලය එහෙම තමයි. ඩිලාන් විජේසිංහ මහත්මයාගේ කාලයේ ඉඳලා මේ ප්‍රශ්නය තිබෙනවා. මා ඇමතිතුමාගෙන් ඉල්ලනවා, මේකට මොකක් හෝ ක්‍රමවේදයක් සකස් කරන්න කියලා. මොකද, මේ සංඛ්‍යා, දත්ත, ලේඛනවලින් රට රවටන්න බැහැ. ඇත්ත වශයෙන් අද සිද්ධ වෙමින් තිබෙන්නේ, කර්මාන්තශාලා වැහෙමින් යන එකයි. රන්මලු ගාමන්ට් කියන ආයතන දෙකම අද වැහිලා තිබෙනවා. ඒ දෙකේම සේවක සංඛ්‍යාව 1,400කට වැඩියි.

ඔබතුමන්ලාගේ අලුත් වැඩ පිළිවෙළ යටතේ රට සංවර්ධනය කරන්න ඔබතුමාට ලොකු වැඩසටහනක් තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් බලන්න මේ අලුතින් හැදෙන මාර්ග ගැන. උදාහරණයක් විධියට, 1977 ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා ගෙනාපු කටුනායක ආයෝජන කලාපයේත්, බියගම ආයෝජන කලාපයේත් පාරවල් ටික හදන්න රුපියල් බිලියන 2.5ක්වත් වියදම් කළේ නැහැ. හැබැයි දැන් ඔබතුමන්ලා දැවැන්ත වියදමක් කරලා අලුත් ආයෝජනවලට එන්න අවශ්‍ය කරන වටපිටාව හදනවා. ඒක හොඳයි. හැබැයි ඒක ඉතාම දැවැන්ත වියදමක්. දැන් හම්බන්තොට වරායේ කටයුතු අවසන් වන කොට වියදම රුපියල් කෝටි 25,000යි. මේ වරායේ කටයුතු අවසන් කරන්න අපේ රටේ ආදායමෙන් 1/4ක් අපි වියදම් කරනවා.

දැන් බලන්න, හම්බන්තොට වරාය සම්බන්ධයෙන් තිබෙන advertisement එක. මා දන්නේ නැහැ, මේ advertisements හදන්නේ කවුද කියලා. හම්බන්තොට වරාය හදලා, ඒක විවෘත කරන්න කලින් රූපවාහිනියේ ප්‍රචාරය වුණු advertisements මොනවාද? ආප්ප හදන මනුෂ්‍යයෙක්, ආප්ප හදන ගමන් කියනවා, "මහත්තයා, හෙට උදේ ඉඳලා අපට වැඩියෙන් ආප්ප විකුණන්න පුළුවන්" කියලායි. බලන්න, දැන් ඒකෙන් කියන්න ඕනෑ පණිවුඩය ඒක නොවෙයි නේ. ඒකෙන් කියන්න ඕනෑ මේකයි. කොළඹ ඉන්න ව්‍යාපාරිකයෙක් කාමරයකට වෙලා ඉඳ ගෙන, "මා වෙන දා containers සියල්ලම කොළඹින් අරගෙනයි ගියේ. හම්බන්තොට වරාය හැදුවාම කොළඹින් ගෙන යන්න ඕනෑ නැහැ, හම්බන්තොටින් ගෙනෙන්න පුළුවන්" කියලා කියන්න ඕනෑ. එහෙම පණිවුඩයක් තමයි දෙන්න ඕනෑ. දැන් මේකෙන් කියන්නේ මොකක්ද? ආප්ප හදන මනුෂ්‍යයෙක් ආප්ප හදලා කියනවා, "දැන් අපේ ආප්පවල ගණන වැඩි වනවා. වැඩි වැඩියෙන් ආප්ප කන්න අය එනවා"යි කියලා. ඒ කියන්නේ, වරාය හදන්නේ ආප්ප කන්නද? හම්බන්තොට වරායට නැව් එන්නේ ආප්ප කන්න බලා ගෙනද? මේකද, අලුත් ආර්ථික දර්ශනයේ වැඩ පිළිවෙළ?

ඊ ළඟට, ඊයේ-පෙරේදා විවෘත කළ දකුණු අධිවේගී මාර්ගය ගැන ප්‍රචාරය වුණු advertisement එක මා දැක්කා. තරුණ ජෝඩුවක් හිනා වෙවී, සින්දු කියකියා විනෝදයෙන් අධිවේගී මාර්ගයේ යනවා. ඒ කියන්නේ ගාල්ලට ගිහින් දවාලට කෑම කාලා එන්නද මේ දකුණු අධිවේගී මාර්ගය හැදුවේ? අපි ඒකටද මේ අධිවේගී මාර්ගය හැදුවේ? නැහැ. ඒකෙන් ප්‍රචාරය වන්න ඕනෑ මේකයි. Containers තිබෙන ගාල්ලේ ව්‍යාපාරිකයෙක්, එහෙම නැත්නම් කර්මාන්තශාලා හිමියෙක් ප්‍රකාශ කරන්න ඕනෑ, "මෙන්න, දැන් අපි containers ගෙන යන මාර්ගයක් හදලා තිබෙනවා. වෙන දා කොළඹ ඉඳලා ගාල්ලට යන්න මට පැය දෙකක්, තුනක් ගත වුණා. දැන් මගේ containers ටික අරගෙන මට පැයෙන් ගාල්ලේ තිබෙන කර්මාන්තශාලාවට යන්න පුළුවන්"යි කියලා. එහෙම ප්‍රචාරය වන්නේ නැහැ. දැන් මේ හදපු අධිවේගී මාර්ගයේ containersවලට යන්න පුළුවන්ද? තමුන්නාන්සේලා ඒකට ඉඩ දීලා තිබෙනවාද? නැහැ. ඉඩ දීලා නැහැ. ගමනා ගමනයේ යෙදෙන සාමාන්‍ය මිනිසුන්ට අධිවේගී මාර්ගයේ ගිහින් වැඩ කර ගන්නට නොවෙයි අපට වුවමනා වෙලා තිබෙන්නේ. මේකත් එක්ක හැදෙන්න ඕනෑ මොනවාද? අධිවේගී මාර්ග ලෝකයේ හැදෙනකොට -මැලේසියාව අරගෙන බලන්න. මැලේසියාවේ එක ප්‍රදේශයක අධිවේගී මාර්ගය හැදෙනකොට- එහා පැත්තෙන් කර්මාන්තශාලා හැදිලා ඉවරයි. [බාධා කිරීමක්] මම ඔබතුමාට පසුව නම කියන්නම්. දැන් ඔබතුමන්ලාට සිද්ධ වෙලා තිබෙනවා, අධිවේගී මාර්ගය හදලා ඊ ළඟට කර්මාන්තශාලා හදන්න. අඩුම ගණනේ මේ පාරෙන් containersවලට යන්නට පුළුවන්ද කියා ඇහුවොත්, "මේ පාරේ containersවලට යන්න බැහැ. Containersවලට යන්නට දෙන්නේ නැහැ" කියනවා. නමුත් මේකේ යන්න ඕනෑ containers. එතකොට තමයි ආර්ථික දියුණුවක් රට ඇතුළේ සිද්ධ වෙන්නේ; අලුත් කර්මාන්තශාලා ඇති වෙන්නේ; අලුත් රැකී රක්ෂා අවස්ථා ඇති වෙන්නේ. එහෙම ඇති වෙන්නේ නැතිව, රුපියල් කෝටි පන්දාහක, කෝටි දහ දාහක වියදමක් කරලා රටක් විධියට අප මේ රට කොහාටද අර ගෙන යන්නේ කියන එක මම අහන්න කැමැතියි.

ආයෝජකයන් පිළිබඳ තත්ත්වය ගත්තාම, ඔබතුමන්ලා යුද්ධයෙන් පස්සේ ආයෝජනය කරන්න කැලමැන්ඩල් කියන සමාගමක් එක්ක ව්‍යාපාර රක්ෂණ අරමුදලක් ගොඩ ගන්න අවශ්‍ය කටයුතු ටික ලැහැස්ති කළා. ඒකේ මූලික බලපොරොත්තුව වුණේ මේ ආයෝජන අවස්ථාවට ඩොලර් මිලියන 75ක අරමුදලක් හදන්න. මේකට ලංකාවට ආවා, කැලමැන්ඩල් කැපිටල් සිංගප්පූරු සමාගමේ කොළඹ කර්යාලයේ අධ්‍යක්ෂ මාෆාජ් ඉෂාක්. ඔහු සාකච්ඡාවක් කරනවා. ඒ සාකච්ඡාවේදී ඔහු මොකක්ද කියන්නේ? "විශාල පරාසයක විහිදී ඇති උනන්දු කණ්ඩායම් සහ ආධාරකරුවන් balance කිරීමට ජනාධිපතිවරයාට සිදු වන නිසා ප්‍රතිපත්ති පිළිබඳ අස්ථාවරභාවයක් කරා යොමු වෙනවා. උදාහරණයක් වශයෙන්, ජනාධිපතිවරයාගේ පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ පවා වාමාංශිකයන්ට අවශ්‍ය, මිශ්‍ර ආර්ථිකයක් ගොඩ නගන්නට වන අතර එක්සත් ජාතික පක්ෂයෙන් පැමිණිච්ච ආර්ථික දක්ෂිණාංශිකයන් කැමැති වන්නේ ලිබරල් නිදහස් වෙළෙඳ පොළ මත පදනම් වූ ආර්ථිකයකටයි. ඊළඟට ආණ්ඩුවේ සිටින ජාතිකවාදී දක්ෂිණාංශිකයින් පාරිසරික බලපෑම් ගැන වැඩි අවධානයක් යොදවනවා. බලශක්ති ක්ෂේත්‍රය මේ තත්ත්වය හොඳින් නිරූපණය කරනවා. බලශක්ති උත්පාදන ක්ෂේත්‍රය නිදහස් කර තිබුණත් බෙදා හැරීම සහ අලෙවිකරණය වැනි ක්ෂේත්‍ර කිසි යම් අර්ථාන්විත ආකාරයකට නිදහස් කර නැහැ." කියලා ඉෂාක් කියනවා. ඉෂාක් බලනවා, ලංකාවේ අලුත්

ආයෝජන අවස්ථාවන් ඇති කරන්න. ඔහු කියනවා, ඔබතුමන්ලාගේ ඇතුළේ තිබෙන ප්‍රශ්නය. ඒ, යූඇන්පී එකෙන් පැනලා ආපු දක්ෂිණාංශිකයෝ ලිබරල් වාදය ඉල්ලනවා, තමුන්නාන්සේලාගේ පාරම්පරික සමාජ ප්‍රජාතන්ත්‍රවාදයෙන් මොකුත් කර ගන්නට බැරිව ජාතික ආර්ථිකය ගැන කියව කියවා ඉන්නවා, මේකේ ඇතුළේ ඉන්න අන්ත වාමාංශික කට්ටිය වෙනත් කථාවක් කියනවා කියායි.

මේ යුද්ධය අවසාන වෙලා තිබෙන තත්ත්වයක් තුළ ඔබතුමන්ලාට රට දියුණු කරන්නට පුළුවන් ආර්ථික වැඩ පිළිවෙළකට තල්ලු කරන්නට බැහැ. මොකද, ඊට වඩා තිරිංග වැටිලා තිබෙනවා තමුන්නාන්සේලාව පල්ලෙහාට අදින්න. මේක තමයි අද සිද්ධ වෙලා තිබෙන්නේ. බලන්න, ඒකේ ප්‍රතිඵලය මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. ඒකේ අවසාන ප්‍රතිඵලය මොකක්ද? ආර්ථික සහයෝගීතා හා සංවර්ධනය පිළිබඳ සංවිධානයේ -OECD එකේ- අවදානම් වර්ගීකරණයේ බිංදුවේ සිට හය දක්වා පරාසයක ලංකාවට හම්බ වෙලා තිබෙන්නේ හය වන ස්ථානයයි. ඒ ස්ථානයේ සිටින අනෙක් රටවල් මොනවාද? ඇන්ගෝලාව, ජෝර්ජියාව, උගන්ඩාව, ඉරානයයි.

ඊළඟට, 2010 MIGA එක -ලෝක ආයෝජන හා දේශපාලන අවදානම් පිළිබඳ ආයතනය- තම වාර්තාවේ මොකක්ද කියන්නේ? කොළොම්බියාව, උගන්ඩාව සහ ආර්ජන්ටිනාව යන රටවල් ශ්‍රී ලංකාවට වඩා අඩු දේශපාලන අවදානමක් සහිත රටවල් වශයෙන් හඳුන්වනවා. ඊළඟට, 2011, Aon Corporation එක, දේශපාලන අවදානම් සිතියම සහ 2011 Maplecroft website එක බලන්න. දේශපාලන අවදානම් සිතියම ලංකාව දක්වා තිබෙන්නේ ලිබියාව, ඊජිප්තුව සහ පේරු යන රටවල් සමඟ එක කණ්ඩායමක් විධියටයි. අපි කොහාටද අලුත් ආයෝජන අරගෙන යන්නේ?

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් මුද්‍රණය කර ඇති පොත බලන්න. අපට නේ ආයෝජන සියයට 32ක් ඇවිත් තිබෙන්නේ මුරිසියෙන්; මුරිසි දූපතෙන්. ඊළඟට, සියයට 9ක් ඇවිත් තිබෙන්නේ අනෙක් රටවල්වලින්. අනෙක් එක ඉන්දියාවෙන් තමයි වැඩිම ආයෝජන තිබෙන්නේ. ඊළඟට, හොංකොං.මේ මුරිසි දූපතෙන් ආයෝජන ගේන්නද ලංකාවේ අයෝජන අවස්ථා ඇති කර තිබෙන්නේ? අපට ආයෝජන අවශ්‍ය වන්නේ කොහෙන්ද? ලෝකයේ අනෙක් ප්‍රධාන රටවල් අපේ රටේ ආයෝජනය කරන්නට ඇවිත් තිබෙනවාද? නැහැ. එන්නේ නැත්තේ ඇයි? එන්නේ නැත්තේ ප්‍රශ්න ගණනාවක් තිබෙන නිසා. ඔබතුමන්ලාට සෘජු විදේශ ආයෝජන සම්බන්ධව ඇති වෙලා තිබෙන ප්‍රධාන ප්‍රශ්නයට ඇති හේතු විධියට අප කිව්වා, මේ ආයෝජන සඳහා එන්න නම් අපට අනිවාර්යයෙන්ම යම් කිසි ස්ථාවර වැඩ පිළිවෙළක් අවශ්‍ය කරනවාය කියා. ඒ වැඩ පිළිවෙළ මොකක්ද? ඔබතුමන්ලා ඉස්සෙල්ලාම ලාභ නොලබන ආයතන එකට එකතු කරලා ඒකට අමාත්‍යාංශයක් හැදුවා. ඒ අමාත්‍යාංශය තමයි ඔබතුමන්ලාට අවශ්‍ය කරන කටයුතු ටික ලැහැස්ති කළේ, මේවා කොහොමද කර ගෙන යන්නේ කියා.

දැන් මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? දැන් ඒ අමාත්‍යාංශය යටතේ ඔබතුමන්ලා වැඩ කර ගෙන යන කොට සමහර ආයතන ලාභ ලබනවා; සමහර ආයතන පාඩුයි. හැබැයි ඔබතුමන්ලා මේ තිබිච්ච ආයතන ටික අත් පත් කර ගන්න ගෙනාපු ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත බලන්න. මේ පනත ගෙනාවාට පස්සේ ආයෝජන කීයක් ආවාද කියලා කරුණාකරලා මට කියන්න. ඔබතුමාට පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න. මේ පනත ගෙනාවාට පස්සේ ආයෝජනවල කඩා වැටීමක් නැද්ද කියලා කරුණාකරලා මට කියන්න.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ )
(The Hon. Basil Rohana Rajapaksa)
පසු ගිය සුමානේත් ආවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පසු ගිය සුමානේ ආවා තමයි. ඔබතුමන්ලා pick කර ගන්න ඒවා එනවා. ඒකයි මම කිව්වේ. හැබැයි pick කර ගන්න ඒවා නොවෙයි. [බාධා කිරීමක්] නැහැ. හරි නම් ඔබතුමන්ලා දාලා තිබෙන ක්‍රමවේදයන් අනුව pick කරන්න ඕනෑ නැහැ නේ. ඔබතුමා ෂැන්ග්‍රි-ලා එකට ගිහිල්ලා මෙච්චරයි ගණන, දෙන්නම් ඉඩම කියලා කථා කරන්න ඕනෑ නැහැ. සාමාන්‍යයෙන් විදේශ ආයෝජකයෝ BOI එකට ඇවිල්ලා වැඩ කරන්න ඕනෑ. දැන් ඔබතුමන්ලා මොකක්ද මේ හදලා තිබෙන්නේ? BOI එක ඇතුළෙත් දැන් තව BOI එකක් තිබෙනවා. මේ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ අත් කර ගත්තු ආයතන 37 හදා ගන්න BOI එක ඇතුළෙත් දැන් තව BOI එකක් දාලා. දැන් ඒකට වෙනම කාර්යාලයකුත් දාලා. දැන් ඒ කාර්යාලයෙන් ඒවා පාලනය කරනවා. ඒවාට වියදම් කරන්නේ කවුද? අපිද? තමුන්නාන්සේලාද? මේ රටේ ජනතාව වියදම් කරන්නේ. ඉතින් අද මම ඒකයි කියන්නේ මේ ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතේ ප්‍රශ්නය අද බලන්න කියලා. දැන් බලන්න ඒ පනත නිසා සෙවනගලට වෙලා තිබෙන දේ? ඔබතුමන්ලා දැන් සෙවනගලට මොකක්ද කරන්න යන්නේ?

**ගරු එච්.ආර්. මිත්‍රපාල මහතා**
(மாண்புமிகு எச்.ஆர். மித்திரபால)
(The Hon. H.R. Mithrapala)
මන්ත්‍රීතුමා, වෙන මොනවා කියන්නද සෙවනගල තමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
පොඩ්ඩක් ඉන්න ඉතින්. කියලා දෙන්නම් එකින් එක. අද සෙවනගල සීනි නිෂ්පාදනය සම්පූර්ණයෙන් කඩා වැටිලායි තිබෙන්නේ. මම ඔබතුමාට බොහොම වග කීමක් ඇතිව කියනවා දැන් සීනි සියයට 20ක්- [බාධා කිරීමක්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
සීනි තිබ්බේ නැහැ නේ- [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දන්නවා. සීනි තිබිච්ච ගණන මම කියලා දෙන්නම්. ලංකාවේ සියයට 20යි සීනි නිෂ්පාදනය කරන්නේ. ඉතුරු ටික අපි ලංකාවට ගෙන්වනවා. දැන් මේවා නිෂ්පාදනය කරමින් හිටපු ක්‍රමවේදය මම ඔබතුමාට කියන්නම්. කරුණාකරලා ගිහිල්ලා බලන්න, දැන් මොකද වෙලා තිබෙන්නේ කියලා. දැන් සීනි නිෂ්පාදනය සඳහා උක් වවන්නට අවශ්‍ය ඉඩම් එළි පෙහෙළි කරලා අවශ්‍ය කරන වැඩ කටයුතු ටික කෙරෙමින් තියෙන්න ඕනෑ කාලය. නමුත් දැන් ඒක කඩා වැටිලා. ඒ වාගේම තමයි පැල්වත්ත ආයතනයත්. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනතක් ගෙනැල්ලා ඔබතුමන්ලා පැල්වත්ත පවරා ගත්තා. පැල්වත්තේ අයිතිකාරයා කවුද? හැරී ජයවර්ධන මහත්තයා. එතකොට හැරී ජයවර්ධන මහත්තයා කියන්නේ පාඩු ලබන ආයතනයක සභාපති නේද? පාඩු ලබන ආයතනයක සභාපති හැරී ජයවර්ධන. ඒ කියන්නේ එයා හරියට business කරන්නේ නැහැ. හැබැයි හැරී ජයවර්ධනව ඔබතුමන්ලා ගෙනැල්ලා දා ගන්නවා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති විධියට. ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් සහ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීමේ පනත යටතේ එයාගේ business එක

[ගරු දයාසිරි ජයසේකර මහතා]

පවරා ගන්නවා පාඩු ලබනවා කියලා. හැබැයි පාඩු ලබන ඒ ආයතනයේ ප්‍රධානියාව ගෙනැල්ලා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට දානවා. එතකොට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවත් පවරා ගන්න වෙයි අනාගතයේදී? ඇයි, හැරී ජයවර්ධනගේ ඉන්නේ, ඔබතුමන්ලා එහෙම නම් කල්පනා කරන්නේ. එතකොට බලන්න දැන් ඔබතුමන්ලා මොකක්ද කරන්න යන්නේ? ලංකාවේ සීනි නිෂ්පාදනය කරන්න තිබුණු වැඩ පිළිවෙළ පැත්තකට දාලා ඒවා ටික පවරා ගෙන දැන් ඔබතුමන්ලා හදනවා හම්බන්තොට raw sugar -ගල් සීනි- ගෙනැල්ලා මෙහෙ කුඩු කරන කර්මාන්තශාලාවක් හදන්න. මොකක්ද ඒ කර්මාන්තශාලාවේ නම? Shree Renuka Sugars Limited. අවුරුදු 25කට බදු ගිවිසුම ගහලා තිබෙන්නේ. මිලියන 220යි. මොකක්ද ඒ ගොල්ලෝ කරන්නේ? ඒ ගොල්ලෝ ලංකාවේ සීනි නිෂ්පාදනය කරන්නේ නැහැ. පිට රටින් සීනි ටික ගෙනැල්ලා හම්බන්තොට කර්මාන්තශාලාවේ ඒ ටික කුඩු කරලා ආපහු අපට බෙදනවා. මේවාද ඔබතුමන්ලාගේ අලුත් ආර්ථික සංවර්ධන ව්‍යාපෘති? පැල්වත්ත, සෙවනගල සීනි කර්මාන්තශාලා තිබුණු ඒවා විනාශ කරලා ඒවායේ වවන්න තිබ්බ ඒවා අයින් කරලා- [බාධා කිරීමක්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මන්ත්‍රීතුමා, විනාශ කරන්න දෙයක් ඉතුරු වෙලා තිබුණේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මන්ත්‍රීතුමා, ඉඳ ගන්න කෝ. [බාධා කිරීමක්] මම කියන්නේ එහෙම නම් ඉතින් හදන්න කෝ, දෙවියනේ. [බාධා කිරීමක්] අරගෙන හදන්න. ඇයි ඒක තිබෙද්දී- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉඳ ගන්න කෝ. ඔබතුමා කථා කරන්නේ නැතුව ඉන්න කෝ.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා (පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார - தெங்கு அபிவிருத்தி, மக்கள் தோட்ட அபிவிருத்தி அமைச்சர்)
(The Hon. A.P. Jagath Pushpakumara - Minister of Coconut Development and Janata Estate Development)
දයාසිරි මන්ත්‍රීතුමා, ඔක්කෝම දීලා ඉවරයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම දන්නවා, ඔබතුමා බලාපොරොත්තු වුණ දේ කෙරුණේ නැහැ කියලා. මට ඒකයි කනගාටුව. ඔබතුමාට වුවමනා වෙලා තිබුණේ ඒකේ යම් කිසි පාලනයක් අතට ගන්න. ඔබතුමාට ඒක ලැබුණේ නැහැ. මම ඒ ගැන කනගාටු වෙනවා. මොකද, ඔබතුමා ඒ වෙනුවෙන් විශාල මහන්සියක් වුණා තමයි. මම ඒ ගැන දන්නවා. ඒක පවරා ගන්න පළමුවැනි දැවැන්ත බලපෑම කළේ ඔබතුමා හිටපු සභාපතිතුමා විධියට. මම දන්නවා, මොකද, ඒක පාඩු ලැබුවාම තමයි අතට ගන්න පුළුවන්. ඒකට ඔබතුමා සෑහෙන්න මහන්සි වුණා. ඒ මහන්සියේ ප්‍රතිඵල තවම ඔබතුමාට ලැබිලා නැහැ. ඔබතුමාට ප්‍රතිඵල ලැබුණු දවසක පොඩ්ඩක් නැඟිටලා කථා කරන්න. මම කියන්නම් ප්‍රතිඵලය ලැබුණු වුණ දවසට. මොකද ඔබතුමාගේ පෞද්ගලික ඉල්ලීමක ප්‍රතිඵල තමයි ලැබිලා නැත්තේ.

ලංකාවේ සීනි නිෂ්පාදනය සම්බන්ධව- [බාධා කිරීමක්] මම කථා කළේ නැහැ නේ දොඹකර ගැන. මම කථා කළේ නැහැ ගංජා ගැන. මම කථා කළේ නැහැ හොර හරක් ගැන. එතකොට මම කියන්න කැමැතියි, දැන් පිට රටින් සීනි ගෙනැල්ලා ලංකාවේ කුඩු කරලා - sugar refinery - බෙදන්න තමයි වැඩ පිළිවෙළ තිබෙන්නේ කියලා.

ඔබතුමන්ලාගේ සීනි නිෂ්පාදනය කිරීමේ අලුත් වැඩ පිළිවෙළ මොකක්ද කියා මා අහනවා. අලුත් වැඩ පිළිවෙළක් නැහැ. ඔබතුමන්ලා එක එක දේවල් විකුණනවා. ඔබතුමන්ලා ඕස්ට්‍රේලියානු සමාගමකට ඇඹිලිපිටියේ කර්මාන්තශාලාව වික්කා. ඔබතුමන්ලා ඒ කර්මාන්තශාලාව රුපියල් මිලියන 600කට දුන්නා. Perth Engineering and Maintenance (Pvt.) Limited කියා තමයි දැම්මේ. ඇඹිලිපිටියේ කර්මාන්තශාලාව ගැන ඔබතුමාගෙන් අහනවා. ඔබතුමන්ලා pick කරලා නේ ඒ උදවිය ගන්නේ. දැන් මේ pick කරපු කොම්පැනියට පුළුවන්ද, මේ නිෂ්පාදන කරලා ආපහු මේ කර්මාන්තශාලාව ගොඩ නඟන්න. කවුද, මේකේ අයිතිකරුවෝ? මේකේ අයිතිකරුවෝ Mr. S.M.D. Alwis and Mr. P. Gonapinuwala. 2003 ඉඳලා තමයි -active from 26th August 2003- මේ ගොල්ලන්ගේ කොම්පැනිය පටන් අරගෙන තිබෙන්නේ. ඒක family partnership එකක්. මේ ගොල්ලෝ මොනවාද කරන්නේ? මේ අය බැලුවාම, they have not even currently registered for GST; Goods and Services Tax. අඩුම තරමේ GST එකක්වත් ගෙවන කොම්පැනියක් නොවෙයි මේ. ඒ විතරක් නොවෙයි. Main Business Location - WA 6053, Trading Name - Perth Engineering and Maintenance (Pvt.) Limited. මේ ගොල්ලෝ මොකක්ද කරන්නේ? මේ ගොල්ලෝ cleaning service එකක් කරන්නේ. [බාධා කිරීමක්] ඔව්. Cleaning service එකක් තමයි කරන්නේ. ඔබතුමන්ලා internet එකට ගිහින් බලන්න. Australian Business Register. This company is apparently not a company, a sole trade registered by a VIP's relative who was in Perth until 2006. 2006 වන තුරු හිටපු උදවියගේ යාළුවෝ තමයි මේ ගෙනැල්ලා තිබෙන්නේ. ඇමෙරිකාවේ cleaning service franchise එකක් කරන්නේ. කරුණාකර, මේ address එක අරගෙන ගිහින් බලන්න. තමුන්නාන්සේලා ඇඹිලිපිටියේ කර්මාන්තශාලාව මිලියන හයසිය ගණනකට දුන්නා.ඒක දීලා තිබෙන්නේ ඇමෙරිකාවේ cleaning service එකක් අයිතිකරුවකුට.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
හැබැයි, අපේ ඇඹිලිපිටියේ කම්හලක් cleaning service එකක් කළේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලයේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒවා වළක්වන්න නේ තමුන්නාන්සේලා ආණ්ඩුවේ ඉඳගත්තේ.

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
අපි ඇඹිලිපිටියේ නේ. අපි දන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කරුණාකර, පොඩ්ඩක් ඉඳගන්න. [බාධා කිරීම්] කෑ ගහන්නේ නැතුව ඉඳගන්න. [බාධා කිරීම්] කරුණාකර, ඉඳගන්න. [බාධා කිරීම්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඇයි?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please!

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මෙතුමා එළියට දමන්න. [බාධා කිරීම්] මෙතුමාට ඕනෑ ඕනෑ දේවල් මෙතැන කරන්න බැහැ. [බාධා කිරීම්] ඉඳගන්න. [බාධා කිරීම්] මොකද කරන්නේ? [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Ranjith De Zoysa - [බාධා කිරීම්] කරුණාකර, වාඩි වන්න. [බාධා කිරීම්] වාඩි වන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කෑ ගහන්නේ නැතුව ඉඳගන්න. [බාධා කිරීම්] තමුන්නාන්සේ මට මොනවා කරන්නද? [බාධා කිරීම්] තමුන්නාන්සේට මොනවාද ඕනෑ? [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
සොයිසා මන්ත්‍රීතුමා වාඩි වන්න. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කරුණාකර, මෙතුමා අයින් කරනවාද? [බාධා කිරීම්] මට කථා කරන්න ඉඩ දෙනවාද? [බාධා කිරීම්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
සොයිසා මන්ත්‍රීතුමා වාඩි වන්න. [බාධා කිරීම්]

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ලොක්කෙක්? ලොක්කෙක් තමයි. ඇයි? [බාධා කිරීම්]

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
අපිත් ලොක්කෝ තමයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තමුන්නාන්සේ කරපු ඒවා මගෙන් අහගන්න එපා.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කරපු ඒවා. [බාධා කිරීම්] කොහේද හිටපු

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු ටී. රංජිත් ද සොයිසා මහතා**
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ප්‍රාදේශීය සභාවේ තමුන්නාන්සේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඒවා මා කියන්නම්. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා වාඩි වන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අද මේවා කියන විට තරහා යනවා. ඇයි, මේ ඇඹිලිපිටියේ කර්මාන්තශාලාව දුන්නේ cleaning service එකක් තියෙන කෙනෙකුට? ඒක කිව්වාමයි තරහා යන්නේ. ඒකයි මා අහන්නේ. මෙකෙන් කාට හෝ ගණනක් හම්බ වෙලාද මම දන්නේ නැහැ. මේක තමයි අද තමුන්නාන්සේලාගේ අලුත් ව්‍යාපාරය, මේ වැඩ පිළිවෙළ අරගෙන යන්න.

**ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)
ගරු මන්ත්‍රීතුමා මට පොඩ්ඩක් ඉඩ දෙන්න. ඔබතුමා අද ඔය කථාව කියන්නේ අවුරුදු ගණනක් තිස්සේ වසා දමා තිබුණු කර්මාන්තශාලාවක් ගැන. ඕකේ පඩි නඩි ගෙවා ගන්න බැරුව තිබුණා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ගැන මා කියන්නම්. [බාධා කිරීම්] ඔබතුමා පොඩ්ඩක් ඉඳගන්න. මා කියන්නම්.

**ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)
ඔබතුමා අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේක පටන් ගත්තාට මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීම්] ඒකට ඔබතුමා කලබල වන්න එපා. [බාධා කිරීම්] ඔබතුමා කලබල වන්න එපා. මා කියන්න කැමැතියි,- [බාධා කිරීම්] මේ ඇඹිලිපිටියේ කර්මාන්තශාලාවට අපේ අමාත්‍යාංශය පැවැති කාලයේ සල්ලි දමා ඒ කාලයේ පවත්වාගෙන ගියා. තමුන්නාන්සේලාගේ දැන් ඉන්න ජනක රණතුංග මහතාගෙන් අහන්න, කොහොමද කරගෙන ගියේ කියා. ඊට පස්සෙයි ඒක කරගෙන යන්න බැරුව ගියේ. ඒක මා දැන් කියන්නම්. [බාධා කිරීම්] තමුන්නාන්සේලා මේකේ වැඩ කර ගෙන යන්න රුපියල් මිලියන 250ක් දැම්මා. [බාධා කිරීම්] මා පාර්ලිමේන්තුවේ උපදේශක කාරක සභාවට ගිහින් ඇහුවා, "ඒකේ වැඩ පිළිවෙළ මොකක්ද?" කියා. SEMA එකෙන් සල්ලි ගෙනල්ලා දැම්මා. රුපියල් මිලියන 250කින් මේක දුවන්න පුළුවන් කිව්වා. ජනතා විමුක්ති පෙරමුණේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අමරසිංහ මහත්මයා තමයි report එක ගෙනාවේ. එතකොට මා ඇහුවා, "රුපියල් මිලියන 250කින් මේක හදන්න පුළුවන්ද?" කියා. "පුළුවන්" කිව්වා. "හදලා දුවන්න පුළුවන්ද?" ඇහුවා, "පුළුවන්" කිව්වා. Pulp තිබෙනවාද ඇහුවා, කොහොම හරි ගෙනත් හදන්න පුළුවන් කිව්වා. ඒ විධියට රුපියල් මිලියන 250ක් දාලා තමයි මේක කළේ. මම කිව්වා මේක කරන්න බැරිව යනවා කියලා. හැබැයි, ඇහුවේ නැහැ. ඒකෙන් තමයි පාඩුව වුණේ. ඒක දැන ගෙන තමයි අපි කිව්වේ මේක පාඩු ලබනවා කියලා. දැන් කමක් නැහැ, ඔබතුමන්ලාට ලාභ ලබන්න පුළුවන් නම් අරගෙන කරන්න. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද මම මේ කාරණයත් කියන්න ඕනෑ. කථා කරන්න හම්බ වුණේ නැහැ නේ. කථා කරන්න දෙන්නේ නැහැ. ඇත්ත කථාවක් කියා ගෙන එන විට තමයි අමාරුව තිබෙන්නේ. අද ඔබතුමන්ලා මොනවාද කරන්නේ? 16වැනිදා සහ 17 වැනිදා කොළඹ කොටුවේ මාර්ගවල ලොකු සංදර්ශනයක් තිබෙනවා. ඒ, ශ්‍රී ලංකා ඔටෝ මොබයිල් ක්‍රීඩා සංගමය සහ ශ්‍රී ලංකා යතුරු පැදි ක්‍රීඩා සංගමයෙන්. මේ උත්සව කාලයේ, මොකක්ද මේ කරන්නේ? මේ race එක කොළඹ ගලදාරි හෝටලය ඉදිරිපිටින් ආරම්භ වෙලා ලෝටස් පාරේ හිල්ටන් හෝටල් මං සන්ධිය පසු කර, කොටුව පොලීසිය අසලින් වැතැම් විදියට වමට හරවා එතැනින් නැවත ඩියුක් වීදියට හරවා, ඩියුක් වීදියෙන් බාරොන් ජයතිලක මාවතට නැවත හරවා එතැනින් යෝක් වීදියට වමට හරවා යෝක් වීදියෙන් ලංකා බැංකු මාවතෙන් ජනාධිපති මාවතට වමට හරවා නැවත ආරම්භක ස්ථානය වූ ගලදාරි වටරවුමට පැමිණීමට නියමිතයි. මේ race එක තිබෙන්නේ රෑ වෙලා. Race තියා ගත්තාට කමක් නැහැ. මේකෙන් සිදු වන්නේ පාරවල් ටික වහන එකයි. මේ පාරවල් ටික වහපුවාම කොළඹ කොටුවේ අහිංසක, දුප්පත් මිනිසුන්ට මේක බලපානවා. රථ කාර් race ගියාට කමක් නැහැ, හැබැයි මේ පාරවල් ටික වහන එක - [බාධා කිරීම්]

ගලදාරි හෝටලය, හිල්ටන් හෝටලය, සිලෝන් ඉන්ටර් කොන්ටිනෙන්ටල් හෝටලය, ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලය, Colombo City Hotel ආදී තරු පහේ හෝටල් ටිකයි, අනෙත් හෝටල්වලයි ඉන්න සංචාරකයෝ කොහේ යන්නද කියලායි මම අහන්නේ. ඒ අයට ගිහිල්ලා රථ කාර් පදින්න කියන්න. නමුත් රටේ ජනතාවගේ බඩට ගහන්න එපා.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Azwer, what is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, race දුවන්න බැහැ ගේ ඇතුළේ. පාරවල්වල තමයි race දුවන්නේ.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. Hon. Dayasiri Jayasekara, please wind up now

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අද මේ රටේ ලක්ෂ 6කට ඩොලර් එකකට වඩා අඩුවෙන් ආදායම තිබෙන්නේ. අති බහුතරයක් ජීවත් වෙන්නේ කොළඹ market එකේ බඩු විකුණලා. අහිංසක, දුප්පත් මිනිස්සු. දැන් ඒ පාරවල් ටික වහනවා. රථ පැද ගන්න කියන්න කාර්, අපට ප්‍රශ්නයක් නැහැ. කරුණාකරලා මේ පාරවල් වහලා කරන සෙල්ලම නතර කරන්න. අපට car race නොවෙයි වුවමනා වෙලා තිබෙන්නේ. මිනිසුන්ට ජීවත් වෙන්න බැරි වාතාවරණයක් තිබෙන්නේ. ඒ කාරණය ඉටු කරන ලෙස ඉල්ලමින්, මේ වැඩ කටයුතු ටික කර ගෙන යන බැසිල් රාජපක්ෂ මැතිතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. [බාධා කිරීම්]

[අ. භා. 1.44]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Minister of Agrarian Services and Wildlife)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව වචන කිහිපයක් කථා කරන්නට හැකි වීම පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා. අපේ විරුද්ධ පක්ෂ මන්ත්‍රීතුමන්ලා කිව්වා මේක බලය එක තැනකට ගත්ත, ලොකු අමාත්‍යාංශයක් කියලා. මම විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ, ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමා මේ රට සංවර්ධනය කරන්න විශාල වගකීමක් අරන් තිබෙන ඇමතිවරයෙක් බව. එතුමා දරන්නේ වගකීමක්. විශාල වගකීමක් භාර ගෙන තිබෙනවා.

අද අපේ දයාසිරි මන්ත්‍රීතුමන්ලා මැරිලා ඉපදුණා වාගේයි කථා කරන්නේ. ඇඹිලිපිටිය කර්මාන්තශාලාව වාගේ ඒවා විනාශ කරලා දැම්මේ එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. ඒ වාගේම

සෙවනගල වාගේ ආයතන කුණු කොල්ලයට ලබා දුන්නේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. ඒවා කළේ අවුරුදු 3ක් රටේ රාජ්‍ය නායකකමත් නැතිව, අගමැතිකම විතරක් තිබෙද්දී. ඒ විධියට විනාශ කරලා දාපු මේ සියලුම කර්මාන්ත, ඒ සියලුම ආයතන ගොඩ ගන්න අද අවශ්‍ය වෙලා තිබෙනවා අපේ රජයට; විශේෂයෙන් ආර්ථික සංවර්ධන ඇමතිවරයා හැටියට ගරු බැසිල් රාජපක්ෂ අමාත්‍යතුමාට අවශ්‍ය වී තිබෙනවා. ඇඹිලිපිටිය කර්මාන්තශාලාව වහලා, විනාශ කරලා, මැෂින් ටිකත් දිරලා තිබුණේ. ඒක ගොඩ ගන්න තමයි දැන් ලබා දීලා තිබෙන්නේ. මේකෙන් අපට රුපියල් මිලියන 100ක වාසියක් තිබෙනවා. මේ විධියට තමුන්නාන්සේලා අපි කරන කරන දේ අනෙක් පැත්තට කියන්නේ. දන්නවා මේක හොඳයි කියලා. අද කියන්න දෙයක් නැති නිසා මේ සියලු දේවල්ම නරකයි කියනවා. දැන් වරාය හදපු එක නරකයිලු. තමුන්නාන්සේලා අවුරුදු 17ක් හිටියා. වරායක් හදා ගන්න බැරි වුණා. අද වරාය හදපු එක නරකයිලු. ඒ advertisement එකත් නරකයිලු. [බාධා කිරීමක්] ඔව්. අපේ පොඩි මිනිහාගේ advertisement එකක් එතැනදී අප දමන්නේ. ආප්ප කන මනුස්සයෙකුගේ දැන්වීමක් දමන එකත් නරකයි ලු. තමුන්නාන්සේලා වාගේ ලොකු ව්‍යාපාරිකයන්ගේ advertisement එකක් නොවෙයි අප දමන්නේ. අප දමන්නේ සාමාන්‍ය මිනිහාගේ advertisement එකක්.

විශේෂයෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැඩ කටයුතු ගැන කථා කරන කොට, මේ අමාත්‍යාංශය ඉතාම සැලසුම් සහගතව වැඩ කරන අමාත්‍යාංශයක් බව අපට පෙනෙනවා. එය පළාත් මට්ටමින්, දිස්ත්‍රික්ක මට්ටමින්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින්, ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටමින් හැම තැනටම සංවර්ධනය ගලා ගෙන යන හැටියට කටයුතු කරන අමාත්‍යාංශයක්. අධිවේගී මාර්ගය හදන කොට ගමේ තිබෙන බොරළු පාරත් හදන්න අද රජය කටයුතු කරලා තිබෙනවා. මහා වරායවල් හදන කොට ගමේ තිබෙන සුළු වාරි මාර්ග, වැව් හදන්නත් අද කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම හැම ගමකටම විදුලිය ලබා දෙන්න කටයුතු කර තිබෙනවා. ඒ සියලුම කටයුතු සැලසුමක් ඇතිව මෙහෙයවන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයයි. ඒ වාගේම සුළු වාරිමාර්ග පද්ධති, anicut එක, ඇළ වේල්ල වාගේ වාරි මාර්ග දියුණු කරන්න ඒ අවශ්‍ය සැලසුම් සකස් කරලා ඒ ඒ අමාත්‍යාංශවලට භාර දෙනවා. ගරු ඇමතිතුමා කරන්නේ ඒ සියලු දේවල් සැලසුම් කරලා ක්‍රියාත්මක කරන්න අනික් අමාත්‍යාංශවලට භාර දෙන එකයි. අපට භාර දීලා තිබෙනවා. පොල් සංවර්ධන අමාත්‍යාංශයට, කෘෂිකර්ම අමාත්‍යාංශයට, කර්මාන්ත අමාත්‍යාංශයට යන මේ සියලුම අමාත්‍යාංශවලට මඟ පෙන්වමින් සැලසුමක් සහිතව කටයුතු කරන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයයි. ඒ නිසායි අප විශේෂයෙන්ම සන්තෝෂයෙන් මේ අමාත්‍යාංශය ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අප දන්නවා අවුරුදු 30ක් තිස්සේ මේ රට යුද්ධයකට යට වෙලා තිබුණු බව. විශේෂයෙන්ම උතුරු, නැඟෙනහිර ත්‍රස්තවාදයෙන් බේරා ගන්න කොට එක විදුලි කණුවක්, විදුලි බුබුලක් තිබුණේ නැති ප්‍රදේශවලට අද විදුලිය ලබා දීලා තිබෙනවා. වතුර ටිකක් බොන්න නැතිව තිබුණු ප්‍රදේශවලට මේ වන කොට පානීය ජල පහසුකම් ලබා දීලා තිබෙනවා. කැලෑ වැදිලා තිබුණු, ගරා වැටුණු වැව් අමුණු ටික හදලා දීලා තිබෙනවා. ඒ වාගේම පාසල් පද්ධතිය ශක්තිමත් කරලා සෞඛ්‍ය මධ්‍යස්ථාන ඉදි කරලා තිබෙනවා. උතුරු, නැඟෙනහිර සංවර්ධනය කළා වාගේම අද අනික් ප්‍රදේශවල සෞඛ්‍ය මධ්‍යස්ථාන, මාතෘ නිවාස, පාසල්වල වැසිකිළි පද්ධතිය වැනි සියලු දේවල්වලටම අවධානය යොමු කරමින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා ඉතාම දක්ෂ විධියට මේ අමාත්‍යාංශය මෙහෙයවනවා. ඒක අප කවුරුත් දන්නවා. රටේ සාමාන්‍ය ජනතාව දන්නවා. ගමේ මිනිස්සු ප්‍රාදේශීය සභා මැතිවරණයක් එන කොට සියයට 99ක්ම ප්‍රාදේශීය සභා ටික අපට ලබා දෙන්නේ ඒ නිසායි. පළාත් සභා මැතිවරණයක් තිබ්බාම පළාත් නවයෙන් පළාත් අටක් ඔවුන් අපට ලබා දෙන්නේ ඒ නිසායි. මෙතුමන්ලා මේවා දන්නේ නැතිව මේ සභා ගැබට ඇවිල්ලා නිකම් කෑ ගහනවා. ගම් පැත්තට යන්නේ නැතිව, ගමේ තිබෙන ප්‍රශ්න මොනවාද කියලා හඳුනා ගන්නේ නැතිව මෙහාට ඇවිල්ලා නිකම් කයිය ගහනවා. ඔබතුමන්ලා ගමට ගිහිල්ලා බලන්න. පාර්ලිමේන්තු මැතිවරණයක් තියන කොට තුනෙන් දෙකේ බලයක් ලබා දෙනවා. අද වන කොට අපට මන්ත්‍රීවරු 162ක් ඉන්නවා. හැම අය වැයක් ඉවර වෙන කොටම විපක්ෂය පැත්තෙන් ආණ්ඩුව පැත්තට මන්ත්‍රීවරු එනවා. ඒ අය වැය හොඳ නිසායි. ඉස්සර ආණ්ඩුව හොඳ නැහැ කියලා ආණ්ඩුවෙන් තමයි මන්ත්‍රීවරු විපක්ෂයට යන්නේ. දැන් විපක්ෂයෙන් මන්ත්‍රීවරු ආණ්ඩුවට එනවා හැම අය වැයක්ම ඉවර වෙන කොටම. ඊළඟ අය වැයේදීත් කිහිප දෙනෙක් එනවා. හැම අය වැයේම එනවා. ඒක නවත්වන්න බැහැ තමුන්නාන්සේලාට. මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ආණ්ඩුව පැත්තට ආවේ අධ්‍යාපනය හොඳයි කියලායි. තව ටික දිනක් යන කොට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හොඳයි කියලා තව මන්ත්‍රීවරු එයි. ඕක තමයි සාමාන්‍ය තත්ත්වය.

තමුන්නාන්සේලා ගම්වලට ගියේ නැති වුණාට, ගමේ මිනිහා ඒක කරනවා. අතිගරු ජනාධිපතිතුමා මේ රටට සාමය උදා කරලා තියපු පළමුවෙනි මැතිවරණයේදී වැඩි ඡන්ද දහඅටලක්ෂ ගණනක් එතුමාට හම්බ වුණා. ගම්වල මිනිස්සු තමයි එතුමාට ඡන්දය දෙන්නේ. වතුර ටික බොන මිනිස්සු, වාරි මාර්ගවලින් ප්‍රයෝජන ගන්න, කෘෂිකර්මයේ ඵල ප්‍රයෝජනය ලබන, බොරළු පාරවල් වෙනුවට කාපට් පාරවල යන අය, කොන්ක්‍රීට් පාරවල යන අය තමයි එතුමාට ඡන්දය දුන්නේ. ඉතින් සාමාන්‍ය ජනතාවට මේක හොඳට දැනෙනවා. ඒ නිසා තමයි ජනතාව අද රජයත් එක්ක, ජනාධිපතිතුමාත් එක්ක, අපත් එක්ක ඉන්නේ. ඒක කාටවත් වළක්වන්න බැහැ. තමුන්නාන්සේලා මේවා විවේචනය කර කර ඉන්න එක නොවෙයි කරන්න තිබෙන්නේ.

වරාය හැදුවාම තමුන්නාන්සේලා ඒක හොඳ නැහැ කියනවා. වරායේ ගලක් තිබෙනවාය කියනවා. අධිවේගී මාර්ගය හැදුවාම ඒකත් හොඳ නැහැ ලු. Accident වෙලා මේ රටේ දවසකට කී දෙනෙක් මැරෙනවාද? එක වත් එකක් පෙරළෙන කොට කියනවා අධිවේගී මාර්ගය හොඳ නැහැයි කියලා. කර්මාන්තශාලාවක් හදන්න යන කොට කියනවා ඒ කර්මාන්තශාලාව හදන එක හොඳ නැහැයි කියලා. පාඩු ලබන ආයතනයක් ආණ්ඩුවට අරගෙන ඒක විධිමත් විධියට පාලනය කරන්න හදන කොට ඒක හොඳ නැහැයි කියනවා. තමුන්නාන්සේලාට ඔක්කොම හොඳ නැහැ. ඉතින් තමුන්නාන්සේලා හොඳ දෙයක් කියන්නකෝ. අය වැයේදී ඒවා තමයි ඉදිරිපත් කරන්න ඕනෑ. "මෙහෙමයි අපි වරායවල් හදන්නේ, මෙහෙයි අපි අධිවේගී මාර්ග හදන්නේ, අපි වැව් අමුණු හදන්නේ මෙහෙමයි, අප කර්මාන්තශාලා හදන්නේ මෙහෙමයි" කියලා ඉදිරිපත් කරන්න ඕනෑ.

විපක්ෂයේ වගකීම ඒකයි. විපක්ෂයේ තිබෙන වගකීම තමයි එතුමන්ලාගේ ප්‍රතිපත්ති ඉදිරිපත් කරන එක. එහෙම නැතිව අප කරන හැම එකටම කුරු ගහන එක නොවෙයි කරන්න තිබෙන්නේ; හැම එකම නරකයි කියන එක නොවෙයි කරන්න තිබෙන්නේ. තමුන්නාන්සේලා නරකයි කිව්වාට රටේ ජනතාව හොඳයි කියනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please!

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
රටේ ජනතාව හොඳයි කියලා තමයි මැතිවරණයකදී ඒ බලය අපට ලබා දෙන්නේ. [බාධා කිරීම්] හෙට මැතිවරණය තිබ්බත් එකයි. තමුන්නාන්සේලා බලන්න, ඊළඟ පළාත් සභා මැතිවරණය තියන කොටත් අප ජයග්‍රහණය කරනවා.

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

ඊළඟට මහ මැතිවරණය පවත්වන කොට නැවත අපි ජයග්‍රහණය කරනවා. නැවතත් ජනාධිපතිවරණය පවත්වන කොට අපි ජයග්‍රහණය කරනවා. නැවතත් පළාත් පාලන මැතිවරණ පවත්වන කොට අපි ජයග්‍රහණය කරනවා. ඒ නිසා මම තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා, විවේචනය කර කර ඉන්නේ නැතුව, ශ්‍රේරු මන්ත්‍රීතුමා වාගේ තමුන්නාන්සේලාත් මෙහාට එන්න කියලා. ඇවිත් අපිත් එක්ක හවුල් වෙන්න කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 1.52]

**ගරු ගුණරත්න වීරකෝන් මහතා (නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමා)**
(மாண்புமிகு குணரத்ன வீரகோன்- மீள்குடியேற்ற அமைச்சர்)
(The Hon. Gunaratne Weerakoon - Minister of Resettlement)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ අද -

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Azwer, what is your point of Order? Do not take much time. Time is limited.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, the Hon. (Mrs.) Rosy Senanayake, is not properly attired. කොණ්ඩේ කඩා දාලා මේ ගරු සභාවට එන්න බැහැ. That is against the dress code prescribed. කොණ්ඩේ හොඳ ලස්සනට බැඳ ගෙන එන්න ඕනෑ, සභාවට එනකොට.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

That is not a point of Order. Hon. Minister, you carry on please.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

මෙතැන චිත්‍රපටි හෝල් එකක් නොවෙයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)

ඒකෙන් මන්ත්‍රීවරුන්ගේ හැඟීම් ඇවිස්සෙනවාලු.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ දිවයින පුරාම පැතිරී තිබෙන සංවර්ධන වැඩ පිළිවෙළ පිළිබඳව වචන කීපයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම ගැන මම ස්තුතිවන්ත වනවා.

ඉතිහාසයේ පළමුවන වතාවට තමයි මෙවැනි වගකීම් සහිත අමාත්‍යාංශයක් පිහිටුවලා, ඒ අමාත්‍යාංශය තුළ තිබෙන ප්‍රතිපාදනවලින් මුළු දිවයින පුරාම සමබර ආර්ථික සංවර්ධනයක් ඇති කරන්නට මහ පැදුවේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ විශාල කාර්ය භාරයක් පසු ගිය කාලය තුළත් ඒ වාගේම වර්තමානයේත් ඉටු වෙමින් පවතිනවා. අද මේ සභාවේදී, විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා මේ අමාත්‍යාංශය පිළිබඳව විවිධ මත ප්‍රකාශ කළා. මෙහිදී කියන්නට ඕනෑ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් ඉලක්කගත කර ගෙන නිශ්චිත මුදලක් ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ලබා දීලා, විවිධ සංවර්ධන ක්ෂේත්‍ර සඳහා ඒවා ආයෝජනය කරන්න මෙම අමාත්‍යාංශය යටතේ අවස්ථාව ලබා දී තිබෙන බව.

විරුද්ධ පාර්ශ්වයේ දෙමළ ජාතික සන්ධානයේ අරියනේත්‍රන් මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ මීට පෙරාතුව කථා කළා. මේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් මම ඉල්ලා සිටිනවා, අරියනේත්‍රන් මන්ත්‍රීතුමා කළ කථාවේදී එතුමා කිව්ව අදහස් පිළිබඳව සොයා බලන්න කියලා. එතුමා ඉතාම සාධාරණ සාධනීය විවේචනයක් කළා. ඒ වාගේම එතුමා ඉල්ලීම් කළා, “ යුද්ධයෙන් විනාශ වූ නැඟෙනහිර පළාත නැවත ගොඩ නඟන්නට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සහයෝගය අපට ලබා දෙන්න, ද්‍රවිඩ ජනතාව ඒ සංවර්ධන කාර්යයට සම්බන්ධ කර ගන්න” කියලා. හර්ෂ ද සිල්වා මැතිතුමනි, දෙමළ ජාතික සන්ධානය නියෝජනය කරන, විනාශ වූ පළාතක් නියෝජනය කරන අරියනේත්‍රන් මන්ත්‍රීතුමාගේ කථාව ඔබතුමා සොයලා බලන්න; අහලා බලන්න. මම හිතන්නේ ඔබතුමාට හොඳ මහ පෙන්වීමක් ඒ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීතුමා කළාය කියලායි. එතුමා කිව්වා, අවුරුදු තිහක් යුද්ධය නිසා විනාශ වූ ප්‍රදේශ නැවත ගොඩ නැඟීමේදී රජය පිළිබඳව බලාපොරොත්තුවක් තිබෙනවායි කියන කාරණය. ඒ වාගේම එතුමා ඉතාම සාධනීය විවේචනයක් කළා. තමුන්නාන්සේලා වාගේ නිශේධාත්මක විවේචන කරන්නේ නැහැ. තමුන්නාන්සේලා කියන්නේ, හැම දේම වැරදියි කියලායි.

හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අද මේ ගරු සභාවේදී අපට ඉගැන්නුවා, ආර්ථික වර්ධනය සහ ආර්ථික සංවර්ධනය අතර තිබෙන වෙනස. තමුන්නාන්සේලා හැම දෙයක් ගැනම බලන්නේ සර්ව අශුභවාදී විධියටයි. සියලු දේම නරකයි. ගරු මන්ත්‍රීතුමනි, එහෙම විවේචන කරන්න එපා, සාධනීය විවේචනයක් කරන්න. තමුන්නාන්සේ මේ ගරු සභාවේදී කිව්වා, සොඳුරු ගම පිළිබඳ සංකල්පය තුළ ගම සංවර්ධනය වෙලා නැහැ කියලා. තමුන්නාන්සේ අම්බලන්ගොඩට ගිහිල්ලා බලන්න. අම්බලන්ගොඩ ආසනයේ තිබෙන ග්‍රාමීය ප්‍රදේශවල යටිතල පහසුකම් කොයි තරම් සංවර්ධනය වෙලා තිබෙනවාද? විදුලිය ලබා දීලා, මාර්ග පහසුකම් ලබා දීලා කොයි තරම් සංවර්ධනය කරලා තිබෙනවාද? මේ ගරු සභාවේ ඉන්නවා, බෙන්තර-ඇල්පිටිය ආසනය සහ ගාල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. අපේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා දන්නවා, බෙන්තර-ඇල්පිටිය ආසනය තුළ විශාල සංවර්ධනයක් ඇති කරලා තිබෙනවා කියලා.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ දන්නවා, ඒ පාරවල් සියල්ල අද කාපට් කරලා තිබෙනවායි කියලා. අධිවේගී මාර්ගය ඔස්සේ ගියාම තමුන්නාන්සේට ඉක්මනින් ගෙදරට යන්න නියාගම දක්වාම පාර සම්පූර්ණයෙන්ම හදලා තිබෙනවා. බලන්න, කාපට් කරපු පාරවල්. ඒවා නැහැ කියන්න බැහැ. බෙන්තර-ඇල්පිටිය ආසනයේ ජනතාවගෙන් සියයට 95කට මේ වන විට විදුලිය ලබා දීලා තිබෙනවා. මන්ත්‍රීතුමා ඒ කාරණය ගැන හොඳට දන්නවා. ඒ නිසා තමුන්නාන්සේලා සාධනීය විවේචන කරන්න. සියල්ල නරකයි, කිසිම දෙයක් කරලා නැහැයි කියන කථාව තමයි තමුන්නාන්සේලා බොහෝ වේලාවට කියන්නේ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වෙලාවේ මේ කාරණය ගැනත් මා සඳහන් කරන්නට ඕනෑ. අපේ ප්‍රදේශවල මාර්ග carpet කිරීම සිදු වුණේ නැති කාලයක් තිබුණා. නමුත් අපේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ගාල්ල දිස්ත්‍රික්කයේ පමණක් ආසන දහයටම එක ආසනයකට කිලෝමීටර් 30 බැගින්, කිලෝ මීටර් 300ක් carpet දමන්නට ප්‍රතිපාදන ලබා දුන්නා. දැන් අපේ ආසනවල අපි ඒවා ආරම්භ කර තිබෙනවා. කරන්දෙණිය ආසනයේ, බෙන්තර-ඇල්පිටිය ආසනයේ දැන් ආරම්භ කරලා හිනිදුම ආසනය දක්වා ආසන දහයේම මේ වැඩ කටයුතු කරගෙන යනවා. මේ කාරණයේ දී මම කියන්නේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමකින් තොරව කවදාවත් සංවර්ධනය සඳහා ගමනක් යන්න බැහැ කියලායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ "දිවි නැඟුම" වැඩ පිළිවෙළ පිළිබඳව විවේචනය කළා. ග්‍රාමීය ආර්ථිකය තුළ ගෘහස්ථ ආර්ථිකයේ මූර්ත ආදායම අඩුවෙමින් පවතිනවා කියලා අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සඳහන් කළා. නමුත් "දිවි නැඟුම" සංවර්ධන වැඩ පිළිවෙළ යටතේ ගෙවතු වගා දස ලක්ෂය, විසිපන් ලක්ෂය දක්වා ගෙන යන්නට වැඩ පිළිවෙළ හදා තිබෙනවා. තමුන්නාන්සේලා ගම්වලට ගිහිල්ලා බලන්න, ගෘහස්ථ ආර්ථිකය නඟා සිටුවීම සඳහා කෘෂිකර්මය, සත්ව පාලනය සහ ඒ වාගේම ඒ අයට කර්මාන්ත පටන් ගන්න, ස්වයං රැකියා පටන් ගන්න අවශ්‍ය සියලු ආධාරයන් ලබා දීලා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලා -[බාධා කිරීමක්] හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට මා ආරාධනා කරනවා, තමුන්නාන්සේ කොළඹ කෝට්ටෙට වෙලා ඉන්නේ නැතිව- [බාධා කිරීම්] හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ කොළඹ කෝට්ටෙට වෙලා විවේචනය කරන්නේ නැතිව ගම්වලට යන්න. ගාල්ල දිස්ත්‍රික්කයට යන්න. ගිහිල්ලා බලන්න, අර හිනිදුම පැත්තේ දුෂ්කර ගම්මාන දිහා. [බාධා කිරීම්] දුෂ්කර ගම්මානවලට යන්න. තමුන්නාන්සේලා මේ කොළඹට වෙලා ඉඳගෙන කිසි දෙයක් කළේ නැහැ කියලා කියනවා. තමුන්නාන්සේලා කැමැති ඇති- [බාධා කිරීමක්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! There is point of Order being raised by the Hon. (Dr.) Harsha De Silva.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඔබතුමා මට විනාඩියක් දෙන්න, මම කියන්නම්. මගේ නම සඳහන් කළා. මම කිව්වේ, ගම නැඟුමට වෙන් කර තිබෙන මුදල් අඩු කර තිබෙනවා කියලායි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. Hon. Minister, you may carry on.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ හැම ගමක්ම, හැම ප්‍රදේශයක්ම සමබරව සංවර්ධනය කරන්නට අවශ්‍ය කටයුතු සිදු කරලා තිබෙනවා. [බාධා කිරීම්] මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ එන්න, බලන්න යන්න. මේ කොළඹට වෙලා ඉන්නේ නැතිව අම්බලන්ගොඩ පැත්තට එන්න. කරුණාකරලා එන්න, මන්ත්‍රීතුමාට පෙන්වන්නම්. ලබන සතියේ එන්න, මේ කොළඹට වෙලා කයිවාරු ගහන්නේ නැතිව. [බාධා කිරීම්] කොළඹට වෙලා කයිවාරු ගහනවා. ඡන්දෙන් ආපු කෙනෙකුත් නොවෙයි. ජාතික ලැයිස්තුවෙන් ආපු කෙනෙක්. [බාධා කිරීම්] අර ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාගෙන් අහගන්න.

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන් උතුරු නැඟෙනහිර ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා විශාල දායකත්වයක් ලබා දීලා තිබෙනවා, මේ අමාත්‍යාංශය තුළින්. [බාධා කිරීම්]

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! There is point of Order being raised by the Hon. (Dr.) Harsha De Silva again. What is the point of Order?

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
I will tell you. According to Standing Order No. 85,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියන එක මේ ගරු සභාවේ පාවිච්චි කරන වචනයක් නොවෙයි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. - [*Interruption.*] Hon. Minister, you may carry on.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
තමන් බුරුවා නම් ඒක භාර ගන්න. අපරාදේ, බූරුවා හොඳ සතෙක්. [බාධා කිරීමක්] බූරුවාට බූරුවා කියන්නේ නැතිව

[ගරු ගුණරත්න වීරකෝන් මහතා]

දෙවියන් වහන්සේ කියන්නයැ. බුරුවාටත් අවනම්බු කරනවා. තමුන්නාන්සේ ඉරට්ටාචාර්යවරයෙක් නේ. තමුන්නාන්සේ අපට ආර්ථික විද්‍යාව උගන්වනවා; සාර්ව ආර්ථික විද්‍යාව උගන්වනවා. [බාධා කිරීමක්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට මම

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කිව්වා කියලා, ඒක ස්ථාවර නියෝගවලට පටහැනියි කියලා එතුමා කිව්වා. බුරුවන්ට අපහාස කරමින් එතුමාට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියපු එක මා මේ වෙලාවේ ඉල්ලා අස්කර ගන්නවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order. Hon. Minister, you may carry on.

**ගරු ගුණරත්න වීරකෝන් මහතා**
(மாண்புமிகு குணரத்ன வீரகோன்)
(The Hon. Gunaratne Weerakoon)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ සමස්ත ආර්ථිකය තුළ ඇති කර තිබෙන වෙනස්කම් පිළිගන්නට බැරි ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන්, ක්‍රෝධයෙන් මේ දිහා බලන සමහර අය ඉන්නවා. බොහොම විශාල දැනුම් සම්භාරයක් තිබෙන ආර්ථික විද්‍යාඥයන් විපක්ෂය පැත්තේ සිටිනවා. ඒ අයගෙන් අපි අහනවා, - හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ගැන නොවෙයි මා මේ කියන්නේ. ආර්ථික විද්‍යාව කෙළ පැමිණි තවත් මහත්වරුන් ඔය පැත්තේ ඉන්නවා.- සමස්ත ආර්ථිකය සංවර්ධනය සඳහා කිසි යම් දායකත්වයක් මේ අමාත්‍යාංශයෙන් ලබා දීලා නැද්ද කියලා. තමුන්නාන්සේලා සියල්ල බැහැර කරන්නේ කිසිම දෙයක් නොවුණු විධියටයි.

අවසාන වශයෙන්, යුද්ධයෙන් තිස් අවුරුද්දක් බැට කාපු, දෙමළ ජාතික සන්ධානය නියෝජනය කරමින් මඩකළපුව දිස්ත්‍රික්කයෙන් තේරී පත් වෙලා ආපු අරියනේත්‍රන් මන්ත්‍රීතුමා අද සභාවේදී කරපු කථාව පිළිබඳව තමුන්නාන්සේලා නැවත වතාවක් සිතා බලන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව නතර කරනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 2.02]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය කියන්නේ මේ අය වැය තුළ අතිවිශාල වැදගත්කමක් ගන්නා, ඒ වාගේම මේ රටේ දියුණුව සඳහා විශාල වගකීම් සම්භාරයක් ඉටු කරන්නට යන අමාත්‍යාංශයක්. මේ අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් දිහා බැලුවාම, අංක එකට තිබෙන්නේ දිළිඳුකම පිටු දැකීමයි. අනෙක් ඒවා තමයි, සංචාරක, ආයෝජන ප්‍රවර්ධනය, ග්‍රාමීය හා ප්‍රාදේශීය ආර්ථිකය සංවර්ධනය සඳහා ප්‍රතිපත්ති වැඩ සටහන් හා ව්‍යාපෘති සැකසීම, ක්‍රියාත්මක කිරීම, ප්‍රජාව මත පදනම් වූ ජීවනෝපාය සංවර්ධනය සඳහා වැඩසටහන්, විමධ්‍යගත අය වැය ක්‍රියාත්මක කිරීම, සංචාරක කර්මාන්තය නඟා සිටු වීම, සංවර්ධනය, කළමනාකරණය, ලියා පදිංචි කිරීම ආදී වැඩ සටහන්, සියලුම සත්වෝද්‍යාන, උද්භිද උද්‍යාන, විනෝදාත්මක කටයුතු, යටිතල පහසුකම්, විදේශීය ආයෝජන. මා හිතන හැටියට තවත් කරන්න දෙයක් ඉතිරි වෙලාම නැහැ. මේ අමාත්‍යාංශයට මුළු ලංකාවේ සියලු කටයුතු කරන්න පුළුවන් හැකියාවක් තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, 2010 දෙසැම්බර් 01වැනි දින පාර්ලිමේන්තුවේදී ඔබතුමා කරපු කථාවක කොටසක් උපුටා දක්වන්න මා කැමැතියි. එදින හැන්සාඩ් වාර්තාවේ 494වැනි තීරුවේ මෙසේ සඳහන් වෙනවා.

"අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. අපේ මේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය පළාත් මට්ටමින්, දිස්ත්‍රික් මට්ටමින්, ප්‍රාදේශීය සංවර්ධන කමිටු මට්ටමින් සහ ගම් මට්ටමින් ක්‍රියාත්මක වන අමාත්‍යාංශයක්. ඒ නිසා අනිවාර්යයෙන්ම මෙම අමාත්‍යාංශයේ සාර්ථකත්වය තිබෙන්නේ ගම් මට්ටමින් කෙරෙන වැඩ මතයි. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට, ජන සභා නියෝජිතවරුන්ට, ගම්වල ඉන්න අපේ රජයේ නිලධාරින්ට, මහජන නියෝජිතයන්ට ඒ සම්බන්ධ වගකීම් පවරලා තිබෙනවා. ඊටත් වඩා ප්‍රාදේශීය සංවර්ධන කමිටුවල සභාපතිවරු හැටියට කටයුතු කරන මන්ත්‍රීවරුන්ට මේ අමාත්‍යාංශයේ විශාල වගකීමක් අපි ලබා දීලා තිබෙනවා. ඒ කටයුතු ඔවුන් මත රඳා පවතිනවා. ඒ වාගේම දිස්ත්‍රික් සංවර්ධන කමිටුවලට වගකීම් දීලා තිබෙනවා. අපේ අමාත්‍යාංශයේ හුඟක් මුදල් යන්නේ ඒ ඒ දිස්ත්‍රික්වලටයි. මම බලාපොරොත්තු වෙනවා, මගේ ලොකු විශ්වාසයක් තිබෙනවා විපක්ෂයේ අයත් සහභාගි වෙලා ඒ කමිටුවල නායකත්වය දරන අපේ මන්ත්‍රීවරු සහ ඇමතිවරු සමඟ ඒ කටයුත්ත කරයි කියලා. ඒක අපේ අමාත්‍යාංශය පමණක් නොවෙයි, මුළු රටේම දියුණුවට, ආර්ථික සංවර්ධනයට ඉවහල් වෙනවා. ඔවුන්ට ඒ සියලු ශක්තිය අපි ලබා දෙන බව සඳහන් කරමින් ඒ සඳහා තමුන්නාන්සේලාගේ සහයෝගය අවංකවම ප්‍රාර්ථනා කරනවා."

ගරු ඇමතිතුමනි, ඊට පස්සේ ඔබතුමා මෙසේද කියනවා:

"මා අවසාන වශයෙන් කියන්නේ අපේ මී ළඟ අරමුණ ආර්ථික යුද්ධය ජය ගැනීම කියන එකයි. ඒ සඳහා සියලු අංශවලින් අපි සන්නද්ධව සිටිනවා."

ගරු ඇමතිතුමනි, නමුත් විමධ්‍යගත අරමුදල් කොච්චර පරක්කු වෙලාද මෙදා පාර අපට හම්බ වුණේ? විමධ්‍යගත අරමුදල් ලබා දීම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා කෙරෙන්නේ. මා හිතන හැටියට මේක පක්ෂ විපක්ෂ ඔක්කෝම මන්ත්‍රීවරුන්ට බලපාන කරුණක්. නිර්ණායකවලින් අපව හිර කරලා. සමිතියකට පුටුවක් දෙන්න බැහැ. ෆුට් බෝල්යක් දෙන්න බැහැ. බැට් එකක්, බෝල්යක් දෙන්න බැහැ. ඉතිහාසය පුරා,- [බාධා කිරීම්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா )
(The Hon. Dilan Perera)
ඔය මනාප වෙනුවෙන් නේ කථා කරන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ඔව්, මනාප වෙනුවෙන් කරන කථාවක්. ඒකට කමක් නැහැ. සමාවෙන්න කෝ එහෙම නම්. ඔබතුමන්ලාත් මනාප අර ගෙන නේ ආවේ. මේක මා ඔබතුමන්ලා වෙනුවෙනුත් කියන කථාවක්. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා ඉල්ලීමක් කරන්නේ. මේක මගේ ඉල්ලීමක්. [බාධා කිරීමක්] ඔව්, මා මනාප පස්සේ යන කෙනෙක්. ගරු ඇමතිතුමනි, මම මනාප පස්සේ යන නිසා ඉල්ලීමක් කරනවා, පුළුවන්කමක් තිබෙනවා නම් ඒ නිර්ණායක ඔබතුමා එන අවුරුද්දේදී වෙනස් කරලා දෙන්න කියලා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

විමධ්‍යගත අය වැය විතරක් නොවෙයි. අපේ අමාත්‍යාංශය යටතේ ගම්වලට දෙන මුදල් සියල්ලක්ම ප්‍රමාද කරන්නට සිද්ධ වුණේ, ප්‍රාදේශීය සභා සහ නගර සභා ඡන්දය කාලයේ ඒ අපේක්ෂකයන් හරහා කරන වැඩ ඡන්දය අවසන් වන කල් අත් හිටුවන්න කියලා මැතිවරණ කොමසාරිස්තුමා අපට දීලා තිබුණු උපදෙසක් නිසා. ඊට පස්සේ අපි ඒ මුදල් ඉක්මනින්ම දුන්නා. අපි වගකීමක් ඇතිව කියනවා ඒ ඔක්කෝම මේ අවුරුද්ද ඇතුළතදී වියදම් කරන්න පුළුවන් ශක්තිය තමුන්නාන්සේලාට-

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. බොහොම ස්තුතියි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
ගරු ඇමතිතුමනි, අපි ඇත්ත වශයෙන්ම ඔබතුමා ගැන විශ්වාසයක් තියා ගෙන හිටියා. නොයෙකුත් කථා පැතිරුණා, මේ විමධ්‍යගත මුදල් එන්නේ නැති වෙයි කියලා. ඒත් අපට විශ්වාසයක් තිබුණා ඔබතුමා කොහොම හරි ඒක දෙයි කියලා. පරක්කු වෙලා හරි ඒ මුදල් ලැබීම ගැන අපි සතුටු වෙනවා. ලබන වසරේ ටිකක් වේලාසනින් දුන්නොත් අපට පහසුයි. ගරු මන්ත්‍රීවරුන් සියලු දෙනා වෙනුවෙන් මම ඒ ඉල්ලීම කරනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ජනවාරි- [බාධා කිරීමක්]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
බොහොම ස්තුතියි. අපේ ඇමතිතුමනි, අපි දන්නවා දිවි නැඟුම වැඩසටහන යටතේ කරුණු කාරණා විශාල ප්‍රමාණයක් සඳහන් වූ බව. දිවි නැඟුම ගෘහ ආර්ථික ඒකක දසලක්ෂයක් ඇති කිරීමේ ජාතික ව්‍යාපාරයක් ඔබතුමා ආරම්භ කර තිබෙනවා. බදුල්ල දිස්ත්‍රික්කය ගත්තොත් ඔබතුමා රුපියල් මිලියන 50ක් ඒ සඳහා වෙන් කරලා තිබුණා. දිස්ත්‍රික් ලේකම්වරයා විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ඒවා බෙදා දුන්නා. ගෙවතු වගා වැඩසටහන සඳහා පළතුරු පැළ 3යි, පොල් පැළ 3යි, සුළු අපනයන බෝග පැළ 3යි, සත්ව නිෂ්පාදන ව්‍යාපෘතිය යටතේ එක් ගොවියෙකුට කුකුළු පැටවුන් 10යි. මීට අමතරව විසිතුරු මත්ස්‍යයින් සහ ජලජ පැළෑටි ලබා දුන්නා. එතකොට දැන් තිබෙන ප්‍රශ්නය මොකක්ද? ඒ ප්‍රදේශයේ ජනගහනය පන්ලක්ෂ විසිහතර දහස් ගණනක් ඉන්නවා. මම හිතන හැටියට ඒ ගණනේ පොඩි වැරදීමක් ඇති. ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු වන අපිත් එක්ක හිටපු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහත්මයා ඒ නිවැරදි සංඛ්‍යාව දන්නවා ඇති. මට මතක නැහැ. [බාධා කිරීමක්] හොඳයි, බොහොම ස්තුතියි. දැක්කාද? ඒ එතුමාගේ දේශපාලන දැනුමේ හැටි. කමක් නැහැ. ඇහුවාට සමාවෙන්න. පන්ලක්ෂ විසිහතර දහසක් වාගේ පිරිසක් ඉන්නවා. ගරු ඇමතිතුමනි, ජනගහනය පන්ලක්ෂ විසිහතර දහසක් සිටියත් මේ ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ හම්බ වුණේ 602ක පිරිසකට විතරයි.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ඒ ආරම්භය.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
හරි ඉතින්, මට කියන්න දෙන්න කෝ. මේ කරුණු ටික කියන්න දෙන්න කෝ. මම නරක දෙයක් නොවෙයි නේ කියන්නේ. ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඉන්නවා. එතුමා ඒ ගැන දන්නවා ඇති. 602ක පිරිසකට පමණයි ඒ ටික හම්බ වුණේ. ඒ වාගේම ගරු ඇමතිතුමා කිව්ව විධියට, පක්ෂ විපක්ෂ සියලු දෙනා එකතු කරගෙන කරනවා කිව්වාට, එහෙම දෙයක් වුණේ නැහැ. විපක්ෂයේ අය ගණන් ගත්තේවත් නැහැ. විපක්ෂයෙන් ඇහුවෙත් නැහැ. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගෙන්වත් ඇහුවේ නැහැ. අපි යනවා දිස්ත්‍රික් සභා රැස්වීම්වලට. ඒක ඩිලාන් පෙරේරා ඇමතිතුමා දන්නවා. [බාධා කිරීමක්]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
What is your point of Order?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ ඉන්න, හාලිඇල ප්‍රාදේශීය සභාවේ රවී මන්ත්‍රීතුමාගෙන් අහන්න, එතුමාගෙනුත් අහලා එතුමාගේ යෝජනාත් මම ක්‍රියාත්මක කළා. එතුමාට දැන් call එකක් දීලා අහන්න. [බාධා කිරීමක්]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
නිවැරදි කිරීම ගැන ස්තුතිවන්ත වෙනවා. අන්න එහෙමයි දේශපාලනය කරන්න ඕනෑ මේ සභාව තුළ. එහෙමයි කථා කරන්නේ. ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අපේ වාරි මාර්ග හා ජලසම්පත් කළමනාකරණ ඇමතිතුමා මේ ළඟදී මුළු බදුල්ල දිස්ත්‍රික්කයේම පොල් පැළ බෙදුවා. ඩිලාන් පෙරේරා ඇමතිතුමා ඒක දන්නවා. පොල් පැළ දෙක ගණනේ හැම ගෙදරකටම බෙදාගෙන යනවා. ඩිලාන් පෙරේරා ඇමතිතුමනි, හැබැයි ඒ පොල් පැළ ඔබතුමාගේ කට්ටියට දෙන්නේ නැහැ; අපේ කට්ටියට දෙන්නේත් නැහැ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ ශාඛාවේ කට්ටියට විතරයි ඒවා බෙදලා දෙන්නේ. ඒ නිසා විපක්ෂයට සම සේ බෙදෙන්නේ නැති කථාව නැවත වතාවක් මෙතැනදී කියනවා.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොඩි නිවැරදි කිරීමක් කරන්න තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
මොකක්ද? පොල් ප්‍රශ්නයක්ද?

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)

උස අඩි 3,000න් පහළ දිස්ත්‍රික්කවල සෑම ග්‍රාම නිලධාරි වසමකම හැම පවුලකටම පොල් පැළ දෙක බැගින් ලබා දෙනවා. ඊට අමතරව මහවැලි අධිකාරියෙන් නිෂ්පාදනය කළ පොල් පැළ වගා කිරීම සඳහාත් කටයුතු කරගෙන යනවා. මේ දෙක පටලවා ගන්න එපා. ගරු අමාත්‍යතුමාගේ දිවි නැඟුම වැඩසටහන සාර්ථකව, අපක්ෂපාතීව කරගෙන යන බව මම වගකීමෙන් ප්‍රකාශ කරනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අය වැය ගැන අපට පුංචි මට්ටමකින්වත් පොඩ්ඩක් සතුටු වෙන්න හැකියාවක් නම් නැහැ. මොකද, මේ අය වැය රටකටත් නැති, ජනතාවටත් නැති, ආර්ථිකයටත් නැති, යන එන මං නැති අය වැයක් හැටියට තමයි අපට පෙනෙන්න තිබෙන්නේ.

**ගරු සනී රෝහන කොඩිතුවක්කු මහතා**
(மாண்புமிகு சனீ ரோஹன கொடிதுவக்கு)
(The Hon. Sanee Rohana Kodithuvakku)

දැන් කොහොමටවත් විපක්ෂයට යන එන මං නැහැ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සියයට 10ක වැටුප් වැඩි වීමක් ගැන අද අපි සියලු දෙනා සාකච්ඡා කරනවා. මේ සියයට 10 වැටුප් වැඩි වීම අපි ගණන් හදලා බලලා තිබෙන්නේ සියයට පහේ,- හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඒ ගැන දීර්ඝ විශ්ලේෂණයක් කළා- [බාධා කිරීමක්]

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතුමා කිව්වා මම පොල් පැළ බෙදුවා කියලා. ඔව්, පොල් පැළ බෙදුවා. තමුන්නාන්සේලාට පොල් පැළයක් තියා මිරිස් පැළයක්වත් බෙදා ගන්න බැහැ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

මම බෙදන්නේ කොහොමද?

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

මම පොල් පැළ බෙදුවේ, කෘෂිකර්ම හා පර්යේෂණ නිලධාරින්ගෙන් සහ සමෘද්ධි නිලධාරින්ගෙන් ලබා ගන්නා ලද ලැයිස්තුවලට. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයේ අයටත් ලැබුණා. පක්ෂ භේදයකින් තොරව දුන්නා. අනිත් එක තමයි ඔබතුමා දන්නවා, බදුල්ල දිස්ත්‍රික්කයේ ඡන්දය දීපු ඡන්ද දායකයන්ගෙන් තුනෙන් දෙකක්ම මට ඡන්දය දීලා තිබෙනවා. එහෙමයි අපි වැඩ කරලා තිබෙන්නේ. අපි ඒ විධියට ඒ පැළ බෙදලා තිබෙනවා. ඒකට තමුන්නාන්සේ ඊර්ෂ්‍යා කරන්න එපා. තමුන්නාන්සේලාට කවදාවත් බලයට එන්න බැහැ. තමුන්නාන්සේලාට පොල් පැළයක් තියා කොස් ඇටයක්වත් බෙදන්න හම්බ වෙන්නේ නැහැ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

ඔබතුමා තුනෙන් දෙකක් ඡන්දය ගැනීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා ඩිලාන් පෙරේරා මහත්මයාට පහරක් ගහන්න ඒක කිව්වාද දන්නේත් නැහැ කියලා මට පොඩි සැකයක් තිබෙනවා. එහෙම කරන එක පව්.

ගරු ඇමතිතුමනි, මමත් ඡන්ද 1,00,000කින් 50,000ක් ගත්තා. ඒ කියන්නේ, ඡන්දය ඉල්ලපු පළමුවන වතාවේම මමත් සියයට 50ක් ගත්තා. විපක්ෂයේ ඉඳලා මට මිරිස් පැළ බෙදන්න බැහැ. මම ඇමති කෙනෙක් වෙලා නැහැ. මට පොල් පැළ බෙදන්න බැහැ. ඒ නිසා මම ඒවා ගැන කටයුතු කරන්නේ නැහැ. මට පුළුවන් විධියට පොතක් පතක් බෙදලා මම ෂේප් එකේ ඉන්නවා. දෙන දෙයක් කාලා, වෙන දෙයක් බලා ගෙන ඉන්නවා.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

විපක්ෂයේ ඉන්දැද්දීත් වි.ජ.මු. ලොකුබණ්ඩාරට වැඩිය අපි ඡන්ද ගත්තා. විපක්ෂයේ ඉන්දැද්දීත් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ගත්තේ මමයි. ඒකත් මතක තියා ගන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)

බොහොම හොඳයි. ඔබතුමා නැති දවසක හරි මම ඒ පාරේ යන්න බලනවා. ඒක බොහොම හොඳයි. ප්‍රශ්නයක් නැහැ. ඒ ගැන විවාදයක් නැහැ. ඔබතුමාට අපි ගරු කරනවා. ඔබතුමා කරපු සංවර්ධනය ගැන අපි කවදාවත් නැහැ කියා නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වැටුප් වැඩි වීම ගැන අපට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මේ වැටුප් වැඩි කිරීම රටේ ජනතාවට අවශ්‍ය පරිදි සිදු වුණාද කියන ප්‍රශ්නය අප තුළ තිබෙනවා. ගරු ඇමතිතුමනි, අය වැය හිඟය බිලියන 468ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. අය වැය හිඟය වෙනුවෙන් ණය ගන්නවා වෙනුවට නිෂ්පාදනය වැඩි කර ගන්නා හැටි, අපනයනය වැඩි කර ගන්නා හැටි මේ අය වැය තුළ එක තැනකවත් සඳහන් වෙලා තිබෙනවාද කියා මම දන්නේ නැහැ. ඒ වාගේම මේ රටේ තිබෙන නාස්තිය, දූෂණය, වංචාව නැති කර ගන්නා හැටි ගැන තොතැනකවත් කියවිලා නැහැ, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

අද ඉතිරි කිරීම් සඳහා දෙන පොලිය අඩු කරලා තිබෙනවා. මෙසේ පොලිය අඩු කිරීම සම්බන්ධයෙන් අතිවිශාල ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. බැංකුවල, මූල්‍ය ආයතනවල ඉතිරි කිරීම්වල පොලිය අඩු කිරීම නිසා දැවැන්ත ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. මොන කුණුහරුපයක් කතා කළත්, මොන සංවර්ධනයක් ගැන කතා කළත්, මොන පාරක් හැදුණත්, මොන highway එකක් හැදුණත්, මොන වරායක් ආවත්, මොන ගුවන් තොටුපළක් හැදුණත් ඔබතුමන්ලාට සෑහීමකට පත් වෙන්න පුළුවන්ද රුපියල් දාහේ කොළයේ වටිනාකම ගැන. මේ පාර්ලිමේන්තුවේ සේවය කරන පුද්ගලයන්ට -ඔබතුමන්ලාට නම් ඒක දැනෙන්නේ නැතිව ඇති.- විපක්ෂයේ ඉන්න අපට, අපේ සේවකයන්ට රුපියල් දාහ බාල්දු වෙලා තිබෙන හැටි භාණ්ඩ හා සේවා මිල වැඩි වෙලා තිබෙන හැටි හොඳට ඇහට දැනිලා තිබෙනවා. ඔබතුමන්ලා නම් රහත් වෙලා ඇවිල්ලා වාගේ බඩු මිල වැඩි නැහැ, ඒක තේරෙන්නේ නැහැ කියා කියනවා. බඩු මිල වැඩියි. මේ තරම් සංවර්ධනයක් තිබෙනවා නම්, ආර්ථිකය මේ තරම් සංවර්ධනය වෙලා තිබෙනවා නම්, දිළිඳුභාවය නැතිවෙලා තිබෙනවා නම් එහෙම වෙන්න ඕනෑ බදුල්ල දිස්ත්‍රික්කයේයි. බදුල්ල දිස්ත්‍රික්යේ සමෘද්ධිලාභීන් 74,312ක් ඉන්නවා. ඒකෙන් තිස් දෙදෙනෙකුට විතරයි රුපියල් දාහේ කාඩ් එක හම්බ වෙන්නේ. දැන් ඕනෑ නම් එකසිය ගණනක් වැඩි වේවි. රුපියල්

දාහේ කාඩ් එක හම්බ වෙන්නේ තිස් දෙදෙනෙකුට විතරයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම අමතක නොකර කිව යුතු තවත් කරුණක් තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து )
(The Hon. Harin Fernando)
තව විනාඩි පහක් දෙනවාය කිව්වා. ඒ වාගේම කලාකරුවන්ට, මාධ්‍යවේදීන්ට, පොලීසියේ සේවය කරන අයගේ පවුල්වල උපදින තුන්වන දරුවාට යම් යම් දීමනා දෙනවාය කිව්වා. ඉතින් මේ ලංකාවේ සමස්ත ජනගහනයෙන් සියයට කීයකටද ලැබෙන්නේ? [බාධා කිරීමක්] හරි, හරි. ඒකත් මම කියන්නම්. ඉතින් ඔබතුමාගේ අයියා නේ. අයියගෙ විෂයය නේ. අයියයි, මල්ලියි එකයි නේ. මේක ඉතින් එක පවුල නේ. ඒ නිසා ප්‍රශ්නයක් නැහැ. ඒක පවුලේ ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ප්‍රාදේශීය සංවර්ධනය ගැන කතා කරනකොට සංචාරක කර්මාන්තය ගැනත් කියන්න ඕනෑ. ඔබතුමන්ලා දන්නවා ඇති, සොරගුණේ දේවාලයට අයිති නින්දගම් අක්කර 628ක් බාසු රාසයියා නමැති පුද්ගලයකුට විකුණා තිබෙනවාය කියලා. මේක සණ කැලෑවක්. ඒක අපි මාධ්‍යවලින් කිව්වා. ඒකට මධ්‍යම පරිසර අධිකාරිය මැදිහත් වුණා. ඒ ඉඩම මැද්දේ තේක්ක, බුරුත ගස් විශාල ප්‍රමාණයක් කපා "එකෝ ගොල්ෆ් රිසෝට්" කියන කාමර දාහක හෝටලයක් හදන්න යනවා. [බාධා කිරීමක්] වැරදි තොරතුරක් කියා කියන්නේ කොහොමද? මට වෙලාව නැහැ ඔබතුමාගේ වෙලාවේදී උත්තර දෙන්න.

ක්‍රිකට් ආයතනයේ හිටපු සුරාජ් දංදෙනිය World Cup එක සම්බන්ධයෙන් කියා තිබෙනවා, Cricket Board එක World Cup එකෙන් Rs. 2.4 billion හම්බ කළාය කියා. ඒක ආර්ථික සංවර්ධනය යටතේ වෙන්න පුළුවන්. මෙතුමාට අයිති නැති subject එකක් නැහැ. ඒ නිසා ඒ ගැනත් පොඩ්ඩක් සොයා බලන්න. අවශ්‍ය නම් ඒවාට tax ගහන්න. ලාබ තිබෙනවාය කියා ඔබතුමන්ලාගෙන් සල්ලි ඉල්ලන්න එතුමන්ලාට අවශ්‍ය නැහැ. මොකද ක්‍රීඩා අමාත්‍යාංශය ගැන කතා කරන දවසේ මම නැහැ. ඒ නිසා අවසාන වශයෙන් මම කියනවා, එක්සත් ජාතික පක්ෂය ගැන තමුන්නාන්සේලා බය වෙන්න එපා. 1956 දීත් ඔහොම තමයි කිව්වේ. මන්ත්‍රීවරුන් අට දෙනාට වැටිච්ච වෙලාවේ යූඑන්පීය මැරුණාය, ඇණ ගැහුවාය කිව්වා. අද කීප දෙනෙක් ඔබතුමන්ලාගේ පැත්තට ගිහින් ඉන්නවා. ඒ ගියේ UNPයේ තේක්ක, බුරුත, නැදුන් නොවෙයි. වණ වෙච්ච, හිල් වෙච්ච, කුඹ ගහපු අඩුම ගණනේ කෙළින් කර ගන්න බැරි කෝටු වාගේ කැලි ටිකක් තමයි ගියේ. හැබැයි තේක්ක, බුරුත, නියම නැදුන් ටික ඉදිරි කාලයේදී ඔබතුමන්ලා ඉදිරියේ පෙන්වන්න පුළුවන් හැකියාවක් එක්සත් ජාතික පක්ෂයට තිබෙනවාය කියමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ. භා. 2.17]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன - பொருளாதார அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Lakshman Yapa Abeywardena - Deputy Minister of Economic Development)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි ස්තුතිවන්ත වෙනවා, අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සාකච්ඡා වන අය වැය කාරක සභා අවස්ථාවේ විවාදයට ගරු මන්ත්‍රීවරුන් ඉතාමත්ම සක්‍රීයව සහභාගී වුණු එක ගැන. ඒකෙන් අපට තේරෙන එක දෙයක් තමයි තමුන්නාන්සේලා සියලු දෙනාටම මේ අමාත්‍යාංශය හොඳට දැනිලා තිබෙනවාය කියන එක. මොකද, ගමට දැනෙන වැඩ කොටසක් කෙරුණාම මේ රිදිල්ල තිබෙනවා. ගමට හරියට දැනුනාම ගමේ මිනිහාට මේක දැනිච්ච බව දන්නේ ගමේ මන්ත්‍රීවරයායි. ඒ නිසා තමුන්නාන්සේලාට මේක හොඳටම මේ කාලයේ දැනුණු බව මම හොඳට දන්නවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මාස 12ට උපදේශක කාරක සභා 11ක් තියලා තිබෙනවා. මාස 12ට උපදේශක කාරක සභා 11ක් තියලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ප්‍රශ්නයක් ඇහුවා නම් අපෙන් ප්‍රශ්නය අහපු දවසට පහු වැනි දා අපි උත්තර දීලා තිබෙනවා. ඒ නිසා ඇමතිතුමාගේ සම්පූර්ණ බලය කොට්ඨාසයේ මන්ත්‍රීවරයාට -සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාට- දීලා තිබෙනවා. අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ බලය දිසාපතිතුමාටත්, ප්‍රාදේශීය ලේකම්තුමාටත් දීලා තිබෙනවා. ඒකයි අපට ප්‍රායෝගිකව අපේ වැඩසටහන් ගම් මට්ටමේ ක්‍රියාත්මක කරන්න පුළුවන්කම ලැබුණේ. ඒ නිසා අපි පසු ගිය කාල වකවානුව ඇතුළත ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු ශක්තිමත් කරලා, ඒ ශක්තිමත් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව තුළ දීර්ඝ කාලයක් මේ රටේ තිබිච්ච මූලික ප්‍රශ්නවලට, ගම්වල තිබිච්ච ප්‍රශ්නවලට උත්තර දෙන්න අපට පුළුවන්කම ලැබිලා තිබෙනවා.

මම කනගාටු වෙනවා, දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා මේ සභාවේ නැති එක ගැන. මම හිතුවා, මගේ කථාව කරන වෙලාවේදී ඉඳීවි කියලා. එතුමාගේ ආසනයට දවස් දෙකකට ඉස්සෙල්ලා මම ගියා. ඒ, දෝතැන්න කියන ගමට. ඒ දෝතැන්න කියන ගමට වසර ගණනාවක් ජලය නැතුව ඉන්න කොට, අපි ඒ ගමට ජලය දෙන්න මිලියන 65ක් වියදම් කරන කොට ශ්‍රම දායකත්වය මිලියන 20ක් දීලා ගමේ මිනිස්සු ජලය අර ගත්තා. එදා දහස් ගණනක් හිටියා. ඒ ජලය පාවිච්චි කරන අය කිව්වා, මේ කරපු සේවය අවුරුදු 30, 40කින් මේ ප්‍රදේශයට කර ගන්න බැරි වුණා කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම තමයි පසු ගිය කාල වකවානුව ඇතුළත ගම් මට්ටමේ දීර්ඝ කාලයක් විසඳුණේ නැති ප්‍රශ්න රාශියක් ක්‍රමයෙන් විසඳන්න පුළුවන්කම ලැබුණා. වාරි මාර්ගවලින් ඇළ මාර්ගවලට ලැබෙන්න ඇති. ගොවි ජන සේවා එකෙන් ලැබෙන්න ඇති. නමුත් ගමේ ප්‍රශ්නය දැක්කේ, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව රැස් වුණු වෙලාවෙයි. එකට එකක් ගැටෙන්නේ නැතුව, හැම ආයතනයකටම වෙන වෙනම මුදල් වෙන් කරලා ඒවා සාකච්ඡා කරලා -නිලධාරින් ඉදිරියේ සාකච්ඡා කරලා, පක්ෂ, විපක්ෂ මන්ත්‍රීවරු සාකච්ඡා කරලා- ඒවා ප්‍රායෝගිකව ගම් මට්ටමේ ක්‍රියාත්මක කරන්න පසු ගිය කාල වකවානුව ඇතුළේ පුළුවන්කම ලැබුණා.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. ඔබතුමාට මතක ඇති. මට මතකයි, මන්ත්‍රීවරයකුට ලක්ෂ 50ක් දුන්නම පසු ගිය කාල වකවානුවල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාට රුපියල් 25,000ක් ගන්න බැරි වුණු බව. අද අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා ගමට ලක්ෂ 300, 400 වැඩ කරනවා. සභාපතිවරයා ලක්ෂ 4,000ක, 5,000ක වැඩ කරලා තිබෙනවා. මේක තමයි මේ රටට අවශ්‍ය වෙලා තිබුණේ. ඒකයි ප්‍රායෝගිකව මේ වැඩසටහන මේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වුණේ. මේ අමාත්‍යාංශයට වැඩ පිළිවෙළවල් රාශියක් තිබුණත්, ගරු ඇමතිතුමා ඒ සියල්ලම බෙදලා දුන්නේ ගමෙන් තේරී පත් වූ මන්ත්‍රීවරයාට සහ ඒ මහ ජන නියෝජිතයන්ටයි. මේකට විපක්ෂයට සම්බන්ධ වන්න තිබුණා. සමහර අය ඇවිල්ලා කරුණු ඉදිරිපත් කළා. නමුත් අද මේ ගරු සභාවේදී ඉදිරිපත් කරපු සමහර කරුණු පිළිබඳව මම කනගාටු වෙනවා. මොකද, පසු ගිය කාලයේ මේ රටේ විරැකියාව සියයට 8 සිට 4.3 දක්වා අඩු වුණේ අපේ මේ

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

වැඩසටහන් ප්‍රායෝගිකව ගම් මට්ටමේ ක්‍රියාත්මක වුණු නිසායි. උද්ධමනය සියයට 11 ඉඳලා 6 දක්වා අඩු වුණේ මේවා ගම් මට්ටමේ ක්‍රියාත්මක වුණු නිසායි. 2010 අගෝස්තු මාසය වන විට අය වැය පරතරය සියයට 8.9 දක්වා අඩු වෙලා, ඒ වාගේම 2011 ජූලි මාසයේ ඉඳලා 2012 වන විට සියයට 6.2 දක්වා අපට ඉලක්ක කරන්නට පුළුවන්කම ලැබුණේ මිනිස්සු අතරේ මේ ප්‍රායෝගික වැඩසටහන් ක්‍රියාත්මක වුණු නිසායි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම ආයෝජන මණ්ඩලය ගැන මේ ගරු සභාවේදී ගරු මන්ත්‍රීවරුන් දෙදෙනෙක් කථා කළා. පසු ගිය වාකවානුව තුළ දී විදේශ ආයෝජන අඩු වුණාය කියලා කවුද කියන්නේ? 2010 වර්ෂයේ විදේශ ආයෝජන අඩු වුණා කියලා එතුමන්ලා කියනවාද? කොහෙන්ද සංඛ්‍යා ලේඛන ගත්තේ? 1978-2011 දක්වා ආයෝජන මණ්ඩලයේ සංඛ්‍යා ලේඛන ඇතුළත් ලේඛන මම **සභාගත*** කරනවා. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීතුමනි, මම සභාගත කළාම තමුන්නාන්සේ ගන්න. පසු ගිය වකවානුව ඇතුළත සම්පූර්ණයෙන්ම විදේශ ආයෝජන පිළිබඳ සංඛ්‍යා ලේඛන එහි අඩංගු වනවා. 2009 වර්ෂයේ අනුමත ව්‍යාපෘති 384යි; ගිවිසුම් අත්සන් කළ ව්‍යාපෘති 182යි; ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 118යි; විදේශ ඍජු ආයෝජන ඇමෙරිකානු ඩොලර් මිලියන 602යි. 2011 වර්ෂය බලන්න. 2011 වර්ෂයේ අනුමත යෝජනා ක්‍රම 134යි; ක්‍රියාත්මක ව්‍යාපෘති 51යි; ඍජු ආයෝජන ඇමෙරිකානු ඩොලර් මිලියන 1070ක් ලැබිලා තිබෙනවා. ඇමෙරිකානු ඩොලර් මිලියන 1070ක් 2010 - 2011 වර්ෂයේ ඇවිල්ලා තිබෙනවා.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
2010ද, 2011ද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
2011 වර්ෂයේ.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
2010 වර්ෂයේ කීයද?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
2010 ඇමෙරිකානු ඩොලර් මිලියන 516යි.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතකොට හයසිය ගණනක-

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
හරි, ඔබතුමා එක්දහස් ගණනට අඩු වුණු එක ගැන කියන්න. [බාධා කිරීමක්]ඔබතුමා වාඩිවන්න. ඔබතුමා මම සභාගත කරපු ලේඛනය බලන්න. [බාධා කිරීමක්]

මම කථා කරලා ඉවර වුණාට පස්සේ ඔබතුමා ඒ ලේඛන ගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගොල්ලන් කථා කරන්නේ පසු ගිය වකවානුව ඇතුළත ඇති වුණු ඇඟලුම් කර්මාන්තශාලා ගැනයි. [බාධා කිරීම්] ඇඟලුම් කර්මාන්තශාලා අද අපට ආයෝජනයක් නොවෙයි. අපි ආයෝජන හැටියට ඒවා ගණන් ගන්නේ නැහැ. මොකද, අද තරුණයෝ කොරියාවේ යනවා; විශාල වශයෙන් ඉතාලියට යන්න උත්සාහ කරනවා; නොයෙක් ආකාරයෙන් හොඳ ආදායම් ලබන රැකියා ලබා ගන්න උත්සාහ කරනවා. මේ සියල්ලම නිසා ඇඟලුම් වැනි කර්මාන්තශාලාවල ආයෝජනයට අද තැනක් නැති වෙලා තිබෙනවා. හේතුව මේකයි. අද විශේෂයෙන්ම පිට රට ඉඳලා මේ රටට හැම අමු ද්‍රව්‍යයක්ම ගෙනැල්ලා අපෙන් ශ්‍රමය විතරක් ගන්න දේවල්වලට අප විශේෂ උනන්දුවක් දැක්විය යුතු නැහැ. අපට තියෙන්න ඕනෑ, අධි තාක්ෂණ ක්‍රම. විශේෂයෙන්ම, ඒ විෂයට අදාළවයි මේ ආයෝජන අපි දාන්න ඕනෑ.

ආයෝජන මණ්ඩලයේ වර්තමාන සභාපතිතුමා ගැනත් මම කියන්න ඕනෑ. විදුලිබල අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම්තුමා, සභාපතිතුමා හැටියට ආවාට පස්සේ මේ මාස කිහිපය ඇතුළත විශාල වෙනසක් කර ගෙන යනවා. ඒ නිසා අපට ආයෝජන අවශ්‍යයි. විශේෂයෙන්ම විශාල වශයෙන් මේ රටට මුදල් ගේන්න ස්ථාවර ආයෝජනයන් මේ රටට අවශ්‍යයි. අපට ඇඟලුම් කර්මාන්තශාලා ගණන වැඩි කළාට මේක කරන්න බැහැ. අපි මේ පළාතේ විතරක් නොවෙයි නැඟෙනහිර පළාතේ ඒක කරලා තිබෙනවා. මොකද, ඉක්මනට කරන්න පුළුවන් දේ. මේ වන විට නැඟෙනහිර පළාතේ කර්මාන්තශාලා පහක් පටන් අර ගෙන තිබෙනවා. ඒ කර්මාන්තශාලා අපට තවදුරටත් වැඩි කරන්නට පුළුවන්, වවුනියාවෙන් එහාට ස්ථිර විදුලි බලයක් තිබුණා නම්. විදුලිය තිබුණාට කර්මාන්තශාලා දුවන්න පුළුවන් විදුලිබල පද්ධතියක් ඇති කර ගෙන 2013 වර්ෂයේ දී වුන්නාකම් දක්වා දියුණු කරන්නට අවශ්‍ය කටයුතු කර ගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙතැන කථා කරපු කාරණා කිහිපයක් පිළිබඳව මා අවධානය යොමු කරනවා. මොකද, මේ වැරදි තොරතුරු මේ පාර්ලිමේන්තුවට දෙන්න එපා. මාධ්‍යය නිවැරදි විය යුතුයි. විශේෂයෙන්ම 2010 මහ බැංකු වාර්තාවේ35 වැනි පිටුවේ- [බාධා කිරීමක්] මේවා අහගෙන ඉන්න බැරි නම් මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ එළියට යන්න. මට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. (Dr.) Harsha de Silva, what is your point of Order?

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ වෙලාව. විනාඩියක්වත් දෙන්නේ නැහැ.[බාධා කිරීම්]

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Order, please! There is a point of Order being raised.

**ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு கலாநிதி ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Sir, the Hon. Minister is saying that I have misled the House. But, I have tabled this document which I have -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Member, that is not a point of Order.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක point of Order එකක් නොවෙයි.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්]

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
කරුණාකර, වාඩි වෙන්න. [බාධා කිරීම්] වාඩි වෙන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. (Dr.) Harsha de Silva, please sit down.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ආදායම් බෙදී යාම පිළිබඳව කථා කළා. මේ වැරදි ප්‍රවෘත්ති, වැරදි වාර්තා පාර්ලිමේන්තුවේ ඉදිරිපත් කරන්නේ ඇයි? ආදායම බෙදී යාමේ ගිනි සංගුණක වාර්තාව තිබෙනවා. විශේෂයෙන්ම දරිද්‍රතා දර්ශකය 2006 ඉඳලා 2011 වන කොට නාගරික, ග්‍රාමීය, වතු කියන අංශ තුනේම අඩු වුණා. නාගරික දරිද්‍රතාව සියයට 6.7 ඉඳලා සියයට 5.3 දක්වා අඩු වුණා. ග්‍රාමීය දරිද්‍රතාව සියයට 15.7 ඉඳලා සියයට 9.4 දක්වා අඩු වුණා. වතුවල දරිද්‍රතාව සියයට 32 ඉඳලා සියයට 11.7 දක්වා අඩු වුණා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ජාතික ආර්ථිකයට සියයට 51ක් එකතු වුණා, පසු ගිය වකවානුවේ. ඒ සියයට 51 මේ වන කොට පළාත්වලට බෙදිලා ගිහින් තිබෙනවා.

මට පුදුමයි, කබීර් හාෂිම් මන්ත්‍රීතුමා ජාතික ආර්ථිකය ගැන කථා කළේ අංශක 160ක් අනෙක් පැත්තට හැරිලායි. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා දන්නවා, ජිමී රොබට්සන් අය වැය හදන්න උපදෙස් දුන්නේ කාටද කියලා. "යළි පුබුදමු ශ්‍රී ලංකා" වැඩසටහන සකස් කරන කොට ජිමී රොබට්සන් කැබිනට් එකේ පැත්තක වාඩි කරවා ගෙන උපදෙස් දුන්නේ කොහොමද? දැන් සුද්දෝ හොඳ නැහැ; විදේශිකයෝ හොඳ නැහැ. මේ පිළිබඳවයි අද කථා කරන්නේ. අංශක 160ක් අනෙක් පැත්තට හැරිලා අද ජාතික ආර්ථිකයක් ගැන කථා කළා.

විශේෂයෙන්ම එතුමා සංචාරක ව්‍යාපාරය පිළිබඳව කථා කළා. දැන් ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. 2011 නොවැම්බර් මාසයේ 24වැනිදා වන කොට සංචාරකයෝ හත්ලක්ෂ පණස්දහස ඉක්මවන්න අපට පුළුවන්කම ලැබුණා. අපේ ඉලක්කය වශයෙන් තිබුණේ දෙසැම්බර් මාසයේ 31වැනිදා වන කොට හත්ලක්ෂ පණස්දහසක සංචාරකයින්ගේ පැමිණීමක්. නමුත් අපට පුළුවන්කම ලැබුණා නොවැම්බර් මාසයේ 24වැනිදා වන කොට ඒ ඉලක්කය ඉක්මවන්න. දැන් මෙතුමන්ලා සඳහන් කළත් ආදායම් නැති, වියදම් කරන්නේ නැති සංචාරකයෝ ආවාය කියලා මේ විපක්ෂයේ ඉන්න එක මන්ත්‍රීවරයෙක්වත් දන්නවාද, ඩොලර් 1,500ටත් ලංකාවේ නවතිනවා කියලා. අපේ කාමර ගාස්තු වැඩි කළා. වාද්දූව සංචාරක නිකේතනයක් -හෝටලයක්- තිබෙනවා, කාමරයක ගාස්තුව ඇමෙරිකන් ඩොලර් 840යි. ඊයේ වන කොට සියයට අනූවක් කාමර සම්පූර්ණ වෙලා. ඔබතුමන්ලා දන්නවාද? ඇයි මේවා ගැන කථා නොකරන්නේ? අද restaurants වැඩියෙන් ඇරෙන්නේ, සංචාරක ව්‍යාපාරය සම්බන්ධ කටයුතුවලට හුඟක් අය අයැදුම්පත් ඉදිරිපත් කරමින් දැන් උනන්දු වෙන්නේ, මේ තරම් කාමර අලුත්වැඩියා කරලා හදන්නේ ඇයි? ඩොලර් 100ට ඉන්නද? නැහැ. මේවා ක්‍රමක්‍රමයෙන් වැඩි වෙලා තියෙනවා. අපි හිටපු තැන අමතක කරන්න එපා. අද පාරක් වැහුවාම කථා කරනවා. පිටකොටුවේ ඉඳලා පාරවල් කීයක් වහලා තිබුණාද?

අද වෙළඳාම ගැන කථා කරනවා. මිනිසුන්ගේ වෙළෙඳම අඩු වනවාලු. කාලයක් පිටකොටුවේ football ගහන්න පුළුවන්කම තිබුණා. එක වීදියක එක මනුෂ්‍යයෙක් ගියේ නැහැ, business කරන්න. හෝටල් වැහිලා තිබුණේ. අද කථා කරනවා මැරිලා ඉපදිලා වාගේ; මේ කිසි දෙයක් දැක්කේ නැති විධියට. සංචාරකයන් ගැන අපට කථා කරනවා තබා හිතන්නවත් තිබුණාද? මේ අවුරුදු දෙක තුළ අපි මේක ක්‍රමක්‍රමයෙන් ඉදිරියට ගෙන ගිහින් තිබෙනවා. අපේ ඉලක්කය ඉදිරි කාලය ඇතුළත - 2012 වර්ෂය වන කොට- සංචාරකයන් 9,50,000ක් ලංකාවට ගෙන්වා ගැනීමයි. 2011 දී අපට ඒක කරන්න පුළුවන් වුණා නම්, 2012 දී අපට ඒක කරන්න බැරි වන්නේ නැහැ. නොවැම්බර් මාසය වනකොට ඇමෙරිකානු ඩොලර් මිලියන 760ක ආදායමක් ලැබිලා තිබෙනවා. ඒ කියන්නේ ඩොලර් බිලියනයකට ආසන්නයි. අපේ ඉලක්කය තිබෙන්නේ විශේෂයෙන්ම ඉදිරි වසර පහ තුළ ඩොලර් බිලියන 3 දක්වා ආදායම වැඩි කර ගන්නයි. මේ අවුරුද්දේ මේ වන කොට ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 760යි. මෙම ප්‍රමාණය අපට වැඩි කර ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ වන විට පාසිකුඩාවල හෝටල් 14ක් ඉදි කරනවා.

2012 මාර්තු මාසයේ 15 වන දා වන විට ඒ කටයුතු අවසන් වනවා. හෝටල් කාමර 930ක් අලුතින් එකතු වනවා. එතැන රුපියල් මිලියන 6,533ක ආයෝජනයක් තිබෙනවා. කුච්චවේලිවල හෝටල් කාමර 200ක් එකතු වනවා. ඒ සඳහා ඩොලර් මිලියන 172ක් ආයෝජනය කරලා තිබෙනවා.

දකුණු පළාතේත් මේ වාගේම ආයෝජනය කරලා තිබෙනවා. හික්කඩුවේ beach එකේ "Chaaya Tranz Hotel" කියලා හෝටලයක් පසු ගිය දිනක අපි විවෘත කළා. ඒ අයගේ දෙවන හෝටලයත් දැන් බෙන්තොට හදා ගෙන යනවා. ඊ ළඟට, ෂැන්ග්‍රි-ලා හෝටලයේ කටයුතු ආරම්භ කළා. අලුතින් තවත් හෝටල් කිහිපයක් සඳහා අයදුම් පත් ඉදිරිපත් කරලා තිබෙන අතර ඒවා අනුමත කර තිබෙනවා. ඉදිරි කාලය ඇතුළත අපට මේ ඉලක්කයට යන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සංචාරක ඒජන්ත ආයතන 87ක් අලුතින් ලියා පදිංචි වෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය හොඳ නැත්නම් ඔවුන් එනවාද? ඔවුන්ට අලුතින් ආදායම එන්නේ

[ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා]

නැත්නම් ඔවුන් එනවාද? අලුතින් guesthouses 38ක්, අලුතින් මාර්ගෝපදේශකයන් 104 දෙනෙක් ලියා පදිංචි වෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපට ගුවන් ගමන් ආරම්භ කරන්න පුළුවන්කම ලැබී තිබෙනවා. විශේෂයෙන්ම සෘජු ගුවන් ගමන් කිහිපයක් ආරම්භ කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. ඊ ළඟට, ලබන අවුරුද්ද වන කොට සෘජු ගුවන් ගමන් 10ක් සඳහා අපට ඉල්ලුම් කරලා තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ගරු සභාවේදී සඳහන් වුණා, ගිය අවුරුද්දේ සමෘද්ධි ව්‍යාපාරය සඳහා රුපියල් ලක්ෂ 93,000ක් වෙන් කළාය කියලා. ජනාධිපතිතුමා මේ අය වැයෙන් එම මුදල වැඩි කළා. ඒ වැඩි කරපු මුදලත් එක්ක තව රුපියල් ලක්ෂ 30,000ක් එකතු කරනවා. එතකොට රුපියල් ලක්ෂ 93,000ට අමතරව සමෘද්ධි සහනාධාරය සඳහා තව රුපියල් ලක්ෂ 30,000ක් එකතු වනවා.

ඒ විතරක්ද? "දිරිය පියස" වැඩසටහන තිබෙනවා. මේවා ගිහින් බලන්න ඕනෑ. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ පඬුවස්නුවර ආසනයට මා ගියා. එදා "දිරිය පියස" නිවාස 4කට මුල් ගල් තැබුවා; එකක් විවෘත කළා. මා හිතන හැටියට ඒ, දෝතැන්න ගමේ. [බාධා කිරීමක්] අන්න ඒ ගමේ. ඒ ජල ව්‍යාපෘතියට මිලියන කීයද? [බාධා කිරීමක්] අන්න, බලන්න. ඒක නේ. කොච්චර හොඳද? ඒක නේ මේ කෑ ගහන්නේ.

ඊ ළඟට, ව්‍යාපෘති ප්‍රතිලාභින්ගේ ආර්ථිකය ඉහළ නැංවීමට කෘෂි, ධීවර, සත්ව ව්‍යාපෘති 60,690ක් අපි අලුතින් ආරම්භ කරලා තිබෙනවා. විශේෂයෙන්ම 2010, 2011 වන කොට ලොතරැයි දිනුම් ඇදීමෙන් විතරක් නිවාස 4,400ක් ඉදි කරන්න අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. කවදාවත් රුපියල් ලක්ෂයක් නොමිලයේ ලැබුණේ නැහැ; රුපියල් 2,50,000ක් නොමිලයේ ලැබුණේ නැහැ. රුපියල් ලක්ෂයෙන් නිවසක් හදන්න බැහැ, ඒක ඇත්ත. හැබැයි ඔබතුමා දන්නවා, කවුරුවත් රුපියල් 15,000ක්වත් දෙන්නේ නැහැයි කියලා.

දැන් රුපියල් ලක්ෂයේ "දිරිය පියස" නිවාස හදන කොට මිනිසුන්ගේ දායකත්වයත් එක්ක ඒ සඳහා විශාල උනන්දුවක් ඇති වී තිබෙනවා. ලොතරැයි විකිණීමෙන් ලැබුණු සල්ලිවලින් රුපියල් 2,50,000 ගණනේ නිවාසවලට දීලා දැන් වෙනම නිවාස හදන්න පටන් අර ගෙන තිබෙනවා. මොකක්ද මේ සමෘද්ධිය කියන්නේ? පාර්ලිමේන්තුවට ඇවිත් සමහර මන්ත්‍රීවරුන් අහනවා, මේ මුදල පිළිබඳව. මේ මුදල විතරක් නොවෙයි මෙතැන තිබෙන්නේ. මේ මුදලට පරිබාහිරව මේකට බැඳිච්ච වැඩ පිළිවෙළවල් රාශියක් තිබෙනවා. ඒවා අද ගම් මට්ටමේ මිනිසුන්ට හොඳට දැනිලා තිබෙනවා. මම එක පැත්තකින් සතුටු වෙනවා, මෙතුමන්ලාගේ ආර්ථික න්‍යාය අංශක 190කින් කැරකැවිච්ච එක ගැන. මොකද, අඩු ගණනේ ඔයගොල්ලෝ කැරකැවුණාට මහ තැන කරකවන්න හම්බ වෙන්නේ නැහැ කවදාවත්. ඒක කවදාවත් කරන්න බැහැ. කවදාවත් බැහැ. ජීවිතයට කරන්නට බැහැ. එතැනම ඉන්නවා. [බාධා කිරීම්] මොකද, මේක චින්තන දෙකක්. [බාධා කිරීම්] අපි "ට්‍රයි" කළා, බැරි වුණා. [බාධා කිරීම්] මැදමුලන චින්තනයත් එක්ක කුරුඳුවත්ත චින්තනය කවදාවත් ගලපන්න බැහැ. [බාධා කිරීම්] ඒක ගලපන්න බැහැ. මොකද පොළොවේ පය ගහලා ජීවත් වුණොත් විතරයි මේක කරන්න පුළුවන් වන්නේ. තමුන්නාන්සේලාත් තේරුම් ගන්න ඕනෑ එක දෙයක් තිබෙනවා. මේ කාලය ඇතුළත අසාමාන්‍ය විධියට ගම්වලට සල්ලි ගිහිල්ලා මිනිසුන් ශක්තිමත් වුණේ නැත්නම් මිනිස්සු මේ ආණ්ඩුවත් එක්ක ඉන්නේ නැහැ.

තමුන්නාන්සේලා දන්නවා, අවුරුදු දෙකක් කොහොමද හිටියේ කියා. අද මිනිස්සුන්ගේ රැකියා ප්‍රශ්නය ගැන කථා කරනවා; රැකියා හිඟය ගන කථා කරනවා. ඒ අවුරුදු දෙකේදී එක රැකියාවක් දුන්නා ද? නිකම් සනීපාරක්ෂක කම්කරු තනතුරුක් දුන්නා ද? එතැනදී මොකක්ද කිව්වේ? තමුන්නාන්සේලාට මතක ඇති, පොළොන්නරුවේ ගිය වෙලාවේ ගොවීන් පොහොර සහනාධාරය ඉල්ලුවාම, බැණලා එළෙව්වා. ඕනෑ නම් credit card එකක් හඳුන්වා දෙන්නම් කිව්වා. [බාධා කිරීමක්] එහෙම කිව්වා. මොනවා ද මේ කථා කරන්නේ? [බාධා කිරීමක්] ඒක තමයි අප දැකපු දෙය. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, irrigation කිව්වාම, "no more irrigation" කිව්වා.

අද වන කොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමෘද්ධි බැංකු සංගම් 1,043ක් මුළු රටපුරා පිහිටුවා තිබෙනවා. [බාධා කිරීමක්] සාමාජිකත්වය ලක්ෂ 28 ඉක්මවා තිබෙනවා. ඉන් සියයට 65ක් කාන්තාවන්. සමෘද්ධි ගිණුම් සංඛ්‍යාව 1,70,000ක් දක්වා වැඩි වී තිබෙනවා. වර්ධනයේ සියයට 7ක ප්‍රවණතාවක් තිබෙනවා. තැන්පත් මුදල රුපියල් මිලියන 1,500ක් දක්වා වැඩි වී තිබෙනවා. සමෘද්ධි බැංකු සංගම් සාමාජිකයෝ රුපියල් 5,000සිට රුපියල් 2,50,000 දක්වා ණයවලට යන්නට පටන් ගෙන තිබෙනවා. සමෘද්ධි ව්‍යාපාරය යටතේ මේ අවුරුද්දේ පුද්ගලයන් 3,50,000කට ණය ලබා දී තිබෙනවා.

වර්ෂ 2005 සිට 2010 දක්වා මේ ප්‍රගතිය අරගෙන බැලුවොත් ජීවනෝපාය ව්‍යාපෘති විතරක් 3,58,000ක් ඇති කරන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. මේවා මිනිස්සුත් එක්ක බැඳිලායි තිබෙන්නේ. ඒකයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාමීය මට්ටමේ මිනිස්සු ආණ්ඩුවත් එක්ක ඉන්නේ. පසු ගිය වකවානුව ඇතුළත කෘෂි ව්‍යාපෘති 2,33,083ක්, ධීවර ව්‍යාපෘති 48,046ක් හඳුන්වා දෙන්නට පුළුවන්කම ලැබුණා. මේ වාගේ විශේෂ දේවල් පසු ගිය වකවානුව ඇතුළත හඳුන්වා දෙන්නට අපට පුළුවන්කම ලැබී තිබෙනවා. [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එක මන්ත්‍රීවරයෙක් -මට නම කියන්නට බැහැ. නම කිව්වොත් ආපසු කථා කරනවා නේ- කථා කර කිවවා, ගම නැගුම ව්‍යාපෘතියට මුදල් අඩු කරලා කියා. මේක තේරුම් ගන්නේ නැහැ. කොළඹ ඉන්න මන්ත්‍රීවරුන්ට මේක ලොකු ප්‍රශ්නයක්. මොකද, සමහර අය "ගම නැඟුම" කියන වචනය දන්නෙත් නැහැ. ඒ ගොල්ලෝ කියනවා මේ ගම නැඟුම වැඩසටහනේ මුදල් කපලා කියලා. ඇයි දෙවියනේ! ඔබතුමන්ලා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවලට ගිහිල්ලා බලන්න, ගම නැඟුම වැඩසටහනට පසු ගිය අවුරුද්දට කලින් අවුරුද්දේ දුන්නු මුදල හා දැන් දීලා තිබෙන මුදල කොහොමද කියලා. ඉස්කෝලවල වැසිකිළි කැසිකිළි පහසුකම්වලට දුන්නා. ඊ ළඟට ඇළ මාර්ගවලට දුන්නා; සෞඛ්‍ය මධ්‍යස්ථානවලට දුන්නා; මාතෘ නිවාසවලට දුන්නා; පෙර පාසල්වලට දුන්නා. මෙතුමන්ලා පොතේ තිබුණු විස්තර අරගෙන ගම නැඟුමට මේ අවුරුද්දේ මෙච්චරයි කියලා ගණන් හදනවා. අනික් ඒවාට ගිය ඒවාත් ගණන් හදන්න කෝ. අපි අවුරුද්දෙන් අවුරුද්ද මුළු ගමම සංවර්ධනය කරන ව්‍යාපෘති මේ කර ගෙන යන්නේ.

**ගරු පියංකර ජයරත්න මහතා (සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன - சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Piyankara Jayaratne - Minister of Civil Aviation)
ආනමඩුවට ඇවිල්ලා බලන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லசஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ඒක කවදාවත් නැහැයි කියන්න බැහැ. අපි ගිහිපු තැන්වල ගිහින් බලන්න. ආනමඩුවේ මෙතුමාගේ ආසනයට ගියා.

**ගරු පියංකර ජයරත්න මහතා**
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)
බලන්න එන්න.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
දහස් ගණනක් මිනිස්සු රෑ එකොළහ, දොළහ වන තුරු ඇවිල්ලා ඉන්නවා. එන අවුරුද්දේ ඉඳලා සති පොළ සංවර්ධනයත් තිබෙනවා. හැම සති පොළක්ම සංවර්ධනය කරන්නත් මේ මුදල් ප්‍රතිපාදන වෙන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අපි රුපියල්- Sir, how many minutes more do I have?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, you have only six more minutes .

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ සියලු වැඩසටහන් එක්ක සමස්ත ආර්ථිකයේම ලොකු වෙනසක් පසු ගිය වකවානුව ඇතුළත මේ අමාත්‍යාංශය යටතේ කරන්න පුළුවන්කමක් අපිට ලැබුණා. මේවා සියල්ලක්ම දුප්පත් ජනතාවත් එක්ක බැඳුණු ව්‍යාපාර කියලා අපි පසු ගිය කාල පරිච්ඡේදය ඇතුළත හඳුනා ගත්තා. ඒ නිසා එක පැත්තකින් මේ ආණ්ඩුව මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනවා වාගේම දිවි නැඟුම වැඩසටහනත් ඉතාමත්ම සාර්ථකව ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙලා තිබෙනවා. මේ දිවි නැඟුම වැඩසටහන යටතේ විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී පවුල්වලට ගෙවතු විසිපන් ලක්ෂයේ වැඩ පිළිවෙළට අපිට යන්න පුළුවන්කමක් ලැබිලා තිබෙනවා.

මීට පෙර කථා කරපු මන්ත්‍රීවරයෙක් සඳහන් කළා බීජ හා පැළ බෙදීම ගැන. ඒ දිස්ත්‍රික්කයේ පවුල් 600ටයි ලැබුණේ කියලා ගණන් හදලා කිව්වා. අපි හැම ග්‍රාම නිලධාරි වසමකින්ම 100ක් තෝරා ගන්නවා. මේ 100ට මොනවා හෝ ප්‍රතිලාභයක් ලැබෙනවා. දැන් ඒක 150 දක්වා වැඩි කරලා තිබෙනවා. එතකොට අපේ ඉලක්කය තිබෙන්නේ ලබන අවුරුද්ද වන කොට මේක විසිපන් ලක්ෂය දක්වා වැඩි කරන්නයි. ඒ අයට රුපියල් 10,000ක උපරිමයකට යටත්ව ඉඩම හදා ගන්න, බීජ, පැළ හා උපකරණ යන මේවා ඔක්කෝම ලබා දෙනවා. පසු ගිය වකවානුව ඇතුළත අධික වර්ෂාවක් නොලැබුණා නම් මේ වන කොට එළවලු මිලත් මීට වඩා අඩු වෙනවා. නමුත් පසු ගිය කාල පරිච්ඡේදය ඇතුළත අපට තිබුණු ප්‍රශ්නයක් තමයි ලංකාවේ එළවලු මිල ශීඝ්‍රයෙන් වැඩි වීම. තමුන්නාන්සේලාත් හෘදය සාක්ෂියට අනුව පිළිගන්නවා ඇති දිවි නැඟුම වැඩසටහන යටතේ මේක සම්පූර්ණයෙන් වෙනස් වෙලා ගියා කියන එක. අපේ සමහර පැතිවල මේ වගාවන්වලින් නිෂ්පාදනය කරපු දේවල් වැඩි නිසා සමහර වෙලාවට අළෙවි කර ගන්නත් බැරි වුණා. ඒ නිසා තමයි ජීවනෝපාය වැඩසටහන ක්‍රියාත්මක කරන්න සිද්ධ වුණේ. ඒ නිසා මේ අවුරුද්දේ ඉඳලා අපි ජීවනෝපාය වැඩසටහන් වැඩි දියුණු කරන්න අවශ්‍ය කටයුතු කරනවා. විශේෂයෙන්ම ඒක කුකුළු පාලනය වෙන්න පුළුවන්; පිට රට යවන නිෂ්පාදනයක් වෙන්න පුළුවන්. අද ඒ වැඩසටහන් තුළින් ග්‍රාමීය ආර්ථිකයේ විශාල වෙනසක් වෙලා තිබෙනවා.

පසු ගිය වකවානුව ඇතුළත එක පැත්තකින් ආහාර සුරක්ෂිතභාවය, ජීවන වියදම අඩු වීම සෞඛ්‍ය සම්පන්න ආහාර ලබා ගැනීම, අඩු ආදායම්ලාභීන්ට ආදායමක් ලබා ගැනීම කියන කරුණු සියල්ලම කෙරෙහි මිනිසුන් පෙලඹීලා තිබෙනවා. ඒ නිසා ඒ හැම අංශයක් කෙරෙහිම දිවි නැඟුම වැඩසටහන යටතේ අපි අවධානය යොමු කර කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මේවා මිනිසුන් අතරට යෑම විශේෂයෙන්ම දරිද්‍රතාව අඩු වීමට ප්‍රධාන හේතුවක් වුණා. පසු ගිය වකවානුව ඇතුළත නිදහස් වෙළෙඳ කලාපයේ කටුනායක විතරක් රැකියා අවස්ථා 750,000ක් තිබුණා. නමුත් මිනිස්සු අද ඇඟලුම් කර්මාන්තශාලාවලට යන්නේ නැහැ. ඇයි? එහි ලබන වැටුපට වඩා වැඩි ආදායමක් ගමෙන් හොයා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒක විරැකියාව අඩු වීමටත් හේතුවක්. මිනිස්සු අද සල්ලි වැඩියෙන් ලැබෙන රැකියා හොයන්න පටන් අරගෙන තිබෙනවා. මේ වැඩසටහන් නිසා ඒ අයට තමන්ගේ ගෙදර ඉඳ ගෙන ආදායම් ලබන්න පුළුවන්කම ලැබී තිබෙනවා. 2000 වසරේදී සියයට 24ක් වුණු දිළිඳුකම 2011 වන විට සියයට 7.5 දක්වා අඩු කර ගැනීමට අපට පුළුවන්කම ලැබුණා.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" වැඩසටහන යටතේ ග්‍රාමීය මට්ටමේ ජනතාවත් එක්ක අමාත්‍යාංශයක් හැටියට අපට දායකවන්න පුළුවන්කමක් ලැබුණා. මේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී හැම නිලධාරියෙක්ම ශක්තිමත් කරන්න අපට සිද්ධ වුණා. වසර ගණනක් විශ්‍රාම වැටුපක් නොමැතිව සිටි සමෘද්ධි නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමයකට ඇතුළු කර දිවි නැඟුම දෙපාර්තමේන්තුව කියා දෙපාර්තමේන්තුවක් ඇති කළා. ඒ අය නිකම් හිටපු නිලධාරීන්. සමහර නිලධාරීන් පොහොර බෙදුවා විතරයි. ඔවුන්ට රාජකාරියක් පවරා තිබුණේ නැහැ. සමහර නිලධාරීන්ට රාජකාරි එකක් දෙකක් විතරයි තිබුණේ. ඒ සියලුම නිලධාරීන් අද එක තැනකට අරගෙන තිබෙනවා. ඔවුන්ට ජනතාවත් එක්ක ඉදිරියේදී කරන්න විශාල වැඩ කොටසක් තිබෙනවා. ඒ නිලධාරීන්ට ආණ්ඩුවේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරන්න ශක්තිය ලැබිලා තිබෙනවා. 2008 වර්ෂයේ සිට 2010 ජනවාරි දක්වා අපි බැංකුවලින් රුපියල් මිලියන 1,561ක ලාභයක් උපදවා ගෙන තිබෙනවා.

දැන් විදුලියටත් සල්ලි දෙන බව සමහර විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරු දන්නෙත් නැතුව ඇති. විදුලිය ලබා ගන්න බැරි අහිංසක දුප්පත් ජනතාවට, සමෘද්ධි ලාභීන්ට විදුලිය ලබා දීම සඳහා "විදුලි අත්වැල" වැඩසටහන වෙනුවෙන් විදුලිබල මණ්ඩලයට රුපියල් මිලියන 3,000ක් වෙන් කර තිබෙනවා. අහිංසක සමෘද්ධි ලාභියෙක් නම් -සමෘද්ධිය තියෙන්නත් ඕනෑ නැහැ.- දුප්පත්ම මනුෂ්‍යයෙක් නම්, විදුලිය ලබා ගන්න බැරි නම් ඒ අය වෙනුවෙන් විදුලි බලය ලබා දීම සඳහා රුපියල් මිලියන 3,000ක් වෙන් කර මේ වන විට රුපියල් මිලියන 300ක් විදුලිබල මණ්ඩලයට අපි යවා තිබෙනවා. ඒ නිසා මා කියනවා, මේක ජනතාවත් එක්ක බැඳුණු ආණ්ඩුවක් බව. මේවා ආර්ථික සංවර්ධනය සඳහා අපි ගෙන යන වැඩ පිළිවෙළ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දුප්පත් මහ ජනතාවට සමෘද්ධි බැංකුවෙන් ණය ගැනීමට බැංකු පොලිය සියයට 18 සිට 8 දක්වා අඩු කළා. ඉදිරි කාලයේදී මේ කටයුතු සාර්ථක කර ගැනීම සඳහා අපි ඔබතුමන්ලාගේ සහයෝගය ඉල්ලනවා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ කමිටුවලට එන්න. ඇවිත් තමුන්නාන්සේලාගේ අදහස් ඉදිරිපත් කරන්න. අදහස් ඉදිරිපත් කරලා අපිත් එක්ක එකට වැඩ කරන්න ආර්ථික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට එන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාව අවසාන කරන්න. We are short of time.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
මේ ආකාරයට කැප වුණු අපේ අමාත්‍යාංශයේ සියලුම නිලධාරි මහත්වරුන්ටත් විශේෂයෙන්ම අපට නායකත්වය දුන් අපේ ගරු ඇමතිතුමාටත් ස්තුතිය පිරිනමමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The next speaker is the Hon. Kanaka Herath. ඔබතුමාට විනාඩි 9ක් තිබෙනවා.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

විනාඩි 10ක් තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

විනාඩියක් අඩු කරලා.

[අ. භා. 2.50]

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ කාරක සභා විවාදයේදී අදහස් දක්වන්න ඉඩ ලබා දීම පිළිබඳව විශේෂයෙන්ම ඔබතුමාටත් ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් ස්තුතිවන්ත වනවා. මගේ අදහස හැටියට අතිගරු ජනාධිපතිතුමන් හත්වන අය වැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ කරුණු දෙකක් මුල් කර ගෙනයි. එනම් අපේ රටේ ජනතාවගේ ජීවන තත්ත්වය -ජීවන මට්ටම- ඉහළ නැංවීම සඳහා නිෂ්පාදන අංශයන්හි නිෂ්පාදන ඉහළ නැංවීම සහ මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් කළ පරිදි පංච බල කේන්ද්‍රයන් ඇසුරෙන් ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්ය බවට පත් කිරීම සඳහා ක්‍රියාත්මක වන ඉලක්කයන් කරා යොමු කිරීම කියන මේ කාරණා දෙකයි. ඊට අමතරව සම්ප්‍රදායික අය වැයකින් අපේක්ෂා කරන ජනතා සුබසාධන කටයුතු ක්‍රියාත්මක කිරීම සහ කඩිනමින් විසඳා ගත යුතු ගැටලු විසඳා ගැනීමත් අරමුණු වුණා.

අද වන විට මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම තුළින් ලැබූ ජයග්‍රහණයන් කිහිපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න මා බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම සියයට 23ක්ව පැවැති දුප්පත්කම අද සියයට 7 දක්වා පහළ දමන්නට පුළුවන් වී තිබෙනවා. 2015 දී එය සියයට 4 දක්වා පහළ දමන්න හැකියාව ලැබෙයි කියන බලාපොරොත්තුව අප තුළ තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ග්‍රාමීය මට්ටමේ සමෘද්ධි වැඩසටහන් මඟින් අද සිදු වන සේවාව ඉතා විශාලයි. රජයේ ආර්ථික සංවර්ධන පණිවුඩය ගමට කෙළින්ම ගෙන යන පිරිස තමයි සමෘද්ධි නියාමකයන්; සමෘද්ධි නිලධාරින්. මොවුන් අපහසුකම්, අභියෝග හා අඩු පාඩු මධ්‍යයේ තමයි පසු ගිය සමයේ සිට මේ දක්වා තම සේවය හරියාකාරව ඉටු කළේ.

අද "දිවි නැඟුම" වැඩ පිළිවෙළ, ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමත් සමඟ ලබන වසරේ සිට සමෘද්ධි නිලධාරීන් සියලු දෙනාම විශ්‍රාම ලබන රජයේ සේවකයින් බවට පත් වෙනවා. අපේ සමෘද්ධි නිලධාරින්ගේ සේවක සංගමය වසර ගණනාවක් -1998 ඉඳලා මේ දක්වා -ගෙන ගිය අරගලය අද සාර්ථක වෙලා තිබෙනවා. ඒ ඉල්ලීම ඉටු කිරීම පිළිබඳව අපි අතිගරු ජනාධිපතිතුමාටත්, ඒ වාගේම ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අතීතයේදී අපට ස්වයංපෝෂිත ආර්ථිකයක් තිබුණා. අද ලෝකයේ සෑම රටක්ම ආහාර සුරක්ෂිතතාව පිළිබඳව කථා කරනවා. ඉදිරි කාලයේදී අපේ අතිරික්ත සහල් අපනයනය කිරීම සඳහා දැනටමත් සැලසුම් කර ගෙන යනවා. මෙවැනි තත්ත්වයක් අපට ලබා ගැනීමට හැකියාව ලැබුණේ ආහාර නිෂ්පාදන අංශ තුළ නව ජවයක් ඇති කිරීම තුළිනුයි. විශේෂයෙන්ම සුළු වාරි මාර්ග සහ මහා වාරි මාර්ග සංවර්ධනය කිරීම සඳහා අපේ ප්‍රදේශවලට මුදල් ලබා ගන්න හැකියාවක් ලැබුණා. දිවි නැඟුම ජාතික ව්‍යාපාරය ආරම්භ කිරීම තුළින් අපගේ අරමුණ වුණ ගෘහ ආර්ථික ඒකක නැංවීමේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න පුළුවන් වුණා. ස්වයංපෝෂිත පවුලක්, ගමක්, රටක් හදනවා වාගේම පවුල ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීමටත් ඒ තුළින් හැකියාවක් ලැබිලා තිබෙනවා. ඒ වාගේම දීර්ඝ කාලයක් තිස්සේ අමතක වෙලා තිබුණ අපේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහාද විශාල මුදල් ප්‍රමාණයක් අපේ ගම් ප්‍රදේශවලට ලබා ගන්න හැකියාව ලැබිලා තිබෙනවා. ඒ තුළින් යටිතල පහසුකම් දියුණු වෙලා තිබෙනවා.

අපේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ආර්ථික සංවර්ධනයට සෘජුව දායකත්වය දෙන සුවිශේෂී කාර්යයන් රාශියක් තිබෙනවා. ඒ අතර, සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම, විදේශ ආයෝජන ප්‍රවර්ධනය කිරීම, ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නැංවීම, දිවි නැඟුම, ගම නැඟුම, පළාත් නැඟුම වාගේ සුවිශේෂී වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. 2012 අය වැය තුළින් ඉස්මතු වන "දිවි නැඟුමෙන් රට නැඟුම" තේමාව යටතේ වන යෝජනා සියය ආරම්භ කිරීමෙන් ඉදිරි කාලයේදී ඒ කටයුතු සාර්ථක වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා නියෝජනය කරන රඹුක්කන ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට පසු ගිය වසරේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ලැබුණ ප්‍රතිලාභ කිහිපයක් මේ ගරු සභාවට හඳුන්වා දීමට මා කැමැතියි. විශේෂයෙන් අපේ පළාත් මාර්ග කාපට් කිරීම සඳහා රුපියල් මිලියන 306ක් ලබා දීම තුළින් මාර්ග 7ක, කිලෝමීටර් 30ක් පමණ සංවර්ධනය වෙනවා. ග්‍රාමීය මාර්ග 51ක් සඳහා රුපියල් මිලියන 11.35ක් ලැබුණා. සුළු වාරි මාර්ග 40ක් සඳහා රුපියල් මිලියන 12.1ක්; මාතෘ සායන 8ක් සඳහා රුපියල් මිලියන 8ක්. අපේ ප්‍රදේශය කඳු සහිත ප්‍රදේශයක් නිසා නියඟය කාලයේදී ජල හිඟයක් ඇති වෙනවා. ඒ අනුව ජල යෝජනා ක්‍රම 18ක් සඳහා රුපියල් මිලියන 10.5කුත්, විදුලිය සඳහා රුපියල් මිලියන 5.62කුත් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

අතිගරු ජනාධිපතිතුමාගේ බලාපොරොත්තුව අනුව මේ රටේ සෑම නිවසකටම 2012 දී විදුලිය ලබා දීම මඟින් ලබන වසර මුල් භාගයේදී අපේ ප්‍රදේශයේ සියලුම නිවෙස්වලට විදුලිය ලබා දෙන්න හැකියාවක් ලැබෙයි කියන බලාපොරොත්තුව අපට තිබෙනවා. පෙර පාසල් 24ක් සඳහා රුපියල් මිලියන 81කුත්, දිවි නැඟුම අදියර 1 සහ 2 වෙනුවෙන් රුපියල් මිලියන 7.5කුත් ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම මහින්ද චින්තන ඉදිරි දැක්ම අනුව රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා සංචාරක කර්මාන්තය ඉමහත් පිටුවහලක් වෙනවා. අපේ රජයේ බලාපොරොත්තුව වන්නේ 2016 වන විට සංචාරකයන් මිලියන 2.5ක් මේ රටට ගෙන්වා ගන්නයි. මෙය සුවිශාල වගකීමක්. විශේෂයෙන්ම ඒ සඳහා යටිතල පහසුකම් දියුණු කරනවා වාගේම, හෝටල් කාමර 45,000ක් පමණ ඉදි කරන්නත්, ලක්ෂ 8ක ශ්‍රම බළකායක් සූදානම් කිරීමටත් කටයුතු කරනවා. විශේෂයෙන්ම අපේ පළාත්වලත් හෝටල් පාසල් බිහි කරලා අපේ තරුණ, තරුණියන් ඒවාට යොමු කරලා, ඒ ඉදිරියේදී අවශ්‍ය ශ්‍රම බළකාය ලබා දෙන්න හැකි වෙයි කියන බලාපොරොත්තුව තිබෙනවා. ඒ වාගේම අද අපේ රටට ලෝකයේ තිබෙන ප්‍රසිද්ධ සංචාරක සමාගම් කිහිපයක්ම ඇවිල්ලා තිබෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමා, දැන් අවසන් කරන්න.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට තව විනාඩි දෙකක් දෙන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
විනාඩි දෙක්ක දෙන්න බැහැ. We are short of time.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
කෙටියෙන් හෝ අපේ පින්නවල අලි අනාථාගාරය ගැන යම් කිසි අදහසක් මේ ගරු සභාවට ලබා දෙන්න මම කැමැතියි. විශේෂයෙන් අපේ ඉදි වෙමින් පවතින එළිමහන් සත්වෝද්‍යානය ලබන වසරේ අප්‍රේල් මාසයේදී ආරම්භ කරන්න බලාපොරොත්තු වෙනවා.

අපේ රටට ආවේණික වූ සතුන්, දුර්ලභ ගණයේ සතුන් මේ සත්වෝද්‍යානයේ ප්‍රදර්ශනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. මේ නිසා ඉදිරි වසර ඇතුළතදී දේශීය සහ විදේශීය සංචාරකයන් ලක්ෂ හතක් පමණ අපේ ප්‍රදේශයට පැමිණෙයි කියන බලාපොරොත්තුව තිබෙනවා. මේ සංචාරක ව්‍යාපාරය තුළින් අපේ ප්‍රදේශයේ යටිතල පහසුකම් දියුණු වෙනවා වාගේම, ඒ ප්‍රදේශය ආර්ථික වශයෙනුත් ශක්තිමත් වෙයි කියලා අපි හිතනවා.

අපි මේ සඳහා විශාල වැඩ පිළිවෙළක් දැනට ක්‍රියාත්මක කරගෙන යනවා. විශේෂයෙන්ම සංචාරක මණ්ඩලය, සබරගමුව පළාත් සභාවේ සංචාරක අමාත්‍යාංශයේ අනුග්‍රහය අපට ලබා දීලා අපේ ගම් ප්‍රදේශවල තිබෙන සිද්ධස්ථාන සහ විදේශික සංචාරකයන්ට නරඹන්න පුළුවන් ස්ථාන දියුණු කිරීමේ කටයුතු දැනටමත් කරගෙන යනවා. අපේ ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සෘජු හා වක්‍ර වශයෙන් රැකී රක්ෂා විශාල ප්‍රමාණයක් මේ තුළින් ලබා ගන්න හැකියාවක් තිබෙනවා. ඒ වාගේම අපේ ග්‍රාමීය කර්මාන්තවල දියුණුවක් මේ තුළින් අපි අපේක්ෂා කරනවා. මොලගොඩ මැටි කර්මාන්තය, ලී කැටයම්, පිත්තල කර්මාන්තය, කුළු බඩු, කඩදාසි, විසිතුරු භාණ්ඩ වැනි කර්මාන්තශාලා සියල්ලක්ම දියුණු වෙයි කියලා-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

**ගරු කනක හේරත් මහතා**
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. මෙවැනි මුදල් ප්‍රමාණයක් අපේ ප්‍රදේශයට ලබා දීම පිළිබඳව ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මෙමඟින් අපේ ග්‍රාමීය පවුල් ආර්ථික වශයෙන් ශක්තිමත් වීම තුළින් ඉදිරි කාලයේදී අපේ රටට සංවර්ධිත රටක් බවට පත් වෙන්න හැකියාව ලැබෙයි කියලා අපි හිතනවා. බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
The next speaker is the Hon. Eran Wickramaratne. Order, please! The Hon. Alhaj A.H.M Azwer will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

[අ. භා. 2.59]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා මීට පෙර කථා කළා. මම මෙන්න මේ කාරණය එතුමාගේ අවධානයට ගෙන එන්න අවශ්‍යයි. සංචාරකයන්ට විල්පත්තුවේ අලුත් නිවාස හතරක් ගොඩ නඟලා තිබෙනවා. ඒක විවෘත කළේ ගිය අවුරුද්දේ දෙසැම්බර් මාසයේ. නමුත් දැනටම එහි නඩත්තුව හුඟක් මදි කියලා කියන්න පුළුවන්. ඇමතිතුමා නම් දැන් මේ ගරු සභාවේ නැහැ. නමුත් කියන්න ඕනෑ නිසා මම කිව්වේ. නිවසක් ගොඩ නඟන්න, වාරි මාර්ග පද්ධතියක් ගොඩ නඟන්න, පාරක් හදන්න පහසුයි. නමුත් හුඟක් වෙලාවට ඒවා නඩත්තු කරන්න ඊට වැඩිය හුඟක් අපහසුයි. මොකද ඒ සඳහා කළමනාකාරිත්වය, ක්‍රම විධි, දැනුම, පිළිවෙත කියන මේවා සියල්ලක්ම අවශ්‍යයි. මෙතැනදී එතුමා යම් ප්‍රකාශයක් කරපු නිසා තමයි මම ඒක සඳහන් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍ර නියෝජ්‍ය ඇමතිතුමා ආයෝජනය ගැන සඳහන් කළා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා සඳහන් කළේ 2009 දී සෘජු ආයෝජනය ඩොලර් 600ක් ලැබුණත්, 2010 දී ඒක 500කට වැටුණු බවයි. ඉතින් මම හිතන්නේ නැහැ එතැනදී එතුමා අතින් කිසිම වරදක් සිදු වෙලා තිබෙනවා කියලා. නමුත් නියෝජ්‍ය ඇමතිතුමා සඳහන් කළා 2011 දී ඒක බිලියනයක් ඉක්මවා ගියා කියලා. 2011 දී ඒ විධියට ඉක්ම ගියා නම්, අපි ඉඩම් විකුණුවා නම් ඒ කොටස අයින් කරලා -අඩු කරලා- තමයි ආයෝජනය බලන්න ඕනෑ. එතකොට තමයි ඒ අවුරුදු ගණනේ ආයෝජනය කීයද කියලා අපට හරියටම බලන්න පුළුවන් වන්නේ. සෘජු ආයෝජන එනවා. ඒ වාගේම වෙළෙඳ පොළ හරහාත් ආයෝජනය පැමිණෙනවා. කොටස් වෙළෙඳ පොළ හරහා අපට එන ආයෝජනය 2009 දීත් 2010 දීත් ඇත්තටම රටින් පිටට ගියා. මේ අවුරුද්දේ ඒ සංඛ්‍යා ලේඛන මම තවම දැකලා නැහැ. නමුත් වෙළෙඳ පොළේ සිදු වෙලා තිබෙන දේවල් දිහා බැලුවාම ඊට වැඩිය ප්‍රමාණයක් 2011 දී යන්න ඇති කියලා අපට හිතන්නට පුළුවන්. අපි මේ ආයෝජනය ගැන කථා කරන්නේ විශේෂයෙන්ම ඒ ගැන අපට ගැටලුවක් තිබෙන නිසායි. 1956 දී මහ ජන එක්සත් පෙරමුණු ආණ්ඩුව ගෙනාපු ප්‍රගතිශීලීම පනතක් තමයි, සේවක අර්ථසාධක අරමුදල පනත.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தமிழ் பேசும் மக்களின் சமூக பொருளாதார வாழ்வியல் உரிமைகள் நடந்து முடிந்த அழிவு யுத்தத்தினால் வெகுவாகப் பாதிக்கப்பட்டுள்ளன. தொழில் ரீதியாகவும் உற்பத்தி ரீதியாகவும் தமிழ் பேசும் மக்கள் மீட்சி பெற்று வருவதற்கு விரும்புகின்றார்கள். அவர்களது வாழ்வியல் உரிமைகள் சிறந்து விளங்குவதற்காக உரிய நடவடிக்கைகளைத் துரிதமாக முன்னெடுக்க வேண்டியுள்ளது. அதற்காக உற்பத்தி முறைகளிலும் தொழில் முறைகளிலும் நவீன தொழில்நுட்ப வசதிகளைக்கொண்ட திட்டங்கள் எவையென ஆராய்ந்து அவற்றைச் செயற்படுத்த வேண்டியுள்ளது. ஆகவே, இன்று நாடு தழுவிய ரீதியில் பொருளாதார அபிவிருத்திக்காக ஒதுக்கப்பட்ட நிதியிலிருந்து அதிகளவு நிதியை யுத்தத்தினால் பெரிதும் பாதிக்கப்பட்டவர்கள் என்ற ரீதியில் தமிழ் பேசும் மக்களின் வாழ்வியல் உரிமைகளை உயர்த்துவதற்குப் பயன்படுத்த வேண்டும் என நான் விரும்புகின்றேன். இதனைச் சுலபமாகச் செய்து முடிக்கலாம் என்பது எனது உறுதியான நம்பிக்கை. காரணம், இன்று பொருளாதார அபிவிருத்தி அமைச்சராக இருப்பவர் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்கள். அவர் எம்மோடு மிகவும் பரிச்சயமானவர்; தமிழ் மக்களின் தேவைகளைச் சரியானவகையில் புரிந்து செயலாற்றி வருபவர்.

**ගරු ඊ. සරවනපවන් මහතා**
(மாண்புமிகு ஈ. சரவணபவன்)
(The Hon. E. Saravanapavan)

இதைக் கேட்டுக்கொண்டிருக்கும் அமைச்சருக்கு இப்பொழுது உச்சி குளிர்ந்திருக்கும். தலையில் 'ஐஸ்' வைத்த மாதிரிக் குளிருமே!

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ஓம், ஓம். அவருக்குக் குளிரும். நீங்களும் இந்தப் பேச்சைக் கேளுங்கோ; உங்களுக்கும் உச்சி குளிரும்.

அவர் நாம் அழைத்த பொழுதெல்லாம் வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு ஓடோடி வந்து சேவையாற்றுபவர். அவர் வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு வரும்பொழுதெல்லாம் எம்மையும் அழைத்துப் பேசி, எமது மக்களின் பொருளாதார அபிவிருத்திக்காக உழைத்துக் கொண்டிருப்பவர். ஆனால், தமிழ் பேசும் மக்களின் வாக்குகளை அபகரித்து, பாராளுமன்ற நாற்காலிகளை மட்டும் நிரப்பிக்கொண்டிருக்கும் தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் இன்று தமிழ் பேசும் மக்கள் மத்தியில் நிற்பது அரிது; அடிக்கடி வெளிநாடுகளுக்குப் பறந்து போய்விடுகின்றார்கள். ஆனால் பொருளாதார அபிவிருத்தி அமைச்சர் அவர்கள் தமிழ்த் தேசியக் கூட்டமைப்பினரை விடவும் அதிக காலம் தமிழ் மக்கள் மத்தியில் நின்று அவர்களுக்குச் சேவையாற்றி வருகின்றார். அதற்காக நான் தமிழ் மக்களின் சார்பாக அவருக்கு நன்றி தெரிவிக்கின்றேன். அவர் மட்டுமல்ல, ஏனைய எந்தவொரு அமைச்சரும்கூட தமிழ் மக்களுக்குச் சேவையாற்ற வாருங்கள் என்று கேட்பதற்கு

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

முன்பாகவே அவர்கள் அங்கு வந்து நிற்கின்றார்கள். அரசாங்கத்துடனும் அமைச்சர்களுடனும் நான் கொண்டிருக்கும் நல்லுறவைப் பயன்படுத்தி, சிதைந்துபோன தமிழ் மக்களின் வாழ்வியல் உரிமைகளை மறுபடியும் தூக்கி நிறுத்துவதே எனது இலட்சியம். [இடையீடு] ஏன், நாங்கள் செய்துகொண்டுதான் இருக்கின்றோம்; நாங்கள் நம்பிக்கையுடன்தான் செயற்படுகின்றோம்; உங்களைப்போல பொய்யாகவும் கபடத்தனமாகவும் வாக்குகளை அபகரிப்பதற்கும் மக்களைப் பலிகொடுப்பதற்கும் நாங்கள் தயாரில்லை. கடந்த காலங்களில் நீங்கள் அதைத்தான் செய்தீர்கள்! நீங்கள் இங்கே பேசியபொழுது என்ன சொன்னீர்கள்? கத்தி எடுத்தவன் கத்தியால்தான் சாவான் என்பதுபோல, கத்தி எடுத்த வேலுப்பிள்ளை பிரபாகரன், கத்தியால்தான் இறந்தான் என்று சொல்லியிருக்கிறீர்கள். ஆனால், அன்று என்ன சொன்னீர்கள்? கத்தியை எடுக்கவேண்டிய தேவை இருந்தது என்று சொல்லி, அதனை நியாயப்படுத்தினீர்கள். [இடையீடு] நீங்கள் 'சப்ரா' நிறுவனத்தை நடத்தி, மக்களுடைய பணத்தைச் சூறையாடிவிட்டு, இங்கு வந்து கதைக்காதீர்கள்! 'சப்ரா' நிறுவனத்தில் இருந்து எவ்வளவு பணத்தைக் கொள்ளையடித்தீர்கள் என்பது எங்களுக்குத் தெரியும். [இடையீடு] அதுமாத்திரமல்ல, தென்னிலங்கையில் -

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

What is your point of Order, Hon. Punchinilame?

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මයික් එක දෙන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Minister, a point of Order is being raised. Yes, Hon. Punchinilame, what is your point of Order?

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

Sir, the Hon. Sumanthiran told the same thing about Trincomalee, but what happened?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Minister, you may continue.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

In the South, there was Sakvithi. Likewise in the North, it was Sabra. He ruined the people there. He is the person who -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Minister, you have only a few more minutes. Please continue.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

இணக்க அரசியல்மூலம் தமிழ் பேசும் மக்களுக்குப் பொருளாதார அபிவிருத்தி முதற்கொண்டு அரசியல் தீர்வுவரை அனைத்தையும் பெற்றுக்கொடுப்பதே எனது கொள்கை. 2011ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களால் முன்மொழியப்பட்ட, ஒரு மில்லியன் வீட்டுத் தோட்டங்களை உருவாக்குவதற்கான அபிவிருத்திச் செயற்றிட்டமாக நோக்கப்படுகின்ற 'வாழ்வு எழுச்சி' மனைப் பொருளாதாரத் தேசிய நிகழ்ச்சித்திட்டமானது, 2012ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் 2.5 மில்லியன் மனைப் பொருளாதார அலகுகளை உள்ளடக்கும் வகையில் விரிவுபடுத்தப்பட்டுள்ளது. பொருளாதார அபிவிருத்தி அமைச்சர் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்கள் இந்நிகழ்ச்சித்திட்டத்தை முன்னெடுத்துச் செல்வதற்குரிய வழிகாட்டல்களை வழங்கி வருகின்றார். இத்திட்டம் பின்வரும் மூன்று துறைகளை உள்ளடக்குகின்றது: ஒன்று, வீட்டுத்தோட்டம்; மற்றையது கால்நடை, கோழி வளர்ப்பு, மற்றும் கடற்றொழில்; அடுத்தது குடிசைக் கைத்தொழில். ஒரு மில்லியன் மனைப் பொருளாதார அலகுகளை வடக்கு, கிழக்கு உட்பட அகில இலங்கை பூராவும் எல்லா மாவட்டங்களிலும் செயற்படுத்துவதற்கு அவசியமான முன்னெடுப்புக்கள் மற்றும் செயற்பாடுகள் பொருளாதார அபிவிருத்தி அமைச்சின் வழிகாட்டலில் மேற்கொள்ளப்பட்டு வருகின்றன. இவ்வேலைத் திட்டமானது யுத்தத்தினால் பாதிக்கப்பட்ட பிரதேச மக்களுக்குப் பெரிதும் உதவும். அவர்களது வாழ்வாதாரத்தை மேலும் வலுப்படுத்தும் என்பது உறுதி. மாண்புமிகு சுமந்திரன் அவர்கள் சபையிலிருந்து ஓடிவிட்டார்போல இருக்கிறது.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

அவர் ஓடிவிட்டார்; சரவணபவன் ஐயா இருக்கிறார்.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

எனது பாரம்பரிய கைத்தொழில் மற்றும் சிறுதொழில் முயற்சி அபிவிருத்தி அமைச்சு, பொருளாதார அபிவிருத்தி அமைச்சின் வழிகாட்டலில் மேலும் நான்கு அமைச்சுக்களுடன் இணைந்து குடிசைக் கைத்தொழிலை உருவாக்கி, வலுப்படுத்தும் பொறுப்பில் பங்காளிகளாகச்

செயற்படுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். அதாவது, எனது அமைச்சுடன் கைத்தொழில் வாணிப அமைச்சு, தொழிநுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சு, இளைஞர் அலுவல்கள் மற்றும் திறன் அபிவிருத்தி அமைச்சு மற்றும் அரச வளங்கள், தொழில்முயற்சி அபிவிருத்தி அமைச்சு என்பன இக்குடிசைக் கைத்தொழில் திட்டத்தினை அமுலாக்குவதற்குப் பங்காளர்களாக ஒன்றிணைந்து செயற்படுவது வரவேற்கத்தக்கதாகும். குடிசைக் கைத்தொழிலை மேம்படுத்தும் உபாயத் திட்டத்தின் முதலாம் படிமுறையாகத் தொழிநுட்பக் கண்காட்சியும் விழிப்புணர்வு நிகழ்ச்சித்திட்டமும் இடம்பெறுகின்றன. தெரிவுசெய்யப்பட்ட பயனாளிகள், ஏனைய ஆர்வம் உடையவர்கள் மற்றும் பாடசாலை மாணவர்கள் இந்தக் கண்காட்சியைப் பார்வையிட அழைக்கப்பட்டுள்ளனர். இத்தகைய கண்காட்சிகளில் கிராமங்கள் பாரிய பங்கினை வகிக்கின்றன. இதனடிப்படையில் பயனாளிகள் தாம் விரும்பும் குடிசைக் கைத்தொழில்முயற்சியைத் தெரிவுசெய்ய வசதி செய்யப்படுவதுடன், அவ்வாறு தெரிவு செய்யப்பட்டவர்களுக்குத் தொழிநுட்ப முகாமைத்துவப் பயிற்சியும் வழங்கப்பட்டு வருகின்றது. அத்துடன், 10,000 ரூபாய் பெறுமதியான மூலப்பொருள் மற்றும் அடிப்படை உபகரணங்கள் பொதியும் வழங்கப்படும். மேலும், இவர்கள் வங்கிகளுடன் இணைக்கப்பட்டு, அவர்களுக்குத் தேவையான நிதியைப் பெறவும் வசதி செய்துகொடுக்கப்படும். அத்துடன், சந்தைப்படுத்தல் வசதிகளைச் சக்திப்படுத்தும் நோக்குடன் தனியார் துறையினரும் வர்த்தக சம்மேளனங்களைச் சேர்ந்தவர்களும் இந்நிகழ்ச்சியில் பங்குபற்றுகின்றனர். முதலாவது குடிசைக் கைத்தொழில் நிகழ்ச்சித்திட்டம் ஒரு முன்மாதிரி -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய உரையை முடித்துக்கொள்ளவேண்டிய நேரம் நெருங்கிவிட்டது.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இரண்டு நிமிடங்களை மேலதிகமாகத் தர முடியுமா?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
இன்னும் ஒரு நிமிடத்துக்குள் முடித்துக்கொள்ளுங்கள்!

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
எமது மக்களின் பிரச்சினைகளைத் தீராப் பிரச்சினைகளாக்கித் தொடர்ந்தும் கொதிநிலையில் வைத்துக்கொண்டு தமிழ் மக்களின் வாக்குகளை அபகரிப்பதே அவர்களது நோக்கம். 7 கட்சிகள் அவர்களது கூட்டில் உள்ளன; 14 நாடாளுமன்ற உறுப்பினர்கள் அவர்கள் சார்பாக இந்த நாடாளுமன்றில் இருக்கிறார்கள். அந்த 14 உறுப்பினர்களும் 14 கட்சிகள்போல் செயற்படுகிறார்கள். ஒருவர், "சிங்களம் தமிழ் பேசும் மக்களுக்குத் தீர்வு தராது" என்று கூறுவார்; மற்றவர் அதை மறுத்துப் பேசுவார். இவ்வாறு அவர்களிடையே தமிழ் பேசும் மக்களின் அரசியல் தீர்வு விடயத்திலும் ஒருமித்த நிலைப்பாடு இல்லை. அரசாங்கத்திடம் அதிகாரப் பகிர்வு கேட்கின்றார்கள் - அது அதை அடைவதற்காக அல்ல என்பதும், அவர்களது தேர்தல் கோஷம் இது என்பதும் வேறு விடயம். ஆனால், தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் தமக்குள் அதிகாரப் பகிர்வைக் கொண்டிருக்கவில்லை என்பதுதான் வேடிக்கை! நீயா, நானா? என்ற போட்டியும் கூட்டமைப்பில் தமது கட்சிக்கே பிரதான உறுப்புரிமை என்ற பதவி மோகங்களும் அவர்களிடம் மேலோங்கி நிற்கின்றன.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
மாண்புமிகு அமைச்சர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ளுங்கள்.

**ගරු ඩග්ලස් දේවානන්ද මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நேரம் போதாமையால் எனது மிகுதி உரையைச் சபையில் *சமர்ப்பிக்கின்றேன். நன்றி. வணக்கம்.

[பி. ப. 4.09]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில், வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த விவாதத்திலே கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். மேதகு ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள், 2009ஆம் ஆண்டு மே மாதம் பயங்கரவாதத்தை முற்றாக ஒழித்து, இலங்கையிலே ஒரு சமாதான சூழ்நிலையை உருவாக்கினார் என்பதை மிகவும் பெருமிதத்தோடு இந்த உயர் சபையிலே தெரிவித்துக்கொள்கின்றேன். உருவாக்கப்பட்ட அந்தச் சமாதான சூழ்நிலையின் விளைவாகத்தான் இந்த நாட்டில் இன்று ஓர் அரசியல் ஸ்திரத்தன்மை உருவாகி, அதன் பயனாகப் பொருளாதார அபிவிருத்தி ஏற்பட்டு, மக்களின் வாழ்க்கைத்தரமும் உயரக்கூடியதாக இருக்கின்றது.

பொருளாதார வளர்ச்சிக்கு உறுதுணையான சகல முக்கிய துறைகளையும் அபிவிருத்தி செய்யும் நோக்குடன், 2010ஆம் ஆண்டு ஏப்ரல் மாதம் மேதகு ஜனாதிபதி அவர்களால் பொருளாதார அபிவிருத்தி அமைச்சு உருவாக்கப்பட்டு, அது ஆற்றலுள்ள, அறிவுள்ள, மிகவும் சுறுசுறுப்பான, செயற்றிறனுடைய மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்களிடம் பொறுப்புக் கொடுக்கப்பட்டிருக்கிறது. பிராந்திய மற்றும் கிராமிய அபிவிருத்தி, வறுமையைக் குறைத்தல், வறிய மக்களுக்கு வலுவூட்டுதல், இலங்கையில் மூலதனத்தை மேம்படுத்துதல், பிரயாணம் மற்றும் சுற்றுலாத்துறையை அபிவிருத்தி செய்தல், இயற்கை மற்றும் வன விலங்குகளைப் பாதுகாத்தல் போன்ற பல்வகைப்பட்ட விடயங்களை நடைமுறைப்படுத்தும் பொறுப்பை இவ்வமைச்சு கொண்டுள்ளது. குறிப்பாக, இந்த அமைச்சுக்குக் கீழே வருகின்ற முதலீட்டுச் சபை ஊடாக அதன் அங்கீகாரத்துடன்

---
* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රිෂාඩ් බදියුදීන් මහතා]

ஆரம்பிக்கப்பட்டிருக்கின்ற கம்பனிகள் தேசிய பொருளாதாரத்தில் ஒரு முக்கிய பங்கை ஆற்றி வருகின்றன. அவை ஐந்து இலட்சத்துக்கு மேற்பட்டவர்களுக்கு நேரடித் தொழில் வாய்ப்புகளை வழங்கிவருகின்றன. இந்த நாட்டிலே ஏற்றுமதியில் 70 வீதமான பங்கினையும் கைத்தொழில் பொருட்களின் ஏற்றுமதியில் 90 வீதமான பங்கினையும் கொண்டிருக்கின்றன. முதலீட்டுச் சபையினால் மேற்கொள்ளப்பட்ட முதலீட்டு ஊக்குவிப்பு முயற்சிகள் பயனளிக்கத் தொடங்கியுள்ளன.

உலக வங்கியினால் வர்த்தகம் செய்வதற்கு உகந்த நாடுகள் என்ற கணிப்பீட்டில் 183 நாடுகள் கணக்கெடுக்கப்பட்டன. வர்த்தகம் செய்வதனைத் தரப்படுத்துதல், வர்த்தக ஒழுங்குபடுத்துதல் மற்றும் ஆதன உரிமைகள் பாதுகாப்பு என்பன 183 நாடுகளிலும் ஆராயப்பட்டு, கணிப்பீடு செய்யப்பட்டிருக்கின்றது. வர்த்தகமொன்றைத் தாபித்தல், கட்டிட நிர்மாண அனுமதியைப் பெறுதல், மின்சாரத்தைப் பெறுதல், ஆதனத்தைப் பதிவு செய்தல், கடன் வசதிகளைப் பெறுதல், முதலீட்டாளர்களின் பாதுகாப்பு, வரி செலுத்துதல், பிற நாடுகளுடன் வர்த்தகத்தைச் செய்தல், ஒப்பந்தங்களை அமுல்படுத்துதல், நிதிப் பிரச்சினைகளைத் தீர்த்தல் போன்ற அம்சங்களைக் கருத்திற்கொண்டு இக்கணிப்பீடு செய்யப்படுகின்றது. அதில் இலங்கை 89வது இடத்தைப் பெற்றிருக்கின்றது; முன்னைய ஆண்டில் 98வது இடம் கிடைத்திருந்தது. அத்துடன், முதலீட்டாளர்களைப் பாதுகாக்கின்ற துறையிலே இலங்கை 74வது இடத்திலிருந்து 46வது இடத்துக்கு முன்னேறியிருக்கின்றது. இன்று மேதகு ஜனாதிபதி அவர்களுடைய அரசாங்கத்திலே மாண்புமிகு அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களின் அயராத முயற்சியினால் இதனை நாங்கள் இன்று அடைந்திருக்கின்றோம்.

அதேபோல, "இலங்கைக்கு வருகை தருக-2011" என்ற தொனிப்பொருளின்கீழ் சந்தைப்படுத்தல் இயக்கமொன்றை அவர் ஆரம்பித்தார். அதன் பயனாக இன்று அவரின் அமைச்சுக்குக் கீழே இயங்குகின்ற சுற்றுலாத்துறை மிகவும் வளர்ந்திருக்கின்றது. 2012ஆம் ஆண்டு இலங்கையிலே 10 இலட்சத்துக்கும் மேற்பட்ட சுற்றுலாப் பிரயாணிகளின் வருகையை நாங்கள் எதிர்பார்த்து நிற்கின்றோம். கடந்த ஆண்டுடன் ஒப்பிடுகின்றபோது, 2011ஆம் ஆண்டின் முதல் 10 மாதங்களில் உல்லாசப் பிரயாணிகளின் வருகை 34.2 வீதத்தால் அதிகரித்துள்ளது. 2012ஆம் ஆண்டிலே 25 இலட்சம் உல்லாசப் பிரயாணிகளை நாங்கள் எதிர்பார்க்கின்றோம்; 2.75 பில்லியன் டொலர்களை வருமானமாகப் பெறக்கூடியதாக இருக்குமென எதிர்பார்க்கின்றோம். அத்துடன் நேரடி வெளிநாட்டு முதலீடாக 3 மில்லியன் டொலர்களைப் பெறக்கூடியதாக இருக்குமென எதிர்பார்க்கப்படுகின்றது. 2010ஆம் ஆண்டில் சுற்றுலாத்துறை 46 வீத வளர்ச்சி கண்டுள்ளது. மத்திய வங்கியின் தரவுகளின் பிரகாரம் 2010ஆம் ஆண்டிலே சுற்றுலாத்துறையின்மூலம் பெறப்பட்ட வருமானம் 64.8 வீதம் அதிகரித்திருக்கின்றது. அதன் பெறுமதி 575.9 மில்லியன் டொலர்களாகும். 2011ஆம் ஆண்டின் முதல் அரையாண்டு காலத்திலே சுற்றுலாத்துறையில் 1.2 பில்லியன் அமெரிக்க டொலர்கள் முதலீடு செய்யப்பட்டுள்ளது. 2011ஆம் ஆண்டு முதல் 9 மாதத்திலே சுற்றுலாத்துறையின் மூலம் பெறப்பட்ட வருமானம் 580.1 மில்லியன் டொலர்களாக அதிகரித்துள்ளது. இவ்வாறு இந்த சாதனைகளையெல்லாம் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்களுடைய தலைமையிலான இந்தச் சுற்றுலாத்துறை அமைச்சு நிலைநாட்டி வருவதை நான் கௌரவத்தோடும் பெருமையோடும் கூறிக்கொள்கின்ற அதேவேளை, இந்த நாட்டு மக்களின் சார்பாக அவருக்கு எனது நன்றியையும் தெரிவித்துக்கொள்கின்றேன்.

அடுத்ததாக, எமது மாண்புமிகு அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்கள் தொட்டுச்சென்ற விடயம் பற்றிச் சில வார்த்தைகள் பேசலாமென எண்ணுகின்றேன். மாண்புமிகு அமைச்சர் டக்ளஸ் தேவானந்தா அவர்களுடைய அமைச்சு மாத்திரமல்ல, வேறு பல அமைச்சுக்களும் இணைந்ததாக மாண்புமிகு அமைச்சர் பசில் ராஜபக்ஷ அவர்கள் 2011ஆம் ஆண்டில் "திவிநெகும" என்னும் திட்டத்தை ஆரம்பித்தார். அவர் இத்திட்டத்தை ஆரம்பித்தபொழுது, ஒரு சில படித்த உயர் அதிகாரிகளும் சில அமைச்சர்களும், "இத்திட்டத்தின்மூலம் ஒரு வருடத்துக்குள் 10 இலட்சம் குடும்பங்களை உள்வாங்குவதாக மாண்புமிகு அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்கள் கூறுவது எவ்வாறு சாத்தியமாகும்? இது வெறும் கனவு" என்று சொன்னதை அன்று நான் கேட்டேன். ஆனால் கௌரவ அமைச்சர் அவர்கள் இன்று அத்திட்டத்தை நிறைவேற்றிச் சாதித்துக் காட்டியிருக்கிறார். அச்சாதனைமூலம் இன்று பத்து இலட்சத்துக்கும் அதிகமானவர்கள் பங்காளிகள் ஆக்கப்பட்டிருக்கிறார்கள். எதிர்காலத்திலே அத்தொகையை இருபது இலட்சமாக அதிகரிக்கும் எதிர்பார்ப்புடன் அப்பணியை அவர் மேற்கொண்டிருக்கின்றார். இது இலகுவான திட்டமல்ல. இது தனி ஒருவரால் அல்லது ஓர் அமைச்சினால் அல்லது ஓர் அரசாங்கத்தினால் நிறைவேற்றக்கூடியதல்ல. இந்த நாடு சுதந்திரம் பெற்ற பின்னர், வரலாற்றிலே பல அமைச்சுக்களையும் பல திணைக்களங்களையும் பல அமைப்புக்களையும் ஒன்றுபடுத்தி, மிக வறிய குடும்பங்களில் உள்ளவர்களை இத்தகைய ஒரு பாரிய முன்னேற்றகரமான திட்டத்துக்குள் உள்வாங்கும் ஆற்றலை இறைவன் அவருக்கு அளித்திருக்கின்றான். மேதகு மஹிந்த ராஜபக்ஷ அவர்களை ஜனாதிபதியாகக் கொண்டு விளங்கும் அரசாங்கம் மாண்புமிகு அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்களை ஓர் அமைச்சராகப் பெற்றிருப்பது மிகுந்த பாக்கியமென நான் கருதுகின்றேன். ஏனெனில், வரலாற்றிலே சிறந்த ஒரு திட்டமாக அமையவிருக்கின்ற இந்த 'திவிநெகும' திட்டம் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் நீண்ட காலம் இந்த நாட்டின் ஜனாதிபதியாக விளங்குவதற்கும் இந்த அரசாங்கம் நீண்ட காலம் ஆட்சியிலிருப்பதற்கும் நிச்சயமாக உறுதுணையளிக்கப்போகின்றது என்பதை நான் இந்த உயர் சபையிலே கௌரவமாகவும் உறுதியாகவும் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அவ்வாறே, இந்த அமைச்சின்கீழ் சமுர்த்தி திட்டத்தினூடாக ஆற்றிப்படுகின்ற பணிகள் பாராட்டத்தக்கன. இந்த நாட்டிலுள்ள மொத்த சனத்தொகையின் 45 சதவீதமான மக்கள் சமுர்த்தி நலனைப் பெற்று வாழ்கின்றனர். இந்தச் சமுர்த்தித் திட்டத்தின் வாயிலாக நாம் பல அபிவிருத்திகளைக் காண்கின்றோம். கடந்த காலங்களிலும் சமுர்த்தி திட்டம் அமுல்படுத்தப்பட்டது. ஆனால், மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்களின் அமைச்சுப் பொறுப்பின்கீழ் இந்தத் திட்டம் வந்த பின்னர் பாரிய முன்னேற்றகரமான முறையிலே அது நடைமுறைப்படுத்தப்படுவதை நாம் எமது பிரதேசங்களிலே காணக்கூடியதாக இருக்கிறது. எமது நாடு இன்று பொருளாதார ரீதியாக முன்னேறிக்கொண்டு செல்கின்றது. 2010ஆம் ஆண்டில் நாங்கள் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்களைப் பொருளாதார அமைச்சராகப் பெற்ற பின்னர் என்றுமே இல்லாதவாறு எமது நாட்டின் பொருளாதார வளர்ச்சி 8 சதவீதமாக உயர்ந்து உயர் மட்டத்துக்குச் சென்றுள்ளது. 2011ஆம் ஆண்டிலும் அந்த வளர்ச்சி மட்டம் பேணிப் பாதுகாக்கப்பட்டுக்கொண்டு

வருகின்றது. பிரதானமாக இன்று பொருளாதார வளர்ச்சியில், வெளிநாட்டு முதலீடுகள், சுற்றுலாத்துறை ஆகியவற்றின் பங்கு குறித்துக் கூடிய கவனம் செலுத்தப்பட்டிருக்கின்றது. பிராந்திய ரீதியிலான அபிவிருத்தி முன்னெடுத்துச் செல்லப்படுகின்றது. அபிவிருத்தியானது மேற்கு மாகாணங்களில் மட்டும் நிலைகொள்ளாது ஏனைய மாகாணங்களிலும் பரவும் விதத்திலே செயற்றிட்டங்கள் நடைமுறைப்படுத்தப்பட்டு வருவதை நான் இங்கு சுட்டிக்காட்டுவதோடு, அதற்கு உறுதுணையாக இருக்கின்ற அமைச்சர் மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்கள் போற்றப்பட வேண்டியவர் என்பதையும் இவ்விடத்திலே குறிப்பிட விரும்புகின்றேன்.

இந்த வகையிலே வடக்கு, கிழக்கு மாகாணங்களின் பங்களிப்பு சுட்டிக்காட்டப்பட வேண்டிய ஒன்றாகும். 2008ஆம் ஆண்டில் கிழக்கு மாகாணத்திலிருந்து விடுதலைப் புலிகளால் மக்கள் துரத்தப்பட்டனர். 2009ஆம் ஆண்டுக்குப் பின்னர் அரசாங்கம் வடக்கு, கிழக்கு மாகாணங்களைத் தனது கட்டுப்பாட்டின்கீழ் கொண்டுவந்ததன் பின்னர் அமுல்படுத்தப்பட்ட 'கிழக்கின் உதயம்', 'வடக்கின் வசந்தம்' என்னும் செயற்றிட்டங்களின் வாயிலாக இவ்விரண்டு மாகாணங்களினதும் பொருளாதாரப் பங்களிப்பு கணிசமான அளவு அதிகரித்திருக்கிறது. 1980ஆம் ஆண்டுக்கு முன்னர் நாட்டின் பொருளாதார மொத்த உற்பத்தியில் இவ்விரு மாகாணங்களும் 14 சதவீத பங்களிப்பைக் கொண்டிருந்தன. கடந்த 30 வருட கால யுத்தத்தின் காரணமாக பொருளாதார அபிவிருத்தியில் அவற்றின் உற்பத்திப் பங்களிப்பு அரைவாசிக்குக்கீழ் குறைந்து காணப்பட்டது.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
கௌரவ அமைச்சர் அவர்களே, இப்பொழுது உங்களுடைய உரையை முடித்துக்கொள்ளுங்கள்.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
எனக்கு மேலதிகமாக 3 நிமிடங்கள் தாருங்கள்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
முடியாது; ஏனென்றால், ஏனைய அமைச்சர்களும் உரையாற்ற இருக்கிறார்கள்.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாத் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்கள் யுத்தத்தை முடித்து சமாதானத்தைக் கொண்டுவந்திருக்கிறார். இந்த நிலையில், பொருளாதார அபிவிருத்தி அமைச்சரவர்கள் ஆற்றி வருகின்ற பங்களிப்பு காரணமாக இன்று வடக்கு, கிழக்கிலே உற்பத்திப் பங்களிப்பு மீண்டும் 14 சதவீதமாக அதிகரித்திருக்கிறது. அதற்காக கௌரவ அமைச்சரவர்களுக்கு நான் இந்த இடத்திலே நன்றி கூறுகின்றேன். அவ்வாறே பால நிர்மாணம், பாதை அபிவிருத்தி, குளங்கள் புனரமைப்பு, மின்சார வசதி, வீட்டு வசதியென 'வடக்கின் வசந்தம்' திட்டத்தினூடாக எத்தனையோ அபிவிருத்திப் பணிகள்! அவைகளைப் பற்றி விரிவாகச் சொல்வதற்கு எனக்கு நேரம் போதவில்லை. இதற்கு முன்பு 'கொங்கிறீட்' பாதைகளை நாங்கள் காணவில்லை. இந்த அரசாங்கத்தின் ஆட்சியிலேதான் 'கொங்கிறீட்' பாதைகளை நாங்கள் கண்டோம். மண் வீதிகளிலே பயணம் செய்த எங்களுடைய மக்கள் இன்று 'கொங்கிறீட்' பாதைகளிலே பயணம் செய்கின்றார்கள். அவ்வாறான அபிவிருத்திப் பணிகள் நடைபெற்றுக்கொண்டிருப்பதைப் பார்த்தும் ரீ.என்.ஏ. உறுப்பினர்கள் தூங்கிக்கொண்டிருப்பவர்கள்போல நடித்துக்கொண்டிருக்கிறார்கள். இத்தகைய நல்ல விடயங்களைப் பாராட்டுவதற்குக்கூட அவர்களுக்கு நா எழவில்லையென்பதை வேதனையோடு இந்த இடத்திலே நான் சொல்லிக்கொள்ள விரும்புகின்றேன்.

அன்று 3 இலட்சம் மக்கள் முல்லைத்தீவு - முள்ளிவாய்க்காலிலிருந்து வெளியேறி வந்தபொழுது மாண்புமிகு பெஸில் ராஜபக்ஷ அவர்கள் ஆற்றிய அந்தப் பங்களிப்பை எங்களால் மறக்கமுடியாது. 'மெனிக் பாம்' இல் அவர்கள் தங்கியிருந்தபொழுது தண்ணீர் வசதி, மலசலகூட வசதி, வைத்திய வசதி போன்ற அவர்களுடைய அடிப்படைத் தேவைகளைக் கவனிக்கும்பொருட்டு ஒவ்வொரு நாளும் கூட்டங்களை நடத்தி உதவிகள் செய்ததை எங்களால் மறக்க முடியாது. தமிழ்த் தேசியக் கூட்டமைப்பினர் அவற்றை மறந்திருக்கலாம். ஆனால், அந்த மக்கள் அதை மறக்கவில்லை. அவர்கள் இன்றும் நன்றியோடு அவற்றை நினைவுபடுத்திக்கொண்டிருக்கிறார்கள். அன்று நான் மீள்குடியேற்ற அமைச்சராக இருந்தபோது, அந்த மக்களை மிகவிரைவாக குடியமர்த்துவதிலே கௌரவ அமைச்சர் அவர்கள் ஆற்றிய பங்களிப்பை, தந்த உற்சாகத்தை, வழிநடத்தலை, மிதி வெடிகளை அகற்றுவதில் உதவியதை எங்களால் மறக்க முடியாது. அவ்வாறான பணிகளை யுத்தத்தால் பாதிக்கப்பட்ட சமூகத்திற்கு அவர் ஆற்றியிருக்கிறார். அதேநேரம், அமைச்சர் அவர்களிடத்திலே ஒரு முக்கியமான வேண்டுகோளையும் விடுக்க விரும்புகின்றேன்.

கௌரவ அமைச்சரவர்களே! புலிகளால் பலவந்தமாக விரட்டப்பட்டு புத்தளத்திலே வாழ்கின்ற 20,000 க்கும் மேற்பட்ட குடும்பங்கள் தங்கள் சொந்த மண்ணிலே வாழ்வதற்காக அங்கு சென்று குடியேறி வருகிறார்கள். ஜனாதிபதி செயலணியின் தலைவராக இருக்கின்ற அமைச்சராகிய நீங்கள் தமிழ், முஸ்லிம், சிங்களம் என்று வேறுபாடு காட்டாமல் அத்தனை பேரையும் குடியேற்றுகின்ற விடயத்திலே அக்கறை காட்டி வருகின்றீர்கள். அதற்காக உங்களுடைய நேரத்தை, காலத்தை, தூக்கத்தை தியாகம் செய்து வருகிறீர்கள். எத்தனையோ முறை வடக்கு, கிழக்குக்கு விஜயம் செய்திருக்கிறீர்கள். அந்தப் பகுதிகளுக்கு எங்களையும் அனுப்பினீர்கள். அந்த வடபுல முஸ்லிம்கள் இன்று தத்தளித்துக்கொண்டிருக்கிறார்கள். மன்னாரிலே மதத் தலைவரொருவர் அந்த மக்களைக் குடியமர்த்துவதைத் தடுக்கிறார்; ரீ.என்.ஏ. பாராளுமன்ற உறுப்பினர்கள் தடுக்கிறார்கள். அந்த மக்கள் புத்தளத்திலிருந்து transfer எடுத்துக்கொண்டு தொழில் புரிவதற்காக அங்கு சென்றால், புதிய நியமனங்கள் பெற்று வருபவர்கள்போல அவர்களுக்கெதிராக இனவாதத்தைத் தூண்டுகிறார்கள். ஓரிலட்சம் முஸ்லிம்களை விரட்டிய வரலாறு பிரபாகரனுக்கு இருக்கிறது. அவர்கள் அத்தனை பேரையும் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய அரசாங்கத்திலே அமைச்சர் பெஸில் ராஜபக்ஷ அவர்கள் மீளக் குடியேற்றினார் என்ற வரலாற்றை நீங்கள் எழுத வேண்டும். அதை உங்களால் மட்டும்தான் செய்ய முடியும். நீங்களும் அதைச் செய்யவில்லையென்றால் யாரும் செய்யமாட்டார்கள். அப்போது அவர்களால் ஒருபோதும் அந்த மண்ணிலே குடியேற முடியாது. என்னுடைய அமைச்சு நல்லமுறையில்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

செயற்படுவதற்கும் நீங்கள் வழிகாட்டி வருகின்றீர்கள்; ஆலோசனைகள் கூறி வருகின்றீர்கள். மீளெழுச்சித்திட்டம் போன்ற இன்னோரன்ன நலத் திட்டங்கள் அங்கு செயற்பட்டுக்கொண்டிருக்கின்றன. அந்தப் பிரதேசங்கள் பொருளாதாரத்திலே முன்னேறி வருகின்றன. அந்த வகையில், வட மாகாணத்தின் அபிவிருத்தியில் நீங்கள் ஆற்றியிருக்கின்ற பணிகளுக்கும் நிதியுதவிகளுட்பட அத்தனை உதவிகளுக்கும் எங்கள் மக்கள் சார்பாக நன்றி கூறிக்கொள்கின்றேன். அத்தோடு, உங்களோடு சேர்ந்து உழைக்கின்ற பிரதி அமைச்சர்களுக்கும் அமைச்சின் செயலாளர் கலாநிதி ஜயசுந்தர மற்றும் நிஹால் சமரவீர உட்பட அதிகாரிகளுக்கும் எங்களுடைய மனமார்ந்த நன்றியையைக் கூறி, விடைபெறுகின்றேன்.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ. භා. 4.19]

**ගරු බන්දුල ගුණවර්ධන මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பந்துல குணவர்தன - கல்வி அமைச்சர்)
(The Hon. Bandula Gunawardane - Minister of Education)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි 10ක් තුළ සියලු කරුණු ඉදිරිපත් කිරීම ඉතා අසීරු කාර්යයක්. කෙසේ වෙතත්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, රටේ සංවර්ධනයට ඉතා වැදගත් වන, එමෙන්ම අලුත් වෙනසක් යටතේ සමස්ත ජනතාව සහභාගි කර ගනිමින්, සාර්ව සහභාගිත්වය සහිත වර්ධනයක් ශ්‍රී ලංකාවේ ළඟා කර ගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරපු අමාත්‍යාංශයක් ලෙස මා දකිනවා.

ලෝකයේ ආර්ථික විද්‍යාඥයන් අතර තිබෙන මතවාද විටින් විට වෙනස් වෙනවා. මේ සාර්ව ආර්ථික සහභාගිත්ව වර්ධනය - inclusive growth- පිළිබඳව පසු ගිය වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථ ශාස්ත්‍රඥයන් විසින් සනිටුහන් කරනු ලැබූ සටහනක් මා අතේ තිබෙනවා. එය මගේ කථාවේ අවසානයේ පළ කරන්නය කියලා මා ඉල්ලා සිටිනවා. ඒ තුළ තිබෙන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මේ රටේ ජනතාව ආර්ථිකයේ වර්ධන ක්‍රියාවලියට සහභාගි කරවා ගැනීම තුළින් රට ඉදිරියට ගෙන යන්නේ කෙසේද යන්න පිළිබඳ සටහනක්. ඒ සටහන මගේ කථාව අවසානයේ පළ කරන ලෙස ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිමින් මා එය **සභාගත*** කරනවා.

දෙවනුව, මේ විවේචන දෙස බලන විට අද අපේ රටේ වෙනසක් සිදු වෙමින් පවතින බව මා සඳහන් කරන්න කැමැතියි. විපක්ෂය කැමැති වුණත්, අකැමැති වුණත් ලංකා ඉතිහාසයේ මෙතෙක් නොවූ විරූ වෙනසක් ඇති වී තිබෙන බව මා කියන්න කැමැතියි. පසු ගිය කාල පරිච්ඡේදය තුළදී මේ ගරු සභාවට ඉදිරිපත් කළ හැම අය වැය ලේඛනයකින්ම මීට වඩා පිරිමැසුම්දායකව මුදල් වෙන් කිරීමක් කරන්න පුළුවන්කම ලැබුණා. මක්නිසාද යත්, මේ මාතෘ භූමියේ මුහුදු වෙරළෙන් තුනෙන් දෙකක්, මහ පොළොවෙන් තුනෙන් එකක් එල්ටීටීඊ ත්‍රස්තවාදය යටතේ ප්‍රභාකරන්ගේ අණසකට යටත් වෙලායි තිබුණේ. ඒ කාලයේ අය වැය ලේඛනයෙන් මහ පොළොවෙන් තුනෙන් එකකට විදුලිය සඳහා මුදල් වෙන් කරන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ; මහ පොළොවෙන් තුනෙන් එකකට ජල බස්නා ජලප්‍රවාහන ක්‍රම සඳහා මුදල් වෙන් කරන්න අවශ්‍යතාවක් තිබුණේ නැහැ; මහ පොළොවෙන් තුනෙන් එකකට දුම්රිය මාර්ග තැනීම පිළිබඳ අවශ්‍යතාවක් තිබුණේ නැහැ; මහ පොළොවෙන් තුනෙන් එකකට වැව් අමුණු, ඇනිකට්, වේලි යන මේ කිසි දෙයකට මුදල් වෙන් කරන්න රජයට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. අවුරුදු 30ක් තිස්සේ සියලුම ප්‍රාග්ධන වත්කම් එකින් එක ජාතියට අහිමි වීම පමණයි සිද්ධ වුණේ. එදා උතුරට යන්න තිබුණු දුම්රිය මාර්ග ගැලවීම, උතුරට විදුලිය ලැබිලා තිබුණු ලයිට් කණු බිමට පෙරළීම, උතුරට යන්න තිබුණු බෝක්කු, පාලම් කඩා බිඳ දැමීම, ඒ වාගේම උතුරේ තිබුණු වැව් අමුණු විනාශ කර දැමීම සිදු වුණා. ඒ තුළින් ප්‍රභාකරන්ගේ සහ ඔහුගේ එල්ටීටීඊ ත්‍රස්තවාදයේ රුදුරු ගොදුරක් බවට ඒ ප්‍රදේශය පත් වෙලා තිබුණා.

එවන් තත්ත්වයක් තුළදී අභීත, අදීන නායකත්වය යටතේ අතිගරු ජනාධිපතිතුමා සේනාධිනායකයා ලෙස, එකා පිට එකා මැරී වැටුණත් ඒ කාලකණ්ණි ත්‍රස්තවාදය නතර කරලා සිංහල, මුස්ලිම්, දෙමළ, බර්ගර් සියලු ජනයාට කැමැති තැනක ජීවත් වෙන්න හා ජීවනෝපාය සලසා ගන්න පුළුවන් අලුත් ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීම සඳහා ත්‍රස්තවාදය මුලිනුපුටා දැමීමේ යුග මෙහෙවර ඉෂ්ට කළා. ඒ කාර්ය භාරය ඉෂ්ට කළ ලංකාවේ එකම සේනාධිනායකයා අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා පමණයි කියන ටික අපි මතක් කරන්න ඕනෑ. එයින් පසු මේ රට ගොඩ නැඟීමේ කාර්යයේදී, අර විනාශ වෙච්ච උතුර නැඟෙනහිර ගොඩ නැඟීම සඳහා මේ ආණ්ඩුව ප්‍රමුඛතාව දුන්නා. ඒ සඳහා දීපු හැම ශතයක්ම දකුණට දෙනවා වාගේම හෝ ඊට වඩා වැඩියෙන් උතුරු නැඟෙනහිරට දුන්නේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පමණයි කියන එක අපි මතක් කර ගනිමු.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුර නැඟෙනහිර සංවර්ධනය කිරීම භාර දුන්නේ බැසිල් රාජපක්ෂ මැතිතුමාටයි. උතුරු නැඟෙනහිරට දිනපතා ලක්ෂ ගණනින් යන මහ ජනතාව දන්නවා, අමාත්‍යවරයෙක් වශයෙන් එතුමා උතුරු වසන්තය, නැඟෙනහිර උදානය ආරම්භ කරලා දිවි නැඟුම, ගම නැඟුම, පළාත් නැඟුම, සංචාරක සංවර්ධනය, ආයෝජන ප්‍රවර්ධනය යන අංශ යටතේ උතුරු නැඟෙනහිර ද්‍රවිඩ ජනතාව තමන්ගේ ජීවිත කාලය තුළදී සිහිනෙන්වත් නොපැතූ, නොසිතූ දැවැන්තම පරිවර්තනය ඒ ප්‍රදේශයේ සිදු කළ බව. දකුණේ කෙරෙන සංවර්ධනයෙන් අබමල් රේණුවකවත් ප්‍රතිලාභයක් ඒ ප්‍රදේශයේ ඇති නොවීම එදා පැවැති ත්‍රස්තවාදයට මූලික හේතුව බවයි බොහෝ අය කිව්වේ. සංචාරක හෝටල් ඉදි වෙන්නේ නැහැ; කර්මාන්තශාලා ඉදි වෙන්නේ නැහැ; පාරවල් ඉදි වෙන්නේ නැහැ; රෝහල් ඉදි වෙන්නේ නැහැ; පාසල් ඉදි වෙන්නේ නැහැ; ඒක නිසා පීඩාවට පත් වුණු ජනයා ආයුධ අරගෙන, මුහුදු වෙරළෙන් 2/3ක් හා මහ පොළොවෙන් 1/3ක් කඩලා වෙනම රටක් ලෙස ගැනීම සඳහා තමයි කටයුතු කළේ. අද උතුරු නැඟෙනහිර පළාත්වලට ගිහින් බැලුවොත්, කවදා හෝ ලංකා ඉතිහාසයේ උතුරු නැඟෙනහිර පළාත්වල මාර්ග පද්ධතියක් තිබුණා නම්, ඊට පස්සේ තිබුණු හොඳම මාර්ග පද්ධතිය තමයි අද ඇති වෙලා තිබෙන්නේ කියන එක හෘදය සාක්ෂියට එකඟව ඕනෑම මනුෂ්‍යයෙක් දන්නවා; ඒ පළාතේ ජනතාවට ඒ බව මොනවට පැහැදිලි වනවා.

මේ රටේ තිබුණු ලොකුම වැව නැඟෙනහිර පළාතේ යෝධ වැව. ඒක මේ රටේ කවුරුත් දැකලා තිබුණේ නැහැ. යෝධ වැවට එහා පැත්තේ තිබෙන සහල් නැළිය ප්‍රදේශ අස් වද්දන්නේ නැතුව ජාතික නිෂ්පාදනයට එකතුවක් නොකරපු ප්‍රදේශ වශයෙනුයි එදා තිබුණේ. අද යෝධ වැව සම්පූර්ණයෙන් අලුත්වැඩියා කරලා, සහල් නැළිය ප්‍රදේශ අස් වද්දලා තිබෙනවා. එදා උතුරු නැඟෙනහිර ජනතාව රටේ ආර්ථික වර්ධන ක්‍රියාවලියට සහභාගි වුණේ නැහැ. ඔවුන් ප්‍රථම වතාවට තමයි අක්කර දහස් ගණන්

---

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

පුරන් වූ වෙල් යායවල් වගා කටයුතු සඳහා යොදා ගෙන, විනාශ වුණු ගොඩනැඟිලි, ගේ දොර නැවත හදා ගෙන, ඒවායේ පදිංචි වෙලා, පාර හැදිලා, පාලම හැදිලා, anicut එක හැදිලා, වේල්ල හැදිලා, විදුලිය ලැබිලා, විදුලි සන්දේශ ලැබිලා, අද ජංගම දුරකථනයෙන් හා අනික් දුරකථනයෙන් ලෝකයට කථා කරන්න පුළුවන් විධියට, රූපවාහිනිය බලන්න පුළුවන් විධියට උතුරු නැඟෙනහිරට නැවත මනුස්සකම ලබා දුන්න ආණ්ඩුව ලෙස තමයි මේ ආණ්ඩුව ඉතිහාස පොතේ ලියවෙන්නේ කියන ටික අපි, තමුන්නාන්සේලා මතක් කර ගත යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම නිසාම දකුණේ ජනතාවට පමණක් වෙන් කර ගන්න තිබුණු විශාල මුදල් කන්දරාවකට වඩා වැඩි මුදල් කන්දරාවක් උතුරු නැඟෙනහිර ප්‍රදේශයට වෙන් කරන්න සිද්ධ වුණා. පේදුරු තුඩුවේ සිට දෙවුන්දර තුඩුව දක්වා මුළු රටක් ලෙස තුලිත සංවර්ධනයකට -සමබර සංවර්ධනයකට- මුදල් වෙන් කරපු අය වැය ලේඛන තිබෙනවා නම් ඒ, මේ අය වැය ලේඛන පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අලුත් ශ්‍රී ලංකාවක් ගොඩ නැඟීම සඳහා පංච බල කේන්ද්‍රීය සංවර්ධනය සඳහා වුවමනා කරන වැඩිම ආයෝජනය ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට මේ අය වැයෙන් ලබා දීලා තිබෙනවා. සාමාන්‍යයෙන් මේ රටේ වර්ෂයක ආදායම රුපියල් බිලියන දහසක්, රුපියල් බිලියන එක්දහස් එක්සියයක් හෝ රුපියල් බිලියන එක්දහස් දෙසියයක් පමණ වනවා. මේ වර්ෂයේ රටේ නිමැවුම පහත නොවැටී පවත්වා ගෙන යන්න, නිමැවුම තවදුරටත් වැඩි කරන්න, රක්ෂා අවස්ථා ජනිත කරන්න, ආදායම් මාර්ග වැඩි කරන්න, ජීවිතයේ තත්ත්වය උසස් කරන්න කරන රාජ්‍ය ආයෝජනය පමණක් රුපියල් බිලියන 497ක් වනවා. රුපියල් බිලියන 497ක් කියන්නේ රුපියල් බිලියන 500ක්. රුපියල් බිලියන 500ක් කියන්නේ මේ රටේ සමස්ත වර්ෂයක් තුළ එකතු කරන මුළු ආදායමෙන් භාගයකට කිට්ටු ප්‍රමාණයක්. මේ රටේ සමස්ත වර්ෂයක් තුළ එකතු කරන මුළු ආදායමෙන් භාගයකට කිට්ටු ප්‍රමාණයක් සංවර්ධනය සඳහා වෙන් කරපු අය වැයක් ලංකා ඉතිහාසයේ තිබෙනවා නම් ඒ, මේ 2012 අය වැය ලේඛනය පමණයි කියන ටික අපි මතක් කර ගනිමු.

මේ ගරු සභාවේ සමහර මන්ත්‍රීවරුන් අහනවා, "රක්ෂාවල් දෙන්න කීයක් වෙන් කළාද?" කියලා. එහෙම රක්ෂාවල් දෙන්න අය වැයෙන් සල්ලි වෙන් කරන්නේ නැහැ. මේ රටේ ආයෝජනය වැඩි වන කොට ප්‍රධාන වශයෙන් මං මාවත්, විදුලි බලය, ජල බස්නා ජලප්‍රවාහන ක්‍රම යනාදී යටිතල පහසුකම් සඳහා ආයෝජනය කරන්න ඕනෑ. ඒ සඳහා මෙච්චර කල් ආයෝජනය කළේ නැහැ. පසු ගිය ඉතිහාසයේ ඕනෑම මහ බැංකු වාර්තාවක් පෙරළා බැලුවොත්, මේ මෑත මහින්ද රාජපක්ෂ යුගය එන්න කලින් රාජ්‍ය ආයෝජනය රුපියල් බිලියන 100කට අඩුයි කියලා දැක ගන්න පුළුවන් වනවා. රුපියල් බිලියන 100කට අඩු ආයෝජනය රුපියල් බිලියන 500 දක්වා වැඩි කළාය කියන්නේ, හෙට දවස එච්චර කළුවර නැති රටක් ඇති වනවා කියන එකයි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා, ඔබතුමාට නියමිත වේලාව අවසානයි.

**ගරු බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு பந்துல குணவர்தன)
(The Hon. Bandula Gunawardane)

සුපිරි අධිවේගී මාර්ගය ගැන අද මේ ගරු සභාවේ සාකච්ඡා වුණා. මා උදේ ගාල්ල මහින්ද විද්‍යාලයට ගියා. අධිවේගී මාර්ගයේ කොට්ටාවෙන් 7.15ට පිටත් වුණා. හරියට 8.00ට විද්‍යාලයට ගියා. අතිගරු ජනාධිපතිතුමාත් එයට සහභාගි වුණා. අධිවේගී මාර්ගය නිසා ඉතා විශාල පිරිමැස්මක් ඇති වනවා. මක් නිසාද යත්, කාලය ඉතුරු වීම එකක්. එක gear එකකින් පටන් ගත්තාම ගමන අවසන් වන තුරු ඒ gear එකේ යන්න පුළුවන්. ඉන්ධනවල ඉතා විශාල පිරිමැස්මක් ඇති වනවා. Gearbox එකට වන හානිය - ගෙවෙන ප්‍රමාණය- අඩු වනවා. අනික් සියලුම දේ සඳහා ගෙවන මුදල වාගේ කිහිප ගුණයක ඉතිරියක් සහ වාසියක් ඇති වන සුපිරි අධිවේගී මාර්ගය ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට හදලා ඉවර වුණාම කියනවා, ඒකට පරිසර අධ්‍යයනයක් කරලා නැහැයි කියලා. මේ රටේ මිනිස්සු ලෙස සිංහල, දෙමළ, මුස්ලිම් මන්ත්‍රීවරු සියලු දෙනාම ආසියාවේ ආශ්චර්ය බවට ශ්‍රී ලංකාව පත් කිරීමේ කොටස්කරුවන් බවට පත් වන මේ සැබෑ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා වශයෙන් බැසිල් රාජපක්ෂයන්ට වැඩි ශක්තියක් ලැබේවා!යි කියා ප්‍රාර්ථනා කරමින් මගේ වචන කිහිපය මෙයින් සමාප්ත කරනවා.

***සභාමේසය මත තබන ලද සටහන:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட குறிப்பு:*
*Note tabled:*



**සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක් සඳහා යටිතල පහසුකම්**

**හැඳින්වීම**

ආර්ථිකයේ සෑම අංශයකම පැතිරුණ ඉහළ තිරසාර වර්ධනයක් ළඟාකර ගැනීම සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් (Inclusive Growth) යන්නෙන් අදහස් වේ. සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථිකයක වෙළෙඳපොළ ප්‍රවිශ්ඨය, සම්පත් සහ සමාජ ආරක්ෂණය සඳහා පවතින ඉඩ ප්‍රස්ථා ඉහල මට්ටමක පැවතිය යුතුය. සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක දී ආර්ථික වර්ධන රටාව මෙන්ම ආර්ථික වර්ධන වේගය ද වැදගත් වන අතර, එමගින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියෙන් ඈත්ව සිටින සමාජ කොටස්වලට ද ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට එකතුවීමට ඉඩ සැලසීම ඉතා වැදගත් වේ. ඒ අනුව සමාජයේ සෑම පුරවැසියෙකුටම ආර්ථික වර්ධනයට දායක වීමට සහ එමගින් ප්‍රතිලාභ ලැබීමට ඉඩ සැලසේ. සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනය යන්නෙන් ආදායම් ප්‍රති-ව්‍යාප්ත වීම යන්න පමණක් අදහස් නොකෙරේ. සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනය මගින් අවධාරණය කෙරෙනුයේ පුද්ගලයින්ට ආර්ථික කටයුතුවලට දායක වීමට ඇති හැකියාව වැඩිදියුණු කිරීම හා රැකියා අවස්ථා ජනනය කිරීම සඳහා සුදුසු ව්‍යාපාරික පරිසරයක් ගොඩනැඟීම වන අතර, එය ආදායම් ප්‍රති-ව්‍යාප්තිය යන සංකල්පයට වඩා වෙනස් වේ (Ianchovichina and Lundstrom, 2009). සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් අත්කර ගැනීම සඳහා පවතින ප්‍රධානතම බාධාව වනුයේ ආර්ථික, සමාජ සහ මූල්‍යමය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීමයි (Rauniyar and Kanbur, 2009).

**සර්ව සහභාගිත්වයක් සහිත ආර්ථික වර්ධනයක් ශ්‍රී ලංකාවට අවශ්‍ය වන්නේ ඇයි?**

ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉහළ ආර්ථික වර්ධන මාවතකට එළඹ ඇති නිසා, සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. මේ වන විට ජනගහනයෙන් සැලකිය යුතු කොටසක්, මූලික, භෞතික, සමාජමය හා මූල්‍ය යටිතල පහසුකම් නිසි පරිදි නොලැබෙන තත්ත්වයක පසුවන අතර, ඔවුනට මෙම ඉහළ ආර්ථික වර්ධනයට දායක වීමට ඇති ඉඩ ප්‍රස්ථා එමගින් සීමා වී ඇත. "මහින්ද චින්තනය"(රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුව) මගින් ආර්ථික වර්ධනය සඳහා ප්‍රතිපත්ති කඩිනමින් යොමුකිරීමේ වැදගත්කම හඳුනාගෙන ඇත. *"සංවර්ධන උපාය මාර්ග වාණිජ්‍යමය සහ ආර්ථිකමය ප්‍රතිලාභ වෙනුවෙන් පමණක්ම, යටිතල පහසුකම් සඳහා ආයෝජන ප්‍රවර්ධනය සීමා නොවී යටිතල පහසුකම් වෙත ප්‍රවිශ්ඨ වීමට ජනතාවට සමාන අවස්ථා ලබාදීම තුළින් ප්‍රතිලාභ හිමිවන ආර්ථිකමය කටයුතුවල නිරතවීමට ඔවුනට අවස්ථාව සලසාදීමත් බලාපොරොත්තු වේ."* එහෙයින්, රජයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩ පිළිවෙල, සමාජ හා ආර්ථික අසමානතාවයන් ඵලදායි ලෙස අඩු කරමින්, සමාජ ආර්ථික වර්ධනය වැඩි දියුණු කිරීමට හැකිවෙන පරිදි ආර්ථික වර්ධනය පුළුල් පදනමක් සහිත, වේගවත් සහ සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් බවට පරිවර්තනය කිරීමේ අරමුණු වලින් සමන්විත වේ. එමනිසා, රජයේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් ප්‍රාදේශීය වශයෙන් සමබර ආර්ථික වර්ධනයක් අත්පත් කරගැනීම පිළිබඳව අවධානය යොමුවී ඇත. එසේම, සර්ව සහභාගිත්වයක් සහිත තුලිත ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා ආර්ථික, සමාජ සහ මූල්‍ය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහ ජීවන මට්ටම උසස් කිරීම සඳහා අවශ්‍ය රාජ්‍ය ප්‍රතිපත්තිවල ප්‍රමුඛතාවය හඳුනාගැනීම වැදගත් වේ.

**සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා ආර්ථික යටිතල පහසුකම්**

ආර්ථික යටිතල පහසුකම්වලට ප්‍රවාහන, බලශක්තිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සහ වාරිමාර්ග ඇතුළත් වේ. ආර්ථිකමය යටිතල පහසුකම්වල ආයෝජනය කිරීම, නිෂ්පාදන පදනම පුළුල් කිරීමට, තරඟකාරීත්වය වැඩිදියුණු කිරීමට හා සේවා නියුක්ති අවස්ථාවන් ජනනය කිරීමට උපකාරී වේ. තවද, ආර්ථික යටිතල පහසුකම් සම්පත් උපයෝජනයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට මෙන්ම, ඵලදායීතාවය හා ආර්ථික වර්ධනය ඉහළ නැංවීමටත් උපකාරී වන අතර, පළාත් අතර වෙළෙඳාම සඳහා ඇති විභවතාව වැඩිදියුණු කරයි. එමනිසා, ආර්ථික වර්ධනයට වැඩි දායකත්වයක් ඇති සහ අඩු දායකත්වයක් ඇති ප්‍රදේශ අතර ප්‍රවාහන, මාර්ග, සන්නිවේදන සේවා මගින් මනා භෞතිකමය සම්බන්ධතාවයක් ඇති කිරීම තුළින් ප්‍රවාහන වියදම අඩු කළහැකි අතර, ආර්ථික වර්ධනයට අඩු දායකත්වයක් ඇති ප්‍රදේශවල කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා වෙළෙඳපොළක් ඇති කිරීමටද, එමගින් රැකියා අවස්ථා ජනනය කිරීමට ද හැකි වේ. මග නැගුම වැඩසටහන මගින් ග්‍රාමීය ප්‍රදේශ නගරය හා සම්බන්ධ කිරීමට අවශ්‍ය පසුබිම සකසා ඇත. මේ අතර රජයේ ජාතික මට්ටමේ යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන යටතේ, භාණ්ඩ සහ මගී ප්‍රවාහනය වැඩිදියුණු කිරීම සඳහා අන්තර් පළාත් මහා මාර්ග සහ දුම්රිය මාර්ග ඉදිකිරීමට කටයුතු කිරීම, නුදුරු අනාගයේ දී ආර්ථික ප්‍රතිලාභ ජනිත කිරීමට හේතුවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආර්ථික යටිතල පහසුකම් දියුණුවීමත් සමඟ ආර්ථික වර්ධනයට අඩු දායකත්වයක් ඇති ප්‍රදේශවල ආර්ථික ව්‍යුහය වෙනස්වීමට අවශ්‍ය වෙළෙඳපොළ බලවේග සැකසෙනු ඇත. එම ප්‍රදේශවල ආර්ථික ව්‍යුහය වෙනස් කිරීමට වෙළෙඳපොළ බලවේග අසමත් වුවහොත්, ඒ සඳහා මනා සම්බන්ධතාවයක් සහිත මැදිහත් වීමක් අවශ්‍ය වන අතර, එමගින් එහි වෙසෙන ජනතාවට ආර්ථික වර්ධන ක්‍රියාවලියට සක්‍රියව දායක වීමට අවස්ථාව උදාකර දිය හැක.

[ගරු බන්දුල ගුණවර්ධන මහතා]

**සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා සමාජ යටිතල පහසුකම්**

අධ්‍යාපනය, සෞඛ්‍ය සේවා, ප්‍රජා සංවර්ධන සහ සමාජ සුභසාධන යනාදිය සහතික කරන පහසුකම් සහ යාන්ත්‍රණයන් සමාජ යටිතල පහසුකම් යන්නට ඇතුළත් වේ. සෞඛ්‍ය, සාක්ෂරතාවය සහ පාරිසරික තිරසාරබව යන දර්ශකවලින් පෙන්වන පරිදි ජීවන තත්ත්වයේ ගුණාත්මකභාවය වැඩි දියුණු වීම සහ ආර්ථික සෞභාග්‍ය ළඟාකර ගැනීම අතර දැඩි සම්බන්ධතාවයක් පෙන්නුම් කරයි. රටක සමාජ යටිතල පහසුකම් දියුණු වීම, ඉහළ ආර්ථික වර්ධනයක් අභිමුඛ කොටගත් වඩාත් ඵලදායී සහ පූර්ණ නිපුණතා සහිත ශ්‍රම බලකායක් බිහිකිරීම කෙරෙහි බලපාන අතර එමඟින්, ආර්ථිකය තවදුරටත් වඩාත් වේගවත් ආර්ථික වර්ධනයකට සහ සංවර්ධනයකට යොමුවීම සඳහා රටට අවශ්‍ය පරිණතභාවය ලබා ගැනීම තහවුරු කරනු ඇත.

අධ්‍යාපනය සහ සෞඛ්‍ය සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා සෘජුව දායකත්වයක් සැපයිය හැකි ප්‍රධාන සමාජ යටිතල පහසුකම් වශයෙන් හඳුනාගෙන ඇත. ශ්‍රී ලංකාවේ සැමට නිදහස් අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා ලබාදීමේ ප්‍රතිපත්තිය, අධ්‍යාපන හා සෞඛ්‍ය සේවා ලබාගැනීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය වශයෙන් ඇති විෂමතා ඉවත් කර ඇත. කෙසේ නමුත්, අධ්‍යාපන ප්‍රමිතිය එනම් එහි ගුණාත්මක භාවය සහ වෙළෙඳපොළ අවශ්‍යතාවයන්ට සරිලන මට්ටමකට දියුණු කිරීම මඟින් ආර්ථිකයට අඩු දායකත්වයක් සපයන ප්‍රදේශවල ජනතාවට ආර්ථිකමය වශයෙන් වැඩි ක්‍රියාකාරිත්වයකින් යුතු අංශවල ශ්‍රම වෙළෙඳපොළට එක් වීමට අවස්ථාව සැලසෙනු ඇත. මෙය ශ්‍රම සංචලතාව වැඩිදියුණු කිරීමට සහ ආර්ථිකයට අඩු දායකත්වයක් සපයන ප්‍රදේශවල දරිද්‍රතාව අඩුකිරීමට උපකාරී වනු ඇත. ශ්‍රී ලංකාව හා සමාන ආර්ථික මට්ටමේ සිටින රටවල් සමඟ සංසන්දනය කිරීමේ දී, අධ්‍යාපනය සම්බන්ධයෙන් විශේෂයෙන්ම, උසස් අධ්‍යාපනය සහ වෘත්තීමය පුහුණුව සම්බන්ධයෙන් කරනු ලබන ආයෝජන සාපේක්ෂව අඩු මට්ටමක පවතී. එමනිසා, අධ්‍යාපනය සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ධෛර්යමත් කිරීමට දරණ උත්සාහය ඇගයිය යුතුය. අ.පො.ස. සාමාන්‍ය පෙළ ගණිතය, ඉංග්‍රීසි සහ තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ කුසලතා යන අංශ සම්බන්ධයෙන් ඇති මූලික දැනුම සහ කුසලතා හිඟකම හේතුවෙන් ශ්‍රම වෙළෙඳපොළට අවශෝෂණය කර නොගත් බොහොමයක් ශ්‍රමිකයන්, ආර්ථිකයට අඩු දායකත්වයක් සහිත ප්‍රදේශවල ජීවත්වන හෙයින්, ඉහළ ගුණාත්මක බවින් යුත් අධ්‍යාපනය සඳහා ප්‍රවිශ්ඨවීමට ඔවුන්ට අවස්ථාව ලබාදීම සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා ගතයුතු වැදගත් පියවරක් වේ. තවද, ව්‍යවසායකත්ව කුසලතා වැඩි දියුණු කිරීම ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ තවදුරටත් වර්ධනය විය යුතු අංශයකි. මානව ප්‍රාග්ධනය විශේෂයෙන්ම, නිපුණතා සහ ව්‍යවසායකත්ව පුහුණුව සඳහා කරනු ලබන ආයෝජන අඩු වීම සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා පවතින සංරෝධකයකි (McKay, 2008).

රටක ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වය, රටෙහි මානව ප්‍රාග්ධනයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සම්බන්ධයෙන් වැදගත් දායකත්වයක් සපයයි. මේ සම්බන්ධයෙන් සලකනවිට පුද්ගලයන් 1,000 ට ඇඳන් 3.2 ක් සහ පුද්ගලයන් 1,462 ට එක් වෛද්‍යවරයෙක් බැගින් සිටින ශ්‍රී ලංකාවේ රජයේ සෞඛ්‍ය සේවාවේ ව්‍යාප්තිය ප්‍රශංසනීය වේ. කලාපයේ අනෙකුත් රටවල් හා සසඳන කල ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය අංශයේ කාර්ය සාධනය උසස් මට්ටමක පැවැතියද, එහි යථා තත්ත්වය වනුයේ ප්‍රධාන සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ ව්‍යාප්තියේ විෂමතාවක් දැකිය හැකි වීමයි. ජනගහනයට සමානුපාතිකව වෛද්‍යවරුන්, හෙදියන්, පවුල් සෞඛ්‍ය නිලධාරීන් ඇතුළු රජයේ සෞඛ්‍ය නිලධාරීන් ප්‍රමාණය කොළඹ ප්‍රදේශය කේන්ද්‍ර කරගනිමින් ඉහළ අගයක පවතින අතර, දුෂ්කර පළාත් සම්බන්ධයෙන් එය ඉතා පහළ අගයක් ගනී. ආර්ථික වර්ධනයට අඩු දායකත්වයක් සහිත ප්‍රදේශවල බහුලව දැකිය හැකි, මන්දපෝෂණය සහ සූක්ෂම පෝෂණ ගැටළු මඟහරවා ගැනීම සඳහා සෞඛ්‍ය අංශය විසින් ඉලක්කගත මැදිහත්වීම සිදුකළ යුතු අතර, ප්‍රාදේශීය වශයෙන් පවතින සෞඛ්‍ය අවශ්‍යතා සඳහා විශේෂිත වූ ප්‍රතිපත්ති හඳුන්වා දිය යුතුව ඇත.

**සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා මූල්‍ය යටිතල පහසුකම්**

මූල්‍ය යටිතල පහසුකම් යනු මූල්‍ය අතරමැදියන්ගේ කාර්යක්ෂම මෙහෙයුම් පද්ධතියක් සඳහා දායකවන ආයතන සමූහයකි. මීට අමතරව, මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සඳහා පවතින නෛතික හා නියාමන රාමුව ද මෙයට අයත් වේ. සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් සඳහා දායක වීමට නම් මූල්‍ය යටිතල පහසුකම් යටතේ ණය ලබාගැනීමට ඇති පහසුකම් වැඩිකිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, ණය පහසුකම් දරා ගත හැකි මට්ටමේ පැවතීමත්, ඉතුරුම් හා ගෙවීම් මාධ්‍යයන් සුරක්ෂිතවීමත්, රක්ෂණ ක්‍රම, ජාත්‍යන්තර ප්‍රේෂණ සහ මූල්‍ය උපදේශන සේවාවන් ලබාගැනීමට හැකිවීමත් අවශ්‍ය වේ. ණය ලබාගැනීමට ඇති ඉඩ සීමාසහිතවීම ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක් අත් කරගැනීමට ඇති ප්‍රධානතම බාධාවක් වේ. ණය ලබාගැනීම සඳහා ඉල්ලුම හා සැපයුම යන දෙඅංශයෙන්ම සංරෝධක පවතී. ඉල්ලුම් අංශයෙන් බලන කල, ඇපයට තැබිය හැකි වත්කම් හිඟකම අඩු ආදායම් ලබන්නන්ට ණය පහසුකම් ලබාගැනීමට ඇති ප්‍රධාන බාධකය වේ. බැංකු ගිණුමක් ආරම්භ කිරීමට සහ ණය ලබාගැනීමට අවශ්‍ය මූල්‍යමය සාක්ෂරතාවය නොමැතිකම ද ඔවුනට ණය ලබාගැනීමේ දී ඇති බාධාවකි. සැපයුම් අංශයෙන් බලන කල,

ගනුදෙනු පිරිවැය ඉහළ මට්ටමක පැවැතීම සහ මූල්‍යමය යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අඩු ආදායම් ලාභීන් සහ ග්‍රාමීය සේවා දායකයන් හට සේවා සැපයීම, පිරිවැය අධික කටයුත්තක් ලෙස බැංකු සලකයි (Ianchovichina and Lundstrom, 2009). මීට අමතරව භූගෝලීය වශයෙන් පවතින බාධාවන් ඉල්ලුම සහ සැපයුම දෙඅංශයෙන්ම ඇතිවන මූලික ගැටළුවකි.

ශ්‍රී ලංකා රජය 2015 වන විට සැමට මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවිශ්ඨවීමට ඇති අවස්ථාව ලබාදීමට අවශ්‍ය පියවර ගෙන ඇති අතර, බැංකු මෙම අවස්ථාව මනාව ග්‍රහණය කර ගැනීමට ඉදිරිපත් විය යුතුය. මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවිශ්ඨවීමට ඇති නොහැකියාවට ප්‍රධානතම බාධාව වී ඇත්තේ මූල්‍ය සේවාවන් පිළිබඳ ඇති නොදැනුවත්කම සහ එම සේවාවන්ගේ ඇති අනම්‍යශීලී භාවයයි. භෞතික හා මූල්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත්ව නොතිබීම හේතුවෙන්, බ්‍රෝඩ්බෑන්ඩ් (broadband) සේවා අවම මට්ටමක පැවැතීම වැනි බැංකුකරණය සඳහා අවශ්‍ය තාක්ෂණය ග්‍රාමීය ප්‍රදේශ සම්බන්ධයෙන් නොපැවතීම, මූල්‍ය සේවා සඳහා ප්‍රවිශ්ඨවීමට සැමට අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ඇති ගැටළුවකි. මූල්‍ය යටිතල පහසුකම් දියුණු කිරීම, සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයට බාධාවක්ව පවතින ඉල්ලුම සහ සැපයුම යන දෙඅංශයෙන්ම දැකිය හැකි සංරෝධකවලට පිළියමක් වේ.

සර්ව සහභාගිත්වයක් සහිත වර්ධනයක දී ආර්ථික වර්ධන වේගය මෙන්ම එහි ස්වභාවයද සැලකිල්ලට ගන්නා අතර, එමඟින් ඉහළ ආර්ථික වර්ධනයක් පමණක් නොව ආර්ථික වර්ධන ක්‍රියාවලියට සහභාගිවීමට සියළු පුරවැසියන්ට අවස්ථාව ලැබේ. දශක ගණනාවක් තිස්සේ ශ්‍රී ලංකාවේ අනුගමනය කරන ලද රාජ්‍ය ප්‍රතිපත්ති, දරිද්‍රතාවය අඩු කිරීමට මෙන්ම රට ආර්ථික වශයෙන් ඒකාබද්ධ කිරීමට සහ සෑම ප්‍රදේශයකම ජීවත්වන ජනතාවට මෙම පොදු සේවාවන්ට ප්‍රවිශ්ඨවීමට ඇති අවස්ථාව සලසමින් සාර්ථක ප්‍රතිඵල ගෙන දී ඇතත්, ශ්‍රී ලංකාව ඉහළ මැදි ආදායම් ලබන රටක් කරා යන ගමනේ දී, සෑම පළාතකම ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමට අවශ්‍ය සමාජ - ආර්ථික ප්‍රතිපත්ති සම්බන්ධව වැඩි අවධානයක් යොමු කළ යුතුය. වේගවත් ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ සමස්ත රටෙහිම සියළුම කුටුම්භවලට සහ විවිධ ආදායම් ලබන ජනතාවට ගලායෑම සඳහා භූගෝලීය වශයෙන් පවතින ආර්ථික විෂමතා ඉවත් කිරීම, සෞඛ්‍ය හා අධ්‍යාපන ප්‍රතිපත්තීන් යළි හැඩගැස්වීම තුළින් මානව ප්‍රාග්ධන පදනම දියුණු කිරීම, ජනතාවට ණය සඳහා ප්‍රවිශ්ඨවීමට ඇති අවස්ථා වැඩි දියුණු කිරීම සහ සමාජ ආරක්ෂණ ජාල වැඩි දියුණු කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ වැඩි අවධානය යොමුවීම වැදගත් වනු ඇත.

මූලාශ්‍ර

Ianchovichina, E. and S. Lundstrom, (2009), 'Inclusive Growth Analytics: Framework and Application', Economic Policy and Debt Department, The World Bank, Washington, D.C.

McKay, A., (2008), 'Economic Growth, Inequality and Poverty Reduction: Does Pro-Poor Growth Matter?', IDS in Focus, No. 3.

Rauniyar, G. and R. Kanbur, (2009), 'Inclusive Growth and Inclusive Development: A Review and Synthesis of Asian Development Bank Literature', Asian Development Bank (ADB), Manila, Philippines.

The World Bank, (2010), *Reshaping Economic Geography, Connecting People to Prosperity*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ඊ ළඟට ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ. භා. 4.29]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට විනාඩි 22ක් තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ඉතාමත් සතුටින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කරලා, විපක්ෂයක් වශයෙන් ඒ පිළිබඳව අපේ අදහස් යොමු කරන්න බලාපොරොත්තුවෙන් සිටිනවා.

අමාත්‍යාංශ හැටහුටහමාරක් තිබුණත් වැඩ කරන අමාත්‍යාංශයක් ලෙස ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හඳුන්වා දෙන්න පුළුවන් බව මම විපක්ෂයේ හිටියත් ප්‍රථමයෙන්ම කියන්න කැමතියි. [බාධා කිරීම්] අත්පුඩිය තරමම වැඩත් තිබුණා නම් හොඳයි. ඒත් කියන්න තිබෙන දේ අපි කියමු. මම මේ අවස්ථාවේදී මුලින්ම මගේ කථාව පටන් ගන්නේ බැසිල් රාජපක්ෂ ඇමතිතුමා අය වැය සම්බන්ධයෙන් කරපු කථාවක් ඉදිරිපත් කරමිනුයි. එතුමා ඉදිරිපත් කළ අදහස නොවැම්බර් 20වැනි දා, "The Sunday Times" පත්තරේ මෙහෙම සඳහන්ව තිබෙනවා. I quote:

"Budget focus on price reduction, not salary hikes…"

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඉතාමත් වැදගත් අමාත්‍යාංශයක් දරන ඇමතිවරයෙකු වශයෙන් මට කාරුණිකව කියන්න පුළුවන්ද, කොහේද මේ බඩු මිල අඩු වුණේ, කොහේද පඩි ටික වැඩි වුණේ කියලා. ඉතින් මේ දෙකම සිදු නොවුණු දෙයක් නිසා ඔබතුමාගේ අමාත්‍යාංශයට තිබුණාටත් වඩා බරක් පැටවෙලා තිබෙනවා. වියදම් ශීඝ්‍රයෙන් වැඩි වෙලා තිබෙනවා. ආදායම් උත්පාදන ක්‍රම අඩු වෙලා තවත් අමාරුකම් ඇති වෙලා තිබෙනවා. ඒ තුළින් ඔබතුමන්ලාගේ නිෂ්පාදන වියදම වැඩි වෙලා තිබෙන නිසා දැන් තරගකාරී තත්ත්වය අඩු වෙලා තිබෙනවා. අගනුවර කොළඹ නිසා හැම දෙනාම කොළඹට ඇවිල්ලා යනවා වාගේ හැම අමාත්‍යාංශයකටම ඔබතුමාගේ අමාත්‍යාංශය හරහායි යන්න තිබෙන්නේ. ඒ යන කොට මේ තිබෙන අමාරු දේ මීට වඩා ඵලදායීවත්, මීට වඩා තරගකාරිවත් කර ගෙන යන එක තමයි ඔබතුමාගේ අමාත්‍යාංශයට 2012 වර්ෂයේ කරන්නම තිබෙන්නේ.

මේ ප්‍රාන්තයේ තිබෙන -මේ ප්‍රදේශයේ තිබෙන- ප්‍රශ්නය අනුව අපේ රුපියලේ අගය අවප්‍රමාණය වෙලා තිබෙනවාය කියන එක අපි පිළිගන්න අවශ්‍යයි. "Ceylon Today" එකේ දාලා තිබෙන ශීර්ෂ පාඨයක් මම මේ අවස්ථාවේදී උපුටා ගන්නවා. ඒක මම ඔබතුමාට පෙන්වන්නයි ගෙනාවේ. එහි තිබෙනවා, "Why the Indian rupee is falling" කියලා. මම හිතන්නේ, ඉන්දියාව සමඟ අපට අතිවිශේෂ වැඩ කටයුත්තක් කරන්න පුළුවන්ය කියායි. ඉන්දියාවේ නිෂ්පාදනය අපට පාවිච්චි කරන්න පුළුවන්, අපේ සේවා අංශය දියුණු කරලා ලංකාවට ඒ තුළින් ආර්ථික වාසි ලබා ගන්න. ඒ සම්බන්ධයෙන් අපේ ආර්ථික ප්‍රතිපත්තිය දවසින් දවස වෙනස් නොවිය යුතුයි. අද වමට හැරෙනවා. හෙට දකුණට හැරෙනවා. මේ බද්ද අද දානවා. හෙට ඉවත් කරනවා. රජය අද පනතක් ගේනවා, මේවා රජයට පවරා ගන්නවා කියලා. ඔය වාගේ දේවල් කරන්නේ නැතුව සෘජු ප්‍රතිපත්තියක් සකස් කරලා, මෙන්න මෙහෙම තමයි අපි ජාතික ප්‍රතිපත්තියක් විධියට රට ගෙන යන්නේ කියලා පෙන්වන්න පුළුවන් වුණොත් අන්න ඒක තමයි ඔබතුමාට රටට කරන්න පුළුවන් ලොකුම සේවය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා (මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா - மக்கள் தொடர்பு, மக்கள் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Mervyn Silva - Minister of Public Relations and Public Affairs)

ගරු මන්ත්‍රීතුමනි, රජයට පවරා ගත යුතු දේ පවරා ගන්න ඕනෑ. ඒක හැම රජයක්ම කළා. යම් කිසි ආයතනයක් අලාභ ලබනවා නම්, ඒක පවරා ගෙන එය ලාභදායී කරන්න ඕනෑ. නමුත් ඒක දේශපාලන සංස්කෘතියක් කර ගන්න මොන පක්ෂයක්වත් හොඳ නැහැ. ඔබතුමා වාගේ දක්ෂ, හිටපු ඇමතිවරයකු -නිකම් නෝංජල් මන්ත්‍රීවරු කියන ඒවා නම් අපි ගණන් ගන්නේ නැහැ.- එහෙම අදහසක් ඉදිරිපත් කළොත් අපි පෙන්වන්න ඕනෑ ඒක වැරැදියි කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට මෙතැනදී මතක් කරන්න තිබෙන එකම දේ තමයි රටේ ප්‍රතිපත්ති සකස් කිරීම කියන කාරණය. අපට මතකයි, චන්ද්‍රිකා කුමාරණතුංග හිටපු ජනාධිපතිතුමිය පාන් රුපියල් 3.50ට දෙන්න ගිහිල්ලා අන්තිමට මොකක්ද වුණේ කියලා. සතොස නැති කළා. ඔබතුමන්ලා ඒ ගැන අපට බණිනවා. නමුත් අපි විතරයි සතොස බේරා ගත්තේ. මෙන්න මේක තමයි වෙනස. [බාධා කිරීම්] ඒ වාගේ දේවල් තමයි කරන්න එපාය කියලා මම කියන්නේ. ඔබතුමන්ලා පනතක් ගේන්න අවශ්‍ය නම් ඉස්සෙල්ලාම කරන්න තිබෙන දේ- [බාධා කිරීම්] ඕක බලන්න දෙයක් නැහැ. ඔබතුමා පොත් ටික බැලුවා නම් හරි. [බාධා කිරීමක්] දැන් මෙතැන ඔබතුමා කිව්වා පාඩු ලබන ආයතන- [බාධා කිරීමක්] පාඩු ලබන ආයතන ගැන කථා කරන කොට ඉස්සරවෙලාම මිහින් එයාර් ආයතනය ගන්න. දැන් ඒකට මොනවාද කරලා තිබෙන්නේ?

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ඔබතුමා වෙනස් මාර්ගවල යන්නේ නැතිව අදාළ කථාව කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථාව කර ගෙන යන්න. වෙලාව ගත වනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමනි, දැන් ඉන්දියාවේ රුපියල සියයට 22කින් අවප්‍රමාණ වෙලා තිබෙනවා. එහෙම නම් ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවෙක් ඉන්දියාවත් එක්ක තරග කරන්නේ කොහොමද? මෙන්න මේක තමයි තිබෙන ප්‍රශ්නය. ගරු ඇමතිතුමාට තමයි ඒ ප්‍රශ්නය එන්නේ. අද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට - BOI එකට- කවුරු හරි ආවොත් බලන්නේ වැඩ කරන පුද්ගලයකුට කීයක් ගෙවන්න තිබෙනවාද, electricityවලට ගෙවන්නේ කොහොමද, වතුරවලට කීයක් ගෙවන්න අවශ්‍යද කියන එකයි. මේවා ඔක්කොම එකතු කළාම නිෂ්පාදන වියදම වැඩියි. ඉන්දියාවත් සමඟ සාපේක්ෂව බැලුවාම අඩුම ගණනේ සියයට 40ක් පමණ අපේ රටේ වියදම වැඩියි කියලා පෙනෙනවා.

මුදල අවප්‍රමාණ කිරීමෙන් තරගකාරී තත්ත්වය යම් විධියකට සම මට්ටමකට ගේන්න තමයි හදන්නේ. නමුත් මම තවත් කාරණයක් අහනවා. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා එක පැත්තකින් අය වැය හදන කොට රුපියල සියයට 3ක් අවප්‍රමාණ කරන්න කියනවා. ඒ වාගේම එතුමා මහ බැංකුවේ Monetary Board එකේත් ඉන්නවා. එතැනදී රුපියල සරු කරන්න රුපියල් මිලියන 2,000ක සල්ලි විකුණන්න ඉඩ දෙනවා. එහෙම විකුණන්න ඉඩ දුන්නේ ඇයි? එහෙම කරන එතුමා අනෙක් පැත්තෙන් රුපියල සියයට 3කින් අවප්‍රමාණ කරන්නේ ඇයි? එතුමා ඒවාටත් වගකියන්න අවශ්‍යයි. එහෙම නම්, එතුමා නොදැනුවත්වද, එහෙම නැත්නම් නොකියාද මේක කළේ කියන ප්‍රශ්නය අපි ඇමතිතුමාගෙන් අහන්න අවශ්‍යයි. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය තමයි ආනයනය කිරීම සහ අපනයනය කිරීම කියන මේ දෙකටම තිබෙන්නේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමාත්, මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමාත් දෙදෙනාම එක්කෙනෙක්. මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා Monetary Board එකේ ඉන්නවා. ඒ නිසා මේ මාස දෙක තුළ රුපියලේ අගය සරු කරන්න US Dollars 2,000 million විතර නිදහස් කළා. අය වැයෙන් රුපියල සියයට 3කින් අවප්‍රමාණ කරලා එක වරටම මේ වාගේ හොණ ගහන අපරාධයක් කිරීම ගැන ඔබතුමන්ලා යම් විධියකින් වගකියන්න අවශ්‍යයි කියන එකත් මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. ඉතින් මේ ඉන්දියන් රුපියල සම්බන්ධයෙන් ඔබතුමන්ලා අනිවාර්යයෙන්ම ප්‍රතිචාර දක්වන්න අවශ්‍යයි. නැත්නම් අපේ නිෂ්පාදකයන්ට අමාරු තත්ත්වයක් ඇති වනවා. මේකට තිබෙන උත්තරය රුපියලේ අගය අවප්‍රමාණ කිරීම නොවෙයි. යම් විධියකින් ආයෝජනවලට වරප්‍රසාද දෙන්න අවශ්‍ය වනවා. Tax holidays දෙන එක ගැන මම ඉතාම සතුටු වනවා. මොකද, අය වැය ලේඛනය කියවන අවස්ථාවේ දී ජනාධිපතිතුමා කියපු tax holidays අපට නිසියාකාරව පෙනුණේ නැති වුණාට, ඒක විශ්ලේෂණය කරන කොට පෙනෙනවා, දැන් ආරම්භ කර තිබෙන ව්‍යාපාරවල සියයට 50කට වැඩියෙන් ආයෝජනය කළොත් tax holidays දීලා තිබෙන බව. ඒක හොඳ සාධකයක්.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පටන් ගත්ත දවසේ සිට අද වන තුරු BOI Section 16, 17 යටතේ කර්මාන්ත 7,158ක් ලියා පදිංචි වෙලා තිබෙනවා, මේ දත්ත අනුව. මෙවායින් 2,228ක් වහලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, පිට රටකින් ඇවිල්ලා ආයෝජනය කරන ව්‍යාපෘති වැහෙන්නේ ඇයි කියන එක ඔබතුමන්ලා මුලින්ම බැලුවොත් හොඳයි. මොකද, අලුතින් එකක් ගේනවාට වඩා තිබෙන දේ ආරක්ෂා කර ගැනීම වැඩියෙන් වටිනවා. කර්මාන්තශාලා 2,228ක් වහලා තිබෙනවා කියන්නේ අපේ රටට ඇවිල්ලා තිබෙන ආයෝජනවලින් සියයට 31ක් වහලා දමලා තිබෙනවා කියන එකයි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

ගරු මන්ත්‍රීතුමනි, ඒකෙන් අපි 24ක් ගත්තා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

2,228ක් වහලා තිබෙනවා නම්, ඒකෙන් 24ක් ගත්තා කිව්වාට හරියන්නේ නැහැ නේ. මම කියන්න හදන්නේ මේකයි. සාමාන්‍යයෙන් රටක සියයට 10ක් 12ක් විතර ඒවා වහන්න තිබෙනවා. නමුත් ඇයි මේවා වහන්නේ? වැරදි ප්‍රතිපත්ති අනුගමනය කරන නිසායි එහෙම වෙන්නේ. [බාධා කිරීමක්] ඕව, මම කිව්වේ පටන් ගත්ත දවසේ සිටම ඒවා ගැනයි. මේවායේ සම්පූර්ණ වගකීම එක්සත් ජාතික පක්ෂයෙන් ඔබතුමාට පවරන්නේ නැහැ. නමුත් සියයට 90කට විතර ඔබතුමන්ලා වගකියන්න ඕනෑ. මොකද, 1994 සිටම ඔබතුමන්ලා ගෙන ගිය ප්‍රතිපත්තිය තමයි ඒක. එක දවසක වමට හැරෙනවා. අනෙක් දවසට දකුණට හැරෙනවා.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
2005 දී බලන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි, හොඳයි. 2005 ගැන බැලුවත් වැඩිය කියන්න දෙයක් නැහැ. ඔක්කොම වහලා තිබෙනවා. [බාධා කිරීමක්] අපි හරි තැනට එමු කෝ. මම මේකෙන් පෙන්වන්න හදන්නේ, අපට ඕනෑ වන්නේ චින්තන නොවෙයි කියන එක. සෘජු ප්‍රතිපත්ති තමයි අපට අවශ්‍ය වන්නේ. මේ රටේ ආර්ථිකයත් එක්ක සන්සන්දනය කරන කොට ඉදිරි දැක්මක් සහිතව ගමන් කරන්න අවශ්‍ය නම්, අපට කරන්න තිබෙන්නේ සෘජු ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීමයි. මේකට අවශ්‍ය 2005 චින්තනය නොවෙයි. එක්සත් ජාතික පක්ෂය කොළ පාට කිරීම නොවෙයි. කරන්නට තිබෙන්නේ, මේ සඳහා ජාතික ප්‍රතිපත්තියක් ඇති කිරීමයි. එහෙම කළොත් මොන ආණ්ඩුවක් තිබුණත් ආයෝජන ගලා ගෙන එනවා. මෙහිදී අපි බලන්න ඕනෑ, ඇයි මෙතරම් කර්මාන්තශාලා ප්‍රමාණයක් වහලා තිබෙන්නේ කියලා. අපේ මර්වින් සිල්වා ඇමතිතුමා කිව්වා 2005 සිට බලන්න කියලා. 2005 සිට අද වන තුරු ආයෝජන 1,300ක් ඇවිල්ලා තිබෙනවා. ඒකත් එක්ක බැලුවොත් 2005 වර්ෂයේ 121ක් වහලා තිබෙනවා කියලා පෙනෙනවා. 2006 වර්ෂයේ 113ක් වහලා තිබෙනවා. 2007 වර්ෂයේ 119ක් වහලා තිබෙනවා. 2008 වර්ෂයේ 107ක් වහලා තිබෙනවා. [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, මගෙන් ඇහුවේ 2005 ඉඳලා නේ. එම නිසා මා 2005 ඉඳලා උත්තරයක් දුන්නා.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ගරු බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වා වාගේ ඔබතුමන්ලා මේ රටේ පාලනයක් කළේ සොච්චම් කාලයකට විතරයි. ඒ අවධියේ දී මේ රටේ මහා විපරීතකාරී තත්ත්වයක් ඇති වුණු නිසා,-[බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉතින්, අහගෙන ඉන්නකෝ. ගරු ඇමතිතුමා දැන් අහගන්නකෝ. ඔබතුමා 2005 ගැන ඇහුවා. මම උත්තරය දෙනවා. [බාධා කිරීම්]

අපි ඉස්සෙල්ලාම කරන්න තිබෙන දේ තමයි, මේ රටට ආයෝජකයන් ගෙන්වා ගන්නා ක්‍රම ඇති කරන එක. දැන් රජයක් හැටියට ඔබතුමන්ලා ඉලක්ක කරලා තිබෙනවා, සියයට 8ක් දක්වා ආර්ථිකය වර්ධනය කර ගන්න. ඒක හොඳයි. මම හිතන විධියට සියයට 8, සියයට 9 ක ප්‍රමාණයක් ඉලක්ක කළාට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ රටේ ඉතිරි කිරීම් සියයට 15ක් තිබෙනකොට රටට ආයෝජකයන් ගෙන්වා ගන්න අවශ්‍යයි. ආයෝජකයන් ගෙන්වා ගන්න අවශ්‍ය නම් වැදගත්ම දේ හැටියට මා අර කිව්ව ප්‍රතිපත්ති අවශ්‍යයි.

දැන් බලන්න, ඉන්දියාවේ 2010 වර්ෂයේ US Dollars කෝටි 1400ක ආයෝජන ඇති කර තිබෙනවා. ඒ වාගේම තායිලන්තයේ US Dollars කෝටි 600ක්; වියට්නාමයේ US Dollars කෝටි 300ක්; පාකිස්තානයේ US Dollars කෝටි 220ක්. ශ්‍රී ලංකාවේ 2007 වර්ෂයේ කෝටි 75යි; 2008 වර්ෂයේ කෝටි 69යි. යුද්ධයට පස්සේ 2009 වර්ෂයේ කෝටි 47යි. 2010 වර්ෂයේ කෝටි 54යි; 2011වර්ෂයේ කෝටි 79යි. ඒ කෝටි 79ට "කෙයාන් ලංකා" එකේ තෙල් ගවේෂණ සම්බන්ධයෙන් සියයට 10ක වියදම් ඇතුළත් වෙලා තිබෙනවා. අපි මීට වඩා ශීඝ්‍ර වශයෙන් ආයෝජනයන් ගෙන්වා ගැනීම අවශ්‍යයි. මේ ආයෝජන ගෙන්වා ගන්නා විට රටට එන ආයෝජකයන් ආරක්ෂා කිරීමේ වගකීමත් දරන්න අවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, පාඩු ලබන ආයතන පවරා ගන්න ඕනෑ කියලා. ඒක ආණ්ඩුවට තිබෙන ප්‍රතිපත්තියක්. නමුත් ඒ ප්‍රතිපත්තියෙන් ආයෝජකයන්ට හානියක් නොවන විධියට කටයුතු කිරීම අවශ්‍යයි. ඒ කටයුතු දේශපාලනීකරණය කරන්න අවශ්‍යතාවක් නැහැ. පැල්වත්ත සීනි සමාගමේ ලාභයක් තිබෙනවා. සෙවනගල සීනි සමාගමේ අලාභයක් තිබිලා ලාභයක් බවට ගෙනාවා. ලංකා ට්‍රැක්ටර්ස් ආයතනයේ ලාභයක් තිබුණා. මේ වාගේ ආයතන පවරා ගෙන මොනවාද කරන්න තිබෙන්නේ? [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න ගරු ඇමතිතුමා. අහගෙන ඉන්න. [බාධා කිරීම්] දැන් ඔබතුමා මගේ වෙලාව ගත්තාම කොහොමද? මා ඔබතුමාගේ අමාත්‍යාංශය කරන වැඩ හොඳයි කිව්වා නේ. [බාධා කිරීම්]ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157වන ව්‍යවස්ථාව යටතේ මේ ආයතනවල safety guarantee කරලා තිබෙනවා. පසු ගිය සුමාන දෙක තුන තුළ කරපු අපරාධයෙන් ඒකට ප්‍රශ්නයක් වුණා. ඒ වාගේම මේවාට විරුද්ධව ICC international arbitration වලට යන්න ඒ කොම්පැනිවලට පුළුවන්. මේ කොම්පැනි අනිවාර්යයෙන්ම එතැනට යනවා. එතැනදී ඔබතුමන්ලා පරාද වුණොත් මොකද වෙන්නේ? අපි මෙතැන නීතිගත කරන ඒවාට එහෙම වුණොත් මොකද වෙන්නේ? ඒ අයට අයිතියක් තිබෙනවා එහෙම කරන්න. මොකද, මේවා මීට ප්‍රථම අත්සන් කර තිබෙන ගිවිසුම් නිසා. එයින් පරාද වුණොත් අපට ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ වාගේම ඒවාට BOI guarantee තිබෙනවා.

මේ රටට ආයෝජකයෙක් ඇවිල්ලා නිකරුණේ සල්ලි යොදවන්නේ නැහැ. ඒ යොදවන සල්ලිවලින් ආයෝජනයක් කරලා, රැකී රක්ෂා ලබා දීලා, ඔවුන් නැවත යන දවසේ ඒ ප්‍රාග්ධනයත් අරගෙන යන්න පුළුවන් ආකාරයටයි කටයුතු කරන්නේ. ඉතින්, සියයට 8 ක ආර්ථික වර්ධන වේගයක් ඇති කරන්න අවශ්‍ය නම් ඉස්සෙල්ලා ඊට අවශ්‍ය පසු බිම හදන්න අවශ්‍යයි. නමුත් ඔබතුමන්ලා මොකද කරන්නේ? එක පැත්තකින් බිම් බෝම්බ ටික ඉවත් කරනවා. අනෙක් පැත්තෙන් ආර්ථික බිම් බෝම්බ ටිකක් දානවා. ඒ නිසා තමයි සියයට අටේ ආර්ථික වර්ධන වේගය කවදාවත් ලබා ගන්න බැරි වන්නේ.

එක්සත් ජාතික පක්ෂය හැටියට අපි මේවා කුහකත්වයෙන් කියන්නේ නැහැ. 2001 චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ඍණ 1.4ට වැට්ටුව, ආර්ථිකය අපි හදා ගත්තේ කොහොමද? අපි ආයෝජකයන්ට විශ්වාසක් ඇති කරලා දුන්නා. ඒ මාස 24 දී සියයට 7ක වර්ධන වේගයක් ඇති කර දුන්නේ නිකම් නෙවෙයි. මෙන්න මෙහෙමයි, අපේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යන්නේ කියලා පෙන්වන්න අපට පුළුවන් වුණා. කරුණාකර ඒක කරන්න කියලා අපි කියනවා. මේ ආණ්ඩුව වැටුණාට පස්සෙ අපේ ආණ්ඩුව එනවා. අපේ ආණ්ඩුව එනකොට වැටිලා තිබෙන ආර්ථිකය හදන්න කල් ගන්නවාට වැඩිය හොඳයි, ඔබතුමන්ලා ආර්ථිකය වට්ටන්නේ නැතිව ආරක්ෂා කරන එක. ඊට පස්සේ ඊට වඩා ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කරන්න අපි සූදානමින් ඉන්නේ. [බාධා කිරීම්] එම නිසා ඉස්සෙල්ලාම කරන්න තිබෙන දේ තමයි, ආයොජකයන් මේ රටට ගෙන්වා ගැනීම. ආයෝජකයන් ගෙන්වා ගන්නට කරන්න ඕනෑ එකම දේ තමයි, නිෂ්පාදන වියදම අඩු කරන්න කටයුතු කරන එක.

වෙළෙඳ කලාප ගණනාවක් තිබෙනවා. වෙළෙඳ කලාපවල ඒ තරම් කාර්ය ශූර තත්ත්වයක් නෙවෙයි අද තිබෙන්නේ. පුළුවන් තරම් වැඩ කරන්න පුළුවන් සේවකයන් පුහුණු කරන්න අවශ්‍යයි. අද සාමාන්‍ය කම්කරුවකුට ඩොලර් 110ක් ගෙවන එක ලොකු ප්‍රශ්නයක්. ඉන්දුනීසියාවේ ගෙවන්නේ ඩොලර් 30යි, 35යි;

බංග්ලාදේශයේ ඩොලර් 45යි. දැන් අපට තිබෙන ලොකුම අභියෝගය වන්නේ, ආයෝජකයන් සියල්ලෝම Myanmar වලට යන එක.

ඇමෙරිකන් නිෂ්පාදකයෝ සහ ව්‍යාපාරිකයෝත් මියන්මාරයට ගියාම එතකොට අපට තරගකාරී තත්ත්වයක් ඇති වෙනවා; ලොකු අභියෝගයක් එනවා. ඉතින් මේවාට මුහුණ පාන්න වුණාම, මියන්මාරයේ ඩොලර් 20ක් මාසයකට ගෙවන්න වුණාම ඒක ප්‍රශ්නයක් වනවා කියන එක අපට යම් හෙළිදරව් කිරීම් තුළින් ප්‍රායෝගිකව පෙනෙනවා. බලන්න වියට්නාමයට ගියාම ඒක ලොකු අභියෝගක් වුණා, අපි සියලු දෙනාටම. ඒ නිසා කරුණාකරලා මියන්මාරයේ වන දේවල් ගැන බලා ගෙන අපි ඊට සාපේක්ෂව උත්තර දෙන්න ඕනෑ කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

දැන් නොවැම්බර් මාසයට ඉස්සෙල්ලා ඔබතුමන්ලාගේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට සාමාන්‍යයෙන් ආයෝජකයෝ 20ක්, 30ක් එන තත්ත්වයක් තිබුණා. දැන් එතැනට දවසකට ආයෝජකයෝ තුන්-හතර දෙනෙක්වත් එනවාද කියන ප්‍රශ්නය ඇති වෙලා තිබෙනවා. මම මේ නිකම් නොවෙයි කියන්නේ. ඒ ආයෝජන මණ්ඩලයේ ඉන්න අයම තමයි කියන්නේ, ආණ්ඩුව මේ ගෙන යන ප්‍රතිපත්ති තුළින් අපිටත් ප්‍රශ්නයක් ඇති වෙනවා කියලා. මොකද, roadshows දාලා ගිහිල්ලා මේ රට විකුණන කොට ඇයි මේ ආණ්ඩුවෙන් ඒවාම කරන්නේ කියන එකට උත්තර දෙන්න යන කොට, පරස්පර විරෝධී මත ඉදිරිපත් වුණාම ආයෝජකයෝ භය වෙනවා. ඒ නිසා ඉස්සර වෙලාම කරන්න තිබෙන දේ තමයි, කරුණාකරලා මේ තිබෙන ආර්ථික බිම් බෝම්බ ටික අහක් කරලා ඒකෙන් ජයග්‍රහණය කළොත් ඔන්න රට හරි මාර්ගයට ගෙන යන්න පුළුවන්.

ඊ ළඟ එක, විදුලි බිල. විදුලිය නිෂ්පාදනය කරන කොට ඒක ඉතාමත් අධික මිල මට්ටමකයි තිබෙන්නේ. මේ ආසියාවේ විදුලි බිල වැඩිම රටක් ලෙස තමයි ලංකාව නම් කරලා තිබෙන්නේ. වතුර බිලත් ඒ ආකාරයෙන්මයි. ඒ සම්බන්ධයෙන් අපි යම් විධියක තරගකාරී තත්ත්වයක් ඇති කළේ නැත්නම් ඔන්න දෙවැනි ආර්ථික බිම් බෝම්බය ලෙස තමයි අපි ඒවා නම් කරන්නේ. ඔබතුමාට මේ අමාත්‍යාංශයේ දරන්න තිබෙන ලොකුම අමාරුකම තිබෙන්නේ ඒ තුළයි. ඉතින් මේවාට උත්තර සපයන්න ඉස්සෙල්ලා අපි විපක්ෂයෙන් මේවා පෙන්වලා දෙන්නේ මොකද මේක රටේ ජාතික ආර්ථිකයට බලපාන නිසායි. මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආර්ථිකයක් නොවෙයි. මේ ලංකාවේ ආර්ථිකය ගැන අපි කථා කරන්නේ. ඉතින් ඉතාමත් ඕනෑකමින් අපි කියන්නේ එකතු වෙන්න, මේ සම්බන්ධයෙන් අදහස් යොමු කරන්න කියලායි. කථා කරලා වැඩ කටයුතු කරන්න කියන එක මම ඉතාමත් ඕනෑකමින් මතක් කරන්න කැමැතියි.

ඊ ළඟ කාරණය තමයි දූෂණය. මම හිතන හැටියට දැන් මේ මෑතකදී ඉදිරිපත් කරලා තිබෙනවා, corruption rates of each country. ඒ අනුව දැන් ලංකාව 86වැනි ස්ථානයේයි ඉන්නේ. දැන් මේකත් ලොකු බාධකයක් රටේ ආයෝජනයට සහ රටේ ආර්ථික සංවර්ධනයට. මේ සම්බන්ධයෙන් මොනවාද කරන්නේ? අද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වැඩ කරන්නේ නැහැ. විපක්ෂයේ එක්කෙනෙක්ගේ දෙදෙනෙක්ගේ පස්සේ දුව දුවා ඉන්නවා, ඊට පස්සේ ඔය පැත්තේ එක් කෙනෙක් හිරිහැර කරනවා නම් ඒක පස්සේ දුව දුවා ඉන්නවා මිස අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ කිසිම කාර්යක්ෂමතාවක් නැහැ. මේවා තමයි කාර්යක්ෂම කරන්න අවශ්‍ය වන්නේ. රටක් සංවර්ධනය කරන්න අවශ්‍ය නම් මෙන්න මේවා ඉලක්ක කරලා වැඩ කළොත් ඔන්න දැන ගන්න පුළුවන් වෙයි ඉදිරියේදී කොයි ආකාරයෙන්ද කටයුතු කරන්න අවශ්‍ය වන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි මේ රටේ අධිකරණ ක්ෂේත්‍රය. අධිකරණය කෙරෙහි විශ්වාසයක් ඇති කරන්න අවශ්‍යයි. උදාහරණයකට සෙවනගල ගනිමු. සෙවනගල ලංකාවේ ආයෝජකයෝ පමණක් නොවෙයි පිට රට කට්ටියත් ඉන්නවා. ඒකේ ඉන්නවා ස්විට්සර්ලන්තයේ ආයෝජකයෝ දෙදෙනෙක්, තුන් දෙනෙක්. ඒ වාගේම බ්‍රිතාන්‍යයේ ආයෝජකයෝ තුන්-හතර දෙනෙක් ඉන්නවා. බැරිවෙලාවත් ඒ අය ඒ රටවලට ගිහිල්ලා කිව්වොත්, "මෙන්න අපි ලංකාවට ගිහිල්ලා ආයෝජනය කළා; මේ වාගේ ප්‍රශ්නයක් ඇති වුණා; මම අධිකරණයට ගියා; නමුත් අධිකරණයෙන් ඒක පිළිගත්තේවත් නැහැ." කියලා. එතකොට මීට පස්සේ එන ආයෝජකයෝ මොකක්ද හිතන්නේ? මේ රටේ අධිකරණයෙන් සාධාරණයක් ඉෂ්ට කර ගන්න බැහැ කියලායි. මේක නිකම් banana republic එකක් වාගේ වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි හෙජින් සුදුව. ලංකාවේ අධිකරණය ඒක ප්‍රතික්ෂේප කරනවා. Arbitration ගිහිල්ලා ඒක දිනනවා. මේවා තමයි මට කියන්න තිබෙන කාරණා. ඔබතුමන්ලාගේ අදහස් මේ පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කථා කරලා තීරණය නොකර නිකම් හිතූ මතේ කටයුතු කිරීමෙන් ඇති වන ප්‍රති විපාකය නිසා තමයි අන්තිමට හෙජින් සූදුව වාගේ දේවල් ඇති වන්නේ. මේ ලංකාවේ අපිට international arbitration එකත් සමඟ සටන් කරන්න බැහැ. අපිට කියන්න පුළුවන්, "නැහැ, අපි පාර්ලිමේන්තුවේදී මේක තීන්දු කළා. ඒ නිසා ඔයගොල්ලෝ ඕනෑ එකක් කරන්න." කියලා. නමුත් ඊට පස්සේ වෙන්නේ ආයෝජකයෝ කවදාකවත් මේ පැත්තට එන්නේ නැති එකයි. ඉතින් ඇමතිතුමා මේ සම්බන්ධයෙන් කරුණාකරලා තීරණයක් ගන්න; වැඩ කරන්න.

Labour GSP එකත් ඒ වාගේම තමයි. අපි එදා විපක්ෂයක් වශයෙන් කරුණු 7, 8ක් කිව්වා. අපි කිව්වා, "ඔව්. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන දේවල් ක්‍රියාත්මක කරන්න. සුද්දන් කියන දේවල් කරන්න ඕනෑ නැහැ." කියලා. නමුත් එදා ඒක කළා නම් මොකද වෙන්නේ? එදා ජී.එල්. පීරිස් ඇමතිතුමා පුලපුලා ප්‍රතික්ෂේප කළා අරක නැහැ මේක නැහැ කියලා, දැන් පස්සේ දොරෙන් ගිහිල්ලා අරක කරමු මේක කරමු කියලා කථා කරනවා. එදා අපි මේ පාර්ලිමේන්තුවේ ප්‍රශ්න කරන කොට එතුමා කිව්වා නම්, "ඔව්, අපට ප්‍රශ්නයක් තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් කථා කරමු. විපක්ෂයේ උදව්වත් අපට ලබා දෙන්න" කියලා අන්න එතකොට තමයි රටක් ඉදිරියට ගෙන යන්න පුළුවන් වෙන්නේ. නැත්නම් ඒ ගොල්ලන්නට අවශ්‍ය වෙලාවට එක්සත් ජාතික පක්ෂයට බණිනවා. ඊට පස්සේ කියනවා, මොවුන් පිට රට ගිහිල්ලා දේශ ද්‍රෝහී ප්‍රකාශ කරනවා කියලා. ඊට පස්සේ පස්සා දොරෙන් ගිහිල්ලා ඒ අයම මේ ගැන කථා කරලා කරන දේවල්වලට තමයි හෙණ ගහන අපරාධ කියා කියන්නේ. ඉතින් මේ Labour GSP එක ගැන කරුණාකරලා බලන්න. මේක නිසා සියයට 11කින් ව්‍යාපාරිකයන්ට තිබෙන වරප්‍රසාදය නැති වීම කියන්නේ අපේ අපනයනකරුවන්ගේ නිෂ්පාදන වියදම සියයට 11කින් වැඩි වුණාය කියන එක බවයි මෙහිදී මතක් කරන්න අවශ්‍ය වන්නේ. ඒ සියයට 11 දුන්නා නම් ඉන්දියාවේ රුපියල අවප්‍රමාණය කිරීමට උදව්වක් වනවා. අප මෙහෙ නිෂ්පාදනය කළාය කිව්වාට එංගලන්තය ගන්නේ නැහැ. අපි මෙහෙ නිෂ්පාදනය කර "Made in Sri Lanka" කිව්වාට ඒක ඇමෙරිකාව ගන්නේ නැහැ. අන්තිමට සාපේක්ෂව හොඳම මිල තමයි බලන්නේ. මෙන්න මේ නිසා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මීට වැඩිය හොඳට කටයුතු කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි වාණිජ මණ්ඩලත්. අද වාණිජ මණ්ඩල ආණ්ඩුවට ප්‍රකාශ කිරීමක් විතරයි කරන්නේ. වාණිජ මණ්ඩල එක තැනක "Spineless Chambers" කියා තිබුණා. මම කියනවා, මේක "Spineless and gutless

[ගරු රවි කරුණානායක මහතා]

Chambers" කියා. ආණ්ඩුව කිව්වාම, බොහොම හොඳයි කියා ඒ ගොල්ලන් පත්තරවල අරක මේක දමනවා. ඊට පසු අපට ඇවිත් කියනවා, "ඇයි, එක්සත් ජාතික පක්ෂයේ උඹලා කෑ ගහන්නේ නැත්තේ?" කියා. අන්න එහෙම කොන්දක් නැති වාණිජ මණ්ඩල තමයි අද ලංකාවේ තිබෙන්නේ. ඒ ගොල්ලොන් භය වෙලා තිබෙනවා. මොකද, ඒ ගොල්ලෝ කෑ ගැහුවොත් අර සෙවනගල වාගේ පැල්වත්ත වාගේ ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ් වාගේ මේවාත් ගන්න තවත් පනත් කෙටුම්පත් ගෙනෙයි කියා භයක් තිබෙනවා. අනෙක් පැත්තෙන් "white van" සංකල්පය එනවා.

මෙන්න මේ වාගේ දේවල් තුළින් රටක් ඉදිරියට ගෙන යන්න බැහැ. මේක banana republic එකක් නම් යන්න පුළුවන්. නමුත් ශ්‍රී ලංකාවේ සියයට 8ක ආර්ථික වර්ධන වේගයක් ඇති කරනවා නම් මීට වැඩිය ලොකු වෙනසක් ඇති කරන්න අවශ්‍යයි. ඒ නිසා හිලරි ක්ලින්ටන් වාගේ උදවිය Myanmar වලට ගෙන යන්නේ නැතුව ලංකාවට ගෙනාවා නම්, කොතරම් වරප්‍රසාදයක් ලබා ගන්න පුළුවන් වෙයිද? ඇයි, බැරි වන්නේ? අවුරුදු 30ක් මේ රටේ ත්‍රස්තවාදය තිබුණු එකේ ඒ හිලරි ක්ලින්ටන් මෙහාට ආවා නම් ආයෝජන ගලා ගෙන මෙහාට එන්නේ නැද්ද? Myanmarවල -[බාධා කිරීමක්] ඕක තමයි තිබෙන ප්‍රශ්නය. අපි මේ ලංකාව. අපි ඇමෙරිකාවට ණය දෙනවා කියා ගෙන අන්තිමට අධි තක්සේරුවක් කර ගෙන නැති ප්‍රශ්න ඇති කර ගන්න එපා. ඔබාමාගේ හිසරදය ඔබාමාට විසඳා ගන්න ඉඩ දෙන්න. [බාධා කිරීමක්] මම කියන්නේ ඔය කැඩෙනවා වාගේ තමයි. රුපියල් බිලියන ගණන් තියා ගෙන කැඩිලා වැටිලා තියෙනවා. මේක නිකම් පිට රට කොම්පැනි වාගේ. Marks & Spencer පසු ගිය අවුරුද්දේ රුපියල් බිලියන 10ක විතර profit එකක් තියා ගෙන ඒක බිලියන 9ට අඩු වුණාය කිව්වාට කඩා වැටුණේ නැහැ. අපේ ආර්ථිකය කියන්නේ, අපි බංකොලොත්. රුපියල් බිලියන 500ක අලාභයක් තිබෙන රට රුපියල් බිලියන 600ක් වුණාම කඩාගෙන වැටෙනවා. ඕන්න ඕක තමයි තිබෙන වෙනස. ඒක ලාභයෙන් අඩු වීමක්. අපේ වියදම වැඩි වීමක්. [බාධා කිරීමක්] මේ ඇමති මණ්ඩලයේ හොඳම දේ. ඇමෙරිකාවට බැණ බැණ ඉඳලා ලංකාවේ සංවර්ධනය ගැන අපේ රාළහාමිට අපේ පොඩි මැණිකේට අපේ හකීම්ලාට අපේ දේවනායගම්ට කියලා වැඩක් නැහැ.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
අපි කියන්නේ ආදර්ශයට ගන්න කියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට අවශ්‍ය වන්නේ ඔබතුමන්ලාගේ ඒක පුද්ගල ආදායම සංසන්දනය කිරීම වාගේ දෙයක් තමයි. අපේ ඒක පුද්ගල ආදායම US Dollars 2300ක් කියලා කිව්වාට කාටද 26,500ක පඩියක් සහිත රක්ෂාවක් ලැබෙන්නේ? සියයට 90කට විතර ලැබෙනවාද? මේක තමයි ඒක පුද්ගල ආදායමේ වටිනාකම කියන්නේ. කරුණාකර, ඔබතුමන්ලා ඔය වාගේ දේවල් කියන විට ඊට වැඩිය ඉදිරියෙන් කටයුතු කරන්න ඕනෑ කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. විපක්ෂය හැටියට අපි කියන්නේ රටේ ආර්ථිකයට කොයි ආකාරයෙන්ද උදව් වන්නේ කියන කරුණුයි. ඒක මතක තියා ගන්න අවශ්‍යයි.

පොලීසිය තවත් සාධකයක්. අද අහුලානේ වුණේ ඒක; දොම්පේ වුණේ ඒක; කොළොන්නාවේ වුණේ ඒක. ඒ වාගේම කටුනායක වෙළෙඳ කලාපයේ වුණ දේවල් දැක්කාම මේ රටට එන ආයෝජකයෝ භය වනවා. මේ රටේ අධිකරණයෙන් සාධාරණයක් ඉෂ්ට වුණේ නැත්නම් පොලීසියට ගියාම ගහලා පැන්නුවා නම්, කෑ ගහලා එළෙව්වා නම් මෙන්න මේවා තමයි තියෙන ප්‍රශ්න. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මේ ගැනත් බලන්න අවශ්‍යයි. දවසකට සුද්දෝ කී දෙනෙක් එනවාද? ඇවිත් කථා කර අහනවාද? මෑතකදී දකුණු අප්‍රිකාවේ Deputy Foreign Minister ඇවිත් ඔබතුමාට කථා කළා. ඔබතුමා කිව්වා, බොහොම හොඳයි, මේ කොම්පැනිය එනවා, අර කොම්පැනිය එනවා කියලා. නමුත් අනෙක් පැත්තෙන් ඇහුවේ මොකක්ද? "ඇයි ඇමතිතුමනි, මේ වාගේ පනතක් පාර්ලිමේන්තුවට ගෙනාවේ?" කියායි.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
නැහැ, ඇහුවේ නැහැ. ඒක මා පැහැදිලිව කියනවා. ඒ උදවිය එහෙම කිව්වේ නැහැ. ඒ උදවිය ආයෝජනය කරන්න එනවාය කිව්වා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එහෙම නම් ඔබතුමා කියන එක මා පිළිගන්නම්. ඒ ආයෝජකයෝ කවදාද එන්නේ කියා අපි බලමු. මේ අවුරුදු තුළ එනවාද කියා බලමු. [බාධා කිරීමක්] ඔබතුමා අහගන්න. එතුමන්ලා ආණ්ඩුවට එනවා. ඇවිත් කියනවා, මෙන්න මේ මේ කොම්පැනි ටික එනවා. ඇවිත් ප්‍රශ්න කරනවා. එතුමන්ලා ඇවිත් විපක්ෂය එක්කත් කථා කරනවා. විපක්ෂයෙන් අහනවා, කොහොමද කියා. අපි විපක්ෂයක් වශයෙන් කිව්වා, "ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය එහෙම දෙයක් කිව්වා නම් බොහොම හොඳයි. එතුමන්ලාට වැඩක් කර ගන්න පුළුවන් අමාත්‍යාංශයක්" කියා. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය එහෙම කියනවා නම්, ඒ වාගේ දෙයක් වන්නේ නැහැයි කියා ලියුමක් ඉල්ලා ගන්න කියන එක විතරයි අපි කිව්වේ. අපි කිව්වා, "එහෙම කරන්න පුළුවන්" කියා. දැන් එනවා කියලා කියනවා නම් මේ අවුරුද්දේ එන්න අවශ්‍යයි. මෙන්න මේක තමයි කියන්න තිබෙන්නේ. අන්න ඒ සම්බන්ධයෙන්-[බාධා කිරීමක්] ඔබතුමන්ලා දන්න ආර්ථිකයක් නැහැ. මම ඇමතිතුමාත් එක්ක කථා කරන්නේ. [බාධා කිරීම්] මම මෙතැන හෙළිදරව් කරන්නේ නැහැ එතුමා මොනවාද කිව්වේ කියලා. බලා ගන්න අවශ්‍ය වන්නේ මේවා එනවාද නැද්ද කියන එකයි. [බාධා කිරීම්] ඒක තමයි තිබෙන්නේ. ඔබතුමන්ලා ඒ අයෝජන ගේන්නේ කටානටද, මේ ආයෝජන ගේන්නේ ඩී.ආර්. විජේවර්ධන මාවතටද? මේවා තමයි තිබෙන ප්‍රශ්න. අපි නොදන්නවා නොවෙයි. අපි දන්නවා ආර්ථිකය සම්බන්ධයෙන්. අපි බාධා කිරීමක් නොවෙයි කරන්නේ. අපිත් කැමැතියි අපේ රට සංවර්ධනය කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වේලාව අවසන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
DNA එකේ මිනිත්තු 20ක් තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Chief Opposition Whip, he wants time from the DNA. Is it all right?

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

Okay.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Hon. Ravi Karunanayake, do you want another five minutes more?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I need 15 minutes more. They have 25 minutes.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

That must be assured to the Chair.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඒ සම්බන්ධයෙන් අපට කරන්න පුළුවන් එකම දේ මෙයයි. කරුණාකරලා අපි මේ රටේ ජාතික ආර්ථිකය හදමු. ඒ ජාතික ආර්ථිකය හදන අවස්ථාවේ යුරෝපයේ Marks & Spencer, Next, ASDA, Sainsbury's වාගේ ආයතන ලංකාවට එන්න කැමැතියි. නමුත් ඒ අයට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි මේ රටේදී නිෂ්පාදන වියදම අඩු කර ගන්නේ කොහොමද කියන එක; මේ රටේ නැව්ගත කිරීම කරන්නේ කොහොමද කියන එක. ඒ අය මේ ප්‍රදේශය බලා තිබෙනවා. ඉන්දියාව, ලංකාව සහ බංගලාදේශය. [බාධා කිරීම්] ඉන්න කෝ. මේ තිබෙන ඒවා යවන්නේ නැතිව ඉන්න එක තමයි අපට දෙන්න තිබෙන තෑගි. ඉන්දියාව, පාකිස්තානය, බංගලාදේශය, මැලේසියාව, සිංගප්පූරුව, ලංකාව. මේකෙන් පස්වන ස්ථානයේ තමයි ලංකාව තිබෙන්නේ. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය දන්නවා, අපි ඉන්දියාව එක්ක සටන් කරලා, සිංගප්පූරුව එක්ක සටන් කරලායි ඉන්නේ. කරුණාකරලා මේ තිබෙන වරප්‍රසාදය නැති කරන්න එපා කියන එක මම ඉතාමත්ම ඕනෑකමින් ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා. බ්‍රිතාන්‍ය අපනයනකරුවන් මේ රටට ගේන්න පුළුවන් නම් ඒක තමයි වටිනාම දේ. දකුණු අප්‍රිකාවේ තිබෙන දේ බොහොම හොඳයි. නමුත් විශේෂ ආරක්ෂාව ලබා දීම තමයි ඒ අය ඉල්ලන්නේ. මම ඔබතුමාට ඉදිරිපත් කරන්නම් ඒ අය ඉදිරිපත් කළ ලියුම. ඉන් පසුව දැන ගන්න පුළුවන් මොන වාගේ අයෝජනයක්ද මේ රටට ගෙන්වා ගන්න පුළුවන් කියලා.[බාධා කිරීමක්] ඔය index පැත්තකට තියන්න ඇමතිතුමා.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

"Ease of Doing Business Index" වල එහෙම තිබෙනවා නම් ලංකාව ගැන කථා කරන්න තවත් ඕනෑ නැහැ නේ ගරු මන්ත්‍රීතුමා?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ඔය ඇමතිතුමා ඔහොම කථා කරනවා නම් මේ ගැන බලන්න. ඔබතුමන්ලාගේ index අනුව අද මලික් කාඩර් කොටස් වෙළෙඳ පොළේ නැහැ. අයින් වුණා. අද Mrs. Sugathadasa ඉල්ලා අස් වුණා. [බාධා කිරීමක්] ඔය investment index තුට්ටු දෙකකට වැඩක් නැහැ. අන්තිමට ලෝකයේ හොඳම කොටස් වෙළෙඳ පොළ කියලා කියපු එකේ, index එකේ මොකක්ද තිබෙන්නේ? අද මලික් කාඩර් නැති වුණා; අයින් වුණා. Mrs. Sugathadasa අයින් වුණා. Mrs. Sugathadasa කියන්නේ කවුද? ලලිත් වීරතුංග මහත්මයාගේ භාර්යාව. ඒ අය ඉල්ලා අස් වෙලා තිබෙනවා. නමුත් කොටස් වෙළෙඳ පොළ කඩා වැටීම නැවතුණේ නැහැ. මේ සම්බන්ධයෙන් අපට කියන්න තිබෙන්නේ ඒ අයට බැණලා වැඩක් නැහැ කියලායි. [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

Order, please! Let him continue and finish his speech.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ශ්‍රේරූ ආවා. එහෙම තමයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ඇමතිතුමන්ලා ඕවා ගැන හිතන්න ඕනෑ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ එහෙම දේශපාලනඥයෝ නොවෙයි. ඒ පැත්තට පැන්නා නම් ඒකට කමක් නැහැ. [බාධා කිරීමක්] ඒවාට භය වෙන්න එපා. අන්තිමට අපි

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නැති එක්සත් ජාතික පක්ෂයක් හදලා වැඩි කල් යන්නට කලින් මේ රට බේරා ගන්න ආණ්ඩුවක් හදනවා කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

ඔබතුමා ඒක ආරක්ෂා කරන්න-[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා, තමන්ගේ ආසනයට යන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේ වාගේ සුහදව, මේ අයට තිබෙන වෙලාවෙන් මිනිත්තු පහක් කපා හැරලා අපට ලබා දෙන්න. මේ අවස්ථාවේදී අපට කියන්න තිබෙන එකම දේ තමයි කරුණාකරලා මීට වැඩිය ඕනෑකමින් මේ තිබෙන සාධක ටික හදා ගන්න කියන එකයි. මේවා තමයි ඉදිරියට ගෙන යන්නේ. කොටස් වෙළෙඳ පොළේ වැටීමට සුගතදාස මැතිනියට බැණලා වැඩක් නැහැ. මලික් කාඩර්ට බැණලා වැඩක් නැහැ. අන්තිමට මොනවාද වෙලා තිබෙන්නේ? ආණ්ඩුවේ තිබෙන ප්‍රතිපත්ති නිසා තමයි මේක කඩා වැටෙන්නේ. එක පැත්තකින් expropriation - [බාධා කිරීම්] මොකක්ද? ඉතිහාසයේ ජීවත් වෙලා වැඩක් නැහැ නේ. ඔබතුමන්ලා කරන එකම දේ තමයි අවුරුදු 30ක් තිබුණ යුද්ධය ගැන කථා කරනවා. මාස 30ක යුද්ධය නැති ආර්ථිකය ගැන කථා කරන්න. කෝ ඒකේ ප්‍රතිලාභය? ජීවන වියදම අඩු වුණාද? ආයෝජකයෝ වැඩි වුණාද? [බාධා කිරීම්]

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ඔබතුමාත් share market එකේ ඉන්නවා නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඇමතිතුමා අපි කරන දේ බොහොම විවෘතයි. අපේ තිබෙන දේවල් assets and liabilities ඔක්කොම තිබෙනවා. බලන්න ඕනෑ දෙයක් බලන්න. ඒ සම්බන්ධයෙන් අපි කියන්නේ මේ රටේ- [බාධා කිරීම්] අපේ කාලයේ තිබුණු මාස තිහේ ඒ සංවර්ධනය නිසා තමයි තවමත් මේ ආණ්ඩුව යන්නේ කියන එක මා ඉතාමත් ආඩම්බරයෙන් කියන්න කැමැතියි. මේක තමයි තිබෙන ප්‍රශ්නය. මා නැවත වරක් කියන්නේ සුගතදාස මැතිනියට, මලික් කාඩර්ට බැණලා වැඩක් නැහැ කියලායි. රටේ ප්‍රතිපත්තිය හදා ගන්න. මේ රටේ තිබෙන පෞද්ගලික ව්‍යාපාර රජයට පවරා ගන්නේ නැතිව, මේ රටේ හරි විදේශ විනිමය අනුපාතයක්, හරි බදු ප්‍රතිපත්තියක් තිබුණා නම් ඔය කොටස් වෙළෙඳ පොළ කඩාගෙන වැටෙන්නේ නැහැ. ඇමෙරිකාවේ Wall Street එක කඩාගෙන වැටෙන කොට මේ ආයෝජකයෝ ගිහිල්ලා ඔබාමාගෙන් ඉල්ලන්නේ නැහැ මොනවාද කරන්න තිබෙන්නේ කියලා. එහේ තිබෙන Federal Reserve එක ගැන ප්‍රතිපත්ති අනුව හදාගන්නවා. මෙහේ එක්කෙනා මොනවාද කරන්නේ? ආණ්ඩුවට ගිහිල්ලා සින්දු කියනවා. එච්චරයි කරන්නේ. දැන් උද්ධමනය සියයට 5යි කියලා ප්‍රකාශ කරනවා. අප ඔක්කොම දන්නවා. ගිය අවුරුද්දේ රුපියල් සියයේ වටිනාකම මේ අවුරුද්දේ කීයද? දැන් ඒක අඩු වෙලා තිබෙනවා නම් උද්ධමනය අඩු වෙලා තිබෙන වටිනාකම මොකක්ද? ඔබතුමාගේ අර Investment Index එක වාගේ තමයි. මහ බැංකුවේ අරක දමනවා, මේක දමනවා [බාධා කිරීම්]හදන්න ඕනෑ නැහැ. Colombo Consumer Index එකේ මොනවාද තිබෙන්නේ? ඒකේ සිගරට් නැහැ. ඒකේ අරක්කු නැහැ. ඒකේ අවශ්‍ය දේවල් දහයක් විතර නැති එකෙන් තමයි උද්ධමනය නැද්ද කියලා බලන්නේ. අප මේ අවස්ථාවේදී අහන්නේ ඒකයි. දැන් බලන්න කඩදාසි කම්හල. ඒක එක පාරට දමනවා ටෙන්ඩර් එකක් නැතිව. කාටද විකුණන්නේ?

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)
ටෙන්ඩර් එකක් දැම්මා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කොහේද දැම්මේ? අපට පේන්න තිබෙන ඒවා නොවෙයි. නමුත් අන්තිමට දමලා තිබෙන්නේ Perth Engineering and Maintenance (Pvt.) Limited; Western Australia වල contact person - Mr. Priyanga Mallawarachchi, occupation - one of the Directors, Perth Engineering and Maintenance (Pvt.) Limited, Western Australia මේකේ මොනවාද තිබෙන්නේ? ඒ කොම්පැනියේ වැඩ කරන්න 30 දෙනෙක් ඉන්නවා. Hive Resource Recovery (Pvt.) Limited [බාධා කිරීමක්] ගරු ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඉඳගන්න. ඔබතුමා ආර්ථිකය ගැන දන්නවාද? ඔබතුමා අර මාවනැල්ලේ ගිහිල්ලා මුස්ලිම් පල්ලි කඩනවා වාගේ ආර්ථිකය කඩන්න එපා. අහගන්න ටිකක්. ගරු ඇමතිතුමනි, කරුණාකරලා මේක search කරලා බලන්න. ඊට වැඩිය කාගේද කාගේද කියලා කියන්න ඕනෑ නැහැ. ඔබතුමා බලාගන්න. මේ මිලියන 600කට අවුරුදු 30ක් දුන්නාම තව අවුරුද්දක් යන්න ඉස්සර වෙලා මේක යටතේ නැවත මේ වාගේ පනත් ගෙනැල්ලා මේවා ගන්න වේවි. මේකේ වැඩ කරන්න තිස් දෙනායි ඉන්නේ.

ඊළඟට බලන්න, සෙවනගල කර්මාන්තශාලාව. ඒක රජයට ගන්නවා; ලාභ තිබෙන ආයතනයක්. මොකක්ද මේකේ තිබෙන්නේ? ඔබතුමන්ලා කියනවා බදු ගෙවන්නේ නැහැ කියලා. Tax holiday එකක් තිබෙන කොම්පැනියක්. පැල්වත්ත බලන්න. මිලියන 400ක් profit ඇති කරනවා. මේවා අරගෙන මොනවාද ලැබෙන්නේ?

**ගරු ලලිත් දිසානායක මහතා**
(மாண்புமிகு லலித் திசாநாயக்க)
(The Hon. Lalith Dissanayake)
ඒවා දුන්නේ කසිප්පු හදන්න නොවෙයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලාගේ එකම වැරැද්ද තමයි කියන දෙය අහගන්නේ නැති කම. ඇහුවාට පස්සේ උත්තර දෙන්නේ නැහැ. ඔබතුමන්ලා නිකම් කෑ ගහන එක නොවෙයි කරන්න ඕනෑ. ඔබතුමන්ලාගේ ආයෝජන මණ්ඩලය පැල්වත්තට, සෙවනගලට ලියුමක් දීලා තිබෙනවා, මෙන්න මේකේ tax ගෙවන්නේ නැහැ, මෙන්න මේක තමයි ගෙවන්න තිබෙන්නේ, මෙන්න මේ වාගේ ඒවා ගෙවලා තිබෙන්නේ කියලා. ඉතින් ඔබතුමන්ලාගේ දකුණු අත කරන්නේ මොකක්ද කියලා වම් අත දන්නේ නැත්නම් කරුණාකරලා ඒක දැන ගන්න.

ඒ ආයෝජනය ගැන තව කථා කරන්න ගියොත් මට අනික් ක්ෂේත්‍රය ගැන කථා කරන්න වෙලාව නැති වෙනවා. අනික් එක තමයි සංචාරක කර්මාන්තය. ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමා මෙතැනට ඇවිල්ලා අය වැය කථාවේදී කිව්වා පිට රට සංචාරකයෝ මේ රටට ඒමෙන් මිලියන 2,000ක් හොයනවා කියලා. එක පැත්තකින් කියනවා දැන් online visa system එකක් ඇති කරනවා, ඒකට US Dollars 10කුත් US Dollars 20 කුත් අතර ප්‍රමාණයක් තමයි යන්නේ කියලා. මම මේකේ මධ්‍යස්ථය ගත්තා. ඒක US Dollars 15ක් වෙනවා. මේකේ මිලියන 2,000ක් උපයන්න මිලියන 1,300ක් එන්න තිබෙනවා. ඒ කියන්නේ ලක්ෂ 13ක පිරිසක් එන්න තිබෙනවා. ඔබතුමන්ලාම පිළිගන්නවා එන අවුරුද්දේ සංචාරකයන් ලක්ෂ අටහමාරක්, ලක්ෂ නවයක් එන්නේ කියලා. ඉතින් තමන්ගේ ඇස්තමේන්තුව සම්පූර්ණයෙන් වැරැදියි නේද? ඔබතුමන්ලා එක පැත්තකින් කියනවා මිලියන 2,000ක් ලැබෙනවා කියලා. අනික් පැත්තෙන් කියනවා මෙන්න අප මිලියන 2,000ක් ඇස්තමේන්තු කළාට එන ප්‍රමාණය මේකයි කියලා. ඉතින් කෙළින්ම ඒකෙන් මිලියන 600ක් විතර අඩු වෙනවා. අද මේ 7වැනි අය වැය තුළින් බිලියන 1,120ක ආදායමක් පෙන්වන එකේ අඩු ගණනේ සියයට 20ක් වැඩියෙන් පෙන්වලා තිබෙන්නේ. ඉතින් අන්තිමට පරතරය වැඩි වෙනවා. දැන් බලන්න, තමන්ගේ රුපියල අවප්‍රමාණය කිරීමෙන් මොනවාද වෙලා තිබෙන්නේ කියලා. කෝටි 8,100ක් වැඩි වුණා. අපේ හිඟය බිලියන 467යි නැත්නම් කෝටි 45,800යි. මේ කෝටි 8,100 එකතු කළොත් අන්තිමට අය වැය හිඟය සියයට 7.3කට වැඩි වෙනවා. ඉතින් 7.3කට වැඩි වෙනවා කිව්වාම මෙතැන තිබෙන පරතරය තමන්ගේ ආදායම වැඩි කරනවාද? තමන්ගේ බදු ප්‍රමාණය වැඩි කරනවාද? නැත්නම් ප්‍රාග්ධන වියදම් අඩු කරනවාද කියන එක තමයි ඔබතුමාගෙන් අහන්න තිබෙන්නේ.

විරුද්ධ පාර්ශ්වය වශයෙන් අපට තිබෙන වගකීම ඔබතුමන්ලාගේ අඩු පාඩුකම් ටික පෙන්වලා දෙන එක. ඒවා පාවිච්චි කරන එක ඔබතුමන්ලාගේ දක්ෂතාව. හැබැයි, මේ මොනවා කළත් රටේ ආර්ථිකයත් එක්ක සෙල්ලම් කරන්න එපා කියන එක තමයි අපි කියන්නේ. ඔබතුමන්ලාගේ බොහෝ දෙනා World Travel Mart එකේ සිටියා. මමත් ඒ කාලයේ එංගලන්තයේ ඒ හරියේ සිටියා. අපට අහන්න පුළුවන්, කී දෙනෙක් මේකට ඇවිල්ලා ලංකාව ගැන යම් කිසි විධියක

සෝදිසියක් කළාද කියලා. ගිය අවුරුද්දට වඩා අඩු ප්‍රවණතාවක් මේ අවුරුද්දේ තිබුණායි කියලා එංගලන්තයේ Sri Lanka Ambassador නෝනිස් මහතා කිව්ව බව මම ඉතාමත් ඕනෑකමින් කියනවා. ඒ කියන්නේ ලංකාවේ තිබෙන වරදක් නොවෙයි, යුරෝපයේ ආර්ථිකය කඩා වැටිලා තිබෙන නිසායි. ලාබෙට මෙහාට එන්න පුළුවන්කම ලැබීම, නැතිනම් tour operatorsලාට යම් විධියේ වරප්‍රසාද දෙන එක -මේවා- තමයි කරන්න ඕනෑ කරන්නේ සංචාරක කර්මාන්තය වැඩිදියුණු කරන්න අවශ්‍ය නම්. නැත්නම් මෙහේ ඉඳගෙන, අපේ ලංකාව කොච්චර හොඳද කියලා ලෝකයට කියලා වැඩක් නැහැ. විදේශිකයන්ට කියන්න අවශ්‍යයි, තායිලන්තයට යන්නේ නැතුව, මාලදිවයිනට යන්නේ නැතුව, බංග්ලාදේශයට හෝ ඉන්දියාවේ ගෝවේවලට යන්නේ නැතුව, ඉන්දුනීසියාවට යන්නේ නැතුව අපේ ලංකාවට එන්න කියලා. ඒ ඇයි කියලාත් පහදලා දෙන්න අවශ්‍යයි.

ඒ සම්බන්ධයෙන් තවත් වැදගත් කොටසක් තමයි, MICE tourism. ඒ කියන්නේ, Meetings, Incentives, Conventions and Exhibitions. මේවා අපි ඇදලා ගන්න අවශ්‍යයි. මොකද, මේ සම්බන්ධයෙන් තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි fixed rate එකක් දමා ගෙන minimum rate එක තියා ගෙන කවදාවත් MICE tourism ක්‍රියාත්මක කරන්න නොහැකි වීම. අද තායිලන්තයට ගියොත් තරුපහේ හෝටලයක් යූඑස් ඩොලර්ස් 75කට 80කට ගන්න තිබෙන කොට, MICE සංචාරක කර්මාන්තය කවදාවත් මේ රටට ඇද ගන්නට ඔබතුමන්ලාට බැරි වෙනවායි කියන එක තමයි මම මේ අවස්ථාවේදී මතක් කරන්නේ.

අපි සාමාන්‍යයෙන් රුපියල් බිලියන 333ක, ඒ කියන්නේ රුපියල් කෝටි 33,300ක සිමෙන්ති, යකඩ, ඖෂධ හා ඇඟලුම් කර්මාන්තය සම්බන්ධයෙන් ද්‍රව්‍ය ආනයනය කරනවා. මෙයින් සියයට 10ක් ලංකාවේ නිෂ්පාදනය කරන්න පුළුවන් නම් තමයි අපේ රටේ ආර්ථිකය සවි ශක්තිමත් කරන්න පුළුවන් වන්නේ. ඒ වාගේම රුපියල් කෝටි 16,700ක් අපේ ආහාර සම්බන්ධයෙන් -ඒ කියන්නේ වියළි ආහාර, කිරි ආහාර ද්‍රව්‍ය, තිරිඟු සහ සීනි ආනයනය කරන්නට- වැය කරනවා. මෙයින් සියයට 15ක් මෙහි නිෂ්පාදනය කරන්න පුළුවන් නම්, අපේ ආර්ථිකය සවි ශක්තිමත් කරන්න පුළුවන් මාර්ගය එතැනින් තමයි පටන් ගන්නේ. ඒ වාගේම තමයි රුපියල් කෝටි 33,300ක අපි ඛනිජ තෙල් ආනයනය කරනවා කියන එක.

දැන් අපි අහනවා,"කොළඹ නගර සභා ඡන්ද කාලයේදී මන්නාරමෙන් හම්බ වුණායි කිව්ව ගෑස් ටික කෝ?" කියලා. පේසාලේ තිබෙනවා යයි කිව්ව ඛනිජ තෙල් ලැබුණාද? මෙන්න මේ වාගේ ජනතාව නොමඟ යවන ප්‍රකාශ කරලා අන්තිමට මේවා තුළින් -[බාධා කිරීමක්] කොහෙන්ද ගෙනෙන්නේ? ඔබතුමන්ලා කොළඹ මහ නගර සභා ඡන්ද කාලයේදී හම්බ වෙලා තිබෙනවායි කිව්ව තෙල් හම්බ වෙලා තිබෙනවා නම් මේ රටට ඉදිරිපත් කරන්න, ඒ තෙල් ටික, ගෑස් ටික ලබා ගන්න පුළුවන් වන්නේ කොහෙන්ද කියලා.

ඇඟලුම් කර්මාන්තයට රුපියල් 75ක බද්දක් දැම්මාම තරගකාරී තත්ත්වයට නැවත ප්‍රශ්නයක් ඇති වනවා. ඒකෙන් ලැබෙන ආදායමට ඇති කර තිබෙන හානිය මොකක්ද කියන එක මම මේ වේලාවේදී මතක් කරන්න කැමැතියි.

මම මේ අවස්ථාවේදී තවත් වැදගත් දෙයක් කියන්න තිබෙනවා ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන්. මම මේක කියන්නේ ක්‍රිකට් ක්ෂේත්‍රයටත් ඔබතුමන්ලාගේ සංචාරක කර්මාන්තයටත් අතිවිශේෂ නිසා. මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමාගෙන් මම මේ ගැන ප්‍රශ්න කරලා තිබෙනවා. මම එතුමාව අගය කරනවා, එතුමා පාර්ලිමේන්තුවට අවංකව කිව්වා, "ඔව්, අපේ ඒ ක්‍රීඩකයන්ට ගෙවුවේ නැහැ" කියා. [බාධා කිරීමක්] ඉන්න කෝ ඇමතිතුමා. ඔබතුමාට හොඳක් කිව්වොත් නරකයි, නරකක් කිව්වොත් හොඳයි. [බාධා කිරීමක්] ෆ්‍රෙන්ඩ් කියලා ඔළුව අත ගාලා ටොකු දෙන ඇමතිවරයෙක් තමයි ඔය ඉන්නේ. කමක් නැහැ, අපේ ඔළුවට ටොකු ටික ගන්න පුළුවන් නිසා අපි භයක් නැතුව කියනවා. ලංකාවයි, බංග්ලාදේශයයි අතර ICC එකේ ක්‍රීඩා තරගයක් පැවැත්තුවාම tax free status එකක් දීලා තිබුණා. ජනාධිපතිතුමා ඒ tax free status එක අන්තිමට දීලා තිබෙන්නේ 2006 දී. ඒක හරි හොඳයි. කිසි ප්‍රශ්නයක් නැහැ. නමුත් ඉන්දියාවේ එහෙම දීලා ඒක ප්‍රශ්නයක් වෙලා ඒක පාර්ලිමේන්තුවේ හෙළිදරව් කරලා තිබෙනවා. ඒ දීලා තිබෙන සියලු දේම නැවත ගන්න ඕනෑ කියලා ඉන්දියාවේ ඒ Financial Standing Committee එක තීරණය කරලා තිබෙනවා. දැන් මෙහේ අපට තිබෙන ප්‍රශ්නය තමයි, අදාළ audit වාර්තා තවම දීලා නැති එක. ඇමතිතුමා ඊයේ පාර්ලිමේන්තුවේ දී මේක දුන්නායි කියලා කිව්වාට තාම ICC එක එය භාර අරන් නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )
දීලා තිබෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා කිව්වාට Cricket Board එකෙන් තවම දීලා නැහැ. මම එය වග කීමකින් කියනවා. අපට ඒ සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්නය තමයි ඒ tickets 21,800 කොහෙන්ද ලැබුණේ, කොහොමද නැති වුණේ කියන එක.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ද ක්‍රීඩා ඇමති, ඔබතුමාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඇමති. ඔබතුමා ඇමති වුණාට එහේ වෙන දේවලුත් මම දන්නවායි කියන එක මතක තියා ගන්න අවශ්‍යයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඉතින් අපි යැව්වා නේ මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා එක එක්කෙනාගේ photocopy උස්සා ගෙන - [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, නැහැ. අපි photocopy උස්සන අය නොවෙයි. අපි original අය. අපට duplicate අවශ්‍ය නැහැ. මේ සම්බන්ධයෙන්

[ගරු රවි කරුණානායක මහතා]

ICC එකෙන් සල්ලි ලැබෙන්න තිබෙනවා නම් ඒක බලපානවා ඉන්දියාවට; ඒක බලපානවා බංග්ලාදේශයට.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා සජිත්ට නේ ගැහුවේ, duplicate කියලා. එහෙම කරන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මහත්තයෝ, ඕනෑ විධියකට අපේ සටන අපි කරන්නම්. අපේ පක්ෂයේ සියලු දෙනාවම අපි ආරක්ෂා කරනවා. අපේ අභ්‍යන්තරයේ වෙන දේවල් අපි බාහිරට දෙන්නේ නැහැ. ඒවා ගැන භය වෙන්න ඕනෑ නැහැ. [බාධා කිරීම්] ඇත්ත කියන කොට තිත්තයි. ඔබතුමන්ලා බදු ගහලා, බදු ගහලා, මේ ආර්ථිකය - [බාධා කිරීම්] එක්සත් ජාතික පක්ෂයේ අපේ මන්ත්‍රීවරුන් 55ක්, 60ක් සිටියත් අපේ තිබෙනවා quality එකක්. ඔබතුමන්ලාගේ quantity තිබුණාට කිසිම ගුණාත්මක භාවයක් නැති එක තමයි තිබෙන්නේ. ඒ නිසා තමයි මෙහෙන් nuts ටික ගන්න හදන්නේ, මැෂිම දුවන්න. හැබැයි nuts ටික ගත්තාට කැඩිලා තිබෙන මැෂිම කවදාවත් වැඩ කරන්නේ නැහැ යි කියන එක මා වගකීමෙන් කියන්න කැමැතියි. [බාධා කිරීම්] ඔබතුමන්ලා අවුරුදු 20ක් කැගැහුවත් කවුද අධ්‍යාපන ඇමති? එක්සත් ජාතික පක්ෂයෙන් පැනපු එකෙක්. [බාධා කිරීම්] ඔබතුමන්ලාගේ ධීවර ඇමැති කවුද? ඒත් එක්සත් ජාතික පක්ෂයෙන් පැනපු එකෙක්. තමුන්නාන්සේලාගේ External Affairs' Minister එක්සත් ජාතික පක්ෂයෙන් වියුණන් ගත්ත එකෙක්. [බාධා කිරීම්]මේ බලන්න, ෆවුසි ඇමතිතුමා, එදා ඉඳලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට දර දිය ඇද්ද ජ්‍යෙෂ්ඨ ඇමතිවරයෙක්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා කවුද? [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඊළඟට මර්වින් සිල්වා, එක්සත් ජාතික පක්ෂයට වැඩ කරපු එක්කෙනෙක්. ඉතින් ඔන්න ඕක තමයි කියන්නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, [බාධා කිරීම්] Order, please!

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් බලන්න කෝ, මෙතැන සිටින එකම කාන්තාව වන අපේ පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමියත් - [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, [බාධා කිරීම්] Order, please!

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැඩක් නැහැ. [බාධා කිරීම්] ඒවා තමයි bullet බඩු. [බාධා කිරීම්] ඒක තමයි එතුමා bullet බඩුවක් වෙන්නේ. [බාධා කිරීම්] දැන් මේ ආයෝජන මණ්ඩලයේ - [බාධා කිරීම්] ඔන්න ඔය වාගේ හැසිරීමෙන් තමයි - [බාධා කිරීම්] එදා මේ සභාවේ ගැලරියේ තානාපතිවරුන් ඔක්කොම සිටින කොට, ඔබතුමන්ලා ඇවිල්ලා අපේ පැත්තේ මන්ත්‍රීවරුන්ට ගහලා යන කොට -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා -[බාධා කිරීම්] Order, please! [බාධා කිරීම්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මේකේ තිබෙන වැදගත්ම දේ තමයි, ගයන්ත කරුණාතිලක මගේ පාසල් මිත්‍රයා කියනවා - [බාධා කිරීම්] සභාපතිත් එක්සත් ජාතික පක්ෂයෙන් පැනපු පුද්ගලයෙක් කියලා. ඉතින් ඒ නිසා දැන් බලන්න, හැම තැනම - [බාධා කිරීම්] හැබැයි වෙලා තිබෙන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කැබිනට් මැෂිමත් - [බාධා කිරීම්] අපෙන් ගත්තු nutsවලින් ඒ මැෂිම දුවන්න බැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා - [බාධා කිරීම්] Order, please! තමුන්නාන්සේට mike එකත් නැහැ. Order, please! ගරු මන්ත්‍රීතුමා මූලාසනයට සවන් දෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. මන්ත්‍රීවරුන් ගැන සඳහන් කරන කොට "එකෙක්" කියලා කියන්න එපා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, ඇමතිවරුන් ගැන සඳහන් කරන කොට මෙහේ ඉඳලා එහෙට ගිය "එකෙක්" කියලා කිව්වා. එහෙම කියන්න එපා. "කෙනෙක්" කියලා කියන්න, නැත්නම් "මන්ත්‍රීවරයෙක්" කියලා කියන්න. [බාධා කිරීම්] ඒ වචනය හරිගස්සා ගන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හරි. ඉතින් -

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார )
(The Hon. A.P. Jagath Pushpakumara )
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රීති ප්‍රශ්නයක් තිබෙනවා. මෙතුමා 1994 අවුරුද්දේ ශ්‍රීමනී මැතිනියගේ සාරි පොටේ එල්ලිලා ඇවිල්ලා, මේ පැත්තේ ඉඳලා AirLanka Catering Services එක දුන්නේ නැහැයි කියලායි අනෙක් පැත්තට ගියේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. Hon Member, you can continue with your speech .

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමන්ලා වාගේ දොඹකරය උඩට ගිහිල්ලා ශබ්ද කරන්නට වුවමනා නැහැ අපට. අපි දේශපාලනයට ඇවිල්ලා පාඩු ලබලා

තිබෙන පුද්ගලයන් වශයෙන් අපි කවදාවත් වරප්‍රසාද පසුපස ගිහිල්ලාත් නැහැ; යන්නේත් නැහැ. තමුන්නාන්සේ ඒක මතක තබා ගන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව තුළින් අපට නඩු 51ක් දමලා, අපිව භය කරන්නට හැදුවාට, භය වෙන්නේ නැති මන්ත්‍රීවරුන් ලෙස තමයි අපි එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ. ඔබතුමන්ලාගේ වාගේ, මන්ත්‍රීවරයෙකුට ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ප්‍රශ්නයක් තිබුණාය කියලා පනින්නේ නැහැ. ඇමතිකමක් දෙනවා කියලා පනින්නේ නැහැ. ඉතින් ඒ නිසා - [බාධා කිරීම්] ඔබතුමන්ලා මට බාධා කරන්න එපා. මේක තමයි ඇමති මණ්ඩලය බැසිල් රාජපක්ෂට විරුද්ධව කරන කුමන්ත්‍රණය. වැඩ කරන එකම අමාත්‍යාංශය තුළ එතුමාට වැඩ කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඕක තමයි කරන්න හදන්නේ. ඒ නිසා මා මේ ඕනෑකමින් කියන්නේ, ඔබතුමන්ලා පිටස්තරව කරන කුමන්ත්‍රණය අද පාර්ලිමේන්තුව ඇතුළේත් කරන්න එපා කියලායි. [බාධා කිරීම්] දැන් විපක්ෂයේ අපි ඕවා ගැන කියන කොට ආණ්ඩු පක්ෂයේ අය ඊර්ෂ්‍යා කරනවා. මොකද, එතුමා වැඩ කරන අමාත්‍යවරයෙක් වශයෙන් - [බාධා කිරීම්] ඉතින් කරුණාකරලා මා කියන්නේ - [බාධා කිරීම්]වැඩ කරන අමාත්‍යාංශ ගැන අපි කියනවා. අපි විපක්ෂය විධියට කියන්නේ, ඔබතුමන්ලා මේ ආර්ථිකය සම්බන්ධයෙන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

[බාධා කිරීම්] මේ රටේ ආර්ථිකය හදන්න තිබෙන එකම පක්ෂය එක්සත් ජාතික පක්ෂයයි කියන එක අනිවාර්යෙන් මතක් කරන්න කැමැතියි. [බාධා කිරීම්] ඔව්, ඔහොම තමයි 2001 අවුරුද්දේ චන්ද්‍රිකා කුමාරතුංග ආර්ථිකය වැට්ටුවේ. ඒ වට්ටපු ආර්ථිකය හැදුවේ අපියි කියන එකත් මතක් කරන්නට කැමැතියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමන්ලාගේ නායකයා කවුද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ නායකයා රනිල් වික්‍රමසිංහ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, [බාධා කිරීම්] Order, please! - [*Interruption.*]

Order, please! The time allotted to you - [බාධා කිරීම්] අහන්න. නැත්නම් record වෙන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මහත්තයෝ, අපි මේ හම්බන්තොට බඩුවලට බය නැහැ. [බාධා කිරීම්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, your speech is not being recorded. - [*Interruption.*] You listen to the Chair.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපට තිබෙන්නේ ඍජු ප්‍රතිපත්ති.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage )
Mike එක off කරලා තිබෙන්නේ. දැන් කථා කරන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, your time is up but I think the Chief Opposition Whip wants to give you five minutes more. You wind up your speech sharp at the end of the five minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Yes, he will ensure that we are supported at every given moment.[බාධා කිරීමක්] අපට කපන්න ඕනෑකමක් නැහැ. අපි දොඹකර උඩට ගිහිල්ලා කථා කරන්නේ නැහැ. අපි කියන දේ මූණටම කියනවා. ඒක මතක තියා ගන්න. [බාධා කිරීමක්] මේ දවස්වල හම්බන්තොට ග්‍රහයෝත් වෙනස් වෙනවා. ඒකත් මතක තියා ගන්න.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මොකක්ද? මොකක්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, ඒවා ඕනෑ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හම්බන්තොට ග්‍රහයා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මා කිව්වා, මේ, ග්‍රහයෝ වෙනස් වන දවස් කියලා. ඒක හම්බන්තොටට හුඟක් බලපාලා තිබෙනවා. ජනාධිපතිට, ඒ පැත්තේ ඉන්න හැම දෙනාටම ඒක බලපානවා කියන එක මතක තියා ගන්න. හම්බන්තොට කිව්වාම- [බාධා කිරීම්] අපි අපේ ගරු මන්ත්‍රීවරුන් ආරක්ෂා කරන්නම්. රනිල් වික්‍රමසිංහ, කරු ජයසූරිය, සජිත් ප්‍රේමදාස ගැන වචනයක්වත් කියන්න ඕනෑ නැහැ. අපි සුහදව අපේ වැඩේ කරන්නම්. අපි ඔක්කෝම එකතු වෙලා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් හදනවා කියන එක මතක තියා ගන්න. [බාධා කිරීම්] ඔබතුමන්ලා ආරක්ෂක අමාත්‍යාංශයෙන් ගිහිල්ලා කත් ඇද්දාට, ප්‍රශ්න ඇති කරන්න හැදුවාට ඊට වඩා සමඟියක් අප අතර තිබෙනවා කියන එක අප වැඩි කල් යන්න ඉස්සර වෙලා පෙන්වනවා කියා මම වගකීමකින් කියන්න කැමැතියි.[බාධා කිරීම්] ජාතික සංවිධායක වශයෙන් තිබෙන එකම දේ තමයි අපේ තිබෙන සියලුම ප්‍රශ්න විසඳීම- [බාධා කිරීම්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
රංජිත් මද්දුම බණ්ඩාර ගැන මොකද කියන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ බොහොම හොඳ මිත්‍රයෙක්. බොහොම හොඳ මිත්‍රයෙක්. අර විරෝධතා රැළියට වැඩියෙන්ම ජනතාව ගෙනාපු පුද්ගලයා රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමාය කියලා මා මතක් කරන්න කැමැතියි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තව මාසයකින් සජිත් නායකයා වුණොත් මොකද කියන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක නිකම් සිහින මවන දෙයක් නේ. ඒක වෙන්නේ නැති දෙයක් නේ. කවදාවත් එක්සත් ජාතික පක්ෂය තුළ එය සිදු වන්නේ නැහැ කියන එක මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. නමුත් මම කියනවා මාස හයක් යන්න ඉස්සර වෙලා එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් -රනිල් වික්‍රමසිංහ, කරු ජයසූරිය, සජිත් ප්‍රේමදාස, රවි කරුණානායක, ජෝන් අමරතුංග, අපේ ගයන්ත කරුණාතිලක ඉන්නා ආණ්ඩුවක්- හදනවා කියන එක.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ ආණ්ඩුවේ සමාජ සේවා ඇමති සජිත්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බැසිල් රාජපක්ෂ මැතිතුමාට විරුද්ධව කුමන්ත්‍රණය කරන්න එපා. එතුමාගේ අමාත්‍යාංශය වැඩ කරන අමාත්‍යාංශයක් කියලා මං කිව්වාම, දැන් ඔබතුමන්ලා මට කථා කරන්න ඉඩ දෙන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලා ගිහිල්ලා හැන්දෑවට report කරන්න තිබෙනවා නේ, බැසිල් රාජපක්ෂට විරුද්ධව මෙන්න මෙච්චර කෑ ගැහුවා කියලා. එතකොට අර ෆවුසි ඇමතිතුමා වාගේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු වශයෙන් බලා ගෙන ඉන්න ඕනෑ නැහැ. බලන්න, එතුමා වැඩ කරන්න පුළුවන් කෙනෙක්. එතුමා නිකම් මැසි ෆර්ගියුසන් එකක් වාගෙයි. අර

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ඇද ගෙන යන ප්‍රමාණය තමයි අද එතුමාට දී තිබෙන්නේ. මැසි ෆර්ගියුසන් ට්‍රැක්ටරයක් වාගේ වැඩ කරන්න පුළුවන් මනුස්සයෙක්.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
වැඩකාරයෙක්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
වැඩකාරයෙක්. කොළඹ දිස්ත්‍රික්කයේ හැම මළ ගෙයකටම වාගේ යන එකම පුද්ගලයා ෆවුසි ඇමතිතුමායි කියන එක මම බය නැතිව කියනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කියලා කියපු ප්‍රකාශය ඉල්ලා අස් කර ගන්න ඕනෑ. ඒක expunge කරනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමාට වැඩ කරන්න පුළුවන්; නමුත් ඉඩ දෙන්නේ නැහැ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමාට ප්‍රශ්නයක් නැත්නම් ඔබතුමාට මොකක්ද තිබෙන ප්‍රශ්නය?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මතක තියා ගන්න, මා බලන්නේ ආයෝජකයන් වැඩි කරන්නයි. රටේ ආයෝජන වැඩි කළාම, වැටිලා තිබෙන ආර්ථිකය පවත්වා ගෙන යන්න අප ආවාට පස්සේ ටිකක් ලෙහෙසි වෙනවා. ඒ නිසා මා කියන්නේ කරුණාකර මේ අවස්ථාවේදී -[බාධා කිරීමක්] ගරු ඇමතිතුමා, ආර්ථික සංවර්ධන ඇමතිතුමා වශයෙන් කටයුතු කරන ඔබතුමාට මා කියන්නේ-

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)
ආයෝජකයන් ලංකාවට ගෙනෙන කොට- [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමාගේ කාලයෙන් මිනිත්තු පහක් දෙනවා නම් මම ඉඩ දෙන්නම්. නැත්නම් කරුණාකර ඉඳ ගන්න. [බාධා කිරීමක්] මා කථා කළේ ෆවුසි ඇමතිතුමා ගැනයි. [බාධා කිරීමක්] ආර්ථික සංවර්ධන ඇමතිතුමනි, import expenditure සියයට 50කින් වැඩි වෙලා තිබෙනවා. අපනයන ආදායම -export earnings- සියයට 28.6කිනුයි වැඩි වෙලා තිබෙන්නේ. මේකත් අපේ රුපියල බාල්දු වීමට බලපාන කාරණයක් වෙනවා. ඒ සම්බන්ධයෙන් අපට කරන්න තිබෙන එකම දේ තමයි අපනයන වැඩි කරන්න පුළුවන් වැඩ පිළිවෙළ ඇති කිරීම. අපනයනය වැඩි කරන්න පුළුවන් එකම ක්‍රමය තමයි තරගකාරී තත්ත්වය ඇති කිරීම. තරගකාරී තත්ත්වය ඇති කරන්න පුළුවන් වන්නේ විනිමය අනුපාතය අඩු කිරීම, එහෙම නැත්නම් නිෂ්පාදන වියදම් අඩු කිරීම මගිනුයි. ඉතින් කරුණාකර මේ දේවල් ක්‍රියාත්මක කරන්න. ඒක තමයි වැදගත්ම දේ.

බලන්න, දැන් ඔබතුමා කියනවා මේ රටට ආයෝජකයන් ගෙන්වා ගන්න ඕනෑ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නොවැම්බර් මාසයේ 18වැනි දින "ඬේලිමිරර්" පත්තරයෙන් උපුටා දැක්වීමක් කරනවා.

I quote:

"Rise in Robberies"

ඒ කියන්නේ මොකක්ද? හොරකම් ගිය අවුරුද්දට වඩා වැඩි වෙලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කථාව අවසන් කළ යුතුයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අධිකරණයෙන් පිහිටක් නැහැ පොලීසියෙන් පිහිටක් නැහැ. හොරකම් එතරම් ප්‍රමාණයකින් වැඩි වුණාම කොයි ආයෝජකයාද ලංකාවට එන්නේ? අපේ ආයෝජකයා හයිද්‍රාබාද්වලට යන කොට, අපේ ආයෝජකයා බංග්ලාදේශයට යන කොට පිට රට අය මේ රටට එන්න නම් යම් විධියේ වරප්‍රසාදයක් ලබා දෙන්න අවශ්‍යයි. ගරු ඇමතිතුමා, ඒ නිසා මා ඉතාම ඕනෑකමින් එක කාරණයක් කියනවා. ඔබතුමන්ලා ජාතික ආර්ථිකය දියුණු කරන්න ඕනෑ කියා කියනවා. මා මේ අවස්ථාවේ සීනි කර්මාන්තයට අදාළව උදාහරණ 4ක් දෙනවා. පැල්වත්ත කර්මාන්තශාලාවේ ටොන් 42,000ක් දවසකට නිෂ්පාදනය කරන්න පුළුවන්. ඒකේ crushing capacity එක දවසකට ටොන් 300යි. සෙවනගල කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදනය ටොන් 25,000යි. එහි crushing capacity එක ටොන් 1,250යි. හිඟුරාන කර්මාන්තශාලාව අර ගෙන බලන්න. ඒක රජය යටතේ තිබෙන එකක්. එහි සීනි නිෂ්පාදනය කරන්න පුළුවන් ටොන් 30,000ක්. හැබැයි එහි crushing capacity එක ටොන් 2,000යි තිබෙන්නේ. එහි මොකක්ද සිද්ධ වෙලා තිබෙන්නේ? අලාභයක්. කන්තලේ කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරන්න පුළුවන් ටොන් 25,000ක්. එහි crushing capacity එක ටොන් 1,250යි. ඔන්න බලන්න, රජය යටතේ ඒවා තිබුණාට වැඩ කරලා නැහැ.

දැන් ඔබතුමන්ලා පැල්වත්තයි, සෙවනගලයි අරගෙන තිබෙනවා. දැන් සීනි නිෂ්පාදනය දේශීය වශයෙන් -[බාධා කිරීම්] කරුණාකරලා ඔබතුමන්ලා මම කථා කළාට පස්සේ කථා කරන්න. මම කියනවා සෙවනගලයි, පැල්වත්තයි සීනි අවශ්‍යතාවෙන් සියයට 15ක් නිෂ්පාදනය කළා; ඔබතුමන්ලා ආණ්ඩුවට ගත්තාට පස්සේ අවුරුද්දකින් ඒ ප්‍රතිශතය සියයට 25 දක්වා වැඩි කළේ නැත්නම් කරුණාකරලා නැවත පනතක් ගෙනැල්ලා ඒවා ආපසු ඒ අයට දෙන්න කියලා. මොකද, එහෙම කළේ නැත්නම් අපි ආණ්ඩුවට ඉස්සෙල්ලා ICC එකට ගිහිල්ලා ඒවා අනිවාර්යයෙන්ම ලබා ගන්නවා. මේ රටේ දේශීය නිෂ්පාදන ආරක්ෂා කරන්න නම්, මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

නැතුව කරුණාකරලා ලාභයක් ලබා ගන්න පුළුවන් අයට, ලාභයක් ඇතිව වැඩ කරපු අයට මේවා නැවත භාර දෙන්න කියලා මම ඉතා ඕනෑකමින් කියනවා. ඒ වාගේම ICC - International Court of Arbitration - එකේ උත්තරය ලබා ගන්න ඉස්සෙල්ලා කරුණාකරලා ඒවා නැවත ලබා දෙන්න කියන එක මම මේ අවස්ථාවේදී කියනවා.

[අ. භා. 5.19]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය (තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி - தொழில்நுட்ப, ஆராய்ச்சி அமைச்சர்)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi - Minister of Technology and Research)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බොහොම සන්තෝෂ වෙනවා, සතොස ආයතනය ඉතාම ලාභදායී ආකාරයට පාලනය කරමින් කටයුතු කරපු අපේ රවි කරුණානායක මන්ත්‍රීතුමාගේ කථාවෙන් පස්සේ කථා කරන්නට ලැබීම ගැන.

**ගරු ඒ.පී. ජගත් පුෂ්පකුමාර මහතා**
(மாண்புமிகு ஏ.பீ. ஜகத் புஷ்பகுமார)
(The Hon. A.P. Jagath Pushpakumara)
ඒක ලාභදායීද?

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ලාභදායී තත්ත්වයට පත් කළේ කොහොමද කියන එක මේ රටේ ජනතාව දන්නවා. රවි කරුණානායක මන්ත්‍රීතුමා සතොසට කරපු අපරාධය මොකක්ද කියනවා නම්, අපේ රටේ ගමේ ජනතාව සතොසට ගිහිල්ලා පොල් ගෙඩිය, හාල් ටික, සීනි ටික ගත්ත එක නැති කරලා, ඊ එළි වෙනකල් සතොස ඇරලා, ඊට පස්සේ සතොස විකුණලා, සතොසේ තිබුණු warehouses ටික තමන්ගේ හිතවතුන්ට තුට්ටු දෙකට දුන්නා. සතොස ආයතනය හරියට කර ගන්න බැරි වෙච්ච ඔබතුමා මේ අවස්ථාවේදී මේ ගරු සභාවට උපදෙස් දීම ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
The Hon. Ravi Karunanayake, What is the point of Order?

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රජයේ,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
I have risen to a point of Order. දන්නේ නැත්නම් අහගෙන ඉන්න. Sir, she mentioned that there was stripping of assets and handing them to known persons. I want her to give one name of a person to whom those assets were given. නිකම් කට තිබුණු පලියට කථා කරන්න එපා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
That is not a point of Order. Hon. Minister, you carry on.- [*Interruption.*]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
වොක්ෂෝල් වීදියේ එක කාටද දුන්නේ? ප්‍රින්සි කියන්නේ කවුද? වොක්ෂෝල් වීදියේ එක කාටද දුන්නේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එකක් කියන්න.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
වොක්ෂෝල් වීදියේ එක කාටද දුන්නේ? [බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමිය කථා කරන්න.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මගේ වෙලාව අවශ්‍යයි. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ආණ්ඩුවට ලොකු උපදේශයක් දුන්නා, හිලරි ක්ලින්ටන් මහත්මිය ලංකාවට ගෙන්වන්න කියලා. අපි බොහොම සන්තෝෂ වෙනවා එතුමාගේ ආර්ථික උපදේශය ගැන. හැබැයි ඔබතුමා මතක තියා ගන්නට ඕනෑ, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනය කියන්නේ ඔබතුමන්ලා පිට රටින් ආනයනය කරපු ධනවාදයවත්, එහෙම නැත්නම් කාලයෙන් කාලයට මේ රටේ තිබුණු ආර්ථික න්‍යායන් වෙච්ච සමාජවාදය සහ ධනවාදයවත්, එහෙම නැත්නම් ආවෘත ආර්ථිකය, සංවෘත ආර්ථිකය කියලා පිට රටින් එක එක ගෙනැල්ලා මෙහේ බින්න බස්සවා ගත්තු එකක්වත් නොවෙයි කියන එක. එය, මේ රටට සුවිශේෂී වූ නව දැක්මක් නිර්මාණය කරලා මේ රටේ ආර්ථිකය ඉහළම තලයට ගෙනියන්න ගෙනාපු නව චින්තාවලියක්, ඒ සඳහා සකස් කළ වැඩ පිළිවෙළක් කියන එක මම මතක් කරන්නට ඕනෑ. ඔබතුමා කියන දේවල් අපට තේරෙනවා. ඔබතුමාගේ කථාවේදීම ඔබතුමා එක සැරයක් කිව්වා, මේ රටේ නිෂ්පාදන දිරි ගන්වන්න ඕනෑ කියලා. දෙවි හාමුදුරුවනේ! ඊට පස්සේ අනෙක් පැත්තෙන් කියනවා, රුපියල අවප්‍රමාණය කරපු එක වැරදියි කියලා. මේක අපට තේරෙන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ නිෂ්පාදන දිරි ගන්වන කොට මහින්ද චින්තනයේ,- [බාධා කිරීමක්] ඔබතුමාට විනයක් තිබෙන්න එපායැ. ඔබතුමා කථා කරන වෙලාවේ මම වචනයක්වත් කථා කළේ නැහැ නේ. ඒක නිසා ඔබතුමා මේක තේරුම් ගන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තේරෙන්නේ නැත්තේ, අපේ රටේ තේ දල්ලට වැඩිපුර මිලක් හම්බ වෙන කොට, අපේ රටේ රබර් ටිකට වැඩිපුර මිලක් හම්බ වෙන කොට -[බාධා කිරීමක්] මහින්ද චින්තන වැඩ පිළිවෙළ කියලා කියන්නේ, ඒ ආර්ථික වැඩ පිළිවෙළ කියලා කියන්නේ රටේ ඉදිරි ආර්ථික ගමන සඳහා දීර්ඝ කාලීනව හදපු වැඩ පිළිවෙළක්. මේ වැඩ පිළිවෙළේදී රුපියල අවප්‍රමාණය කරලා, පිට රටින් ගෙන්වන, අපට අවශ්‍ය කරන රෙදි ටික අපේ රටේ හදා ගන්න අපට අවශ්‍යයි. අපේ රටට අවශ්‍ය කරන බෙහෙත් ටික අපේ රට තුළ හදා ගන්න අපට අවශ්‍යයි. [බාධා කිරීමක්] ඔබතුමා අහගෙන ඉන්න. ඔබතුමාට විනයක් තිබෙන්න එපායැ. මම ඔබතුමාගේ කථාවට බාධා කළේ නැහැ නේ.

අපේ රටට අවශ්‍ය කරන රෙදි ටික අපට හදා ගන්න අවශ්‍යයි. අපේ රටට අවශ්‍ය කරන බෙහෙත් ටික අපට හදා ගන්න අවශ්‍යයි. අපේ රටට අවශ්‍ය තල ටික, මෙනේරි ටික, කුරක්කන් ටික, කව්පි ටික අපේ රටේ හදා ගන්න අවශ්‍යයි. ඒ නිසා පිට රටින් ගෙන්වන ඒවා සඳහා පුළුවන් තරම් දිරි ගැන්වීම අඩු කරලා අපේ රටේ නිෂ්පාදනය දිරි ගන්වන්න තමයි රුපියල අවප්‍රමාණය කළේ. මොකක්ද මේ ඔබතුමා කියන කථාවේ තේරුම? අපට මේක තේරෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද චින්තනය ගැන, ඒ ආර්ථික ක්‍රියාවලිය ගැන, එහි වැඩ පිළිවෙළ ගැන අවබෝධයක් නැතුව කථා කරන කොට UNP එකේ අය වක්කඩ කැඩුවා වාගේ මේ පැත්තට එනවා තමයි. ඒක කාටවත් නවත්වන්න බැහැ. මොහාන් ලාල් ග්‍රේරු මන්ත්‍රීතුමා ගැන අපි බොහොම සන්තෝෂ වෙනවා. එතුමා සත්‍ය තේරුම් අරගෙන මෙහාට ආවා. ඔබතුමා කියනවා, මෙතැන UNP එකෙන් ආපු ඇමතිවරු ගොඩක් ඉන්නවාලු. ඒක තවදුරටත් වෙනවා. ඒක නවත්වන්න හම්බ වෙන්නේ නැහැ. මහින්ද රාජපක්ෂ කියන ප්‍රතාපවත් නායකයා එක්ක මේ රටේ මහ ජන ගඟ එකට එකතු වෙලා තිබෙනවාය කියන එක දැන ගත්ත එක්සත් ජාතික පක්ෂයේ බුද්ධිමත් මන්ත්‍රීවරු තවදුරටත් අපිත් එක්ක එකතු වෙන එක කිසි කෙනෙකුට කිසිසේත් නවත්වන්න බැහැ කියන එක ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාට මතක් කරන්න ඕනෑ.

ගරු කබීර් හාෂිම් මන්ත්‍රීතුමා කියනවා මට ඇහුණා, ගිනි සංගුණකය ගැන. ආචාර්ය හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් ගිනි සංගුණකය ගැන කිව්වා. මේ රටේ ආර්ථිකයේ ආදායම බෙදී යන ආකාරය මනින දර්ශකයක් තමයි ගිනි සංගුණකය කියන්නේ. ඒක හරි. හැබැයි අපි මතක තියා ගන්න ඕනෑ, මහ බැංකු වාර්තාවේ දශම හතරයි හතක් තියෙනකොට වර්තමානයේදී -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பி+ரதித் தவிசாளர் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *took the Chair.*

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ලොකුවට මේ සභාවේ කතා කළා, ගිනි සංගුණකය ගැන. එය ලංකාවේ ආර්ථිකයේ ආදායම බෙදී යෑමේ විෂමතාව මනින දර්ශකයක් තමයි. හැබැයි තවත් ඒ වාගේ දර්ශක තිබෙනවා. හැබැයි, මම එතුමන්ලාට මතක් කර දෙන්න ඕනෑ, ඉතාම මෑතදී නිකුත් වෙච්ච සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වාර්තාවට අනුව ගිනි සංගුණකය මේ අවුරුද්ද වෙනකොට තවදුරටත් අඩු වෙලා තිබෙනවා මිසක් වැඩි වෙලා නැහැ කියන එක.

ඔබතුමන්ලා හැම වෙලාවේම, අද උදේත් කිව්වේ අය වැය පරතරය අඩු වෙලා තිබෙන එක අපි පිළිගන්නවා කියලායි. මේ ආණ්ඩුව එන්න එන්නම අය වැය පරතරය අඩු කරලා තිබෙන බව අපි පිළිගන්නවා කිව්වා. ඇමෙරිකාවේ ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 106ට යනකොට, අපේ රට සියයට හැත්තෑ ගණනකට ඒක බස්සපු බව ඔබතුමන්ලා පිළිගන්නවා. විරැකියාව සියයට පහකට අඩු කරපු බව

ඔබතුමන්ලා පිළිගන්නවා. පොලී අනුපාතය අඩු වෙච්ච බව ඔබතුමන්ලා පිළිගන්නවා. මේ හැම දර්ශකයක්ම ඔබතුමන්ලා පිළිගන්නා ගමන් එක්කෙනෙක්, දෙන්නෙක් මේ ගරු සභාවේ කතා කරලා කියනවා, මේ සංඛ්‍යා ලේඛන පිළිබඳවත් අපට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මොකද, විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ට මේ ආර්ථිකයේ සත්‍ය වර්ධන වේගය හෝ රටේ ආර්ථික තත්ත්වය ගැන දරා ගැනීමට, ඒ අගයන් පිළිගැනීමට පවා පොඩි බැරිකමක් තිබෙන නිසා එතුමන්ලා මේ සභාවේදී පොඩි කුතුහලයක් මතු කළා, මේ අගයන් සම්බන්ධයෙන්, සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ, මහ බැංකුවේ වාර්තා සම්බන්ධයෙන් සැකයක් තිබෙනවා කියලා. අපි බොහොම කනගාටු වෙනවා, පිළිගත් සංඛ්‍යා ලේඛන සම්බන්ධයෙන් ඔබතුමන්ලා ප්‍රශ්නාර්ථයක් මතු කිරීම ගැන. එහි වක්‍ර අරමුණ, සත්‍ය වශයෙන් මේ රටේ තිබෙන ආර්ථික වර්ධන වේගය පිළිගන්නට ඔබතුමන්ලා නිහතමානී වෙලා නැහැ කියන එක. අලුත්ම සංඛ්‍යා ලේඛන තමයි අපි පිළිගන්නේ. ආයෝජන එන බව අපි පිළිගන්නවා. ආර්ථිකයේ විශාල වර්ධනයක් තිබෙන බව පිළිගන්නවා. ඍණ ආර්ථික වර්ධන වේගයක් කරා ගිය රාජ්‍යයක්, එක්සත් ජාතික පක්ෂ රජය කාලයේ ධන ආර්ථික වර්ධන වේගයක් දක්වා-සියයට 8- නංවා ගත්තු බව අපි පිළිගන්නවා. හැබැයි ආදායම් බෙදී යෑමේ විෂමතාවේ යම්කිසි ප්‍රශ්නයක් තිබෙනවාය කියලා තමයි අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ප්‍රශ්නයක් මතු කළේ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම ඒකට උත්තරය දුන්නා. මම මේ කාරණය මතක් කරන්න ඕනෑ. මම රත්නපුර දිස්ත්‍රික්කයේ බොහොම දුෂ්කර ගම්මාන නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක්. මේක මට දැනෙන දේ.

අපි පුංචි කාලයේ, ඔබතුමන්ලාගේ ආණ්ඩු කාලයේ, අපි පාරේ යනකොට පාරවල්වල, බෝක්කු උඩ ඇන තියාගෙන ඉන්න තරුණයන් කොච්චර හිටියාද? අද එහෙම ඉන්නවාද? අද තරුණයන් කී දෙනෙක් mobile phones පාවිච්චි කරනවාද? අද අපි පාරේ යනකොට විනෝද ගමන් යන, වන්දනා ගමන් යන ලක්ෂ සංඛ්‍යාත ජනාවක් අපට හම්බ වෙන්නේ නැද්ද? අද ලංකාවේ තත්පරයකට එක ගණනේ motorcycles ලියා පදිංචි වෙන්නේ නැද්ද? මිනිත්තු දහයකට සැරයක් ලංකාවේ three-wheeler එකක් ලියා පදිංචි වෙන්නේ නැද්ද? මට තේරෙන දේ, අපේ ගම්වල මම දකින දේ තමයි මම මේ කියන්නේ. ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා හැම දාම අපට කිව්වේ ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කරනවා වාගේම ගමේ ආර්ථිකය නැඟිට්ටවීම එතුමාගේ අරමුණ බවයි. ඒ නිසා ඔබතුමන්ලාත්, අපිත් පිළිගන්න ඕනෑ සත්‍යය තමයි එතුමා ඇමති තනතුර බාර ගත්තාට පස්සේ ලංකාවේ හැම ගමකම පාරවල් කොන්ක්‍රීට් වෙනවාය කියන එක. ගම්වලට විදුලිය ලැබෙනවා; ගම්වලට වතුර හම්බ වෙනවා; මාතෘ සායනවලින් අම්මලාට අවශ්‍ය නවීන කාලයේ පහසුකම් හම්බ වෙනවා. ඉස්කෝලවලට වැසිකිළි හම්බ වෙනවා. ගම්වල මිනිසුන්ගේ ආර්ථිකය නැඟිට්ටුවන්න "දිවි නැඟුම" හරහා, "ගම නැඟුම" හරහා සුවිශේෂී කාර්ය භාරයක් ඉටු වෙනවා.

ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා කතා කරමින් කිව්වා, උතුරේ යම් යම් දේවල් සිද්ධ වෙලා නැහැ කියලා. අපි දන්නා විධියට වැව් ප්‍රතිසංස්කරණය වෙනවා නම්, නිවාස හදා දෙනවා නම්, ට්‍රැක්ටර් දෙනවා නම්, බිත්තර වී දෙනවා නම්, පොහොර සහනාධාරය දෙනවා නම් තවත් මොනවාද? පොහොර සහනාධාරය ලබා දෙන්නේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් නොවුණත් අපි පිළිගන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. අද ලංකාවේ මේ වාගේ ආර්ථිකයක් පවත්වාගෙන යන්න මේ අය වැයෙන් මොන තරම් සහනධාර ලබා දෙනවාද කියලා බලන්න. ඒ නිසා සංවර්ධන අය වැයක් විධියට මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙනවා කියන එක අපි කවුරුත් පිළිගත යුතු සත්‍යයක්. ඒ නිසා මම විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලාගෙන් මෙසේ ඉල්ලා සිටින්නේ, වාද භේද අයින් කරමු, සත්‍යයට මුහුණ දෙමු, මේ රටේ ජාතියේ ප්‍රතාපවත් නායකයා වන මහින්ද රාජපක්ෂ මැතිතුමාත් එක්ක මේ ගමන යන්න අපි කවුරුත් එකතු වෙමු, සත්‍ය පිළිගනිමු කියලායි. එසේ ප්‍රකාශ කරමින් මේ රටේ සංවර්ධනයේ නියමුවා විධියට කටයුතු කරන ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාටත්, එතුමාගේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් මගේ ගෞරවය පුදනමමින් මා නිහඬ වෙනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

The next speaker is the Hon. Susantha Punchinilame. You have five minutes.

[අ. භා. 5.29]

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ ඔළුව දැන් නිකම් අච්චාරු නොවෙයි මුසුප්පු වෙලා වාගෙයි. ඒ, මේ විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කරපු කථා අහලා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මා කරන්න ආවේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අදාළ කථාව. ඒ කථාව කරන්න වෙලාව මදි නිසා මා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

මේ ඉන්නේ මගේ පරණ මිත්‍රයෝ. අවුරුදු 17ක් පාර්ලිමේන්තුවේත්, එයිනුත් අවුරුදු 15ක් එක්සත් ජාතික පක්ෂයේත් හිටපු මන්ත්‍රීවරයකු වශයෙන් මට පෙනෙන්නේ, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථා අනුව එතුමන්ලාට කක්කුටු න්‍යායක් තිබෙන බවයි. කක්කුට්ටා කියනවා පුතාට කෙළින් පලයන් කියලා. හැබැයි කක්කුට්ටා යන්නේ ඇදේට. මම හිතන හැටියට ඔය කථා අහලා කවදාවත් මේ රටේ මහ ජනතාව එක්සත් ජාතික පක්ෂයට ඡන්දයක් දෙන එකක් නැහැ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒකට හේතුවක් තිබෙනවා. ඒ කාලයේ කථා කළා ධන, ඍණ ගැන. මම බැලුවා මේ මොකක්ද කියලා. ධන කියනවා, ඍණ කියනවා. ධන කියනවා, ඍණ කියනවා. අපට ගියා සැහෙන කලක් ඒක තේරුම් ගන්න; බේරුම් කර ගන්න. බොහොම අමාරුවෙන් 2001 දී -මේ පැත්තේ එදා හිටපු උදවියත් එක්ක කුමන්ත්‍රණ කරලා හරි, මොනවා කරලා හරි- ආණ්ඩුවක් පිහිටෙව්වා. අනේ, ධන ඍණ කිව්වා විතරයි, අවුරුදු දෙකක් ගියේ නැහැ ඒ ආණ්ඩුව කඩාගෙන වැටුණා. ඒ අය කියන දේ ජනතාවට තේරෙන්නේ නැහැ. ඒකට හේතුව තමයි මහ ජනතාවගේ ඡන්දයෙන් ආවේ නැති, මහ ජනතාවගේ දහඩියේ ගඳ සුවඳ හඳුනන්නේ නැති උදවිය උපදේශකයන් වශයෙන් අවුරුදු ගණනක් හිටපු එක. ඒ ප්‍රතිඵලය තමයි අද මේ එක්සත් ජාතික පක්ෂයට අත් වෙලා තිබෙන්නේ. ඒ පක්ෂයේ හිටපු පරණ මනුස්සයකු වශයෙන් ඒ ගැන මට දුකයි. ඔක්කෝම කථා කරන්නේ ඇමෙරිකාව ගැන; එංගලන්තය ගැන. ලංකාවේ ගමේ ඉන්න පෙළක් මිනිස්සු ඇමෙරිකාව, එංගලන්තය ගැන දන්නේත් නැහැ. හිලරි ගැන දන්නේත් නැහැ.

ඊයේ මම television එක බලන කොට දැක්කා, නිවේදකයෙක් මනුස්සයකුගෙන් අහනවා, කෝප් වාර්තාව ගැන. ඔහු කියනවා, තේ කොප්පයක් වාගේ එකක් කියලා. ගමේ වැඩි හරියක් ඉන්නේ අහිංසක කම්කරු ගොවි ජනතාව. ඒ අයට මේවා තේරෙන්නේ නැහැ. ඉතින් එක්සත් ජාතික පක්ෂයේ ඔබතුමන්ලා කියන කථා

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

ජනතාවට තේරෙන්නේ නැහැ. තේරෙන විධියට ඒ ජනතාවට කථා කළේ මහින්ද චින්තනය තුළින් අතිගරු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා විතරයි. ඒවා තමයි මේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා ගමට ගිහින් තිබෙන්නේ. ගමට, ගමේ ජනතාවට තේරෙන්න කථා කරන්න ඕනෑ. මේ කථා කරපු මන්ත්‍රීවරු -ආචාර්යවරු- හත්තිලව්වේ මොනවාද මේ කථා කළේ? අද ආර්ථික කටයුතු අමාත්‍යාංශය ගැනයි කථා කරන්න ඕනෑ. නමුත් ක්‍රීඩාව ගැන කථා කළා; යුද්ධය ගැන කථා කළා; කොටස් වෙළෙඳ පොළ ගැන කථා කළා; ගිනි ගැන කථා කළා. ඒවා හොඳයි පිට රට ආණ්ඩුවලට. ඒවා කථා කරන්න ඕනෑ ඇමෙරිකාවට ගිහිල්ලා. ඒවා කථා කරන්න ඕනෑ එංගලන්තයට ගිහිල්ලා. රාත්‍රී 7ට පෙන්වන "සිරස" ප්‍රවෘත්තිවලට කථා කරලා වැඩක් නැහැ. මේ තොරතුරු යන්න ඕනෑ ගමේ ජනතාවට.

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මේවා අහගෙන ඉන්නවා. එතුමා මේවා දන්නවා. බලන්න, මගේ පියාගේ කාලයේ සිට ඉන්න මන්ත්‍රීවරයකු වශයෙන් ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා කොච්චර වැදගත් විධියට අහගෙන ඉන්නවාද කියලා. අර සුජීව සේනසිංහ මන්ත්‍රීතුමාත් ඒ වාගේ. අනෙක් අයට මේවා තේරෙන්නේ නැහැ. ඒ තේරෙන්නේ නැති එකේ ප්‍රතිඵල තමයි අද දකින්නට තිබෙන්නේ. එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් අපේ ජීවිතය තිබෙන තුරු නම් එන්නේ නැති බව මට අද විශ්වාස වුණා. එක්සත් ජාතික පක්ෂයේ හිටපු මිනිහෙක් වශයෙන් මට ඒ ගැන ලජ්ජයි; කනගාටුයි. කරන්න දෙයක් නැහැ. දුකයි. අපි බේරුණා. මේ රටේ තිබුණු කුරිරු යුද්ධයට තිත තියන්න ලැබීම ගැනත් අපි බොහොම ආඩම්බර වෙනවා; සන්තෝෂ වෙනවා. ජීවිතයේ කර ගත්ත ලොකු පිනක් හැටියට සලකනවා. අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාට කථා කරන්න වෙලාව අවශ්‍යයි.

මම රත්නපුරයෙන් නැහෙනහිරට ගිහිල්ලා, ඉන්න තැනක් නැතිව, නෑදෑයෙක් නැතිව, යහළුවෙක් නැතිව ජයග්‍රහණය කරන්න ලැබුණේ මහින්ද චින්තනය නිසායි.

එදා මාවිල් ආරු බේරා ගත්තාට පස්සේ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා ඒ ප්‍රදේශවල සංවර්ධනය පටන් ගත්තේ, ඇමතිවරයෙක් වශයෙන් නොවෙයි, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශකයෙක් හැටියටයි. කොටි ආටිලරි ගහද්දී මඩකලපුව, අම්පාර, මුලතිව්, කෝකිලායි දක්වා ගියා. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි, බය නැතිව ගිහිල්ලායි ජනතා ඡන්දයෙන් අපි ඒ පළාත් ජයග්‍රහණය කළේ. අපි ඉතිහාසය වෙනස් කර ගෙන ආවේ අපේ දක්ෂකමක් නිසා නොවෙයි. අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනයත්, මෙතුමාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ජනතාවට දුන්න සහයෝගයත් නිසායි. මම ඒ බව මතක් කරනවා. කියෙව්වාට වැඩක් නැහැ. ප්‍රායෝගික - practical - වන්න ඕනෑ. එහෙම නැතිව නිකම් තමන් දන්න දේ විතරක් මෙතැන කියලා, කෑගහලා වැඩක් නැහැ.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි විශේෂයෙන්ම තමුන්නාන්සේලාට කියන්නේ ජාතික ලැයිස්තුවෙන් එන අයට ඔය දේ වෙනවා කියලායි. ඒ නිසා ජාතික ලැයිස්තුවෙන් එන අය පොඩ්ඩක් ගම්වල ඉන්න මේ ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා වාගේ, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා වාගේ, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා වාගේ අයගෙන් පොඩ්ඩක් කරුණු කාරණා අහලා දැන ගෙන ජනතාවගේ දුක, ජනතාවගේ දහදිය සුවඳද, ගඳද කියන එකත් අහ ගෙන කටයුතු කරන්නය කියලා ඉල්ලා සිටි මින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Muthu Sivalingam, please. You have five minutes.

[பி. ப. 5.35]

**ගරු මුතු සිවලිංගම් මහතා (ආර්ථික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
( மாண்புமிகு முத்து சிவலிங்கம் - பொருளாதார அபிவிருத்தி பிரதி அமைசர்)
(The Hon. Muthu Sivalingam - Deputy Minister of Economic Development)

Sir, only five minutes?

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Yes, only five minutes.

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, 2012ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தில் பொருளாதார அபிவிருத்தி அமைச்சின் நிதி ஒதுக்கீடுகள் மீதான குழுநிலை விவாதத்தில் கலந்துகொள்வதிலே நான் மிகவும் மகிழ்ச்சியடைகின்றேன். இலங்கைக்குச் சுதந்திரம் கிடைத்த காலம் முதல் அமைச்சர்கள் தங்களுக்கு ஒதுக்கப்படும் நிதியைத் தாங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற தொகுதிகளுக்கு மாத்திரம் செலவு செய்ததன்மூலம் அந்தந்தப் பிரதேசங்களை அபிவிருத்தி செய்து வந்ததையே நாங்கள் கடந்த காலங்களில் கண்கூடாகக் கண்டோம். உதாரணமாக டெடிகம தொகுதியை எடுத்துக்கொண்டால், அந்தத் தொகுதியைப் பிரதிநிதித்துவப்படுத்திய பிரதம அமைச்சர் அவர்கள் அங்கு அபிவிருத்தியை மேற்கொண்டார். அத்தனகல்ல தொகுதியில் இருந்து பிரதம அமைச்சர் அவர்கள் தெரிவானபோது அவர் அப்பிரதேசத்தை அபிவிருத்தி செய்தார். அந்த வகையில் அன்று வேறு பகுதிகள் அபிவிருத்தி செய்யப்படவில்லை. ஆனால், எமது ஜனாதிபதி அவர்கள் இலங்கையில் வாழும் எல்லாப் பகுதிகளையும் சேர்ந்த மக்கள் - அவர்கள் நகரப்புற மக்களாக இருக்கலாம், கிராமப்புற மக்களாக இருக்கலாம், தோட்டப்புற மக்களாக இருக்கலாம் - எல்லா வகையிலும் அபிவிருத்தியடைய வேண்டும் என்ற ஒரே நோக்கத்துடன் பொருளாதார அபிவிருத்தி அமைச்சு என்ற ஓர் அமைச்சை உருவாக்கி, அதன்மூலம் அபிவிருத்திக்கான நிதியைப் பகிர்ந்தளித்து வருகின்றார். அதன் அடிப்படையிலேயே இந்த நிதி 2011ஆம் ஆண்டும் அந்தந்த மாவட்டங்களுக்குச் சமமாகப் பிரித்துக் கொடுக்கப்பட்டது. 2012ஆம் ஆண்டும் அதேமுறைதான் நடைமுறைப்படுத்தப்படும்.

அடுத்ததாக, இந்த அமைச்சு செய்யும் நல்ல காரியங்களை கிழக்கு மாகாணத்தைச் சேர்ந்த உறுப்பினர் கௌரவ அரியநேத்திரன் அவர்கள் இன்று இச்சபையிலே முதன்முதலாக ஒத்துக்கொண்டது எனக்கு ரொம்ப மகிழ்ச்சியாக இருக்கின்றது. அதாவது இன்று விவசாயத்துறை அபிவிருத்தி செய்யப்படுவதாகவும் எல்லாக் கிராமங்களிலும் 'மஹிந்த சிந்தனை'யின்கீழ் மூன்று மீற்றர் அகலமான 'கொங்கிறீட்' வீதிகள், மற்றும் 'கார்பட்' வீதிகள் அமைக்கப்படுவதாகவும் அவர் இங்கு கூறியது எனக்கு ரொம்ப மகிழ்ச்சியாக இருக்கின்றது. 2011ஆம் ஆண்டு வரவு செலவுத் திட்டத்தில் கிட்டத்தட்ட எல்லா மாவட்டங்களுக்கும் மாகாணங்களுக்கும் நிதி ஒதுக்கப்பட்டாலும்கூட, வடக்கு, கிழக்கு மாகாணங்களுக்கே ஆகக் கூடுதலான நிதி ஒதுக்கப்பட்டது. அதாவது மேல் மாகாணமாக இருக்கலாம், மத்திய மாகாணமாக இருக்கலாம் அல்லது வட மத்திய மாகாணமாக இருக்கலாம் அவற்றுக்கு ஒதுக்கப்பட்ட

நிதியைவிடக் கூடுதலான நிதி அந்த இரு மாகாணங்களுக்கும் ஒதுக்கப்பட்டது. அந்த வகையில் வடக்கு மாகாணத்துக்கு மாத்திரம் 19,770 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. அதேபோல் கிழக்கு மாகாணத்துக்கு 6,916 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டிருக்கின்றது. நாட்டின் எல்லாப் பகுதிகளும் ஒரே சீராக அபிவிருத்தியடைய வேண்டும், பாதிக்கப்பட்ட மக்கள் வாழும் வடக்கு, கிழக்குப் பகுதிகள் அபிவிருத்தி செய்யப்பட வேண்டும் என்ற சிந்தனையின் அடிப்படையில்தான் அந்தப் பிரதேசங்களுக்கு இவ்வளவு தொகைப் பணம் ஒதுக்கப்பட்டிருக்கின்றது. இருந்தாலும்கூட, இன்று அங்கு எந்தவோர் அபிவிருத்தியும் நடக்கவில்லை என்று ஒருசில உறுப்பினர்கள் இந்த மன்றத்திலே கூறுகின்றார்கள். அந்தப் பிரதேசங்கள் அபிவிருத்தி செய்யப்படுவது அவர்களுக்குத் தெரியவில்லையா? அங்கு விவசாயம் வளர்ச்சியடைவதை அவர்கள் காணவில்லையா? பாலங்கள் மற்றும் பாதைகள் அபிவிருத்தி செய்யப்படுவதை அவர்கள் பார்க்கவில்லையா? இவர்கள் கண்ணிருந்தும் குருடர்களா? ஆனால், இன்று இந்த அரசாங்கம் தங்களுக்கென முன்னெடுக்கும் அபிவிருத்திகள்பற்றி, 30 ஆண்டு கால அடிமைத்தனத்திலிருந்தும் யுத்தத்திலிருந்தும் விடுபட்டு இன்று சுதந்திர மனிதர்களாக வாழும் அந்த வடக்கு, கிழக்கு மக்களுக்குத் தெரியும், எனவே, இதை மூடி மறைக்கவோ அல்லது மறைத்துப் பேசவோ யாரும் முன்வந்தால், அது அவர்களுக்குத்தான் பாதகமாக முடியும்.

"பெருந்தோட்டங்கள் இன்று நஷ்டமடைவதற்குக் காரணம் கூட்டு ஒப்பந்தமா, அல்லது அரசாங்கத்தின் நடவடிக்கையா?" என்று இன்று காலை எதிர்க்கட்சிக் கொறடா அவர்கள் கேள்வி கேட்டார். அவர்களுடைய ஆட்சிக்காலத்தில்கூட நாங்கள் அவர்களை நாடிச் செல்லவில்லை; ஆனால், ஓர் ஆலோசனை கூறுவது வழமை. அதுபோலவே இந்த அரசும் ஆலோசனை கூறியிருக்கின்றது. நாட்டில் எங்கேயாவது ஏதாவது வேலைநிறுத்தங்கள் அல்லது போராட்டங்கள் நடந்தால் அதைக் கவனத்திற்கொண்டு அந்தப் பிரச்சினைகளைத் தீர்த்து வைக்கும் விதத்தில் அதற்கு ஆலோசனை கூறுவது ஜனாதிபதி அவர்களின் கடமை. அதன்படி இந்த ஒப்பந்தம் முறையாகச் செய்யப்பட்டதுடன் அதன்மூலம் தொழிலாளர்களுக்குப் போதுமான அளவு சம்பள உயர்வும் கிடைக்கப்பெற்றது. இருந்தபோதிலும் இன்று தோட்டங்கள் நஷ்டமடைவதற்குப் பல காரணங்கள் உண்டு. அந்த நஷ்டத்தைச் சம்பந்தப்பட்டவர்கள் எல்லோரும்தான் பொறுப்பேற்க வேண்டுமே தவிர, வெறுமனே தோட்டத் தொழிலாளர்களையும் கூட்டு ஒப்பந்தத்தையும் மனதில் வைத்துக்கொண்டு மற்றவர்கள்மீது குறை கூறுவது அவ்வளவு நல்லதல்ல என்பதை நான் கௌரவ உறுப்பினர் அவர்களுக்குக் கூறிக்கொள்ள விரும்புகின்றேன்.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ளுங்கள்!

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)
Sir, I have not finished. So, I will **table*** the rest of my speech to be included in Hansard.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Sujeewa Senasinghe, please. You have to wind up by 5.55 p.m.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I have got 20 minutes.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Time is limited because Members from both sides of the House have taken more time.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
You should not have given them more time.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Please start your speech. - [*Interruption.*] It is not possible during the Committee Stage. We cannot extend the time.

[අ. භා. 5.41]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂ සම්බන්ධයෙන් මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතියි. මේ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයෙන් බොහෝ අදහස් පළ කරනවා අපට දැක ගන්නට ලැබුණා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මෙහිදී මම දැක්ක විශේෂ දෙයක් තමයි, මෙහි ඇමතිවරයා වශයෙන් කටයුතු කරන බැසිල් රාජපක්ෂ ඇමතිතුමා තුළ එක්සත් ජාතික පක්ෂය සමඟ පොඩි හරි සම්බන්ධයක් තිබෙන බව. ඒ ගැන අපිට සන්තෝෂයි. ගාමිණී දිසානායක මැතිතුමා එක්ක එතුමා ළඟින් ක්‍රියා කරපු නිසා යම්කිසි ආකාරයකට මේ ආර්ථිකය කළමනාකරණය කර ගන්නා ආකාරය ගැන එතුමාට අවබෝධයක් තිබෙනවාය කියා අපට හැඟෙනවා. නමුත් ගරු ඇමතිතුමනි, ප්‍රශ්නය වන්නේ ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන්ට මේක හරියට තේරුම් ගන්න බැරි වීමයි. යම් පිරිසක් ණයට විරුද්ධව කථා කරනවා. තව පිරිසක් ණය පොලී අනුපාතය ගැන කිසිම අවබෝධයක් නැතිව කථා කරනවා. තවත් පිරිසක් පෞද්ගලීකරණය සම්බන්ධයෙන් වෙනම අදහස් දරනවා. බැසිල් රාජපක්ෂ ඇමතිතුමා පෞද්ගලීකරණය සම්බන්ධයෙන් දරන අදහස ආණ්ඩුවේ බොහෝ ඇමතිවරුවන්ට තේරුම් ගන්න බැරිව -විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමා කරපු කථාව මම හිතන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිතුමන්ලාටත් හරියට තේරුම් ගන්න බැරිව- කථා කළා. ආර්ථික ප්‍රතිපත්තිය කුමක්ද යන්න පිළිබඳව අවබෝධයක් නැතිව කථා කළා.

පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමිය කථා කරමින් කිව්වා, ඇමෙරිකාව ගැන අපට වුවමනාවක් නැහැයි කියලා. හැබැයි, මේ

[ගරු සුජීව සේනසිංහ මහතා]

කථාව නොවෙයි, මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමාගේ අය වැය කථාවේ 27වැනි පිටුවේ කියා තිබෙනවා, "සම්ප්‍රදායික යුරෝපා හා ඇමෙරිකානු වෙළෙඳ පොළවල් ශක්තිමත් කර ගැනීමට ඇති බාධාවන් ද ඉවත් කර ගැනීමට කටයුතු කරනවා" කියලා. මේක තමයි එක්සත් ජාතික පක්ෂයේ අපි කියන්නේත්. හිලරි ක්ලින්ටන් මැතිනිය මෙහාට ආවාම තිබෙන වරද මොකක්ද? එනවා නම්, එන්න කැමැති නම්, රටට ආයෝජන ගේන්න කැමැති නම් මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒකට කැමැතියි. එතුමා තවදුරටත් කියා තිබෙනවා, "මෙම ජාත්‍යන්තර වෙළෙඳ සම්බන්ධතා පුළුල් කර ගැනීමට යෝග්‍ය පරිදි අපේ විදේශ සේවය හා දූත මණ්ඩල පූර්ණ ප්‍රතිසංස්කරණයට ලක් කිරීමට මා යෝජනා කරනවා" කියලා.

දැන් මේ පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමිය කියපු දේට ප්‍රතිවිරුද්ධ අදහසක් තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා දක්වන්නේ. ඒ වාගේම අදහසක් තමයි බැසිල් රාජපක්ෂ මැතිතුමාත් දක්වන්නේ. අපට අවශ්‍ය කරන්නේ ඔබතුමන්ලාගේ ආර්ථික ප්‍රතිපත්තිය මොකක්ද කියන එක දැන ගැනීමටයි. ඒක පමණක් අපට කියන්න. එතැනින් පස්සේ එක්සත් ජාතික පක්ෂයේ අපේ අදහස්, අපි විවේචනය කරන්නේ කොයි ආකාරයෙන්ද කියන දේ සම්බන්ධයෙන් අපි කථා කරන්නම්. මොකද, ඔබතුමන්ලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳලා, ඒ සංවෘත ආර්ථිකය ගැන කථා කරලා දැන් ඔබතුමන්ලාට ඒක පැටලිලායි තිබෙන්නේ; වලිගය පැගිලායි තිබෙන්නේ. ගරු බැසිල් රාජපක්ෂ මහත්තයාගෙන් class එකක් ගන්න ඔක්කෝම. බැසිල් රාජපක්ෂ මැතිතුමා විශ්වාස කරන ආර්ථික ප්‍රතිපත්තිය, ඔබතුමන්ලා විශ්වාස කරන ආර්ථික ප්‍රතිපත්තිය නොවෙයි. එතුමා පෞද්ගලීකරණය කරනවා. අලාභ ලබන බොහෝ දේවල් පෞද්ගලීකරණය කරන්න එතුමා මේ වන කොටත් ගොඩක් ක්‍රියාපිළිවෙත් අනුගමනය කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ ගැන පොඩ්ඩක් අවබෝධයක් ඇති කර ගන්න. නැත්නම් ඔබතුමන්ලා නැට්ට පාගා ගෙන වටේ කැරකෙමින් එක්සත් ජාතික පක්ෂයට ගහනවා; විවෘත ආර්ථිකයට ගහනවා; ආයෝජනවලට ගහනවා; ණයවලට ගහනවා. හැබැයි අන්තිමට ඔබතුමන්ලා කියන්නේ, "ණය ගැනීම අවශ්‍යයි, වැඩි පොලියට පවා ණය ගත්තාට කමක් නැහැ" කියන එකයි. බුලත් කඩයක් කරලා බලන්න වැඩි පොලියට ණය අරගෙන කරන්න පුළුවන්ද කියලා. අපි කියන්නේ මේ පොලී අනුපාතය අඩු කර ගන්නය කියන එකයි. බැසිල් රාජපක්ෂ මැතිතුමාට පුළුවන් නම් පොලිය සියයට 2.2ට, 1.8ට අඩු කර ගන්න, එතුමා ඒ ණය ප්‍රමාණය ගන්නවා. අපි කියන්නේ ඔබතුමන්ලා අවබෝධයක් නැතිව කථා කරන්න එපා කියන එකයි. එක කොටසක් නැඟිටලා කෑ ගහනවා ඇමෙරිකාවට. හැබැයි ඒ අතරේ ජනාධිපතිතුමා කියනවා, ඇමෙරිකාවේ වෙළෙඳ පොළ විවෘත කර ගන්න ඕනෑ, විදේශික සම්බන්ධතා වෙනස් කර ගන්න ඕනෑ, ඒවා ඔක්කෝම වෙනස් කරලා හොඳ අවබෝධයක් ඇති කරගෙන ඉදිරියට යන්න ඕනෑය කියලා. ඒක තමයි හරි දර්ශනය. ඒක තමයි ඉන්දියාව, චීනය, ඇතුළු සියලුම සමාජවාදී රටවල් විශ්වාස කරපු දර්ශනය. දැන් වෙනස් කරලා. දැන් යන්නේ ඉදිරි ගමනක්. මේ ගමනේදී ඔබතුමන්ලා පොඩ්ඩක් -මේකට විරුද්ධ පිරිසවත්- බැසිල් රාජපක්ෂ මහත්තයා ගෙන්වා ගෙන පොඩි පන්තියක් ලබා ගන්න පැය දෙක තුනක. එතුමා කියලා දේවි, ආර්ථිකය ඉදිරියට යන්නේ කොහොමද කියලා. එතුමාගේ ප්‍රතිපත්තිය මොකක්ද කියලා ඔබතුමන්ලාට අවබෝධයක් ලබා දේවි.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி )
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් කරන්න දෙනවාද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට වෙලාව තිබෙන්නේ පොඩ්ඩයි. [බාධා කිරීම්] ඔබතුමියට අපි බාධා කළේ නැහැනේ. ඔබතුමියට හොඳ අවස්ථාවක් ලැබුණා. ඔබතුමියගේ වෙලාවේදීයි කථා කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර තිබෙන "සංවර්ධනයේ පුරෝගාමියා" නැමැති මේ පොත මම කියෙව්වා. මෙහි සඳහන් වෙලා තිබෙනවා,- [බාධා කිරීම්] අනේ, පොඩ්ඩක් ඉඳ ගන්නකෝ, බාධා කරන්නේ නැතිව. මෙහි සඳහන් වෙලා තිබෙනවා-

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්-

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
Hon. Minister, are you raising a point of Order? Hon. Minister, if you raise a point of Order -

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මගේ නම සඳහන් කරමින් මෙතුමා කිව්වා,- [බාධා කිරීම්] මම එතුමාට ඉතාම ගෞරවයෙන් සඳහන් කරන්න ඕනෑ, මහින්ද චින්තනය කියලා -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
That is not a point of Order.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
That is not a point of Order. At least, you study the rules and come. That is not a point of Order. You are making a clarification. You explain it in your speech.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)
I have given a ruling. That is not a point of Order.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
මම නොකියාපු කාරණයක් කියන්න එපා. ඒ නිසා ඒක ඉල්ලා අස්කර ගන්න. [බාධා කිරීම්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඉඳ ගන්න, ඉඳ ගන්න. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "සංවර්ධනයේ පුරෝගාමියා" නැමැති පොතේ 38වැනි පිටුවේ "දිළිඳුකම තුරන් කිරීම" යටතේ සඳහන් වනවා, අඩු ආදායම්ලාභීන්ගේ පෝෂණ හා සෞඛ්‍ය තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා උතුරු පළාතේ යම් පිරිසකට යම් මුදල් ප්‍රමාණයක් වෙන් කළ බව. එහි පින්තූරයකුත් තිබෙනවා. ගරු ඇමතිතුමනි,

මා මෙය ඔබතුමාගේ අවධානය සඳහා යොමු කරන්නේ පැහැදිලි කර ගැනීමක් සඳහා පමණයි. ත්‍රිපෝෂ බෙදා දීමේ අවස්ථාවක ගත් පින්තූරයකුයි එහි දැක්වෙන්නේ. එම පින්තූරයේ පසුබිමේ World Food Programme යනුවෙන් සඳහන් "බැනර්" එකක් තිබෙනවා. මා දන්නා තරමට මේ ලබාගෙන තිබෙන ඡායා රූපය සහ ඔබතුමා අදහස් කරන දේ පරස්පර විරෝධියි. මොකද, ආණ්ඩුවෙන් වෙන් කරපු මුදලකට World Food Programme යනුවෙන් සඳහන් "බැනර්" එකක් යටතේ ආහාර බෙදීමක් සිදු වීමට හැකියාවක් නැහැ. මා වැරදි නම් නිවැරදි කරන්න. [බාධා කිරීම්] මා ගරු ඇමතිතුමාගෙනුයි මෙය අහන්නේ. ඔබතුමාගේ පිළිතුරු කථාවේදී මේ සම්බන්ධයෙන් පිළිතුරු දෙන්න පුළුවන්. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලබා දෙන ආහාර ප්‍රමාණයක් සම්බන්ධයෙන් පින්තූරයක් මෙහි දැක්වෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. අපේ ගරු ඇමතිතුමා ඒ ගැන හොඳට විස්තර කරාවි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමෘද්ධි සම්බන්ධයෙනුත් එතුමාට භාර වෙලා තිබෙනවා, වැදගත් කාරණයක්. 2005 වර්ෂයේ සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාව එක්ලක්ෂ විසිදෙදහස් එකසියඅසූහයක්. දැන් මෙතුමා ආධාර ලබා දෙන පවුල් සංඛ්‍යාව 61,000කට බැහැලා තිබෙනවා. ඒ වාගේම මෙහිදී පෝෂණ දීමනා වැඩසටහනට වෙන් කරපු මුදල වශයෙන් දක්වා තිබෙන්නේ මිලියන 388ක් වශයෙන්. මෙය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ වාගේම අය වැයේදී ඉදිරිපත් කළා, සමෘද්ධි සහනාධාරය රුපියල් 210ක් ලබන පිරිසට එම මුදල රුපියල් 600 දක්වා වැඩි කරනවා කියලා. මා හිතන්නේ ඒ 600 ප්‍රමාණය හරි කියලායි. ගරු ඇමතිතුමනි, මෙහිදී විශේෂ කාරණය වන්නේ මේ වෙනස් වීමෙන් ඔබතුමන්ලාට වැය වන්නේ මිලියන 35ක් වාගේ පොඩි ප්‍රමාණයක් පමණයි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඒ වාගේම, එක්තරා පුවත් පතක සඳහන් වෙනවා, "ඇමතිවරුන්ට වාහන ලබා දීම සඳහා පමණක් මිලියන 60ක් වෙන් කරලා තිබෙනවා" කියලා. ඒ වාගේම ඇමතිතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා තරගයට ඉදිරිපත් වීමේ වැඩසටහන සඳහා පමණක් මිලියන 500ක් වියදම් කළ බවත් "සන්ඩේ ටයිම්ස්" පුවත් පතේ ඉතා ලස්සනට සඳහන් වනවා. මේ පළ කර තිබෙන රූප රාමුවේ අපේ පළාත් සභා මන්ත්‍රීවරියක් නටන ආකාරයත් දක්වා තිබෙනවා.

මිලියන 500ක් මේ සඳහා වියදම් කරලා තිබෙනවා, ඇමතිතුමනි. මේ ආකාරයේ විනාශයක් කරලා තිබෙනවා. දැන් බලන්න, ඔබතුමන්ලා කථා කරනවා, පෝෂණය සම්බන්ධයෙන් රුපියල් මිලියන තුන්සිය ගණනක් වියදම් කරනවාය කියලා. ඒ සමඟම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල ලබා ගන්න පමණක් රුපියල් මිලියන 500ක් වියදම් කරලා තිබෙනවා. එංගලන්තයේ ඉඳලා විශාල පිරිසක් අරගෙන යන්න පමණක් ඒ අහස් යාත්‍රාවට ඩොලර් මිලියනයයි. [බාධා කිරීමක්] ඔබතුමන්ලාට මේවා හොඳ නම්, මේ රටේ ජනතාවට මේවා දරා ගෙන ඉන්න පුළුවන් නම් අපට කමක් නැහැ. [බාධා කිරීමක්] ලලිත් දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා, මා ඔබතුමාට බාධා කළේ නැහැ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පෝෂණයට වෙන් කරන්නේ රුපියල් මිලියන 300යි. විනාශය සහ දූෂණය සඳහා මේ ආණ්ඩුව වැය කරන මුදල් ප්‍රමාණය පෝෂණය සඳහා යෙදුවා නම්, සමෘද්ධි සහනාධාරය ලබා දෙන පවුල් සංඛ්‍යාව දෙගුණ-තෙගුණ කරලා ඒ ආධාර ප්‍රමාණය ලබා දෙන්න පුළුවන් වනවා, මේ ආණ්ඩුවට. අපි කියන්නේ මේ ආණ්ඩුවට ඒ හැකියාව නැහැ කියලායි. ආණ්ඩුව කරන්නේ, ලොකුවට දක්වනවා -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! There is a point of Order being raised by the Hon. Mahindananda Aluthgamage.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට වැය කරපු මුදල ගැන කිව්වා. ඒක ජනතාවට දරා ගන්න බැහැයි කිව්වා. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා -

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Minister, that is not a point of Order.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

සමා වන්න, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඇමතිතුමනි, ඔබතුමන්ලා point of Order එකක්වත් හරියට ඉගෙන ගෙන එන්න ඕනෑ. [බාධා කිරීමක්] ඇමතිතුමනි, සමෘද්ධි ශුභ සාධන වැඩසටහන යටතේ දක්වා තිබෙනවා, 2006 වර්ෂයේ සිට තිබුණු 1,20,000ක් වන සමෘද්ධි පවුල් සංඛ්‍යාව 2010 වර්ෂය වන විට 30,000 දක්වා -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Mahindananda Aluthgamage, what is your point of Order?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මේ microphone එක දෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ microphone එක දෙන ස්ථානයේ යූඑන්පීකාරයෝ ඉන්නවා. ඒ යූඑන්පීකාරයෝ එලවන්න.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Minister, that is not a point of Order.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

කථා කරන්න කලින් microphone එක off කරනවා. තමුසෙලා හිතුවාද, මේක යූඑන්පී එකේ සිරිකොත කියලා, කථා කරන්න කලින් microphone එක off කරන්නේ? රවි කරුණානායක මන්ත්‍රීතුමා කථා කරනවා නම් - විපක්ෂය කථා කරන කොට- microphone එක පැය ගණන් on කර ගෙන ඉන්නවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමා කියන කොටත් microphone එක off කරනවා.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Hon. Sujeewa Senasinghe, you carry on with your speech.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

හය කරන්න එපා, microphone එක පත්තු වන්නේ මේ පැත්තටයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මන්ත්‍රීතුමා, තමුන්නාන්සේ පාර්ලිමේන්තුව නොමහ යවන කොට point of Order කියලා මා ඒ කරුණ පැහැදිලි කරන්නයි ගියේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

හය කරන්න එපා. එතකොට microphone එක මේ පැත්තට පත්තු වනවා. ක්‍රීඩා ඇමති හැටියට ඔබතුමා හය කළාම ඒ අය හය වනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

තමුන්නාන්සේ අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Microphone එක දෙන්නේම නැහැ. Microphone එක දෙන්නම එපා.

ඒ විතරක් නොවෙයි, ඇමතිතුමනි. අය වැය පිළිබඳ විවාදයේදී ඔබතුමන්ලා උද්ධමනය ගැන කථා කළා. මුළු ලෝකයේම උද්ධමනයේ සාමාන්‍ය වේගය සියයට 4යි, සියයට 5යි, ඇමතිතුමනි. මුළු ලෝකයේම උද්ධමනය සසඳා බැලුවාම අපේ රටේ උද්ධමනය සියයට 6.9යි කියලා එක වාර්තාවක තිබුණා; සියයට 7.1යි කියලා තව වාර්තාවක තිබුණා. කෙසේ වෙතත් අද ලෝකයේම තිබෙන ආර්ථික අර්බුදය නිසා උද්ධමනය ඉතා පහළ තත්ත්වයට වැටිලා තිබෙනවා. හැබැයි, ඒක ඔබතුමන්ලාගේ අය වැයේ දක්වා තිබෙන්නේ කෙසේද? ඒ, ඔබතුමන්ලාගේ ආර්ථිකයේ කාර්යක්ෂමතාව වැඩි නිසා උද්ධමනය පහළ බැස්සාය කියලායි. හැබැයි ඒක නොවෙයි, ඇත්ත තත්ත්වය. මුළු ලෝකයේම උද්ධමනය ඉතා පහත මට්ටමක තිබෙන අවස්ථාවක ඒ උද්ධමනය අපට බලපාන ආකාරය තමයි මෙහි දැක්වෙන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඇමතිතුමනි. විශේෂයෙන්ම ඔබතුමාගේ -

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

අනික් රටවල උද්ධමනයට වඩා වර්ධන වේගය අඩුයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

පිළිගන්නවා, ගරු ඇමතිතුමනි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අනික් රටවල තිබෙන තත්ත්වය මේකයි. දියුණු රටවල ඉහළ වර්ධන වේගයක් ලබා ගන්න බැහැ. හේතුව එම රටවල් දියුණු වෙලායි තිබෙන්නේ. ඇමෙරිකාව, ජපානය, එංගන්තය වාගේ දියුණු රටවල වර්ධන වේගය ඉතා සුළු අගයක් දක්වන්නේ. ආසියාවේ රටවල් ගත්තාම, චීනයේ සියයට 12.8ක් දක්වනවා; ඉන්දියාවේ සියයට 10.8ක් දක්වනවා. මෙතුමන්ලා කියන ආකාරයට ලංකාවේ සියයට 8ක් කියා අපට පිළිගන්න සිදු වනවා. හැබැයි ඇමතිතුමනි, මේ වර්ධන වේගය වැඩි කර ගන්න පුළුවන්, දූෂණය නැති කළොත්. ලංකාවේ සියයට 2 දක්වා වර්ධන වේගය අඩු වනවාය කියලා ආර්ථිකය විශේෂඥයෝ දක්වා තිබෙනවා. ඒක මා ඉදිරිපත් කරන්නම්.

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ)
(The Hon. Basil Rohana Rajapaksa)

අපි පිළිගන්නේ නැහැ. නමුත් -

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

හොඳයි, ඇමතිතුමනි. මට සුළු කාලයක් තිබෙන්නේ. ඔබතුමාට කථා කරන්න අවස්ථාව තිබෙනවා. ඇමතිතුමනි, I have a document with me which states:

"Corruption costs Sri Lanka 2% economic growth : senior economist"

" 'We always talk about the loss in growth due to the terrorist war, but we hardly talk of the loss due to due to this other terrorism - corruption', President of the Sri Lanka Economic Association (SLEA) Prof. A.D.V. de S. Indraratna said in a hard-hitting delivery, opening the annual session of the group".

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ ආකාරයෙන් දූෂණය නිසා බිලියන සියයකට වැඩි මුදලක් අපතේ යනවා. අප ඔබතුමන්ලාට කියන්නේ මේකයි. මේ දූෂණය වළක්වා ගත්තොත් ඔබතුමන්ලා බලාපොරොත්තු වන ආකාරයේ, ඒ වාගේම අප බලාපොරොත්තු වන ආකාරයේ - [බාධා කිරීමක්] මේ රටේ ඉදිරි ගමන අපත් බලාපොරොත්තු වෙනවා. ඔබතුමන්ලා රට සංවර්ධනය කළොත් ලබා ගන්නා ආණ්ඩුව හොඳ තත්ත්වයකින් අපට ඉදිරියට ගෙන යන්නට පුළුවන්. [බාධා කිරීම්] කවදා හෝ වන්නට පුළුවන්. [බාධා කිරීම්] අපේ එහෙම කාලකණ්ණි අදහසක් නැහැ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. [බාධා කිරීම්] රට වෙනුවෙන්, රටේ ඉදිරි අනාගතය වෙනුවෙන් අපට ලැබී තිබෙන මේ මහඟු අවස්ථාව උපයෝගී කර ගන්න ඕනෑ. මේ රට ඉදිරියට ගෙන යන්නට පුළුවන් පසුබිමක් මේ වෙලාවේ ඇති වෙලා තිබෙනවාය කියන එක ගැන අප ආඩම්බර වෙනවා. දූෂණය නැවැත්වුවොත් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අවුරුද්දෙන් අවුරුද්දට අපට සියයට 2ක ආර්ථික වර්ධන වේගයක් තබා ගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි රජයේ ආයතනවල දූෂණය රුපියල් බිලියන 25යි. රජයේ සේවකයන්ගේ දූෂණය නිසා බිලියන 25ක් පාඩු ලබනවා අවුරුදු හතරකට. අප ගරු ඇමතිතුමාගෙන් අහනවා, -[බාධා කිරීමක්]ඔබතුමාගෙන් නොවෙයි. අප ගරු ඇමතිතුමාගෙන් අහනවා, "මිහින් ලංකා"ආයතනය කාගේ වුවමනාවට ද පටන් ගත්තේ කියා. "මිහින් ලංකා" ආයතනය පටන් අරගෙන ලැබුණු වාසිය මොකක්ද? "මිහින් ලංකා" එක දිගින් දිගටම පාඩු ලබනවා. වග කිව යුතු ඇමතිවරයෙකු වශයෙන් ඔබතුමාට හැකියාවක් තිබෙනවා ඒ දූෂණ නවත්වන්න. [බාධා කිරීමක්] ඔබතුමාට අප බාධා කළේ නැහැ. [බාධා කිරීමක්]

**ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා**
( மாண்புமிகு அருந்திக்க பர்னாந்து )
(The Hon. Arundika Fernando)

Those are services.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Service එක කොහේද අහස් යාත්‍රාවල තිබෙන්නේ? ඔබතුමාගේ service එකට ද? ඔබතුමාගේ service එක මම කියන්නම්. ගමේ ඉන්න අහිංසක මිනිසුන්ට, ගමේ ඉන්න කොල්ලන්ට කෙල්ලන්ට ඔය අහස් යාත්‍රාවල service ඕනෑ නැහැ. ඔබතුමාට නම් service එක ඕනෑ. අහස් යාත්‍රා දෙක තුනක් ඕනෑ ඔබතුමාට එහෙට මෙහෙට යන්න. අප දන්නවා ඔබතුමාගේ service එක. ඔබතුමා මේ අහිංසක දුප්පත් ජනතාව ගැන - [බාධා කිරීමක්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Hon. Sujeewa Senasinghe, please wind up now.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මානව සංවර්ධන දර්ශකය ගැන කියන්න ඕනෑ. මෙන්න මේවා තමයි වැදගත් වන්නේ. අද මොකක්ද තත්ත්වය මානව සංවර්ධන දර්ශකයේ? එහි අද ලංකාව ඉන්නේ 97වන ස්ථානයේ. 2001 වර්ෂයේ මානව සංවර්ධන දර්ශකයේ 81වන ස්ථානයේ හිටියේ. අප ඔබතුමන්ලාගෙන් ඉල්ලන්නේ යුද්ධය පවතින අවස්ථාවේදී මේ රටට පුළුවන් වුණා නම් මානව සංවර්ධන දර්ශකය - [බාධා කිරීමක්] හරි. 2010 වර්ෂයේ 93වන ස්ථානයේ. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී කියන්න පුළුවන්. යුද්ධයක් තිබෙද්දී රටේ විශාල ප්‍රශ්න තිබෙන බව ඔබතුමාලා පිළිගන්නවා. යුද්ධය තිබෙන අවස්ථාවේදී මානව සංවර්ධන දර්ශකය 93වන ස්ථානයේ තිබුණා නම්, යුද්ධය නැති වෙලා අවුරුදු තුනක් යන කොට මේ මානව සංවර්ධන දර්ශකය 70වන ස්ථානයේ, 60වන ස්ථානයේ තිබෙන්න ඕනෑ. යුද්ධය අවසාන වුණාට පස්සේ සංවර්ධනය සම්බන්ධයෙන්, සියලු දේවල් සම්බන්ධයෙන් මේ ආණ්ඩුව දූෂණය නවත්වා හරියට කටයුතු කළා නම්, හරි විධියට කළමනාකාරිත්වයක් දුන්නා නම් මේ මානව සංවර්ධන දර්ශකය 80වන ස්ථානයට අපට ගේන්න පුළුවන් වනවා. එවැනි මට්ටමකට ගේන්න පුළුවන් හැකියාව මේ රටට තිබෙනවා. ඒ දක්ෂතාව, නිපුණත්වය තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දළ ජාතික නිෂ්පාදනය -[බාධා කිරීමක්] 2004 දී සියයට 15යි. [බාධා කිරීම්]

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

Order, please! Hon. Member, please wind up now.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

I have taken only 10 minutes.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

No, I have given you 15 minutes.

**ගරු සුජීව සේනසිංහ මහතා**
( மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

Sir, please give me three more minutes.

**නියෝජ්‍ය සභාපතිතුමා**
(பிரதித் தவிசாளர் அவர்கள்)
(The Deputy Chairman)

I am sorry I cannot give you anymore time because the Hon. Basil Rajapaksa has to speak.

[අ. භා. 5.57]

**ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා (ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பெஸில் ரோஹண ராஜபக்ஷ - பொருளாதார அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Basil Rohana Rajapaksa - Minister of Economic Development)

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට කථා කරන්න තිබෙන්නේ ඉතාම කෙටි කාලයයි. මම ප්‍රථමයෙන්ම ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය ගැන කියන්න ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා මෙම අමාත්‍යාංශය මට භාර දුන්නාට පස්සේ එතුමා බලාපොරොත්තු වෙච්ච මූලික කාරණා ඉෂ්ට කර ගන්නට අපට හැකි වුණාය කියන එක කියන්න ඕනෑ. ඒ වාගේම අතිගරු ජනාධිපතිතුමා ඇතුළු මේ රජය කෙරෙහි එදා ජනතාව තැබූ විශ්වාසය එන්න එන්නම වර්ධනය කර ගන්නට අපට හැකි වුණාය කියන එකත් මේ අවස්ථාවේදී ඉතාම සන්තෝෂයෙන් සඳහන් කරනවා.

මා මේ වෙලාවේ විපක්ෂයට පිළිතුරු දෙන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මොකද, විපක්ෂයෙන් ගෙනා හුඟක් කාරණා, කථා කළ දේවල් මෙම අමාත්‍යාංශයට අදාළ ඒවා නොවෙයි. ඒවා පොදුවේ ආර්ථිකයට සම්බන්ධ ඒවා. ඒක විපක්ෂයට අයිති කාර්යයක් වන්නට පුළුවන්. නමුත් අය වැය විවාදයේ කාරක සභා අවස්ථාවේ අප කළ යුත්තේ ඒ අදාළ අමාත්‍යාංශයට සම්බන්ධ දේවල් ගැන සාකච්ඡා කිරීමයි.

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය එක් කෙනෙකුට තනියම කරන්නට පුළුවන් අමාත්‍යාංශයක් නොවෙයි. අමාත්‍යාංශ ගණනාවක් සම්බන්ධ වෙලා තමයි මේ අමාත්‍යාංශයේ කටයුතු කරන්න පුළුවන් වුණේ. විශේෂයෙන්ම ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු පස් දෙනෙකු අපට නායකත්වය දුන්නා. විශේෂයෙන්ම කෘෂිකර්ම ක්ෂේත්‍රය පිළිබඳව අතාවුද සෙනෙවිරත්න ඇමතිතුමාත්, කර්මාන්ත ක්ෂේත්‍රය පිළිබඳව ෆවුසි ඇමතිතුමාත්, ධීවර හා පශු සම්පත් ක්ෂේත්‍රය පිළිබඳව මිල්රෝයි ප්‍රනාන්දු ඇමතිතුමාත්, මුදල් ක්ෂේත්‍රය හා ජාත්‍යන්තර ආයෝජන පිළිබඳව සරත් අමුණුගම ඇමතිතුමාත් නායකත්වය ලබා දුන්නා. ඒ වාගේම නාවින්න ඇමතිතුමාත්, පියසේන ගමගේ ඇමතිතුමාත් විවිධ කමිටුවලදී අපට නායකත්වය දුන්නා. ඒ වාගේම කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ, ධීවර ක්ෂේත්‍රයට සම්බන්ධ, කර්මාන්ත ක්ෂේත්‍රයට හා විද්‍යා කටයුතු ක්ෂේත්‍රයට සම්බන්ධ අමාත්‍යාංශ රාශියක් අපිට උදවු කළා. ඒ අමාත්‍යාංශවල අමාත්‍යවරු ඇතුළු ලේකම්වරුන්ටත්, සියලුම නිලධාරීන්ටත් මේ අවස්ථාවේදී මම ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මම මෙහිදී සඳහන් කරන්න ඕනෑ අපේ අමාත්‍යාංශය යටතේ හුඟක් කටයුතු තිබෙන බව. නමුත් විපක්ෂය කථා කළා නම් කථා කළේ ආයෝජන පැත්ත ගැනයි. ග්‍රාමීය ජනතාව වෙනුවෙන් තිබෙන ක්ෂේත්‍රයට තමයි අපි වැඩි අවධානය යොමු කළේ. මේ උත්තරීතර සභාවෙන් අපට වැඩියෙන් මුදල් වෙන් කරලා දෙන්නේ ඒ අංශයටයි. විශේෂයෙන්ම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ඉඳලා උපදේශක කාරක සභාව දක්වා සෑම

[ගරු බැසිල් රෝහණ රාජපක්ෂ මහතා]

කටයුත්තකදීම අපට උදවු කළා. ඒ කටයුතුවලට සම්බන්ධ වුණු දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන්ටත්, ප්‍රාදේශීය සංවර්ධන කමිටුවල සභාපතිවරු හැටියට කටයුතු කරපු සියලුම මන්ත්‍රීවරුන්ටත්, ඇමතිවරුන්ටත්, ඒ වාගේම විපක්ෂයෙන් එයට සහභාගි වුණු සියලුම මන්ත්‍රීවරුන්ටත් ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම පළාත් සභාවල මහ ඇමතිවරු, අමාත්‍යවරු, මන්ත්‍රීවරු, ඒ වාගේම ප්‍රාදේශීය සභාවල සභාපතිවරු ඇතුළු සියලු දෙනාට, නගර සභාවල, මහ නගර සභාවල නගරාධිපතිවරු, ඒ වාගේම ගම් මට්ටමේ ඉන්න අපේ සංවිධානවල අය යන මේ හැම දෙනාටම අපේ අමාත්‍යාංශයට පූර්ණකාලීනව සහයෝගය දීම පිළිබඳව මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා. ඒ වාගේම විශේෂයෙන්ම පළාත් සභාවල ප්‍රධාන ලේකම්වරු, ඒ වාගේම දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු ඉඳලා ගම් මට්ටමේ ඉන්න ග්‍රාම සේවා නිලධාරින්, සමෘද්ධි නිලධාරින්, කෘෂි පර්යේෂණ නිලධාරින්, පවුල් සෞඛ්‍ය නිලධාරින් ඇතුළු හැම මට්ටමකම සෑම නිලධාරියෙක්ම අපට දීපු සහයෝගය මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරනවා.

විශේෂයෙන්ම අපේ අමාත්‍යාංශයේ ලේකම් පී.බී. ජයසුන්දර මැතිතුමාගේ, ඒ වාගේම අතිරේක ලේකම්වරුන්ගේ, අධ්‍යක්ෂක ජනරාල්වරුන්ගේ සහ අනෙකුත් සියලුම නිලධාරින්ගේ සහයෝගය මත අපිට මේ කාර්ය ඉෂ්ට කර ගන්න හැකියාව ලැබුණා. ඒ නිසා මම ඒ සියලු දෙනාටම මේ අවස්ථාවේදී ස්තුතිවන්ත වෙනවා.

පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීම් වාර මම හිතන්නේ අපි මේ වර්ෂය තුළ 12ක් පවත්වලා තිබෙනවා කියලායි. ඒ රැස්වීම් 12ට සහභාගි වෙලා අපට දක්වපු සහයෝගයට විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ටත් මේ අවස්ථාවේදී මම විශේෂ ස්තුතියක් පුද කරනවා.

මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ විපක්ෂයෙන් මතු කරපු එක කාරණයක් පිළිබඳව. මෙහිදී මතු වුණා විදේශ ආයෝජන පිළිබඳව. මම පැහැදිලිව කියන්න ඕනෑ විදේශ ආයෝජන අපේ රටට අවශ්‍යයි කියා. ඒකේ කිසිම ප්‍රශ්නයක් නැහැ. අපි ඒක පිළිගන්න සූදානම්. අපි ඒ වාගේම කියනවා විදේශ ආයෝජකයෙක් කියන්නේ ව්‍යාපාරිකයෙක් බව. ව්‍යාපාරිකයෙක් කියන්නේ ලාභ ලබන්න මේ රටට එන එක්කෙනෙක්. ඒ අය අපට තිබෙන ආදරයට වඩා ඔවුන් කෙරෙහි තිබෙන ආදරය උඩ එන අය. මට මතක් වෙනවා මේ ළඟදී ආපු ලෝක බැංකුවේ නියෝජ්‍ය සභාපතිතුමිය කියපු කථාවක්. එතුමිය කිව්වා, රටට ආයෝජනය ගෙන එන එක හොඳයි. නමුත් රට විකුණනවා යැයි කියන මතය ජනතාවට දෙන්න එපා, ඒ අනුව කටයුතු කරන්න එපා කියලා. ඒක නිසා අපි ආයෝජකයෝ එන කොට ඉතාම පරිස්සමින්, කල්පනාවෙන් කටයුතු කරන්න ඕනෑ. අපි ජනතාව ශක්තිමත් කරලා, ගමේ ඉන්න ගොවියා, කම්කරුවා, ඒ වාගේම ස්වයං රැකියා කරන අය, කුඩා ව්‍යාපාරිකයෝ ඇතුළු සියලු දෙනා ශක්තිමත් කරලා, ඔවුන් ලවා ආයෝජනය කරලා මේ රට දියුණු කරන බලාපොරොත්තුවයි අපේ තිබෙන්නේ. ඒ බව ප්‍රකාශ කරමින් අපට සහයෝගය දැක්වූ සියලු දෙනාටම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා

"105 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 1,130,650,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

105 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 370,750,000

"105 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 370,750,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

105 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 6,986,000,000

"105 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 6,986,000,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

105 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම,
රු. 84,489,840,000

"105 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 84,489,840,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

105 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**218 වන ශීර්ෂය.- සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු.10,093,350,000

"218 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 10,093,350,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

218 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

01 වන වැඩසටහන.- මෙහෙයුම් වැඩසටහන - මූලධන වියදම,
රු. 38,400,000

"218 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 38,400,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

218 වන ශීර්ෂයෙහි 01 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

**294 වන ශීර්ෂය.- ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව**

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම,
රු. 150,110,000

"294 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 150,110,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

294 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 763,425,000

"294 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 763,425,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

294 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 305 වන ශීර්ෂය.- උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 16,115,000

"305 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 16,115,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

305 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 1,225,000

"305 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 1,225,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

305 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

### 322 වන ශීර්ෂය.- ජාතික උද්භිද උද්‍යාන දෙපාර්තමේන්තුව

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - පුනරාවර්තන වියදම, රු. 171,215,000

"322 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම සඳහා රු. 171,215,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළ යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

322 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, පුනරාවර්තන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

02 වන වැඩසටහන.- සංවර්ධන වැඩසටහන - මූලධන වියදම, රු. 360,250,000

"322 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම සඳහා රු. 360,250,000ක මුදල උපලේඛනයට ඇතුළත් කළයුතුය"යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.

322 වන ශීර්ෂයෙහි 02 වන වැඩසටහන, මූලධන වියදම උපලේඛනයෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

"தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 1,130,650,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 370,750,000

"தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 370,750,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 6,986,000,000

"தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 6,986,000,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 84,489,840,000

"தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 84,489,840,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 105, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 218.- சமுர்த்தி ஆணையாளர் நாயகம் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 10,093,350,000

"தலைப்பு 218, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 10,093,350,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 218, நிகழ்ச்சித்திட்டம் 01, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 01.- செயல்முறைச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 38,400,000

"தலைப்பு 218, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவுக்கான ரூபா 38,400,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 218, நிகழ்ச்சித்திட்டம் 01, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 294.- தேசிய விலங்கினக் காட்சிச்சாலைத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 150,110,000

"தலைப்பு 294, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 150,110,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 294, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 763,425,000**

"தலைப்பு 294, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 763,425,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 294, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 305.- மலைநாட்டு கிராமிய புனர்வாழ்வளிப்புத் திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 16,115,000

"தலைப்பு 305, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 16,115,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 305, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 1,225,000

"தலைப்பு 305, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 1,225,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 305, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

**தலைப்பு 322.- தேசிய தாவரவியற் பூங்கா திணைக்களம்**

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மீண்டுவருஞ் செலவு ரூபா 171,215,000

"தலைப்பு 322, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவுக்கான ரூபா 171,215,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப் பட்டது.

தலைப்பு 322, நிகழ்ச்சித்திட்டம் 02, மீண்டுவருஞ் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

நிகழ்ச்சித்திட்டம் 02.- அபிவிருத்திச் செயற்பாடுகள் - மூலதனச் செலவு ரூபா 360,250,000

"தலைப்பு 322, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவுக்கான ரூபா 360,250,000 அட்டவணையிற் சேர்க்கப்படுமாக" எனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

தலைப்பு 322, நிகழ்ச்சித்திட்டம் 02, மூலதனச் செலவு அட்டவணையின் பகுதியாக இருக்கக் கட்டளையிடப்பட்டது.

Question, "That the sum of Rs. 1,130,650,000, for Head 105, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 105, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 370,750,000

Question, "That the sum of Rs. 370,750,000, for Head 105, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 105, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 6,986,000,000

Question, "That the sum of Rs. 6,986,000,000, for Head 105, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 105, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 84,489,840,000

Question, "That the sum of Rs. 84,489,840,000, for Head 105, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 105, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 218. - DEPARTMENT OF COMMISSIONER GENERAL OF SAMURDHI

Programme 01. - Operational Activities - Recurrent Expenditure, Rs. 10,093,350,000

Question, "That the sum of Rs. 10,093,350,000, for Head 218, Programme 01, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 218, Programme 01, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 01. - Operational Activities - Capital Expenditure, Rs. 38,400,000

Question, "That the sum of Rs. 38,400,000, for Head 218, Programme 01, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 218, Programme 01, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 294.- DEPARTMENT OF NATIONAL ZOOLOGICAL GARDENS

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 150,110,000

Question, "That the sum of Rs. 150,110,000, for Head 294, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 294, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 763,425,000

Question, "That the sum of Rs. 763,425,000, for Head 294, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 294, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 305. - DEPARTMENT OF UP-COUNTRY PEASANTRY REHABILITATION

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 16,115,000

Question, "That the sum of Rs. 16,115,000, for Head 305, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 305, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 1,225,000

Question, "That the sum of Rs. 1,225,000, for Head 305, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 305, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

HEAD 322. - DEPARTMENT OF NATIONAL BOTANICAL GARDENS

Programme 02. - Development Activities - Recurrent Expenditure, Rs. 171,215,000

Question, "That the sum of Rs. 171,215,000, for Head 322, Programme 02, Recurrent Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 322, Programme 02, Recurrent Expenditure, ordered to stand part of the Schedule.

Programme 02. - Development Activities - Capital Expenditure, Rs. 360,250,000

Question, "That the sum of Rs. 360,250,000, for Head 322, Programme 02, Capital Expenditure, be inserted in the Schedule" put and agreed to.

Head 322, Programme 02, Capital Expenditure, ordered to stand part of the Schedule.

***එකල්හි වේලාව අ. භා. 6.00 වූයෙන්, පාර්ලිමේන්තුවට ප්‍රගතිය වාර්තා කරනු පිණිස නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් විය.***

***කාරක සභාව ප්‍රගතිය වාර්තා කරයි; නැවත රැස්වීම 2011 දෙසැම්බර් මස 05 වන සඳුදා.***

*நேரம் பி. ப. 6.00 மணியாகிவிடவே, குழுவின் பரிசீலனை பற்றி அறிவிக்கும் பொருட்டு தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகன்றார்கள்.*

*குழுவினது பரிசீலனை அறிவிக்கப்பட்டது; மீண்டும் கூடுவது 2011 டிசம்பர் 05, திங்கட்கிழமை.*

*It being 6.00 p.m., the Deputy Chairman left the Chair to report Progress.*

*Committee report Progress; to sit again on Monday, 05th December, 2011.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala de Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)

Now, it is time for the Adjournment Motion by the Hon. Gayantha Karunatileka. Before that, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

# බාල පෙට්‍රල් අවදානමෙන් පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම
## தரமற்ற பெற்றோல் ஆபத்திலிருந்து நுகர்வோரைப் பாதுகாத்தல்
## PROTECTION OF CONSUMERS FROM RISK OF SUBSTANDARD PETROL

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"ප්‍රමිතියෙන් තොර ඔක්ටේන් 90 වර්ගයේ බාල පෙට්‍රල් මෙට්‍රික් ටොන් 2600ක් දේශීය වෙළෙඳ පොළට යළි පැමිණීමේ අවදානම සහිතව තෙල් සංස්ථාව විසින් කැඳවන ලද ටෙන්ඩරය 2011.11.07වැනි දිනෙන් අවසන් වී ඇති බැවින් මෙම බාල පෙට්‍රල් යළි දේශීය වෙළෙඳ පොළට පැමිණීමේ අවදානම මතුව ඇති බැවින්ද කොන්දේසි රහිතව කැඳවා ඇති අදාළ ටෙන්ඩරය අවලංගු කර දේශීය වෙළෙඳ පොළට බාල පෙට්‍රල් පැමිණීමේ අවදානමෙන් පාරිභෝගිකයින් මුදවා ගන්නා මෙන් මෙම ගරු සභාවට යෝජනා කරමි."

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ටෙන්ඩර් එක කැඳවා තිබුණා. ඒක අවලංගු කළා. ඒක අවලංගු කරලා අපි නැප්තා වාගේ මිලදී ගන්නා අයගෙන් මිල ගණන් කැඳවා දැන් බොහෝ දුරට finalize කර තිබෙන්නේ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

එතුමා වග කීමක් ඇතුව කියන උත්තරය අපි භාර ගනිමු. බාල පෙට්‍රල් ගෙන්වූ මොහොතේ ඉඳලා මේ ගැන කියද්දි අපේ ඛනිජ තෙල් කර්මාන්ත නියෝජ්‍ය අමාත්‍යතුමා දිගින් දිගටම අපට කිව්වේ,"මේකේ මොනම විධියකවත් දූෂිත ගනුදෙනුවක් වෙලාත් නැහැ; බාල පෙට්‍රල් ගෙනල්ලාත් නැහැ; මේවා කොළොන්නාවේ ටැංකිවල සහ පිරවුම්හල්වල ටැංකිවල වැහි වතුර කලවම් වීම නිසා වුණු දෙයක්" කියායි. හැබැයි, එදා වතුර කලවම් වෙලායි කියා පෙට්‍රල් ගනුදෙනුව යට දමන්න උත්සාහ කරපු නියෝජ්‍ය ඇමතිතුමාට, අද පාර්ලිමේන්තු සභාවේ මා මේ පිළිබඳව ප්‍රශ්න කරනකොට වතුර බෝතල් ප්‍රශ්නයක් නිසා, පාර්ලිමේන්තුවේ සදාචාරය පිළිබඳ ප්‍රශ්නයක් නිසා මේ සභාවට එන්න බැරි වෙලා ඉන්න එක ගැන මා කනගාටු වනවා. ඉස්සෙල්ලාත් අප මේ ප්‍රශ්නය ගෙනාවාම වතුරයි, අරවා මේවා කියා බාල වෙලා නැතැයි කියලා කිව්වා. කොමිටි වාර්තාවලින් තමයි ඊට පසු ආණ්ඩුව පිළිගත්තේ. ඒ නිසා මා හිතනවා, මේ විවාදයේදී අපි ඔබතුමාගේ උත්තරය බලාපොරොත්තු වන එක හොඳයි කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රණවිරුවෝ යුද්ධය දිනා දුන්නාට පසු රට සංසුන් වූ මොහොතක අමාත්‍යාංශ, සංස්ථා, රජයට සම්බන්ධ සමාගම් ආදියට ඉතා හොඳින් කටයුතු කරන්න පුළුවන් පරිසරයක් තමයි උදා වුණේ. ඒ නිසා ඇමතිවරුන්ට, අමාත්‍යාංශ ලේකම්වරුන්ට, සභාපතිවරුන්ට ඒ ආයතනවලට බියෙන් සැකෙන් තොරව යන්නට එන්නට හැකියාවකුත් හොඳ මානසිකත්වයෙන් වැඩ කිරීමේ පරිසරයකුත් අපේ රණවිරුවන්ට පින් සිද්ධ වන්න උදා වුණා. [බාධා කිරීමක්] අපි ඒක හැම දාම කිව්වා, එතුමාගේ දේශපාලන නායකත්වයත්, අනෙක් දේශපාලන පක්ෂ විටින් විට කරපු දේවලුත්, සියලු ජනතාවත් කරපු කැපවීම් නිසාය කියා. එක පැත්තකින් පුදුමයට හේතු වන, තව පැත්තකින් වර්තමාන රජයේ ක්‍රියා කලාප දෙස බලන විට පුදුමයට හේතු නොවන, අනෙක් පැත්තෙන් ජනතාවගේ අවාසනාවට ආණ්ඩු විසින් පත් කරපු සමහර නිලධාරිනුත් ඒ අයට හිතවත් නිලධාරිනුත් එකතු වෙලා මේ රටට බොහොම ආන්දෝලනාත්මක ගනුදෙනුවක් හැටියට තමයි පසු ගිය දවස්වල බාල පෙට්‍රල් ගෙන්වූවේ.

ඒ තමයි තෙල් සංස්ථාව ටෙන්ඩර් කැඳවන ලද ඔක්ටේන් 90 පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600 ඇතුළත් දූෂිත, බාල පෙට්‍රල් මෙට්‍රික්ටොන් 20,000ක් මෙරටට ගෙන්වා බෙදා හැරීමේ බාල, දූෂිත ගනුදෙනුව. අපි මේක දූෂිත, බාල ගනුදෙනුවක් ලෙස කියන්නේ කාරණා කිහිපයක් නිසායි. තෙල් සංස්ථාව 1962 අවුරුද්දේ ඉඳලා පිරිපහදු කළ ඉන්ධන මිලට ගැනීමේදී සහ බොර තෙල් මිලට ගැනීමේදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන්, රාජ්‍ය ටෙන්ඩර් පරිපාටියට අනුකූලව බොහොම පැහැදිලි ක්‍රියාවලියක් පවත්වාගෙන ගියා. 2011 ජුනි මාසයේ 16වෙනි දා දක්වා එහෙම තමයි කටයුතු කළේ. නමුත් 2011 ජුනි 16වෙනි දා කොළඹ වරායට ගෙන්වූ පෙට්‍රල් මෙට්‍රික්ටොන් 20,000ම දූෂිත විධියටයි ගෙන්වා තිබෙන්නේ. පිරිපහදු කළ තෙල් ගෙන්වීමේදී අනුගමනය කරන ටෙන්ඩර් ක්‍රියාවලිය තමයි සංස්ථාවේ ලියා පදිංචි ඉන්ධන සැපයුම්කරුවන්ගෙන් සංස්ථාවට අවශ්‍ය කරන ඉන්ධන ප්‍රමාණය ලබා ගන්න ටෙන්ඩර් කැඳවන එක. නමුත් මේ පෙට්‍රල් මෙට්‍රික්ටොන් 20,000 ගෙන්වූවේ එහෙම නොවෙයි. මේ පෙට්‍රල් මෙට්‍රික්ටොන් 20,000 ගෙන්වූවේ සංස්ථාවේ ඉන්ධන සැපයීමට කිසිම දවසක ලියා පදිංචි වෙලා නැති, සිංගප්පූරුවේ ලියා පදිංචි ඉනොක් සමාගමෙන්. ඒක බරපතළ ප්‍රශ්නයක්. සිංගප්පූරුවේ ඉනොක් සමාගමෙන් මිලදී ගත්තෙත් අරුම පුදුම විධියකට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් සාමාන්‍යයෙන් මෙච්චර කල් අනුගමනය කළ ක්‍රමය තමයි ඉන්ධන සැපයුම්කරු විසින් තමන්ගේ නැවකින් එහෙම නැත්නම් ඔවුන් විසින් සොයා ගත්ත නැවකින් ඉන්ධන ලබා දීම. හැබැයි මෙතැනදී මොකක්ද වුණේ? ඉන්ධන දෙන්නේ ඉනොක් එකෙන්. මෙතැනදී නැව සොයා ගන්නේ සංස්ථාවේ වැඩ බලන සභාපති සහ නිලධාරින් විසින්. ලියා පදිංචි නොවූ සමාගමකින් ඉන්ධන ඇණවුම් කරනවා. ඊ ළඟට නැව සොයා ගන්නේ වැඩ බලන සභාපතිවරයා. ඒ වාගේම දින 30ක් ඇතුළත ඉන්ධන ඇණවුම් කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක වෙලා තිබුණේත් නැහැ. ඉනොක් සමාගමෙන්ම තෙල් ඇණවුම් කිරීමේ අවස්ථාව ලබා ගන්නට වංචනික විධියට අදාළ නිලධාරින් කූට ලෙස සැලසුම් කරලා තමයි මේ ක්‍රමයට අත ගැසුවේ. ඒ නිසා මේ පෙට්‍රල් තොගය මිලට ගන්නට මාස එකහමාරකට කලින් දෙපාරක්ම ටෙන්ඩර් කැඳවීමක් කළා. ඒ හැම වෙලාවේම ඉල්ලුම් කළේ ඉන්දියාවේ රිලයන්ස් සමාගම විතරයි. මේ සමාගම සංස්ථාවට වැඩිපුරම ඉන්ධන සැපයූ, සංස්ථාවේ ලියා පදිංචි සමාගමක්. ඒ වාගේම කවදාවත් බාල ඉන්ධන සංස්ථාවට දුන්නා කියලා වාර්තා වෙලා නැති සමාගමක්. දැන් පාර්ලිමේන්තු තහනමකට ලක් වෙලා ඉන්න අපේ නියෝජ්‍ය ඇමතිතුමා මමත් එක්කත් මේ කාරණය ගැන මාධ්‍යවල විවාද කිහිපයකට සහභාගි වුණා. එතුමා ඒ වෙලාවේ ඇවිල්ලා කිව්වා ඒකාධිකාරයක් ගොඩ නැඟෙන නිසා ඒ සමාගමට දුන්නේ නැහැ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන ප්‍රශ්නය මේකයි. ටෙන්ඩර් ක්‍රියාවලියේ කොතැනකවත් සඳහන් වෙලා නැහැ එක සමාගමක් විතරක් ඉල්ලුම් කළාම ඇණවුම් කරන්න බැහැයි කියලා. ටෙන්ඩර් ක්‍රියාවලියේ තිබෙන්නේ ලියා පදිංචි නැති සමාගමකින් ඉල්ලුම් කළ විට දෙන්න බැරි බව විතරයි. ඒ වාගේම සංස්ථාව ඉල්ලන දිනයට තෙල් ලබා දිය නොහැකි සමාගමකට දෙන්න බැහැ කියන එකත් ඒකේ තිබෙනවා. ඒ වාගේම සංස්ථාවේ අදාළ ප්‍රමිතීන්ට අනුව තෙල් දෙන්න බැරි සමාගම්වලට ටෙන්ඩර් දෙන්න එපා කියලාත් ඒකේ සඳහන් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංස්ථාවට මීට පෙර තෙල් සපයා යම් යම් වැරදි මත ලියා පදිංචිය ඉවත් කර තිබේ නම් එවැනි සමාගම්වලටත් දෙන්න පුළුවන්කමක් නැහැ. ඒත් මේ දක්වාම ඉතා හොඳ තෙල් ලබා දීලා තිබෙන රිලයන්ස් සමාගමට නොදී, ඉන්ධන හිඟයක් කෘත්‍රිමව ඇති වෙන්න කටයුතු කළ නිලධාරින් සංස්ථාවේ ලියා පදිංචි නැති, කවදාවත් සංස්ථාවට තෙල් සපයා නැති සිංගප්පූරුවේ ඉනොක් සමාගමට මේ ටෙන්ඩරය දුන්නේ ටෙන්ඩර් පරිපාටියෙන් සම්පූර්ණයෙන්ම බැහැර වෙලායි. මේක මම කියන කථාවක් නොවෙයි ඇමතිතුමනි. මේක මමවත්, අපේ පක්ෂයෙන්වත්, එහෙම නැත්නම් අපේ වෘත්තීය සමිතිවලින්වත්, බාල පෙට්‍රල් පාවිච්චි කරලා අලාභයට පත් වෙච්ච පාරිභෝගිකයෝවත්, මාධ්‍යවත් කියන කථාවක් නොවෙයි. ගොතපු කථාවක් නොවෙයි.

අපේත්, මාධ්‍යයේත්, ජනතාවගේත් දැඩි බලපෑම නිසා ඇමතිතුමා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කළා. ඒ කමිටුවේ වාර්තාවට අනුවත් මේ සියලු දේවල් අද අනාවරණය වෙලා තිබෙනවා. කමිටුව පත් කරන්න ඉස්සර වෙලා, කමිටු වාර්තාව පිට වෙන්න ඉස්සර වෙලා, බාල පෙට්‍රල් බෙදලා වාහන අතරමඟ නතර වෙන විටම අපි ඒ ටික මේ විධියටම කිව්වා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. නමුත් රජය මොකක්ද කළේ? අශ්වයා ඉස්තාලයෙන් පැන්නාට පස්සේ ඉස්තාලය වහන සුපුරුදු සම්ප්‍රදායය තමයි මෙතැනදීත් රජය අනුගමනය කළේ. අනික් වැරැදිවලට වාගේම මේ පාඩුවත් අද ජනතාවට තමයි විඳවන්න වෙලා තිබෙන්නේ.

කමිටු වාර්තාව පිට වෙලා දැන් තුන් මාසයක් විතර වෙනවා. බාල පෙට්‍රල් ගෙන්වලා රටටත්, ජනතාවටත් අසීමිත පාඩුවක් ගෙන දුන් මේ දූෂිත ගනුදෙනුවට සම්බන්ධ අදාළ සමාගමටවත්, සම්බන්ධ නිලධාරියකුටවත් විරුද්ධව කිසිම ක්‍රියා මාර්ගයක් ගන්න මේ වන තුරු රජයට බැරි වෙලා තිබෙනවා. ඒ නිසා මේ දූෂිත ගනුදෙනුවේ සියලු වගකීම් රජය භාරගත යුතුව තිබෙනවා. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව පොඩ්ඩක් කාලය දෙන්න. විනාඩි 15යි නේ තිබෙන්නේ. [බාධා කිරීමක්]

මම මේ කියා ගෙන එන්නේ මේ දේ සිදු වෙච්ච විදිය. මම දැන් ඉතිරි වෙච්ච පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600 ගැන කියනවා. ඉතිරි වෙච්ච බාල පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600 විකිණීමට ටෙන්ඩර් දැමීම තුළින් යළිත් ජනතාවට බාල පෙට්‍රල් මිලට ගැනීමට සිදු වන අවදානමක් අප පැහැදිලිවම දකිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600ක් කියන්නේ ලීටර් 37,20,600ක විතර ප්‍රමාණයක්. කමිටු වාර්තාවේ පැහැදිලිවම සඳහන් වෙනවා, ප්‍රමිතියෙන් තොර මෙට්‍රික්ටොන් 595ක් සෘජුවම වෙළෙඳ පොළට නිකුත් කරපු නිසායි මේ ගැටලුව මතු වුණේ කියලා. ඒ වාගේම කමිටුව නිර්දේශ කරනවා අදාළ සමාගමෙන් හරි ඊට වග කිව යුතු නිලධාරින්ගෙන් හරි මේ පාඩුව අය කර ගත යුතුයි කියලා. නමුත් මා වග කීමෙන් පවසනවා මෙට්‍රික්ටොන් 595 පමණක් නොවෙයි, බෙදා හැරිය මෙට්‍රික්ටොන් 17,500ම ප්‍රමිතියෙන් තොර ඒවා බව. මා එහෙම කියන්නේ ඇමතිවරයා පත් කරපු ඛනිජ තෙල් තොග සමාගමේ සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂවරයා ජූලි මාසයේ 11වැනි දා මාධ්‍යට ඇවිල්ලා එහෙම පිළිගත්ත නිසායි. අපි දිගටම කරපු චෝදනාව හරි බව ඊට දින 20කට පස්සේ, මෙට්‍රික්ටොන් 17,000ක් බෙදලා ඉවර වෙන තුරු ඉඳලා හරි ඒ සභාපතිවරයා පිළිගත්තා. ඒකෙන්ම තහවුරු වෙනවා ඉතිරි මෙට්‍රික්ටොන් 2,600ත් ප්‍රමිතියෙන් තොර බාල පෙට්‍රල් බව. නොවැම්බර් 07වැනි දායින් අවසන් වෙච්ච, තෙල් සංස්ථාව ටෙන්ඩර් කැඳවපු, ඔක්ටේන් 90 පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600 ප්‍රමිතියෙන් තොර බව ටෙන්ඩර් පත්‍රයේ කොතැනකවත් සඳහන් කරලා නැහැ. එහෙනම් මේවා බාල බව හංගලා, -නොකියා- යළි වෙළෙඳ පොළට නිකුත් කිරීමේ ඉඩ කඩ තියාගෙන තමයි මේ ටෙන්ඩරය කැඳවලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ බාල පෙට්‍රල් පිරවුම්හල්වලට හෝ පාරිභෝගිකයන්ට ලබා දිය නොහැකියි කියලා මේ ටෙන්ඩර් දැන්වීමේ සඳහන් කරලා නැහැ. දැන්වීමේ කොතැනකවත් සඳහන් කරලා නැහැ, බෙදුම්කරුවන්ට හෝ බෙදුම්කරුවන්ගේ සංගමයට මිලදී ගත නොහැක කියලා. ඒ නිසා මේ බාල පෙට්‍රල් යළි ජනතාව අතට පත්වීමේ දැඩි අවදානමක් අපි දකින නිසායි මේ කල් තැබීමේ යෝජනාව ගේන්න මා කල්පනා කළේ.

මේ බාල පෙට්‍රල් දෙන්නේ විදුලිබල මණ්ඩලයට හෝ විදුලි බලය නිපදවන පෞද්ගලික සමාගම්වලට විතරයි කියලා සංස්ථාව කියනවා නම්, ඒ බව ටෙන්ඩරයේ සඳහන් නොවීම තුළම සැබෑ අරමුණ එය නොවන බව අපට පැහැදිලි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදුලිබල මණ්ඩලය විදුලිය නිපදවන්නේ එක්කෝ ජල විදුලියෙන්. එහෙම නැත්නම් ඩීසල්වලින්. එහෙම නැත්නම් දැවි තෙල්වලින්. එහෙමත් නැත්නම් නැප්තා කියන ඉන්ධනවලින්. [බාධා කිරීමක්] ඒක තමයි මම කිව්වේ. මම දැන් ඒක කිව්වා. මම කිව්වා නැප්තාවලින් කියලා. එහෙනම් විදුලිබල මණ්ඩලයට මේ බාල පෙට්‍රල් මිලට ගන්න කිසිම අවශ්‍යතාවක් නැහැ.

ඊළඟට, පෞද්ගලික විදුලි සමාගම් විදුලිය නිපදවන්නේ ඩීසල්වලින් හෝ දැවි තෙල්වලින්. එහෙනම් පෞද්ගලික විදුලි සමාගම්වලටත් මේ බාල පෙට්‍රල් මිලට ගැනීමේ අවශ්‍යතාවක් නැහැ. ඇත්ත වශයෙන්ම තෙල් සංස්ථාව ටෙන්ඩර් දැන්වීමේ කිසිම තැනක සඳහන් කරලා නැහැ විදුලිබල මණ්ඩලයට විතරක් මේ පෙට්‍රල් ගන්න පුළුවන් කියලා. ඒ නිසා මේ බාල පෙට්‍රල් යළි වෙළෙඳ පොළට යෑමේ සෘජු හා වක්‍ර අවදානමක් ඇත්ත වශයෙන්ම පවතිනවා. ඒක නිසා තමයි මේ යෝජනාව අද මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න මා කල්පනා කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ටෙන්ඩරයේ කොහේවත් සඳහන් කරලා නැහැ, විදේශීය වෙළෙඳ පොළට අලෙවි කිරීම සඳහා යළි ප්‍රතිනැව්ගත කිරීමේ හැකියාව ඇති අයට පමණක් ඉදිරිපත් වෙන්න කියලා. ඒ අනුව මේ ටෙන්ඩරයේ "විදේශීය වෙළෙඳ පොළට පමණයි" කියලා කොන්දේසි දමලා නැහැ. පිරවුම්හල් හිමියන්ට, එහෙම නැත්නම් බෙදුම්කරුවන්ගේ සංගමයට ඉල්ලුම් කළ නොහැක කියලා කොන්දේසි දමලා නැහැ.

විදුලිය නිපදවන සමාගම්වලට විතරයි දෙන්නේ කියන කොන්දේසිය දාලා නැහැ. කොන්දේසි රහිත මේ ටෙන්ඩර් කැඳවීම නිසා යළිත් සියයට 100ක්ම බාල පෙට්‍රල් වෙළෙඳ පොළට යෑමේ අවදානම අද තිබෙනවා. සාමාන්‍යයෙන් ටෙන්ඩරයක් කැඳවන කොට අවම ලංසුවක් තිබෙනවා; අවම මිලක් සඳහන් කරනවා. දැන් මෙතැන එහෙම සිදු වෙලාත් නැහැ. මෙය අලෙවි කරන්නේ පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600ක මිලකටද, එහෙම නැත්නම් ඩීසල් මෙට්‍රික්ටොන් 2,600ක මිලකටද, එහෙම නැත්නම් භූමිතෙල් මෙට්‍රික්ටොන් 2,600ක මිලකටද, එහෙමත් නැත්නම් කළුතෙල් මෙට්‍රික්ටොන් 2,600ක මිලකටද කියලා කිසිම මිලක් මෙහි සඳහන් වෙලා නැහැ. අවම ලංසුවක් සඳහන් නැතිවයි මේ ටෙන්ඩරය කැඳවා තිබෙන්නේ. ගජ මිතුරන්ට මේවා සොච්චම් මිලකට ගන්නට ඉඩ හැරලා ජනතාව යළි ගසා කන්නට ඉඩ දීලා තිබෙන අවස්ථාවක් හැටියටත් අපට මේ ගැන සැකයක් තිබෙනවා.

ඇමතිතුමනි, අපට ආරංචියි දැනට හතර දෙනෙක් විතර ටෙන්ඩර් ඉල්ලා තිබෙනවා කියලා. වැඩිම ලංසුවට දෙන්න ඉඩ ඇති නිසා, දේශීය පාරිභෝගිකයා ආරක්ෂා කරන්න මේ ටෙන්ඩරය අවලංගු කරන්න කියන එක තමයි මම මේ යෝජනාවෙන් බලාපොරොත්තු වන්නේ. මා කථාව ආරම්භ කරන කොටම ඔබතුමා කිව්වා, දැන් මේ ටෙන්ඩරය අවලංගු කරලා කියලා. බාල පෙට්‍රල් ඇණවුම් කරන කොටත් ඔබතුමා විදේශගත වෙලා සිටියේ. මේ ටෙන්ඩරය කැඳවන කොටත් ඔබතුමා විදේශගත වෙලා සිටියේ. ඒ නිසා ඔබතුමා නැති වේලාවක් බලලා කවුරු හෝ මේ දේ කරනවාද කියන සැකයත් තිබෙනවා. එහෙම නැත්නම් මේවා වෙන්න දීලා,-[බාධා කිරීමක්] ඇමතිතුමනි, මම කිව්වේ, බාල පෙට්‍රල් ආනයනය කොටත් ඔබතුමා පිට රට සිටියේ කියලායි. මේ ටෙන්ඩරය කෝල් කරන කොටත් ඔබතුමා පිට රට සිටියේ. ඔබතුමා පිට රට යන තුරු ඉඳලා කවුරු හරි ගේමක් ගහනවාද කියලාත් අපට සැකයක් තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එහෙම දෙයක් තමයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙමත් නැත්නම් මේවා වෙන්න දීලා ඔබතුමා පිට රට යනවාද කියන ප්‍රශ්නයකුත් සමහරුන්ට තිබෙනවා. මම විශ්වාස කරන්නේ නැහැ, ඔබතුමා එහෙම කෙනෙක් කියලා. කොහොම වුණත් මේ අවදානම අපට තිබෙනවා. ඒ නිසා මේ ටෙන්ඩරය අවලංගු කරලා, මේ ඉන්ධන දේශීය වෙළෙඳ පොළට යන එක නතර කරලා, විදේශීය වෙළෙඳ පොළට පමණක් අලෙවි කරන්න පුළුවන් වන තත්ත්වයට ගෙනෙන්න. ඔබතුමා ඒක කිව්වා. නමුත්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

ඔබතුමා මේ ගරු සභාවේදීම ඒක ප්‍රකාශ කරන එක හොඳයි. මොකද, මේ බාල පෙට්‍රල් ගැන මුලදී අපි කියන කොට ඔබතුමන්ලා කිව්වේ, එහෙම දෙයක් වෙලා නැහැ, මේ ටැංකිවල වතුර තිබිලා, කුණු රොඩු තිබිලා, වැහි වතුර වැටිලා කියලානේ. එහෙම නේ කිව්වේ. ඒ නිසා මේ පිළිබඳ පැහැදිලි ප්‍රකාශයක් කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලමින් මම කථාව අවසන් කරනවා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා මේ යෝජනාව ස්ථිර කරයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම එම යෝජනාව ස්ථිර කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන්නේ විනාඩියක් -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට කථා කරන්න වේලාවක් නැහැ. ස්ථිර කරනවා පමණයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමාගේ කාලයෙන් විනාඩියක් දෙමුද?

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
හොඳයි.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ස්තුතියි, ගරු ඇමතිතුමනි. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ඉදිරිපත් කළේ හොඳ යෝජනාවක්. විශේෂයෙන්ම ඇමතිතුමා මේ සම්බන්ධයෙන් පරිස්සම් වන්න ඕනෑ. මේ කාරණය ගැන ගොඩක් දෝෂාරෝපණ එනවා. පවතින ලෝකයේ සිදු විය හැකි වැරදි නොවෙයි මේවා. වෙන රටවල්වල නම් ඒ සංස්ථාවල සභාපතිවරු, ඇමතිවරු ඉල්ලා අස් වෙන්නට අවශ්‍ය දෝෂ සහගත දේවල් මේවා. කෙසේ වෙතත් ඔබතුමා උගත් දක්ෂ ඇමතිවරයෙක්. ඔබතුමා මීට වැඩිය පරිස්සම් වන්න ඕනෑ. බාල තෙල් වෙළෙඳ පොළට ලැබිලා කියලා විරුද්ධ පාර්ශ්වය චෝදනා නඟද්දීත් ඔබතුමන්ලා කිව්වා, එහෙම දෙයක් සිදු වෙලා නැහැ කියලා. හැබැයි පස්සේ පිළිගත්තා. මේ නිසා රටේ ගොඩක් ප්‍රශ්න ඇති වුණා. වාහන විශාල ප්‍රමාණයක් මහ මඟ නැවතුණා. ඒ සම්බන්ධයෙන් කිසිම තීන්දුවක්, ඒ වාගේම ඒ සිද්ධියට අදාළ අය සම්බන්ධයෙන් නීතිමය ක්‍රියා මාර්ගයක් අරගෙන තිබුණේ නැහැ. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට මේ අවස්ථාවේ ඒ ඉතුරු ඉන්ධන ප්‍රමාණයත් ටෙන්ඩර් කරලා විකුණන්න යනවා. මුල් වරදට හරියාකාරව දඬුවම් දුන්නා නම් මීට වඩා ඒ නිලධාරීන් පරිස්සම් වනවා. ඔබතුමා අමාත්‍යවරයා වශයෙන් ක්‍රියාත්මක වන්න ඕනෑ, අදාළ නීති අංශ මේ සම්බන්ධයෙන් දැනුවත් කරන්න. මම කලිනුත් සඳහන් කළා, යම් කිසි පුද්ගලයකු මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම වග කියන්න ඕනෑ කියලා. ඒ වග කිය යුතු පුද්ගලයන් අද වන තෙක් නීතිය ඉදිරියට ඉදිරිපත් කරලා නැහැ. ඒ හේතුව නිසා ඒ පුද්ගලයෝ නැවත ඇවිල්ලා, ඉතිරි පෙට්‍රල් ප්‍රමාණයත් ඒ ආකාරයටම තමන්ගේ වාසියට වෙළෙඳාම සඳහා යොදා ගන්න උත්සාහ කරන ආකාරයක් තමයි දකින්න ලැබෙන්නේ. නීතියක් තිබෙන රටක ඒ විධියට කිසිසේත්ම සිදු විය යුතු නැහැ.ඔබතුමන්ලා කථා කරන ආකාරයට ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්චර්යය බවට පත් කිරීමට නම් මේ රටේ ජනතාවට බලපාන දේවල් සම්බන්ධයෙන් තීන්දු තීරණ ගැනීමේදී මීට වැඩිය වගකීමෙන් යුතුව ක්‍රියාත්මක වන්න ඕනෑ.

මම වැඩිදුර කථා කරන්නේ නැහැ, ඒ ටෙන්ඩරය අවලංගු කළා කියලා ඇමතිතුමා කියන නිසා. හැබැයි, මේ කරුණ සම්බන්ධයෙන් කටයුතු කළ සියලුම වග කිය යුතු නිලධාරීන් නීතිය ඉදිරියට ඉදිරිපත් කරලා, ඒ සම්බන්ධයෙන් ඔබතුමා පාර්ලිමේන්තුව දැනුවත් කිරීමක් කළොත් වඩා හොඳයි කියලායි මගේ අදහස. බොහොම ස්තුතියි.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා (ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த - பெற்றோலியக் கைத்தொழில்கள் அமைச்சர்)
(The Hon. A.D. Susil Premajayantha - Minister of Petroleum Industries)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතු කරන ලද ප්‍රශ්න කිහිපයකට ඉතාම කෙටියෙන් මා පිළිතුරු සපයන්නම්. මා හිතන්නේ අපේ ගයන්ත කරුණාතිලක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු මේ යෝජනාවට සම්බන්ධ යෝජනා කිහිපයක් මීට කලිනුත් Adjournment Motions හැටියට ඉදිරිපත් වුණා කියලායි. ඒ අවස්ථාවලදීත් මා පැහැදිලි කිරීම් කළා. හැන්සාඩ් වාර්තා බැලුවොත් එම ඉදිරිපත් කළ පිළිතුරු ඒවායේ තිබෙනවා. මා ප්‍රථමයෙන්ම සඳහන් කරන්නට ඕනෑ, මෙතුමා සඳහන් කරන ආකාරයට අපි පත් කළ කමිටුවේ වාර්තාවේ කොයිම තැනකවත් මේක දූෂිත ගනුදෙනුවක් කියලා සඳහන් කරලා නැහැ කියලා. [බාධා කිරීමක්] ඔව්, මා ඒ ටික කියන්නම්. ඒ වාර්තාවේ කොහේවත්- [බාධා කිරීමක්] මේක දූෂිත ගනුදෙනුවක් කියලා නැහැ. ඊළඟට මා- [බාධා කිරීමක්] ඉන්න, මා එකින් එක එන්නම්.

පසු ගිය අවුරුදු ගණන ගත්තොත් රිලයන්ස් සමාගම සියයට 70ක් සපයා තිබෙනවා. හැබැයි, මේ කියන අවස්ථාවට පෙරාතුව ටෙන්ඩර් දෙකක් ඒ අය පමණක් අයදුම් කරලා තිබෙනවා. රිලයන්ස් සමාගමේ අධිභාරය -premium එක- වැඩියි. ඒ දවස්වල Singapore Platts Rate එක අපි දිනපතා දන්නවා. Singapore Platts Rate එකේ ඉඳලා සාමාන්‍යයෙන් තිබෙන්නට ඕනෑ අධිභාරයට වඩා වැඩි අධිභාරයක් ආව නිසා ප්‍රසංපාදන කමිටුව එම ටෙන්ඩර් දෙක අවලංගු කරලා තිබෙනවා. තුන්වැනි එකත් ගත්තේ ඒගොල්ලන්. හැබැයි, තුන්වැනි එකේදී ඒගොල්ලන් කිව්වා, සතියක් පරක්කු වනවාය කියලා. ඒ අතරතුර අපේ refinery එකේ shutdown එකක් සිදු වුණා. ඒ කියන්නේ හදිසි අලුත්වැඩියාවකට වැහුවා. ඒ වැහුවාම, එතැනින් දවසකට පෙට්‍රල් ටොන් 700ක් එනවා, ඒක ආවේත් නැහැ. මෙතැනදී දින 7 - 10 ප්‍රමාණයකට, ඒ කියන්නේ දවසකට ටොන් 2,000ක් යනවා. එතකොට දවස් 10කට ටොන් 20,000යි. එතකොට මේ ප්‍රමාණයේ හිඟයක් එනවා. එහෙම ආවා නම් අද ඕක කියන්නේ නැහැ. එහෙනම් මුළු රටේම වාහන නවතිනවා. දැන් මේ නිලධාරීන් මොකද කළේ? ඒ අවස්ථාවේ දී ප්‍රසංපාදන කමිටුවේ එවකට වැඩ බලපු සභාපතිවරයා එයින් අනුමැතිය අරගෙන, -අතීතයේ එවැනි අවස්ථා තිබෙනවා. හදිසි අවස්ථාවලදී ක්ෂණිකව මිලදී ගැනීම් කරපු අවස්ථා තිබෙනවා.- ඒ ආකාරයට ටොන් 20,000ක් විතර ගත්තා. දැන් එතැන දූෂිත ගනුදෙනුවක් කරන්නට ඕනෑ නම් ටොන් 20,000ක් ගන්නට ඕනෑ නැහැ, ටොන් 50,000ක් ගෙනෙන්නට තිබුණා. නැත්නම් ටොන් 60,000ක් ගෙනෙන්නට තිබුණා. එතකොට මේ

ටොන් 20,000ක් ගෙනාපු එකෙන් ඉතා පැහැදිලිව පෙනෙනවා, දින හතක ප්‍රමාදය ආවා, refinery එක දින කිහිපයකට වැහුණා, ඒ නිසා මෙතැන දින 7 -10 අතර කාලයකට පෙට්‍රල් හිඟයක් ආවා කියලා. ඒ හිඟය වළක්වා ගන්න අවශ්‍ය ප්‍රමාණය පමණයි ගෙනාවේ. ඒ ගැන මා තව ආකාරයකින් සඳහන් කරන්නම්. [බාධා කිරීමක්] නැහැ, නැහැ, ඒක පරක්කු වුණේ නැහැ. ඒක ආවා. හැබැයි ඒකේ පිරිවිතරය-[බාධා කිරීමක්] ඉන්න, ඉන්න. ඒ ගෙනාපු පිරිවිතරයේ වෙනසක් තිබුණා.

සාමාන්‍යයෙන් සිදු වන්නේ අපේ පිරිපහදුවෙන් එන පෙට්‍රල් ටික ටැංකියේ දී blend වුණාම ඒ පිරිවිතරය නියමිත ගණනට එනවා. ඒක කරන්න විධියකුත් නැහැ, refinery එකේ තෙල් ආවේත් නැහැ. ඒ නිසා පෙට්‍රල් හිඟය වළක්වා ගන්න මොකක්ද කළේ? නැවෙන් ටැංකියට ගහපු තෙල් සාමාන්‍යයෙන් පැය 24ක් තිබෙනවා. එතකොට particles ඔක්කොම පහළට යනවා. වතුර ටික පහළට ගිහිල්ලා, drain කරනවා. ඒ කරන්න කලින් කෙළින්ම බවුසර් එකට ගැහුවා. ඒ ටොන් 595න් ගිය ඒවා ගැන තමයි පැමිණිලි 2,300ක් අපට ඇවිල්ලා තිබුණේ. ඒක අපේ අලෙවි අංශයෙන් පරීක්ෂා කළා. පරීක්ෂා කළාම ඉතා පැහැදිලිව පෙනුණා, blend වෙන්න කලින් ගිය පෙට්‍රල් ටික තමයි අර ටොන් 595 කියලා. ඒකෙන් තමයි වාහන කිහිපයක ඔය තිබෙන තත්ත්වය මතු වුණේ. ඉන් පසුව ගිය සියලු පෙට්‍රල් blend වෙලා යනකොට නියම විධියට ගියා.

ඊළඟ කාරණය තමයි මේ ENOC කියන සමාගම ලියා පදිංචි සමාගමක්. සිංගප්පූරුවේ තමයි trading arm එක තිබෙන්නේ. [බාධා කිරීමක්] නැහැ, සිංගප්පූරුවේ trading arm එක තිබෙන්නේ. [බාධා කිරීමක්] ඉන්න කෝ කියන්න, ඕනෑම තෙල් සපයන සමාගමක trading arm එක තිබෙන්නේ සිංගප්පූර්වලයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කම්ටු වාර්තාව පිළිගන්නවා, ලියා පදිංචි සමාගමක් නොවෙයි කියලා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
නැහැ, නැහැ, කම්ටු වාර්තාවේ පැහැදිලිව තිබෙනවා, ලියා පදිංචි සමාගමක් කියලා. මොකද හේතුව,- [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මා කියන එක අහගන්න. ENOC සමාගම අපට විතරක් නොවෙයි, මාලදිවයිනේ jet oil ඇතුළු සියලු දෙයක්ම- [බාධා කිරීමක්] මාලදිවයිනට ගියොත් තමුන්නාන්සේලාට පෙනෙයි ටැංකි හැම එකකම ගහලා තිබෙන්නේ ENOC කියලා. මුළු මාලදිවයිනටම තෙල් සපයන්නේ ENOC සමාගමෙන්. එතකොට ඕනෑම තෙල් සපයන මැද පෙරදිග සමාගමක හෝ වෙනත් සමාගමක trading arm එක තිබෙන්නේ සිංගප්පූරුවලයි. මොකද, සිංගප්පූරුවල තමයි spot market එකේ ගනුදෙනු සිදු වන්නේ.

මා තව උදාහරණයක් කියන්නම්, Petrobras ගැන. Petrobras කියන්නේ මොකක්ද? Petrobras කියන්නේ බ්‍රසීල රජයේ තෙල් සංස්ථාව වාගේ ආයතනයක්. එතකොට Petrobras එකේ trading arm එක තිබෙන්නේ සිංගප්පූරුවල, වියට්නාමයේ PV oil. වියට්නාමයේ PV oil කියන්නේ Ceylon Petroleum Corporation එක වාගේ සමාගමක්. Trading arm එක තිබෙන්නේ සිංගප්පූර්වල. ඒ නිසා හැම තෙල් සපයන සමාගමකම trading arm එක - trading කරන සමාගම- ලියා පදිංචි කරලා තිබෙන්නේ සිංගප්පූරුවල. නැත්නම් ඒවා trading කරන්න බැහැ. ඉතින් ඒක නිසා තෙල් සපයන්නේ ඩුබායිවලින්, නැත්නම් මැදපෙරදිගින්. සමහර ඒවායේ සිංගප්පූරුවේ තිබෙන stores වලින්. හැබැයි trading arm එක තිබෙන්නේ එතැන. ඒ නිසා ගනුදෙනුව සිදුවන්නේ trading arm එකත් එක්ක. අවසාන වශයෙන් එහි මුදල් යන්නේ මවු සමාගමට. ඒක තමයි මේ තෙල් tradingවල ස්වභාවය. [බාධා කිරීමක්] ඔව්, මා එතැනට එන්නම්. [බාධා කිරීමක්] ඉන්න, ඉන්න, මා ඒක පැහැදිලි කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි දැන් මේ ඉතිරි වෙලා තිබුණු තෙල් ටොන් 2,600ත් මා විදේශගත වෙලා ආපු ගමන් තමයි බෙදා හැරීම නැවැත්තුවේ. ඒක නවත්වන්නේ නැතිව තිබ්බා නම් මේ වන කොට ඒ ටිකත් වෙළඳ පොළට ගිහිල්ලා ඉවරයි. ඒ පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600 samples අර ගෙන අපි යැව්වා, ජර්මනියේ testing lab එකට; ලෝකයේ විශිෂ්ටතම lab එකට. මොකක්ද පිරිවිතරයේ සඳහන් කළේ? මේක අපේ තිබෙන සාමාන්‍ය පිරිවිතරයමයි කියලායි සඳහන් කළේ. මොකද, blend වුණාට පස්සේ නියම පිරිවිතරයට එනවා. එහෙම නම් මේ තිබෙන පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600 බාල ඒවා නොවෙයි. ඒවා නියම පෙට්‍රල්. නමුත් වාර්තාවේ කියා තිබෙනවා මේ ප්‍රමාණය නිකුත් කරන්න එපා කියලා. ඒ නිසා අපි ඒ වාර්තාවට එකඟ වෙලා මේ පෙට්‍රල් මෙට්‍රික්ටොන් 2,600 අපනයනය කරන්න තමයි හිටියේ. හැබැයි තමුන්නාන්සේ කිව්වා වාගේ මා නැති වෙලාවේ නැවත පත්තරයට ටෙන්ඩර් call කරලා තිබුණා, ගරු මන්ත්‍රීතුමනි. මම ඒක අවලංගු කළා. අපෙන් නැප්තා -දැවි තෙල්- ගන්නා විදේශ සමාගම් තිබෙනවා. අපි නැප්තා අපනයනය කරනවා. විදුලිබල මණ්ඩලයට දුන්නාට පස්සේත් වැඩිපුර තිබෙනවා. ඒ නිසා අපි ඒවා අපනයනය කරනවා. අපි කැඳෙව්වා, විදේශ ලියා පදිංචි සමාගම්වලින් quotations. තෙල් සංස්ථාව, ඒ ගෙනාපු quotationsවලින් එකක් දැන් තෝරා ගෙන තිබෙනවා. දැන් ඒවා අපනයනය සඳහා අවශ්‍ය පසු බිම සකස් කර ගෙන යනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විදේශ වෙළඳ පොළට.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
ඔව්, විදේශ වෙළඳ පොළට. ඒ විතරක් නොවෙයි ගරු මන්ත්‍රීතුමනි. තමුන්නාන්සේ කියපු මෙට්‍රික්ටොන් 2,600හි - තමුන්නාන්සේ කියපු ලීටර් ගණනෙහි- පිරිවැය අපට පාඩුවක් නොවන cost එකට නැවත යැවීමයි අරමුණ වෙලා තිබුණේ. අපට දැන් ඒ සඳහා හැකියාව ලැබිලා තිබෙනවා. අප ඒ ටික යවනවා. නියම පිරිවැයට ඒක යැව්වාම තෙල් සංස්ථාවට පාඩුවක් වන්නේ නැහැ. ඊළඟ කාරණය තමයි-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු ඇමතිතුමා-

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
මට ඉතිරි විනාඩි 5 දෙන්න ඕනෑ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
පස් වරු 6.30ට සභාව කල් තබන්න ඕනෑ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)
තව විනාඩි පහක් දෙන්න.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா )
(The Hon. (Dr.) Mervyn Silva)

වැඩක් නැහැ නේ ඉතින්. පරණ කථාවම නේ සුජීව මහත්මයා කියන්නේ.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

වන්දි ගෙවන්න තිබෙන ප්‍රමාණය ගණනය කර තිබෙනවා, දළ වශයෙන් මිලියන 35ක් කියා. දැන් ගෙවා ගෙන යනවා. ඒ ප්‍රමාණයත් අදාළ සමාගමෙන් අය කර ගැනීම සඳහා ලිපි හුවමාරු කරලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුතු සංස්ථාව දැන් කර ගෙන යනවා. එතකොට ඒ මෙට්‍රික්ටොන් 2,600 අපනයනය කිරීමෙන් එහි පිරිවැය ආවරණය කර ගැනීමටත්, වන්දි ගෙවන රුපියල් මිලියන 35ක් පමණ වන මුදල අය කර ගැනීමටත් අවශ්‍ය වෙනවා. මේ දෙක අය කර ගත්තාම පාඩුවක් නොවී මේ වෙච්ච සිද්ධිය අවසන් කරන්න අපට පුළුවන්.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු ඇමතිතුමනි, කලින් ඔබතුමා කිව්වා ඒ සමාගමට මුදල් ගෙවන එකත් නතර කළා කියලා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

නැහැ, නැහැ. ඉන්න මා කියන්නම්. L/C එකක් open කළාට පස්සේ සාමාන්‍යයෙන් ඒක නතර වන්නේ නැහැ. අප ගත්තු credit එක ඒ බැංකුවෙන් තමයි අදාළ මාස ගණනෙන් පස්සේ අපෙන් අය අර කර ගන්නේ. ඒ අතරතුර ඒක යනවා. හැබැයි ඒ මුල් අවස්ථාවේදීම, අපේ claim එකක් තිබෙනවා කියන එක අපි නිල වශයෙන් දැනුම් දුන්නා. අප දැන් ඒ ලිපි හුවමාරු කර ගෙන යනවා. තෙල් සංස්ථාවේ-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

ඔබතුමා කිව්වා, මුදල් ගෙවන එක නතර කළා කියලා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

හරි, හරි. මම කිව්වා, සංස්ථාවට නතර කරන්නය කියලා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මම කිව්වා, නතර කරන්නය කියලා. නමුත් තෙල් සංස්ථාව ණයවර ලිපියක් විවෘත කළාට පස්සේ නතර කිරීමක් වෙන්නේ නැහැ. මොකද, ණයවර ලිපිවල ස්වභාවය ඒකයි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ටෙන්ඩර් එක සම්බන්ධයෙනුත් එහෙම කරන්න එපා.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මෙහිදී එහෙම ප්‍රශ්නයක් මතු වන්නේ නැහැ. අප මේ ප්‍රමාණය අපනයනය කරලා cost එක recover කළාම සහ අර වන්දි මුදල - අපේ claim එක- ලබා ගත්තාම මෙයින් වෙනත් පාඩුවක් ඇති වන්නේ නැහැ. ඒ වාගේම අපි අදාළ නිලධාරින්ද අනිවාර්යය නිවාඩු යවලා තිබෙනවා. ලේකම්වරයා ඒ අවස්ථාවේදීම මාරු කරලා තිබෙනවා. ඒ සඳහා වෙනම පරීක්ෂණ දෙකක් පැවැත්වෙනවා, අභ්‍යන්තර වශයෙන්. ඒ අභ්‍යන්තර පරීක්ෂණ පැවැත්වුණාට පස්සේ තමයි, අපේ ගරු සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙතැනදී යම් ආකාරයක criminal liability එනවාද කියලා තීන්දු වුණාට පස්සේ තමයි ඒ සඳහා නීතිමය ක්‍රියා මාර්ගයට යන්න අපට පුළුවන් වන්නේ. Civil liability එකක් එන්නේ නැහැ මෙහි cost එක recover කර ගත්තාට පස්සේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

ගරු ඇමතිතුමා, දැන් සභාව කල් තැබීමේ වෙලාව. දැන් කථාව අවසාන කරන්න.

**ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு ஏ. டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන්නේ මේ දැනුවත් කිරීම ප්‍රමාණවත් කියලායි. ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට වැඩි පුරම දැන ගන්න ඕනෑ වුණේ මේවා අපේ වෙළඳ පොළට යනවාද කියන එකයි. මේවා අපේ වෙළඳ පොළට යන්න අපි ඉඩ තියන්නේ නැහැ. අප දැනට යොදා ගෙන තිබෙන වැඩ පිළිවෙළට අනුව තෙල් සංස්ථාව ඒ ප්‍රමාණය අපනයනය කරනවා. වෙළඳාමේ ස්වරූපය අනුව එහි යම් ප්‍රශ්නයක් මතු වේවිද කියා අපි දන්නේ නැහැ. දැනට ඒ කටයුතු කර ගෙන යනවා. අවසාන වශයෙන් අපට පුළුවන් ඕනෑ නම් ඒ සියල්ලම අපේ විදුලිබල මණ්ඩලයට සපයන්න. මොකද, නැප්තා වෙනුවට මේවා පාවිච්චි කරන්න පුළුවන්. කෙසේ වෙතත් මේ ප්‍රමාණය අපේ වෙළඳ පොළට යන්න ඉඩ තියන්නේ නැහැ.

**ගරු (ආචාර්ය) මර්වින් සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) மேர்வின் சில்வா)
(The Hon. (Dr.) Mervyn Silva)

වැඩිදුර විස්තර අවශ්‍ය නම් අමාත්‍යාංශයේදී හමු වන්න.

***එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2011 නොවැම්බර් මස 29 වන දින සභා සම්මුතිය අනුව, 2011 දෙසැම්බර් මස 05 වන සඳුදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.***

*அப்பொழுது, பி.ப. 6.30 மணியாகிவிடவே தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*அதன்படி பாராளுமன்றம், அதனது 2011 நவம்பர் 29 ஆந் திகதிய தீர்மானத்திற்கிணங்க, 2011 டிசம்பர் 05, திங்கட்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது*

*It being 6.30 p.m., MR. PRESIDING MEMBER adjourned Parliament without Question put.*

*Adjourned accordingly until 9.30 a.m. on Monday, 05th December, 2011, pursuant to the Resolution of Parliament of 29th November, 2011.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

குறிப்பு

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102,Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year . Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.